# හීන හතක්

sujeewa prasannaarachchi

Elegantalks.com

සුජීව ප්‍රසන්න ආරච්චි

MADHARA BOOKS
loving presents..

සුජීව ප්‍රසන්න අාරච්චි

# හීන ගානක්

SUJEEWA PRASANNA ARACHCHI

Elegantta

# පිදුම

අපරිමිත කරුණා ගුණයෙන්ද
උතුම් මිනිසත්කමින්ද
අනූන වූ... මගේ ජීවිතයේ හමු වූ
ආදරණීයම ජීවකයෙක් වූ
අප මිත්‍ර...

## වෛද්‍ය ටී. එච්. තෙන්නකෝන්

මහතාට මේ කෘතිය
බැතිබරව පුදමි.

Elegant

මධුවන්ත...
චුට්ටක් මං දිහා බලන්න...
මේ ඇස් දිහා බලන්න...
මොනාද ඔයාට පේන්නේ...
ඔයා කියයි මං අඬනවා කියලා...
නෑ රත්තරන්... මම අඬන්නේ නෑ...
ගෑණු අඬන්නේ බොරුවට...
ඇත්තට අඬන ගෑණු හරි අඩුයි...
මාත් බොරුවට අඬනවා...
ඔයා මට ආදරේ බව දැන දැනත්
මං අඬනවා...
මෙතනින් එහාට ජීවිතේ මොනවද ඕන...
ඔයා ඇරෙන්න මට මොනවත් එපා...
මට ඔයාගේ ආදරේ කියන්නේ
ජීවිතේ හැම දේම...
මගේ ජීවිතේම මධුවන්ත අයියේ...
මාව ඔයාගේ දුවෙක් වගේ හදාගන්න...
මං මේ කකුල් දෙක ළඟ වැටිලා
ජීවිතේම දෙන්නම්...
මට මේ තාත්තිගෙනුයි දුවගෙනුයි
තොර ජීවිතයක් නෑ...
මම ජීවිතේ කවදාවත් දෙවියෝ දැකලා නෑ...
දෙවියෙක් මගේ ජීවිතේට



ආවෙත් නෑ... ඒත් මම ඔයාගේ
ඇස් දෙකින් දෙවියෙක් දැක්කා...
ජීවිතේ දැකපු එකම දෙවියා ඒ ඔයාගේ
ඇස් දෙකින් දැකපු දෙවියා...
ඒ දෙවියා දිහා බලාගෙන ඒ දෙවියාගේ
පිවිතුරු බැතිමතෙක් වෙනවා ඇරෙන්න
මේ ජීවිතේ කරන්න වෙන දෙයක් මං
දන්නෑ... මං ඔයාව අදහනවා මධුවන්ත...
අදහනවා... ජීවිතේ අමාරුම දුෂ්කරම
කාලෙක ඔයා මගේ අත් දෙකින් අල්ල ගත්තේ...
ඔයා කියන්නේ මං ඔයාට පිහිට
උනා කියලා... එහෙම කියනව නම් මං
ඒක පිළිගන්නම්... ඒත් බැතිමතෙක්
කොහොමද දෙවියෙකුට පිහිට වෙන්නේ...
මගේ හදවතම දේවාලයක්... ඒකේ වැඩ
ඉන්න එකම දෙවියා ඔයා... සදහටම...

# මුතු



Pagantta.com

Eggantk

“මීට වසර දහයකට
ඉස්සෙල්ලා ඔයාගේ
පොතක් මේ අතට ලැබුණ නම්
ජීවිතය මීට වඩා ගොඩක්
ලස්සනයි... එච්චරයි
මට කියන්න තියෙන්නේ...”



සුජීව ප්‍රසන්න ආරච්චි

# 01

උදෑසන හිරුගේ ප්‍රථම රැස් දහරාව සිංගප්පූරුවේ උස් ගොඩනැගිලි මුදුන් මතට රහසේම කඩා වැටෙමින් තිබුණි. මධුවන්ත සේනාසිංහ ඔහු උන් අපාට්මන්ට් නිවසේ විශාල වීදුරු කවුළුවෙන් සිංගප්පූරුවට හිරු පායන අයුරු බලා උන්නේය. පුරුද්දකට මෙන් ඔහු හැමදාම මෙහේ සිංගප්පූරුවට හිරු පායන අයුරු බලාගෙන උන්නේය. ඒ හැම උදෑසනකම ඔහු සිතුවේ ලෝකයට පායන මේ හිරු තමාගේ ජීවිතයට නොපායන්නේ ඇයිද කියාය.

පෙරදා රැයම මධුවන්ත පහන් කළේ නින්දක් නොමැතිවය. වරෙක ඔහු ඇඳ මැද නිදා උන් පුංචි දියණිය ළඟට වීද... තවත් වරෙක අපාට්මන්ට් නිවසේ කාපට් බිම ඉඳගෙනද... තවත් වරෙක වීදුරු කවුළුවෙන් විදුලි බුබුළු දහස් ගණනක් දැල්වෙන සිංගප්පූරු

නගරය දෙස බලමින්ද ගත කළේය. පෙරදා රෑය පමණක් නොව පසුගිය වසර පුරාම එළඹී හැම රෑයක්ම ගෙවී ගියේ මේ ලෙසමය.

දියණිය ළඟට වී පහන් කරන මේ රෑයේම තම බිරිඳ ඇගේ අනියම් පෙම්වතා සමඟ සිංගප්පූරුවේ සැප හෝටලයක කාමරයක තුළ රෑය පහන් කරන බව මධුවන්ත දැන උන්නේය. ආදරය මුළු ආත්මයෙන්ම ඇදහූ තරුණයෙකු වූ මධුවන්තට සිංගප්පූරුවේ උදාවූ හැම රෑයක්ම කාලකණ්ණි දුකක් ගෙන දුන් කරුමක්කාර රෑයවල් විය... ඔහු මුළු රෑයම දියණියගේ පුංචි අත් පා අතගාමින් ජීවත් වන්නට ශක්තියක් ගත්තේය. ඔහු ජීවත්වන මේ අපාට්මන්ට් ගොඩනැගිල්ලේ විසි තුන්වන තට්ටුවෙන් බිමට පැන සිය දිවි හානි කරගන්නට සිතුණ හැම රෑයකම ඔහු හිත හදා ගත්තේ තමාගේම ලේ ඇති දියණියගේ අත් පා ඉඹය.

දුව කාගේවත් නොවන බව මධුවන්ත දනී. පුදුමයකට මෙන් කෙල්ලට පිහිටා තිබුණේම තමාගේ රුවමය. ඒ තමාමය. ඒ ඇස් දෙකමය... ඒ කතාවමය. මේ ලෝකයේ තමාගේ කියන්නට අද ඉතිරි වී ඇති එකම වස්තුව මේ දුව පමණක්ම බව ඔහු දනියි.

"මගේ කියන නාමයක් නෑ... එක නියපොත්තක් නෑ... නාත්තිම තමයි..."

භාෂිණී මේ කතාව කීවේ දුව උපන් සිංගප්පූරුවේ සෙන්ට් මයිකල් රෝහලේදීය. ඒ ජීවිතයේ ලස්සනම දවස්ය. මධුවන්ත මුලින්ම සිපගත්තේ ඔහුගේ දුවව නොවේ භාෂිණීවය.

"තෑන්ක්ස් බබා..."

ඔහු ඇගේ නළලක සිපගෙන හිස අතගා කීවේය. මධුවන්ත සිතුවේ අන් පසු ජීවිතය තවත් ලස්සන වේවි යැයි කියාය...

"අපි තව මාස හයක් විතර ඉඳලා සල්ලි ටිකකුත් එකතු කරගෙන ලංකාවට යන්... පුංචි ගෙයක් අරගෙන පුංචි බිස්නස් එකකුත් පටන් අරගෙන ජීවත් වෙමු..."

මධුවන්ත ඔහුගේ හීන මාලිගාවම භාෂිණී ඉදිරිපිට තැබුවේය.





එහෙත් ඉන් පසු දෛවය ඒ තරම්ම නොව කොහොමටත් කාරුණික වූයේ නැත. ජීවිතයේ ලස්සනම දේවල් ඔහුට දුන් සිංගප්පූරුවම ඔහුට දුන් දේවල් පමණක් නොව ඔහුගේ ජීවිතයම ඔහුගෙන් උදුරා ගත්තේය.

කොල්ලා තවම ඉන්නේ එදා හිරිවැටුණු ගමන්ය...

මධුවන්තට හිල්ලින... ඔහු තවමත් ඇඳ මත නිදන දියණිය දෙස බලා උන්නේය. කෙල්ල මේ මොහොටත් දන්නේ නැත. මාස දෙක තුනක් අම්මාගේ පැත්තට හැරි හැරී අම්මාව සෙවූ කෙල්ල පසුව තමාගේ පැත්තටම හැරී බඩට වූටි අතක් දමාගෙන නිදන්නට පුරුදු විය.

සමහරක් රෑයවල් වලදී දුක දරාගත නොහැකිව මධුවන්තට ඇඬුණ දවස් විය. එහෙත් මේ සිංගප්පූරුවේ ඔහුගේ කඳුළු පිසලන්නට කෙනෙක් උන්නේ නැත.

ජීවිතය හද්දා පාළු අඳුරු අගාධයක පතුලේ නැවතිණ. ජීවිතයට ලැබුණ එකම එළිය කෙල්ලගේ ඇස්වලින් හා එළිය විය. මධුවන්ත නොමැරී ජීවත් වූයේ ඒ ඇස්වල එල්ලීගෙනය.

ඔහු හීටරය ගසා දුවගේ කිරි එක හදාගෙන ඇඳට ආවේය. තවම ඇයට අවුරුදු දෙකක්වත් නැත. දෙක වෙන්නේ මේ මාර්තුවේය.

"වූ..ටි අම්මී... උදේ වෙලා.. කෝ හා පැටියා තාම දොයිනේ..."

කෙල්ල දහ දොළොස් වතාවකට ඇඹරෙයි. පෙරලෙයි. අවසානයට පුංචි කොට්ටය බදාගෙන ඇස් යංතමට ඇර මධුවන්ත දෙස බලයි. ජීවිතය දමා යන්නට රෑයක් පුරා සිතූ සිතුවිලි කඳ මේ එක බැල්මකට පහව යයි. "මං ඔයාව දාලා මැරෙන්නෑ..." මධුවන්ත කියයි. ඒ හිතටය.

"තාත්ති ර..ස කුක්කු එකක් හැදුවා... අපි බොමු... ඊයේ රෑ සුරංගනාවියොත් ඇවිත් ඇහුවා පැටියා කුක්කු ඔක්කොම බොනවද කියලා..."

"බ..බා දො..යි..ද..."

කෙල්ල යංතමට සිනාසී අහයි.

"ඔ..ව් බබා දොයි..."

"උ..ම්..මා දීලා ගියාද..."

"ඔ.ව්... උම්මා ගොඩක් දීලා ගියා..."

මධුවන්ත කතාවෙන් කතාවෙන්ම කෙල්ලගේ මුවට කිරි බෝතලය කිට්ටු කරයි. කිරි එක බොද්දී කෙල්ලගේ මුහුණට අහිංසක තෘප්තිමත් සිනහවක් එයි... මධුවන්ත ඒ හිනාව බලන්නට පුදුම තරම් ආසය.

යංතමට කිරි දත් හතරක් පමණක් ආ ඒ මුවේ ඇඳෙන කිරි සිනහව දෙස බලා සතුටු වන්නට වත් හිතක් හාෂිණිට නැත්තේ ඇයිදැයි මධුවන්ත සිතුවාය. දෛවය මේ නොරටෙදී තමාට මුණගැස්සුවේ ඒ තරම්ම රුදුරු ගැහැණියක්ද... නැත. සිංගප්පූරුවේ සිංහපුරා හිදී මේ අත් පැටලී තිබුණේ එවැනි රුදුරු ගැහැණියකගේ අතක නොවේ.

"ඇත්ත කියන්න... මෙහෙදි මාව දැකලා ආස උනාට ලංකාවේ කෙල්ලෙක් ඉන්නවා නේද..."

ඒ වචන කොතරම් ආදරණීයද...

"හිටියනම් මෙහෙම දාලා එයිද මම..."

"මා..ව දාලා යන්නෑ..."

"ටුට්ටකට දාලා යන්න වෙනවා..."

"ම්..හ්..."

ඇස් බය වූ හැටි මධුවන්තට තවම මතකය.

"ඒ ඇ..යි..."

"ටොයිලට් එකට යද්දී..."

එදා ඇය මේ උරතලය ඇගේ පුංචි දසත් වලින් විකූ හැටි





මධුවන්තට මතකය. තවමත් ඒ ආදරයේ මිහිර වේදනාව දැනෙනා තරමය.

ඒ සොඳුරු ආදර මාළිගාවෙන් කිරිල්ලිය පියඹා ගියේ ඇයි... තමා අතින් මේ ජීවිතයට අබමල් රේණුවක තරම්වත් වරදක් නොවූ බව මධුවන්ත දනී.

"තා..ත්..තියෝ..."

මධුවන්ත පියවි සිහිය ලැබුවේ දූගේ හඬිනි.

"ඇයි පැටියෝ..."

"කුක්කු වාරයි..."

කෙල්ල කුක්කු වාරයි කීවේ කුක්කු ඉවරයි කියන එකටය. මධුවන්ත එහෙමම කෙල්ලව වඩා ගත්තේය.

"අ..ම්..මියා ආවේ නෑ..."

"දැන් එයි මගේ පුතු..."

හාෂිණිත් මධුවන්තත් අතර බෙදුනේ ජීවිතය දෙපලු කරමින් මෙනි. හාෂිණී ඇය සේවය කරන ගුවන් ටිකට් පත් සමාගමේ දිනපතා රෑ වැඩට දාගත්තාය. එහෙත් මුල් දවස්වල කතා කරන කිසිම අවස්ථාවක ඇය එහි උන්නේ නැත.

"ටිකට්ින් කරන කොට ඔෆිස් එකේම ඉන්න බෑනේ මධූ... මං නිතරම එයාපෝට් යනවා..."

මධුවන්ත මුලින් ඒ කතාව විශ්වාස කළේය. එහෙත් ඇය කිසිම දිනයක ෂැංගි ගුවන් තොටුපලේදී දැක නැති බව මධුවන්ත සේවය කරන කාගෝ ආයතනයේ සිංහල මිතුරන් කිවෝය. ඒත් මධුවන්ත තම බිරිඳව සැක කළේ නැත.

අවසානයේ මධුවන්ත සියල්ල දැන ගනිද්දී බොහෝ දේ බොහෝ දුර ගොස් තිබුණි. හාෂිණී මධුවන්තගෙනුත් දුවගෙනුත් සෑහෙන දුරකට ගොස් උන්නාය.



Elegantbooks.com

හාෂිණී ඇය සේවය කරන ගුවන් ටිකට් පත් ආයතනය හිමි ඉන්දියානු ජාතිකයා සමඟ අනියම් ඇසුරක් පවත්වන බව මධුවන්ත දැනගනිද්දී ඔහුගේ තුන් ලෝකයම දෙදරා ගියේය. මේ ඔහු උන්නේ ඒ දෙදරා ගිය ආදරයේ පවුල් ජීවිතයේ සුන්බුන් සමඟය. ආදරය ජීවිතයෙන් අදහන්නන් ආදරයේ මතක සුන්බුන් වලට පවා පණසේ ආදරය කරයි. මධුවන්තද එහෙමය.

"මිස්ටර් කුමාර් මගේ බොස්... එයා කතා කළාම මං යන්න බැදිලා ඉන්නවා..."

ඒ හාෂිණීගේ වදන්ය.

"එතකොට හාෂි ම..ම..."

"නිකං බොළඳ මිනිහෙක් නොවී ඉන්න මධුවන්ත... ඔයාගේ කාගෝ එකේ අර රස්තියාදු කාරයෝ ඔයාට බොරු කරලා..."

අවසානයට සියල්ල ඔහු ඇස් පිනා පිට දැකගත්තේය...

මධුවන්ත දුවවත් තුරුල් කරගෙන අපාට්මන්ට් ගොඩනැගිල්ලේ දොරකඩ දෙස බලා උන්නාය. උඩ සිට බලද්දී එන යාන වාහන පවා පෙනෙන්නේ කුඩාවටය. ඒත් අපාට්මන්ට් ගොඩනැගිල්ල ඉදිරිපිට නැවැත්වූ සැප කාරය කාගේදැයි මධුවන්ත දැන උන්නේය. ඔහුගේ පපුව තවත් මිරිකමින් හාෂිණී එහි ඉදිරිපස දොර ඇරගෙනම බැස්සාය. බැස්ස පසුත් ඇය කතාවය. මේ මාස හය හතට ඇය එක වචන දහයක් දොළහක් තමාත් සමඟ කතා කළේ නැත. එහෙත් ඔහු සමඟ බැස්ස පසුත් කතා කරන්නට ඇයට දේවල් ඇත.

"අ..ඕ..මේ ආවා..."

මධුවන්ත දුවට රහසින් මෙන් එසේ කියා කවුළුව ළඟින් මෑත් වූවේය. තමාත් දුවත් මේ ජීවන වාලුකාවේ අසරණව අනාථව ඇත. දැන් කොහේ කියා යන්නද... කොහේ කියා ආදරයක් පතන්නද... මධුවන්තට තේරෙන්නේ නැත.

අපාට්මන්ට් නිවසේ දොර ඇරිණ. තමාත් දුවත් ගැන දුක සිතීවත්





ඇය එක රැයක්වත් නවතීවි යැයි මධුවන්ත පසුගිය කාලයේ සිතුවේය. එහෙත් එසේ වූයේ නැත. එහෙත් මධුවන්ත සෑම රැයකම දොර අගුළු නොදමා උන්නේය. නිවසේ පමණක් නොව ඔහු තම හදවතේද අගුළු ඇර දමා උන්නේ ඇය හති වැටී හෝ නැවත මේ ජීවිතයට ඒ යැයි සිතාය. එහෙත් හදවත එහෙමමය. පාළුය.

හාෂිණී ආවේ බිම බලාගෙනමය. ඇය ළඟින් එන විලවුන් සුවඳ මධුවන්තට ගෙන ආවේ දුකකි. ඉස්සර ඒ පපුවේ සුවඳ පවා උදේ හවා සිප බැලූ ඔහුට දැන් ඒ සුවඳ ළංවී වත් විඳින්නට ඉඩක් නැත.

මුළු රැයක් පුරාම ජීවිතයේ පව්කාර ගද ගසන සැපක් විඳ එන හාෂිණී තමාත් දරුවාත් ළඟට ආ පසු කරන්නේ ආ සැනින්ම ඇඳ බදා ගැනීමය.

"හාෂි..."

මධුවන්ත ඇඳ ළඟට ගොස් කතා කළේ දුවවත් වඩාගෙනමය.

"කියන්න..."

ඇය කතා කරන්නේ ඔහු දෙසවත් නොබලාය.

"ටිකක් මේ පැත්ත බලනවද..."

ඔහු අසරණව කීවේය.

"මොන..ම මළ වදයක්ද... හරි කියන්න..."

හාෂිණී ඇඳ මත හැරී කීවාය. හරියටම ගෑණියෙක්ගේ හදවතින් බැලුවා නම් මේ ලෝකයේ ඇයට වැඩියෙන්ම ආදරය කරන දුප්පත් මිනිසාවත් දියණියවත් බලාගන්නට තිබුණි. එහෙත් ඇය එසේ. හදවතින් බැලුවේ නැත. මධුවන්තත් දුවත් බලා උන්නාය.

"මං අද ටිකක් වේලාසන යන්නෝන... දුවට කිරි පොවලා තියෙන්නේ..."

"ම.. හරි ඉතින් යන්න..."



Elegant Kata

"ඒක නෙමේ කියන්න ගියේ..."

"ඉතින් කියන්න..."

"ම..ට ඔයත් එක්ක ටිකක් කතා කරන්නෝන්න... දැන් නෙමේ... හවසට..."

හාමිණී කතා කළේ නැත. ඇය කතා නොකරන බව මධුවන්ත දැන උන්නේය.

"රෑට නිවාඩුවක් ගන්න බැරිද... ටිකක් කතා කරන්න..."

"මං දහයට ඔෆිස් එකේ ඉන්නෝන්න..."

"ඒ ඇති... මං වේලාසන එන්නම්..."

මධුවන්ත දුවව ඇඳමත තබා හැරුණේය.

"ම..ට..ත් දෙයක් කියන්න තියෙනවා..."

"කියන්න..."

මධුවන්ත ඒ ඇස් දෙසම බලා උන්නේය. ඒ තම ආදරණීය බිරිඳගේ... රත්තරන් හාමිගේ ඇස් නොවේ. වෙන කාගෙද දහදරා ඇස් දෙකකි.

"මා..ත් තීරණයක් ගන්නෝන්න..."

මධුවන්ත කතා කළේ නැත. ඇය කවදාක හෝ මෙය කියන බව ඔහු දැන උන්නේය.

"රෑට කතා කරමු... මං සෑන්ඩ්විචස් හදලා ඇති... දුවට ගම්මිරිස් නොදා හදලා ඇති... කාලා ඉන්න..."

දෙදරතිබ්බානම් මේ ගැණු පපුව දැන් දෙදරිය යුතුය. දෙදරා පුපුරා ගලා යා යුතුය. එහෙත් පපුවකට මත් බෙහෙත් දුන් පසු ඒ පපුවට පියවි සිහියක් නැත.

මධුවන්ත සැරසී ඇඳ මතට වී තනිවම සෙල්ලම් කරන දුව





දෙස මොහොතක් බලා උන්නේය. පසුව ඔහු කෙල්ලව මොහොතකට වඩා ගත්තේය.

"අම්මි එක්ක බයි කාලා ඉන්න... තාත්ති ඉක්මනට එන්නම්... කෝ තාත්තිට උම්මා එකක් දෙන්න..."

කෙල්ල මධුවන්තගේ බෙල්ල බදාගෙන ඔහුව ඉඟගත්තාය.

"හාමි මං ය..න්..වා..."

"ම..."

විදුලි සෝපානය වේගයෙන් පහළට කඩාගෙන ගියේය. තම ජීවිතයත් එසේ කඩාගෙන පහතට යන සෙයක් මධුවන්තට දැනුණි. දැන් තමා ඉන්නේ අගාධයෙනුත් පිකක් පහළින් බව ඔහු දනී.

අපාවමත්ට ගොඩනැගිල්ලෙන් පිටවී ඔහු සිංගප්පූරුවේ ආසියාතිකයන් වැඩිපුර ජීවත්වන සෙරන්ගුන් මාවතට පිවිසියේය. ලිට්ල් ඉන්ඩියා නමින් හඳුන්වන ප්‍රදේශය පිහිටියේ මේ සෙරන්ගුන් මාවත කෙළවරය. මධුවන්ත සේවය කළ කාගෝ ආයතනය පිහිටියේ එහිය.

අද ජීවිතයේ වෙනස්ම දවසකැයි මධුවන්තට සිතුණි. ජීවිතය කඳුළක පැටලී තීරණාත්මක මොහොතකට ළංව ඇතැයි ඔහුට සිතුණි. "මාත් තීරණයක් ගන්න ඉන්නේ" එද්දී හාමිණී කියූ කතාව මධුවන්තට සිහිවිය. සාමාන්‍යයෙන් ඇය ඔහොම කියන්නේ තීරණයක් ගන්නට පෙර නොවේ. ගත් පසුය. ඒ තරමටම තමා ඇගේ ජීවිතයේ නොවැදගත් කොටසකි.

තීරණයක් ගත යුත්තේ ඇය නොවේ. තමාය. ජීවිතයේ ගත යුතු බලුම තීරණය ඇය දැන් ගෙන හමාරය. මේ ජීවිතය පුරා ලේ වැකි පැල්ලම් සේ දියවන්නේ ඒ තීරණයේ බෝම්බ සුන්බුන්ය.

මධුවන්ත සෙරන්ගුන් වීදියේ මුස්තාෆා ෂොපින් සෙන්ටර් ඉදිරිපිටටම පැමිණ උන්නේය. ජීවිතයේ ලස්සනම දවස් වලින් බාගයක් ගෙවී ගියේ මේ අවටය. මධුවන්ත වටපිට බැලුවේ ඒ මතක සටහන් තවමත් ඇත්දැයි බලන්නට මෙනි.

ඔහු කාගෝ ආයතනයේ මිතුරෙකුට ඇමතුමක් ගත්තේය.

"ර..වී.. මම..."

"මධු කියපන් මචං..."

"අද මොනවා හරි යවන්න තියෙනවද..."

"දෙක තුනක් නම් තියෙනවා ඇයි..."

"පුළුවන් නම් මට නිවාඩුවක් දීපන්..."

"ඇයි මධු ආයෙත් දුවට සනීප නැද්ද..."

"නෑ මචං... ම..ට පොඩ්ඩක් නිස්කලංකේ අද හිතන්නෝන..."

රවී මොහොතක් නිහඬව උන්නේය.

"ම..ට තේරෙනවා... උඹ අද ලීව් එකක් ගනිං... මං බඩු ටික දාන්නම්..."

"නැනැකිස් මචං...

"මං රෑට එන්නම්... උඹව හම්බවෙන්න..."

"දහයෙන් පස්සේ වරෙන්..."

"කන්නෙපා... මං කෑම උඹටත් එක්කම අරන් එන්නම්... මොනවා හිතුවත් දරුවා ගැනත් හිතපන්..."

"මං දන්නවා මචං..."

"ම.. පරිස්සමින්... ටේක් කෙයා..."

ජීවිතයේ දුෂ්කරම අවස්ථාවල පිහිට වූ මිතුරා ගැන මධුවන්තට දුක සිතුණි. ඔවුන් තමා ගැන ඊටත් වඩා දුක් විඳින බව මධුවන්ත දැන උන්නේය.





# 02

**මධුවන්ත** සේනාසිංහ සිංගප්පූරුවට එද්දී ඔහුට අවුරුදු විසි හතරකි. සිංගප්පූරුවේ සේවය කරන ශ්‍රී ලාංකිකයන් විසින් ලංකාවට යවන බඩු භාණ්ඩ ලංකාවට ගෙන යන කාගෝ ආයතනයක වැඩට ඔහු සම්බන්ධ වූයේ ඒ ගමන මේ ජීවිතයේ දෛවෝපගත ගමනක් වේ යැයි සිතාගෙන නොවේ.

මධුවන්තට ඉන්නේ අයියා කෙනෙක් පමණි. ඔහු ප්‍රියමන්තය. මධුවන්තගේත් ප්‍රියමන්තගේත් දෙමව්පියන් මෙලොවින් සමුගත්තේ ඔවුන්ගේ තරුණ වියේදීමය.



Elegantt talks.com

මධුවන්තගේ අයියා වූ ප්‍රියමන්තගේ වාසනාවට ඔහුට හොඳ රැකියාවක් මෙන්ම හොඳ බිරිඳක්ද ලැබුණේය. ප්‍රියමන්තගේ විවාහය සිදුවූයේ කොළඹ යුවතියක වූ නිම්මි සමඟය. ඔවුන් කොළඹ හොඳටත් පොහොසත් කම් ඇති පවුලකි. ප්‍රියමන්ත සමඟ ඇතිවූ සම්බන්ධයට මුලින් අකමැති වූ නිම්මිගේ දෙමව්පියන් අවසානයට ඔවුන්ට කැමැත්ත දුන්නේ ප්‍රියමන්තගේ ඇති නිවුන ගතිගුණ වලටමය. ඒ වන විට හොඳ රැකියාවක්ද කරමින් උන් ප්‍රියමන්ත දුක් වූයේ මධුවන්ත ගැනය.

"මට හිටියේ උඹ විතරයි... දැන් උඹත් යනවා..."

නමා සිංගප්පූරු යන බව කියූ විට අයියා කියූ අයුරු මධුවන්තට සිහිවිය. ප්‍රියමන්තගේ විවාහය සිදු වූයේ මධුවන්ත සිංගප්පූරුවට එන්නට මාසයකට පෙරය. ඒ විවාහයේදී ප්‍රියමන්තගේ දෙවෙනි මනමාලයා වූයේ මධුවන්තය. නිම්මිගේ දෙවෙනි මනමාලිය වූයේ එවකට අවුරුදු දහතක ලාබාල යුවතියක් වූ මුතුමාලිය.

මංගල උත්සවයේදී වත් ඇය මධුවන්ත සමඟ වචන දෙක තුනක් වත් කතා කළේ නැත. ඇය දැන් සුරූපී තරුණියක වී ඇතැයි මධුවන්තට සිතුණි.

මධුවන්ත සිංගප්පූරුවට ආවේ ජීවිතය පිළිවෙලක් කරගෙන මිස යළි ලංකාවට යන්නේ නැතැයි සිතාගෙනය. ඔහුගේ ඒ අහිංසක සිහිනයේ මල් පිපුණේ භාෂිණී සෙනවිරත්නව හමුවූ දාය. සිංගප්පූරුවේ සේවය කරන ශ්‍රී ලාංකිකයන් සඳහා සංවිධානය කර තිබූ අලුත් අවුරුදු උළෙලකදී මධුවන්තට මුල්ම වරට භාෂිණීව හමුවිය.

ඒ උත්සවයේ මිස් ශ්‍රී ලංකා ඉන් සිංගප්පෝ වූයේ භාෂිණීය. ඒ තරඟය විනිශ්චය කළ විනිශ්චය මණ්ඩලයේ මධුවන්තද උන්නේය. මධුවන්ත විනිශ්චය මණ්ඩලයේ සිට ඇය දෙස බලා උන්නේ පුදුමාකාර ලෝභකමකිනි.

"අයියට තැන්ක්ස් කරන්න ආවේ..."

අවුරුදු උත්සවයෙන් පසුව පැවති රාත්‍රී සාදයේදී ඇය කීවාය. එදා භාෂිණී ඇඳගෙන උන්නේ සුන්දර කළු ගවුමකි. ඒ ගවුමේ පපුවට





අල්ලා තිබූ සුදු සීකුවින්ස් පවා මධුවන්තට තවමත් මතකය.

"කොහෙද වර්ක් කරන්නේ..."

"මංද... මං ටිකටින් ඔෆිස් එකක... ග්ලොබල් ට්‍රැවල්ස්... අයියලගේ කාගෝ එක කිට්ටුවමයි තියෙන්නේ..."

"කොහොමද දන්නේ මං කාගෝ එකේ වැඩ කියලා..."

එදා දුටු සිනහව කොතරම් පිවිතුරුද... කා වෙතුවෙන් වත් විවරව නොතිබූ හදවත් දොර පියන් කිරි කිරිස් ගා සෙලවෙන බවක් එදා මධුවන්තට දැනුණි.

"මං කාගෝ එකට කීප සැරයක් ඇවිත් තියෙනවා... මං අයියව දැකලා තියෙනවා..."

"කාගෝ එකට ආවා..."

"ඔ..ව්.. ගෙදෙට්ට බඩු වගයක් යවන්න..."

"ආයෙමත් බඩු මොනාහරි යවනවා නම් මට කතා කරන්න... මේ මගේ කාඩ් එක..."

භාෂිණී කතා කළේ දෙදිනකට පසුය.

"අයියේ මං.. අ..ර කැත අවුරුදු කුමාරි..."

මධුවන්ත ඇගෙන් ඇමතුමක් බලාපොරොත්තුවෙන් උන්නේය.

"කැතනම් අවුරුදු කුමාරි වෙනවයැ..."

"ලස්සන ගර්ල්ස්ලා හිටපු නැති නිසා හොඳයිනේ..."

"හරි හරි.. කැත අවුරුදු කුමාරිට දැන් කොහොමද..."

ඔහු සිනාසී කීවේය.

"අපි කැත නෑ..."

"ඒකනේ මාත් කිව්වේ..."

දෙදෙනාම සිනාසුණේය.

"අයියා දැන් කොහෙද ඉන්නේ..."

"මං ඔෆිස් එකේ නංගී..."

"චු..ට්..ට..ක..ට තත්පරේකට ප්ලාසා සිංගප්පෝ එකට එනවද..."

"ඇයි නංගි හදිස්සියක්ද..."

"ම.. හදිස්සියක්මත් නෙමේ... අද මගේ බර්ත් ඩේ එක..."

"හැපි බර්ත් ඩේ නංගි..."

"තැන්ක්ස්... ඉතින් මගේ යාළුවෝ දෙන්නත් එක්ක අද ආවා ලන්ච් එකට... අයියත් එන්න..."

"තත්පරෙන් ඔතන..."

"මං දොරකඩ ඉන්නම්..."

එදා මධුවන්ත ටැක්සියකින් ඉගිල්ලී මෙන් ගියේ ඇයට ලස්සන තිළිණයකුත් රැගෙනමය. ඒ ගවුම පුදුමාකාර සුන්දර ගවුමක් විය.

"රෑට මොනාද කරන්නේ..."

"දොයියනවා..."

ඇය කියද්දී ඔහු ඒ සුන්දර මුහුණ දෙසම බලා උන්නේය. ජීවිතයේ හැඩ මධුවන්තට ඒ ඇස්වලින් පෙනෙන්නට විය.

"රිවර් සයිඩ් එකේ ලස්සන තැනක් තියෙනවා... රෑට ලස්සනයි..."

"ම්..."

"මං එතන ඩිනර් එකකට ඉන්වයිට් කළොත්...."

"ගොඩක් රෑ වෙයිද..."

"මං ගෙනත් ඇරලන්නම්.. ම..."





"එහෙනම් මාව ගන්නත් ඕන... ක්වාටස් වලින්..."

"ගන්නම්..."

යළිත් ඒ සිනහව ඉසිරී ගිය අයුරු මධුවන්තට මතකය.

"මධුවන්ත අයියේ..."

"කියන්න..."

"ඇයි මාත් එක්කම රිවර් සයිඩ් එකේ ඩිනර් යන්න හිතුණේ..."

"ඇයි බර්ත් ඩේ එකට මටම කේක් කන්න කතා කළේ..."

එදා මුහුණට මුහුණ බලා උන් අයුරු මධුවන්තට මතකය. ඒ දවස් යළිත් එනවානම්...

"මං ඇඳන් ඉන්නම්..."

"මං හතට ක්වාටස් එක ළඟ..."

"ම්.. ප්‍රසන්ට් එකට තැන්කියු..."

"ඕක හදිස්සියේ ගත්තේ... මං ලස්සන ප්‍රසන්ට් එකක් දෙන්නම්..."

එදා රාත්‍රිය මධුවන්තට හොඳටම මතකය. සිංගප්පූරුවට තරමක සීතල සුළඟක් හමා ගිය ඒ රාත්‍රියේ රිවර් සයිඩ් හි එක පේළියට තිබූ අවන්හල් අතරින් ඇවිද ගොස් සුන්දර ඉන්දියානු අවන්හලක් ළඟ නතර වූ අයුරු ඔහුට මතකය.

"මේ රෑක මෙහෙම ගමනක් ආවමයි... ලංකාවෙදිවත් ගිහින් නෑ..."

අද පුරා රාත්‍රීන් ගණන් හෝටල් වල ලගින්නේ එහෙම එදා කියූ භාෂිණීමය.

"ඇයි තනියම මේ වගේ රටකට ආවේ... ලංකාවේ රස්සාවක් කරන්න තිබ්බනේ..."



Elegantalks.com

"මං නරක කෙල්ලෙක් කියලා හිතුවා..නෙ..."

"නරක ළමයෙක් එක්ක මෙහෙම එන්නෑනේ..."

"මගේ රිලේෂන් අක්කා කෙනෙක් එක්ක ඉන්නේ... එයා යන දවසට මාත් යනවා..."

"අම්මයි තාත්තයි මොකද කරන්නේ..."

ඇය ඒ ප්‍රශ්නයට පිළිතුරු දෙන්නට වෙලා ගත්තාය.

"ඒ දෙන්නා සෙපරේට් වෙලා..."

එදා මේ කෙල්ල ගැන පුදුමාකාර දුකක් සමඟ එතුන ආදරයක් ඔහුට ඇතිවිය.

"මං ලංකාවේ හිටියත් ඉන්න වෙන්නේ තනියම..."

"ඉතින් හැමදාම එහෙම ඉන්න බෑනේ..."

ඒ ඇස් එසවුණු අයුරු මධුවන්තට මතකය.

"කවුද මාව බලාගන්නේ..."

"බලාගන්න කෙනෙක් ලැබුණොත්..."

දෙතොල් මෑත් වූවා පමණි.

අද මේ පපුව හිල් කර කර දුක් දෙන ප්‍රථම ප්‍රේමයේ පළමු රස් දහර ගලා ගියේ ඒ රාත්‍රියේය. එදා ටැක්සියෙන් බැස ඇය ක්වාටස්වලට යන්නට හදද්දී මධුවන්ත මොනවාදෝ කියන්නට බලා උන්නේය.

"මං කතා කළාට කමක් නැද්ද..."

"ක..ම..ක් නෑ..."

"කවදද ඔෆ් එක..."

"ෆ්‍රයිඩේ..."

"මාත් මගේ ඔෆ් එක ෆ්‍රයිඩේ ගන්නද..."





ඇය සිනාසුණා පමණි. මධුවන්ත එදා මුළු රාත්‍රියම ඇහැරී උන්නේය. ඒ රැය මේ ගෙවා දමන පාළු කරුමක්කාර රැයවල්වලට වඩා කොතරම් සුන්දරද...

එදා රෑ මහ රෑ ඇය ඔහුට කතා කළාය. නාද වූ සැනින් මධුවන්ත දුරකථනය ගත්තේය.

"රිං වෙච්ච ගමන් ගත්තේ... නිදාගත්තේ නෑ..."

"කො..හොම නිදාගන්නද..."

ඒ වචන එහෙමම පිටවිය.

"ඇ..යි..."

"ඇයි නංගිත් නිදි නැත්තේ..."

"නෑ මේ.. මේ..."

"නින්ද යන්නෑ නේද..."

"ම්... කොහොම නිදාගන්නද..."

දෙදෙනාටම දෙදෙනාගේ හුස්ම හඬ ඇසුණි.

"මධුවන්ත අයියේ...

"මං අහන් ඉන්නේ භාෂි..."

"මං.. හෙ..ට නිවාඩුවක් දානවා..."

"මාත් දාන්නම්... අපි කොහේ හරි යන්..."

"ඇත්තටම මාව එක්කං යනවද..."

"ම්.. සෙන්තොසා යන්..."

"කමක් නැද්ද..."

"ම..ට හෙට වැඩ කරන්න පුළුවන් කියලා හිතෙනවද..."



Elegantalks.com

"ඒකනේ... මටත් බෑ..."

ජීවිතයට ඒ දෙවෝපගත ආදරය ගලා ආවේ ඔහොමය. ඉන් පසු සිංගප්පූරුවේ හැම පාරකම... හැම ෂොපිං මෝල් එකකම දෙන්නාගේ දෑත් එකට වෙලී තිබුණි.

අවුරුද්දකින් පමණ අල්ලා වත් නැත්තේ ඒ අතින්මය...

"ම..ට පු..දු..ම අවුරුද්දක් තනියම කොහොම සිංගප්පූරුවේ උන්නද කියලා..."

ඒ වචන භාෂිණිගේමය.

"මට මේ සිංගප්පූරුවේ ඕන තරම් තනියම ඉන්න පුළුවන්... තමුසෙට වඩා ඩබල් සැලරි මං ගන්නවා... ඉල්ලුවොත් හෙට මට කා එකක් ලැබෙනවා... අපාට්මන්ට් එකක් ලැබෙනවා... ඒවා නොලැබුණේ තමුසෙ හින්දා... ඉලව් අවුරුදු උත්සවේකට ඇවිත් ජීවිතේම නැවැත්තුවා..."

ඒ වචනත් භාෂිණිගේමය.

මධුවන්තට පුදුම මේ ගෑණි ගැනය. තවමත් ඔහු පපුවෙන් ඒ ආදර ප්‍රතිමාව ඉවත් කර නැත. ඉවත් කරන්නට අමාරුය. ඒ තරමට ඔහු රත්තරන් භාෂිට ආදරය කළේය.

"මධූ එකක් කියන්නම්... හැමතිස්සෙම ඔය ලංකාවට යන කතාව දොඩවන්නෙපා... අපේ කවුරුවත් ලංකාවේ නෑ... මට මේ රට හොඳයි..."

"ඒ..ත් භාෂි මේ අපේ රට නෙමේ... හිතන් ඉන්නේ මේ දරුවව වීන දරුවෝ එක්ක ඉස්කෝලේ දාන්නද... අපේ රට මේ දරුවට පෙන්නන්නෙවත් නැද්ද... ලංකාවේ බත් කටක් මේ දරුවට කවන්නැද්ද..."

"ඉතින් අරන් ගිහින් කවලා ගේනවා... මට යන්න බෑ... බෑ





කිව්වොත් බෑම තමයි..."

ඒ මේ ගැටුමේ මුල් දවස්ය.

"මාලබේ අලුතෙන් ස්කීම් එකක් හදලලු... අයියා කියනවා ඒකෙන් ගෙයක් ගන්නලු... අපට ගෙවන්න ගන්න පුළුවන් හාෂි... ගිහින් ඒ ගේකුත් අරන් අපි අලුතින්ම ජීවිතේ පටන් ගමු..."

"ඇයි දැන් ජීවිතේ නවත්තගෙනද ඉන්නේ..."

"අනුන්ගේ රටක අපට කොහෙන්ද හාෂි ජීවිතයක්..."

"මට බෑ... මං මේ සිංගප්පෝ රටට හරි ආදරෙයි... මං යන්නේ නෑ... ඕන අය යන එකයි ඇත්තේ..."

"මං කියනවට ගිහින් බලලා එමු..."

"මධූ... මට බලපෑම් කරන්නෙපා..."

"ඇයි දාලා යන්න බැරි දෙයක් සිංගප්පු වල තියෙනවද..."

එදා භාෂිණි බැලූ බැල්ම මධුවන්ත සිහි කළේය.

"ගිහින් බදාගන්න දෙයකුත් ලංකාවේ නැනේ..."

"ඒ අපේ රට හාෂි..."

"නෑ.. මගේ රට මේ රට..."

"අවුරුද්දෙන් අවුරුද්ද වීසා ගහන මේක රටක්ද..."

"මට ජීවිත කාලෙටම සිටිසන් ෂිප් එක ගන්න පුළුවන්..."

"එතකොට මම.. දරුවා..."

"මං දන්නෑ..."

ජීවිතය ගිනි ගන්නට පටන් ගත්තේ එතැන් සිටය... මේ ආදරයෙන් තොරව ජීවිතයක් ගැන හිතන්නට වත් නොදැන උන්

මධුවන්තට ජීවිතය තනිවම ගත කරන්නට සිදු විය. ඔහු ජීවිතයේ සියළු දුක් දරාගෙන පුංචි දුවෙකුට හොඳ තාත්තෙක් විය.

"දුවාට බඩ බුරුල් වෙලා දහ දෙළොස් පාරක් ගියා හාමි... මං බයයි... අඩු උනේ නැත්නම් ඩොක්ටර් කෙනෙක් ගාවට යි අරං යං..."

"ඒකට මං ඉන්නෝන නෑනේ..."

"හිටියොත් නේද හොඳ හාමි... දරුවව අතේම තියන් ඉන්නෝනා බලන්න ඇඟම වැහැරිලා ගිහින්..."

"අද ඔෆිස් එකේ කවුරුවත් නෑ... මං ඉන්නම ඕන... හදිස්සියක් උනොත් කතා කරන්න... මට නවතින්න බෑ..."

"හාමි මේ උඹෙත් දරුවා..."

එදා මධුවන්ත කවදාවත් නැති ලෙස කෑගැසුවේය.

පුපුරනනේ මටද... මං කිව්වා බබාල හදන්න බෑ කියලා... ඒ දේ වෙන බව දන්න නිසා තමයි එහෙම කිව්වේ..."

ඒ තරම් කුරිරු වූයේ අර භාෂිණිමද කියා මධුවන්තට සිතා ගන්නට නොහැක. ජීවිතයේ ආදරය කළ එකම ගැහැණිය මෙහෙම කළා නම් තවදුරටත් ආදරය කොහොම අදහන්නද...

වීලෝක් ප්ලේස් හි විදියට විවෘත වූ කෝපි හලේ අසුනකට ඔහු බර වූයේ ඇවිද ඇවිද හති වැටුණ නිසාය. මේ තරම් දුරක් ඇවිදගෙන ආවේ කොහොමද කියාවත් මධුවන්තටම මතක නැත.

අවට උස රුස්ස ගස් සිටුවා ඇති මේ තැනට මධුවන්ත සිංගප්පූරුවට ආ දා සිටම ආසය. මධුවන්ත ඉඳගෙන ඇති වේලාවකින්ම මහා වේගයෙන් ධාරානිපාත වැස්සක ඇද වැටෙන්නට විය. තද සිතලත් අනෝරා වැස්සත් ඔහුගේ සිතට ගෙන ආවේ ප්‍රදූමාකාර පාළුවකි. තනිකමකි. මධුවන්ත සෑහෙන වේලාවක් වැස්ස දෙස බලා උන්නේය. පහළින් පෙනෙන වීදියේ වැස්ස මැදත් වාහන





එහාට මෙහාට යයි. ඒ කාටවත් මේ හදවත ගැන ගාණක් නැත. ජීවිතයම යැයි කියා තුරුළු කරගත් අයත් අහක බැලූ කල ලෝකය ගැන කවර කතාද...

"කොෆි ප්ලීස්..."

මධුවන්ත කෝපි එකක් ඇණවුම් කළේ තනිවී කෝපි එකක් බොන්නට නොවේ. මෙතන රැඳී ඉන්නට ඕනා නිසාය. දැන් සිංගප්පූරු වේලාව උදෑසන නමයය... එහෙත් පරිසරය අද අඳුරුය. වැහිබරය... එය හදවතට මොනවදෝ හිතන්නට බල කළේය.

ජීවිතය ගැන තීරණයක් ගත යුතුය. ගත යුතුමය. ඒත් ඒ කුමක්ද... මධුවන්ත දුම් බීටියක් දල්වාගෙන වහින වැස්ස දෙස බලාගෙනම උන්නේය.

තවදුරටත් මේ ගඳ ගහන ජීවිතයත් සමඟ සිංගප්පූරුවේ සිටීම වැඩක් නැතැයි මධුවන්ත සිතුවේය. යනවානම් යා යුත්තේ ලංකාවටය. එහෙත් ගෙයක් දොරක් නොමැතිව කෙසේ කියා ලංකාවට ගොස් ඉන්නද... පිහිටක් සරණක් ඉල්ලන්නට ඉන්නේ අයියා පමණි. ඔහුගෙන් කොහොම කටක් ඇර උදව්වක් ඉල්ලන්නද...

අයියා දන්නේ මේ දුක් ගින්දර වලින් ටිකකි... ඒද ඔහු කතා කළ කීප අවස්ථාවක තමා කියූ දේවලිනි.

"මං භාෂි නංගිට කතා කරන්නද..."

අයියා ඇසුවේය. මේ තරම් ආදරය කළ තමා කී දේවත් ඇය නෑසූ කල අයියාට කන් දෙයිද...

"මං තව ටිකක් බලන්නම් අයියේ..."

"පුළුවන් නම් ඔය ඔක්කොම දමලා ගහලා ගෑණිවයි ළමයවයි අරගෙන ලංකාවට වරෙන්... නාඳුනන රටවල ඉඳගෙන කොහොම ප්‍රශ්න විසඳන්නද..."

අයියා කියන කතාව ඇත්තය. මේ නන්නාඳුනන රටවල සිට කොහොම ප්‍රශ්න විසඳන්නද... එහෙත් භාෂිණි නිවාඩුවකටවත්

ලංකාවට යන්නට කැමති නැත. ඇය ඒ තරමටම බාල ආදරයක පැටලී උන්නාය.

භාමිණී දුවව බාරගන්නට කැමති නැති බව මධුවන්ත දනී. ඇයට දුවව දෙන්නටද ඔහු කැමති නැත. ජීවිතයේ ඉතිරි අඩ ජීවත් වන්නට ඇත්තේ කෙල්ලගේ පුංචි අතක එල්ලීය. ජීවත් වන්නට ඇති ඒ අහිංසක අයිතිය නැති කරගන්නට මධුවන්ත කැමති නැත.

"සිංගප්පූරුවෙදිත් දරුවව හැදුවේ මම... මට ලංකාවට ගිහින් දරුවව හදාගන්න එක අමාරු වෙන එකක් නෑ..."

මධුවන්ත සිතුවේය. එහෙත් ලංකාවට යන්නේ ජීවිතයේ එක් පරිච්ඡේදයක් අවසන් කරය. දුක ජීකය. මැවූ සුන්දර හීනය නාදුනන පොළොවක් මතදීම බිඳී ගියේය.

"එකපාර මට අමාරුවෙයි... ඒත් හිමිහිට පිළිවෙලක් වෙනවා..."

එක අතකට අමුතුවෙන් පිළිවෙලක් වෙන්නට දෙයක් නැත. ඇත්තේ දුවව හදාගෙන මේ කර්කෂ කටුක තනිකම දරාගෙන ජීවත් වීමට පුරුදු වීමය.

යන්නේ මේ බැඳීම් මෙහෙමම තබාගෙනදැයි මධුවන්ත තම සිතින්ම විමසුවේය... ඒවා දෙවයට විසඳන්නට දී දුවවත් රැගෙන ලංකාවට යනවායැයි මධුවන්ත සිතා ගත්තේය.

"කවදහරි භාමි තේරුම් ගනී... මං නැතත් දුව්ව හරි එයාට මතක් වෙයි..."

හදිස්සියේ දික්කසාදයක් නොගන්නට මධුවන්ත සිතුවේ ඒ නිසාය. "මේ හදිස්සියේ ගෙයක් දොරක් හදාගෙන පිළිවෙලක් වෙන්න අමාරු වෙයි... අයියගෙන් වත් උදව්වක් ඉල්ලනවා... ටික දවසක් ලැබුණොත් මට ඇති..." මධුවන්ත අමාරුවෙන් ජීවිතය ගලපා ගන්නට අහිංසක උත්සාහයක් ගත්තේය. ආදර වීමන් හදා ඒ විමානයේ රැජිණකට ආදරය කළ පිරිමියෙකුට දෙවය මෙහෙමම සිතාසුණේ ඔහු කළ කවර පවකටද... ඒත් එහෙම දෙවියන්ගෙන් අසන්නට පවා කෙනෙක් උන්නේ නැත.





"දුවාව ඉස්කෝලේ යවන්න තරම් වයසක් එනකල් හදාගන්න අමාරු වෙයි..."

දැන් ඒ අමාරුකම් කොහොමත් දරාගන්නට වත බව මධුවන්ත දැන උන්නේය.

මධුවන්ත ඔහුගේ ජංගම දුරකථනය අතේ තබාගෙන අයියාට කතා කරනවාද නැද්ද කියා සිතුවේය... වෙන කරන්නට දෙයක් නැත. මේ ලෝකයේ පිහිටක් ඉල්ලන්නට ඉන්නා එකම කෙනා අයියාය. ඔහුගේ ඇගේ දුවන්නේත් මේ ලේමය.

ප්‍රියමන්ත උන්නේ ඔහුගේ බිරිඳගේ නිවසේමය. ඔවුන්ට පමණක් නොව තව පවුල් තුන හතරකට නවතින්නට තරම් ඉඩක් ඒ විශාල නිවස තුළ තිබුණි. ඔවුන්ට අමතරව ඒ නිවසේ උන්නේ නිම්මිගේ දෙමව්පියනුත් නංගී වූ මුතුමාලිත් පමණි.

මධුවන්ත ලංකාවට ඇමතුමක් ගත්තේය. ඇමතුම සම්බන්ධවන තුරු ඔනු රැඳී උන්නේය.

"හෙලෝ..."

ගත්තේ නිම්මි නොවන බව මධුවන්ත දනී. ඇගේ හඬ ඔහුට පුරුදුය.

"මු..තු නංගී නේ..ද.. නංගී මං මධුවන්ත අයියා... සිංගප්පූරුවේ ඉඳලා කතා කරන්නේ..."

මධුවන්ත තරමක් උස් හඬින් කිවේය. මුතුමාලි කතා කළේ නැත.

"නංගිලට කොහොමද..."

ඔහු අහිංසකව ඇසුවේය.

"ඉන්ඩ ටිකක්..."

ඇය එහෙමම දුරකථනය තබා ගියාය. මධුවන්තගේ පපුව ගැස්සිණි. එහෙම කළේ ඇයි...

"අ..යියේ තෝල් එකක්..."

ඇය අයියාට කෑ ගසන හඬ මධුවන්තට ඇසුණි.

"ක..වුද වූට්..."

අයියා එහෙම කියාගෙන එන හඬ මධුවන්තට ඇසෙයි.

"ද..ත්..නෑ..."

මධුවන්තට හිල්ලින. ඇය එනෙම කළේ ඇයි... තරහ වන්නට පවා කළ වරද කුමක්ද...

"හෙලෝ..."

"අ..යියේ.. ම..ම..."

"මල්ලි... ගත්තේ වූට්නේ බං... කියන්නෙපායැ..."

"මං.. මං කටහඬ ඇදින්නේ නෑ අයියේ..."

මධුවන්ත ඇයව බේරාගත්තේය.

"ඉතින් මල්ලි..."

"ඉන්නවා අයියේ..."

මධුවන්තට ඇඬෙන්නට මෙන් ගියේය.

"ම..ල්ලි... ඇයි කො..ල්ලෝ..."

ප්‍රියමන්ත ඇසුවේ පුදුමාකාර ආදරයකිනි. තම එක කුස උපන් සොහොයුරා නොරටක නොවිඳිනා දුක් විඳින බව ප්‍රියමන්ත දැන උන්නේය. ඔහු හැමදාම දුක් වූයේ ඒ දුක බිඳක් හෝ නිවන්නට කොල්ලා ළඟ නැති එකය.

"නෑ අ..යි..යේ මු..කු..ත් නෑ..."

"උඹ අඬනවා කොල්ලෝ..."

මධුවන්ත කඳුළු පිසදාගත්තේය. මේ රටවල ඉන්නේ දුකට වත්





අඬන මිනිස්සු නොවේ.

"අ..යියටයි අක්කටයි කොහොම..ද..."

"මං නේ බං ඒ කතාව අහන්නෝන... උඹට කොහොමද..."

"ඉ..න්..නවා අයියේ..."

ඔහු හැමදාම කීවේ ඒ කතාවය. කොල්ලා ඉන්නේ වෙන කරන්නට දෙයක් නැති නිසාය.

"උඹ දුක් විඳිනවා... මට පේනවා... කන්න ගියත් අක්කටයි මටයි උඹව මතක් වෙනවා... හිර වෙනවා..."

ප්‍රියමන්ත කීවේ ඇත්තය. නිම්මි ඒ තරමටම තම පුංචි මස්සිනාට ආදරය කළේය. ඒ ඔහු අනන්ත දුක් විඳින බව දැනගෙනය. මොනවා වුවද තම සැමියාගේ පැත්තෙත් ඉන්නා එකම නෑයා මධුවන්තය.

"අයියා ඔෆිස් යන්න නේද..."

"ඔව් මල්ලි... ඇයි..."

"එහෙනම් මං අයියට දවල්වෙලා ගන්නම්... වුට්ටක් කතා කරන්න..."

"පස්සේ ඕන නෑ... දැන් කතා කරමු... මට හදිස්සියක් නෑ..."

ඔහු ඉන්නේ ලොකු ප්‍රශ්නයක බව දැනගෙනම ප්‍රියමන්ත ඇසුවේය.

"අ..යි..යේ..."

ඒ හඬ ඇඬුම්බරය. පුංචි දවස්වලත් ඔහු එහෙමය. තද හිතක් නැත. පොඩි දේටත් අඬයි. කඳුළු එයි.

"මල්ලි.. ඇයි කොල්ලෝ..."

නිම්මි පැමිණ ප්‍රියමන්තගේ මුව දෙස බලා උන්නාය.

"ඉතින් බලපන්... උඹ ෆෝන් එකෙන් අඬනවා... මං ළඟ



Elegantlk.com

ඉන්නවද උඹව සනසන්න.. ආ..."

නිම්මිගේ දෑස් බොඳ විය. "බණින්නෙපා..." ඇය රහසින් මෙත් කීවාය.

"හොඳ මල්ලියා වගේ කියපන්... මොකක්ද ප්‍රශ්නේ..."

"මං.. මං ප්‍රශ්න ගොඩක අයියේ ඉන්නේ..."

මධුවන්ත අමාරුවෙන් දෑස් මිරිකා කීවේය. පපුව නායා යන කන්දක් මෙන් ඉහිරී යන්නේ ආදරය කරන කෙනෙකුට කතා කරද්දීය.

"ම..ට තේරෙනවා මල්ලි... මං..."

"මායි මගේ කෙල්ලයි පුදුම දුකක් විඳින්නේ..."

ඔහු කෙල්ල යැයි කීවේ දුවටය.

"පොඩි එකි සනීපෙන්ද... ගිය පාර කතා කරද්දී අසනීපෙන්නේ හිටියේ..."

"දැන් හොඳයි... කතා කරන්න පටන් අරගෙන... හෝ ගාලා කියවනවා..."

"ප්‍රශ්න තියාගෙන උඹ තනියෙන් දුක් විඳිනවා..."

"මං.. මං මේ ර..ටේ තනිවෙලා අයියේ..."

"මං අදද උඹට ඒක කිව්වේ... හැමදාම කියනවා... උඹට මේ රටේ රස්සාවක් හොයාගන්න බැරිද..."

මධුවන්ත දිග සුසුමක් හෙළුවේය.

"ම..ට දැ..න් කො..හො..ම..ත් මේ ර..ටේ ඉ..න්න බෑ අයි..යේ..."

ප්‍රශ්නය කොතරම් දුර දිග ගොස්දැයි ප්‍රියමන්ත දැන ගත්තේය. නැත්නම් කොල්ලා මේ තරම්ම දුක් විඳින්නේ නැත.

"හාෂිණි තා..ම ඒ..හෙමද..."





"මෙ..වවර කල් මේ රටේ හිටියේ ඒයාව කො..හොම හරි හඳාගෙන ඒ..න්..න..."

"මොකද කියන්නේ..."

"තව ඉන්න ඉන්න දුක වැඩියි අයියේ... ම..ට මාවත් ඉතුරු වෙන්නෑ... ඒ..හෙම උනොත් ම..ගේ කෙ..ල්ලට තාත්තෙකුත් නෑ... මං කොයි වෙලාවක හරි මැරෙයි..."

ප්‍රියමන්ත දිග සුසුමක් හෙළුවේය.

"උ..ඔලා සෙපරේට් වෙන්නද හිතුවද..."

"වෙන්න දෙයක් නෑ අයියේ... අපි සෙපෙරේට් වෙලා ගොඩක් කල්... අපි අතර බැඳීමක් නෑ... පවුල් ජීවිතයක් නෑ..."

"ඒ..තකොට දරුවා..."

"මං කෙල්ලව හඳාගන්නේ..."

මොනවා කියන්නදැයි ප්‍රියමන්තට සිතාගන්නට බැරි විය... පවුල් ජීවිතයක් බිඳී යාම වෙහෙරක් පන්සලක් බිඳී යන්නාක් තරම් දෙයකි.

"ගෑණියෙක් ළඟ වැටිලා වැඳලත් ඉ..ල්ලුවට ප..ස්..සේ..."

ඔහු එහෙම කරන්නට ඇත්තේ ඒ තරමටම හාෂිණිට ආදරය කළ නිසාය.

"මට තේරෙනවා මල්ලී..."

"අපි වැරදිලා හම්බ වෙච්ච දෙන්නෙක්..."

"මං උඹට කොහොම පිහිට වෙන්නද කියාල හිතුවේ කොල්ලෝ... මේ අක්කත් අඬනවා..."

ඇත්තටම නිම්මිගේ ඇස්වල කඳුළුය.

"ම..ල්ලී..."



Elegantlk.com

"අ..යියේ..."

"උඹ කොල්ලෝ තීරණයක් අරගෙනද ඉන්නේ... ම..."

"එ..ක රෑක් නෙමේ අයියේ... මාස දෙකක් නිදි මරාගෙන හිතලා මං තීරණයක් ගත්තා... ඒ අතරතුරත් මං හාමිගේ ළඟ වැටිලා ඉල්ලුවා... මං ආදරේ කරපු ගෑණි නිසා..."

"උඹ එහෙම කරනවා කියලා මං දන්නවා..."

"ඒත් අහන්නෑ... ඒ සරුංගලේ කඩාගෙන ගිහින් ඉවරයි අයියේ... නූලවත් මං අතේ නෑ..."

මධුවන්ත කීවේ විශාල සුසුමක් පිට කරය.

"අයියේ..."

"මල්ලී..."

"මං දුවවත් අරන් ලංකාවට එනවා..."

ප්‍රියමන්තට කතා කරගන්නට පවා බැරි විය. අහිංසක ආදරයක්... පුංචි පවුලක් හදාගත් කෙනෙකුට එය දමා එන්නට වීම තරම් තවත් දුකක් නැත. කොල්ලා ඉන්නේ ඒ දුකින් තැම්බීය.

"තව ටිකක් හිතන්න කියලා මට උඹට කියන්න බෑ... උඹයි දුක් වින්දේ..."

"මං විතරක් නෙමේ අයියේ... මගේ කෙල්ලත් පව්... ඉන්න පුළුවන් නම් මම කෙල්ලව බදාගෙන මුළු රෑක් අඬලා මෙහෙම සිංගප්පූරුවේ පාරවල් වල ඉබාගාතේ ඇවිදින්නෑ... මේ ජීවිතේ මට ආයේ ලැබෙනවනම් මං ඕන දෙයක් කරන්න කැමතියි... ඒත් හාමි හැරෙන්නෑ..."

"උ..ඹ..ට ඔ..හොම කළානේ..."





"මං.. මං.. ම..ගේ දු..වෙක් වගේ ඒකිව බලාගත්තේ අයියේ... දුවෙක් වගේ... මං නැව්වා... කැව්වා පෙව්වා... වැඩක් නෑ..."

කොල්ලා දැන් ඉන්නේ තීරණයක් ගෙන තම් කළ යුත්තේ උඹට ජීවිතය යළි ගොඩනගා ගන්නට උදව් කිරීම නොවේද...

"අ..යියේ..."

"කියපන් මල්ලී... මං මොනාද කරත්තෝන..."

"මං ඉක්මනටම ලංකාවට එනවා..."

ඒත් ඔහු එන්නේ කොහොමද... පුංචි දුවෙකුත් සමඟ තරුණ තාත්තා කෙනෙක් තනිවම කොහොම ජීවිතය පටන් ගන්නද...

"මං උ..ඹ වෙනුවෙන් ඕන දෙයක් කරන්නම් මල්ලී..."

"මං දන්නව අයියේ... මට ලංකාව කිව්වාම මතක් වෙන්නේ අක්කවයි අයියවයි..."

"උඹට තනියම දුවත් එක්ක බෑ... කොහොමද පුංචි දුවෙක්ව බලාගත්තේ..."

"දන්නවා අයියේ..."

"ම..ට මාසයක් දෙකක් තිබ්බොත් ඇති අයියේ..."

"මට තේරෙනවා... මං මොනවා හරි හිතන්නම්..."

"ම..ට අ..යියේ ටි..ක..කට පිහිට වෙ..න්..න..."

මධුවන්තට යළිත් ඇඬුණි. ඒ කඳුළු ප්‍රියමන්තගේ ඇස්වලද විය.

"ම..ට දෙන්න ප්‍රියා..."

"අක්ක ඉල්ලනවා..."

ප්‍රියමන්ත දුරකථනය නිම්මිට දුන්නේය.

"ම..ල්ලී... කරදර වලින් වැටෙන්නෙපා මල්ලී..."



Elegantbooks.com

"වැට්ලා බෑනේ අක්කේ... මං වැටුණොත් මගේ කෙල්ලට මොනවා වෙයිද..."

"ඔයාට කවද හරි හරියයි... බයවෙන්නෙපා... ඔයා තනිවෙලා නෑනේ... අපි ඉන්නවනේ..."

"ම..ට අම්මයි තා..ත්තයි වගේ ඔය දෙන්නා විතරයි ඉන්නේ..."

"ඔයා එන්න මල්ලී... දුවාවයි ඔයාවයි මං බලාගන්නවා... මං බලාගන්නවා..."

නිම්මි කිවේ අඬමින් මෙනි.

"මට එනවා ඇරෙන්න වෙන විසඳුමක් නෑ අක්කේ..."

"මං අයියත් එක්ක කතා කරලා පිළිවෙලක් කරන්නම්... ඒක හිතන්නෙපා... ඔයාව අපි තනි කරන්නෑ..."

"ඔයාට පිං සුදු අක්කේ..."

මධුවන්ත හඬමින් කීවේය.

"එක ගෑණියෙක්ට ඔයාව එපා උනාට ඔයා වගේ රත්තරන් කොල්ලෙක්ට ආදරේ කරන ඕන තරම් කෙල්ලෝ ඉන්නවා..."

"මට කවුරුවත් එපා අක්කේ... මට මගේ දුව ඉන්නවා..."

"බුදු සරණයි... මං අයියා එක්ක කතා කරලා ගන්නම් ඔයාට... හිත කලබල කරගත්නෙපා... ධෛර්යෙන් ජීවිතේට මූණ දෙන්න... ඔයා ලංකාවට එන්නකෝ... ගොඩාක් දේවල් වෙනස් වෙයි... ඔය රටවල් සාංකාවෙන් ඉන්නකොට දුකත් වැඩියි..."

"තියන්නම් අක්කේ... ඔය දෙන්නට කතා කළාට පස්සේ මගේ හිතට ලොකු නිවනක් දැනෙනවා..."

"බුදු සරණයි... මේ දවස් ටිකේ පරිස්සමින් ඉන්න... ඔයාගේ





ලොකු ග්‍රහයෙක් මාරු වෙන්න යන්නේ..."

"බුදු සරණයි අක්කේ..."

මධුවන්ත දුරකථනය ක්‍රියා විරහිත කර එය සිප ගත්තේය. අයියාත් අක්කාත් ගැන පෙර ඇති නොවූ තරම් සෙනෙහසක් ඔහුට දැනුණි.

Elegantt alks.com

# 03

ප්‍රියමන්ත කාමරයට ආවේ ඇස් පිසදමමිනි. නිම්මිගේ නම් ඇස්වල එහෙමම කඳුළු තිබුණි.

"බැල්ලි කොල්ලව විනාශ කරලා... ඒකිට නම් හොඳක් වෙන්නෑ..."

"තීරණයක් ගත්ත එක හොඳයි... ගිය ගෑණියෙක් ආයේ එන්නෑ..." නිම්මි කීවාය.

"දරුවෙකුත් ඉන්න ගෑණි... පව් කොල්ලා දුවව හදන්නේ..."

"ඉවසන්න බැරිම තැන වෙන්න ඇති තීරණයක් ගන්න





ඇත්තේ..."

"උෆ පව්.. පොඩි කාලේ ඉඳලා අහිංසකයා..."

"බ..ල..න්..න..වත් අපි ළඟ උන්නෑනේ ප්‍රියා..."

"උෆ වගේ කොල්ලෙක්ට එහෙම කරන්න හිතන්නවත් බෑ... මේකා බැඳලා කියලා... මං දන්නවා අඬ අඬා කියන්න ඇති..."

"එහෙමත් කරලා උණු වෙච්ච නැති ගෑණියෙක්ගේ පපුවේ ආදරයක් නෑ... ආදරයක් තියෙනවනම් පිව්වෙනවා..."

"පිව්වෙන්න ඒ ගෑණිට පපුවක් නෑ බබා... දැන් පොඩි දුවෙක්ව කොහොම උෆ තනියම හදන්නද..."

"ඇයි ප්‍රියා එහෙම කියන්නේ... අපි ඉන්නේ... අපෙත් කෙල්ලනේ... අපිටත් බබාලා නැති එකේ මං බලන්නම්..."

ප්‍රියමන්ත දිග සුසුමක් හෙළුවේය.

"ඇයි ප්‍රියා..."

"ඒකට යන්න එන්න තැනක් නෑ... ඒ කියලා කොහොමද ඒකට මෙහේ එන්න කියන්නේ... මේ ම..ගේ..."

තම සැමියා කියන්නට ගියේ කුමක්ද කියා නිම්මි දැන උන්නාය. ඔහු කියන්නට ගියේ "මේ මගේ තැනක් නෙමේ" කියාය. ඇත්තය. මේ ඔහුගේ ගේ නොවේ.

"ප්‍රියා... ඇයි එහෙම හිතන්නේ..."

"ඇත්ත ඒකනේ බබා..."

"මං තාත්තලා එක්ක කතා කරන්නද... මේ සාගරේ වගේ ගෙදර අනේ මල්ලිව නවත්ත ගන්න බැරිද..."

"එහෙම නැත්නම් ගෙයක් රෙන්ට් එකට හරි ගමු... අපි මල්ලිත් එක්ක ඉමු..."

ප්‍රියමන්ත තම බිරිඳ දෙසම බලා උන්නේය.

"ඒ ඔයාගේ මල්ලි මහත්තයෝ... ඔයාට ඉන්නේ එච්චරයි... මම මගේ නංගි වෙනුවෙන් එහෙම පරිත්‍යාගයක් කරන්න උනොත් මං කරනවා... මේ ගෙවල් දොරවල් මොකටද... අපිට ඉන්න උත් අපේ ඇස් ඉස්සරහ නැතිවෙලා..."

ප්‍රියමන්ත තම බිරිඳගේ මේ උතුම් ගතිගුණවලට පුදුමාකාර ලෙස ආදරය කළේය. හැම බිරිඳක්ම එහෙම පරිත්‍යාග කරන්නේ නැත.

"මං.. ම..ල්ලි එක්ක කතා කරලා බලන්නම්..."

"ඒ අහිංසකයට තව ප්‍රශ්න දාන්නෙපා... දුවවත් අරන් එන්න කියන්න..."

"අපි බබා..."

"තීරණ දෙකයි ප්‍රියා තියෙන්නේ එක්කෝ ගෙයක් රෙන්ට් කරමු... මල්ලි එක්ක ඉන්න... නැත්නම් මල්ලිට මෙහාට එක්කං එමු... මල්ලි ගැන විතරක් නෙමේ අර පුංචි දුව ගැනත් හිතන්න... පව්... ඒකි මොනාද දන්නේ..."

ප්‍රියමන්ත නිම්මි දෙස බැලුවේය.

"පුළුවන් නම් ගෙයක් බලමු..."

"ඊට කලින් මම අම්මගෙනුයි තාත්තගෙනුයි අහන්නම්..."

"ඇත්තම කියන්න... බොරුවක් කරන්නෙපා..."

"මු..තු..ගෙ..නු..ත් අහන්න වෙයි නේ..ද බබා..."

"ඒකි මොනා කියන්නද..."





"ටිකක් පිළිවෙලක් වෙනකල් අපිට මල්ලිට උදව් කරන්න වෙයි... ඒක මගේ යුතුකම..."

"ඒක මගෙත් යුතුකම... ඔයාගේ මගේ කියලා නෑ... ඒකා අපේ මල්ලී..."

ප්‍රියමන්තට දුක තමාගේ කියා ගෙයක් නැතිවීමය. ගෙයක් හදන්නට ඉඩමක් ගන්නට යද්දීත් නිම්මිගේ පියා එපා යැයි කීවේය. ඔවුන්ට පිටකෝට්ටේ තවත් ගෙයක් ඇත...

"අපෙන් වෙන් වෙන්න ඕන නම් කියන්න මම පිටකෝට්ටේ ගේ අස්කරලා දෙන්නම්... ඒකේ ඉන්න කට්ටියට යන්න කියන්න පුළුවන්..."

ප්‍රියමන්ත ඉන් පසු ඉඩම් ගෙවල් ගැන කතා කළේ නැත. දුවලා දෙන්නා පිට ඉන්නවාට දෙන්නාම කැමති නැත. එහෙත් ගෙයක් තිබුනානම් හොඳයැයි සිතෙන්නේ මේ වැනි ප්‍රශ්න එද්දීය.

අයියාත් අක්කාත් සමඟ කතා කළ පසු හදවතට පුදුමාකාර නිවනක් දැනුණායැයි මධුවන්තට සිතුණි. ඔවුන් දෙදෙනාව ඔහුට පෙනුණේ බුදුවරුන් දෙදෙනකු මෙනි. අයියාට නම් ලැබී ඇත්තේ ලෝකයේ පිරිමියෙකුට ලැබෙන්නට හැකි උතුම්ම බිරිඳක් යැයි මධුවන්තට සිතුණි. එහෙත් ඒ අයියාගේම මල්ලීට ලැබුණේ ලෝකයේ ඉන්නා පහත්ම ගැහැණියය. පුදුම ඒකය.

මධුවන්ත තවමත් ඉන්නේ වීලොක් ජ්ලේස් හි කෝපි හලේය. ඔහු හිතේ ඇතිවූ අලුත් සැනසීම සමරන්නට මෙන් තවත් කෝපි එකක් ගෙන්නා ගත්තේය. පෙර බිවූ කෝපි එකට වඩා දැන් බොන කෝපි එක රසයැයි මධුවන්තට සිතුණි.

දවස් දෙකටම ඔහුගේ බඩට වැටී ඇත්තේ මේ කෝපි උගුරු කිහිපය පමණි. අමුතු බඩගින්නක් මධුවන්තට. නැත.

අයියාත් නිම්මි අක්කාත් තමාට පිහිට වන බව මධුවන්ත දනී. ඔවුන් දෙදෙනා ඉන්නේ නිම්මිගේ මහ ගෙදරය. ඒ ගෙදර සිටිද්දී



Elegant talks.com

ඔවුන් නමාට සිහිට වන්නේ කෙසේදැයි මධුවන්තට සිතාගත නොහැක.

ලංකාවට ගොස් මාස දෙක තුනක් ඉන්නට ලැබුණහොත් ඇතිය. ඉන්පසු මේ ජීවන සටනට කෙසේ හෝ මුහුණ දෙන්නට මඟක් පාදා ගත හැක. එය අමාරු බව මධුවන්තද නොදන්නවා නොවේ. දුවේ දුවෙක් සමඟ නාන්නෙකුට තනිවම ජීවත් වීම අමාරුය. "දුවාවදී ඔයාවයි මං බලාගන්නවා... මං බලාගන්නවා..." නිම්මි අක්කාගේ වචන මධුවන්තගේ සිත තුළ දෝංකාර දෙයි. මේ ජීවිතයේ ඇයට කියා කිසි යුතුකමක් නමා අතින් සිදු වී නැත. මධුවන්ත කර ඇති එකම දේ තුන් හතර වතාවක්ම සිංගප්පූරුවෙන් අයියාටත් අක්කාටත් ඇදුම් පැළඳුම් ගෙන ඔහු සේවය කරන කාගෝ ආයතනය මාර්ගයෙන්ම ඇරීමය.

යුතුකම් යනු ඒවා නොවන බව මධුවන්තද දනී. එහෙත් අදූ අයියාත් අක්කාත් කතා කළේ කොතරම් ආදරයකින්ද... සෙනෙහසකින්ද... තමන්ගේ කියනා අය වටින්නේ ජීවිතය මෙසේ කඩා වැටී ඇති විටය.

ලංකාවට යනවා නම් දුවාට තව ඇඳුම් ටිකක් ගත යුතුය. ඊට අවශ්‍ය කළමණා නම් මධුවන්ත වරින් වර එක් රැස් කර තිබුණි. ඔහුට ලැබෙන වැටුපෙන් ඔහු ඔහුට කියා කිසිවක් ගත්තේ නැත. ඉදහිටවත් දවසක භාම්ඕ කියක් හෝ ඉල්ලනැයි කියා මධුවන්ත බලා උන්නේය. එහෙත් ඇය ළඟ සිංගප්පූරු ඩොලර් තුන් හාර දහසක් සෑම වෙලාවකම තිබුණි.

මධුවන්ත එය ඇක්කේ භාම්ඕගේ අල්මාරිය ඇරි මොහොතය. ඔහු ඇක්කත් ඒ මුදල් පමණක් නොවේ. ඒ ලාච්චුවේ ඇය පාවිච්චි කරන උපත් පාලන පෙති පැකට් කිහිපයක්ද තිබුණි. තමා සමඟ වසුරෑමින් වත් එක් නොවුණු භාම්ඕ උපත් පාලන පෙති ගන්නේ ඇයිදැයි මධුවන්ත දැන උන්නේය.

මේ ජීවිතයේ එවැනි අමිහිරි දසුන් අනන්තවත් මධුවන්ත දැක ඇත. අද සිරුරයෙක් ගත්තේ ඒ සියළු අමිහිරි හිරිකිත දේ දරාගත් අසරණ පදුවෙනි.





මධුවන්ත කෝපි හලෙන් නැගිට ගොස් ටැක්සි රථයකට ගොඩ විය. ඔහු තමාව බූගී ජන්ෂන් එකෙන් දමන්නට යැයි ටැක්සි රියදුරාට කිවේය. බූගී ජන්ෂන් යනු සිංගප්පූරුවේ ජනප්‍රියම ඇඳුම් සාප්පු ඇති ප්‍රදේශයයි. ඔහු මේ බූගී ජන්ෂන් වෙත යන්නේ ඔහුට ඇඳුම් ගන්නට නොවේ. තව ටික දිනකින් තමා සමඟ ලංකාවට යන දුවට ඇඳුම් ටිකක් ගන්නටය. නොවේනම් අද දවස ගත කරන්නට වෙන ක්‍රමයක් නොවූ නිසාය.

බූගී ජන්ෂන් එක ළඟින් බසිද්දී මධුවන්තට හිල්ලින. ජීවිතයේ ලස්සන දවස් වල මේ සාප්පු අතර ගෙවී ගිය සැන්දෑවන් ඔහුට සිහි විය.

"හැමදාම මටනේ ගන්නේ... අද බබාට ෂර්ට් එකක් ගමු... ම්.. ටී ෂර්ට් එකකුත් ගමු..."

එදා උන්නේ ඒ භාම්ඕදැයි ඔහු සිතුවේය.

"ඕනවට වඩා ලස්සන ඇඳුම් අන්දවන්නත් බයයි... අන්තිමට මට අඬ අඬා සිංගප්පු එයාර් පෝට් එකෙන් ලංකාවට යන්න වෙයි..."

එදා එහෙම කීවේ භාම්ය. අද සිදුව ඇත්තේ ඒකේ අනිත් පැත්තය.

"නේ..ද..."

කතා නොකර ඉඳිද්දී ඇය බඩට ඇණ කතා කරයි.

"එහෙම වෙයි කියලා හිතනවද..."

"හි..ත..න්..නෙ..වත් නෑ... වෙලාවකට බයයි..."

"ඇයි..."

"අ..ර.. නෑ එක්කෝ ඕන නෑ..."

"මොකක්ද මොකක්ද... කියන්න..."

"නෑ.. අර.. අයියගේ වෙඩින් ෆොටෝස් පෙන්නුවේ..."

"ඔ..ව්..."

"නෑ... ඒවල හරි ලස්සනයි..."

"නෑ.. බබා... කියන්න ගියේ ඒක නෙමේ..."

"ඒ..ක ත..මයි..."

"ඇත්ත කියපන්... නැත්නම් මං නවතිනවා..."

එදා මේ කොහේ හෝ බංකුවක ඉඳගෙන තමා කියූ අයුරු මධුවන්තට මතකය.

"නෑ මේ.. ඒකේ ඉන්නේ අයියගේ බෙස්ට්මන්ටනේ..."

"ඔ..ව්.. බෙස්ට්මන්ට තමා..."

"එ..ත..කො..ට මේ.. අයියගේ වයිෆ්ගේ බ්‍රයිඩ්ස් මේඩ්ට හිටියේ..."

"මු..තු නංගි..."

"හොඳට මතකයි නේ..ද... මොකද ඒ නම මතක් කරද්දී නිකං අමුතු හිනාවක් ගියේ..."

"ම..ට..."

"නැතුව මටයැ... එයා ම..ට ව..ඩා ලස්සනද..."

"මුතු නංගිද..."

"මං දන්න මුතුවෙක් නෑ... මං කියන්නේ අර හිටපු හෝන්තුව ගැන..."

"ලෑ..ස..තයි..."

එදා ඒ මූණ අමුතු වූ හැටි මධුවන්ත දැක්කේය. ඔහු ඒ ආදර තෝක්කාඩුවට ආසා කළේය.

"එ..යා ක..තා..ත් කරනවද..."





"ම..ට..."

"මි..."

"නෑ..."

"ඔය බොරු කියන්නේ... අර අයියලට යවපු ඇඳුම් ගොඩේ මං දැක්කා ලස්සන ඩ්‍රෙස් එකකුත් තිබ්බා... ඒ එයාටද..."

"නිම්මි අක්කට බබා..."

"ෂුව..."

"ෂුව... ප්‍රොමිස්..."

"මං හිතුවා හොඳ ෆ්‍රෙන්ඩ්ෂිප් එකක් ඇති කියලා... එයා එක්ක..."

"එ..හෙම නෑ... මුතු මාත් එක්ක කතා කරලා තියෙන්නෙත් වචන දෙක තුනයි..."

ඒ තරම් ආදර ඊර්ෂ්‍යාවකින් තමා ගැන ලෝබකමකින් උන් භාෂි මෙහෙම කරාවි යැයි මධුවන්ත කවදාවත් සිතුවේ නැත. ගියවර තමාගේ උපන් දිනය ඇයට මතක වත් තිබ්බේ නැත. එහෙත් ඇය කුමාර්ගේ උපන් දින සාදයට ගියේ මොණරියක් මෙන් හැඩ වීය.

"මං හවස දුවාවත් අරන් ලංකාරාමයට යනවා භාෂි..."

මධුවන්ත ගිය වසරේ ඔහුගේ උපන් දිනය දා හැන්දෑවේ කිවේය. එහෙම කියූ පසුවවත් ඇයට තමාගේ උපන් දිනය මතක් වේවි යැයි ඔහු සිතුවේය.

"හොං..දයි..."

ඇය කීවේ එපමණකි.

"පුජ්වන් නම් ගිහින් මලක් පූජ කරලා එමු..."

සිංගප්පූරුවේ වෙසෙන ශ්‍රී ලාංකිකයන්ට මලක් පූජා කරන්නට



Elegantbooks.com

ඇති එකම තැන සෙරන්ගුන් වීදියේ පිහිටි ශ්‍රී ලංකාරාම විහාරයයි. මධුවන්ත මේ ප්‍රශ්න එක පිට එද්දී නිතර නිතර ඒ පන්සලට ගියේය.

"හදිස්සියේ පන්සල් දුවන්නේ මොකටද..."

"හදිස්සියක් නෑ හාෂි... අ..ද ම..ගේ බ..ර්ත් ඩේ එ..ක..."

එදා මධුවන්තගේ හඬ බිඳිණි. හාෂිණී කුමක් වත් කියන්නට පෙර මධුවන්ත නිවසින් පිට විය. ඇය කළ එකම දේ ඔහුගේ ජංගම දුරකථනයට "හැපි බර්ත් ඩේ" කියා කෙටි පණිවිඩයක් එවීම පමණි.

ආදරයේ ලස්සනම දවස් නදවතේ තබාගෙන ඒවා සමරන ලොව උතුම් ආදරවන්තයන් සිටිද්දී මධුවන්ත මේ තමාගේ ලැබීම යැයි සිතා හිත හදාගත්තේය.

එහෙත් බිඳුණු රිදුන හිතක් එහෙම වාවාගෙන සිටිය හැකි කාලයක්ද ඇත. අවසානයට සියල්ල පුපුරා යයි. අද උදාවී ඇත්තේ ඒ දිනයය.

මධුවන්ත කෙල්ලට ඇඳුම් ටිකක් ගත්තේය. ඔහු අද ගැන පමණක් නොව තව මාස තුන හතරක් වසරක් පමණ ලොකුවන දුව ගැනද සිතා ඇඳුම් ගත්තේය. හෙට හවස් යාමයේ දුවවද එක්කාගෙන සිංගප්පූරුවේ කොහේ හෝ යා යුතු යැයි මධුවන්ත සිතා ගත්තේය.

මේ ගෙවෙන්නේ සිංගප්පූරුවේ ගෙවෙන අවසන් දවස් කිහිපය බව මධුවන්ත දනී. ආයේ මේ රටට කවදා වත් එන්නේ නැත. එන්නේම නැත. මේ රට තමාට දුන් දේට වඩා දේවල් තමාගෙන් උදුරා ගත්තේය. එහෙම වූ පසු මිනිහෙක්ට ඒ මුළු ලෝකයම එපා වෙයි. මධුවන්තට අද සිදුව ඇත්තේ එයයි.

මධුවන්තගේ ජංගම දුරකථනයට ඇමතුමක් ආවේ ඔහු බූගී ජන්ෂන් සාප්පු අතරින් පිටතට එද්දීය. අංකය හාෂිණිගේය.

"ඇ..යි හාෂි..."

මධුවන්ත කතා කළේ ඉක්මනිනි. දෙවය වැරදිලාවත් ඇගේ හිත වෙනස් කරලා නම් කියා ඔහු සිතුවේය.





"මේ දුව අඬනවා තාත්ති ඔන කියලා... මට නලවන්න බැහැ..."

මධුවන්තට හිල්ලින. මේ කතා කරන්නේ අම්මා කෙනෙකි. අම්මා කෙනෙකුට දුවෙක්ව නලවා ගන්නට බැරිද...

"මං එන්නම්..."

මධුවන්ත කීවේය. තව මොනවා හෝ කියාවි යැයි මධුවන්ත අසා උන්නේය. එහෙත් ඇය දුරකථනය විසන්ධි කළාය. යළිත් ඔහුට දිග සුසුමක් පිට විය.

# 04

**නිම්මි** මුතුගේ කාමරයට යද්දී ඇය උන්නේ ඇගේ අල්මාරිය අස් කරමිනි.

"මොකද වූට් අද අල්මාරිය අස් කරන්න හිතුනේ..."

නිම්මි හැඳ මත ඉඳගත්තේත් එසේ අසමිනි. කෙල්ල දැන් ඉස්සරටත් වඩා හැඩය. ඇය තමාට පිටුපා උන් කෙල්ලගේ ලස්සන ඉඟ දෙස බලමින් සිතුවාය.

"නිකං අනේ... කම්මැලියි..."

"ඇයි මේ ඇඳුම් ටික අයින් කරලා..."

"හිරයි.."





"ඔයාගේ මේවා ලොකු වෙලා... ඒකයි හිර..."

මුතු මොනවදෝ කියන්නට ගොස් යළිත් තොල් පට තද කරගත්තාය.

"මොනාද උඹ කියන්න ගියේ..."

"මු..කු..ත් නෑ... මගේ ඒවා තිබ්බ ගානට තමා... ඔයාගේ තමා ලොකු වෙලා තියෙන්නේ..."

නිම්මි සිනාසුණාය.

"එහෙනම් මේ ඇඳුම් හිර උනේ කොහොමද..."

"හිරමත් නෙමේ..."

"ගියපාර මධුවන්ත මල්ලී මට එවපු බිලවුස් දෙකක් තියෙනවා... මං ඇන්දෙම නෑ... හරි ලස්සනයි... මං ඒ දෙක ඔයාට දෙන්නම්... අලුත්ම ඩිසයින්... ඔයාට ලස්සනට තියෙයි..."

"අ..නේ මට එපා..."

මුතු ගත් කටටම කීවාය.

"ඇයි ඒ..."

"මට මොකටද එයා එවපු ඒවා... ඇඳුම් නැතුවයැ..."

"පව් නංගී... ඒකා අහිංසකයා... මට නම් මධුවන්ත ගැන හරි දුකයි..."

මුතු කතා කළේ නැත.

"ආවෙත් ඔයාගෙන් ඒ ගැන දෙයක් අහන්න තමා..."

"එ..යා ගැ..න... මගෙන් මොනාද..."

"මල්ලි ඉන්නේ ලොකු කරදරේක..."



Freeanks.com

"ඉතින් සිංගප්පූරුවේ ඉන්න එයාගේ කරදරවලට ඔයා මේකය අඩන්නෝනෑ.. ඔයා අයියව බැන්දා කියාල ඒ කරදර ගැන මොකුත් හොයනවද..."

නංගි එහෙම හිතන්නේ ඇයිදැයි නිම්මිට සිතාගත හැකිය.

"දැන් ඔබා ඔයා අයියගේ කවුද..."

"නැහා..."

"ඔයාගේ ජීවිතේ කරදරයක් ආවාම අයියා බලන්නෝන නැද්ද.. ඔයාට අපහිප උනාම මට වඩා බලන්නේ අයියනේ... මන්ද..."

"ඒ අයියයි මායි නේ.. අපි දෙන්නා වෙනස්..."

"මොකක්ද වෙනස... ඔයයි අයියයි නෑනයි මස්සිනයි... මයි මදුවන්නයිත් නැනයි මස්සිනයි..."

දිදී කතා කරේ නැත.

"එහෙනම් ඉතින් ඔයා සිංගප්පූරුවට ගිහින් මස්සිනා ගැන බලන්න... මොකද එයා මෙහේ ඉන්න කෙනෙක් නෙමේනේ..."

"එයාට මෙහෙට එන්න වෙ..ලා නැති..."

"ආ... ඒකයි එහෙනම් මේ නෑදෑකම් මතක් වෙලා තියෙන්නේ.. උදේ කතා කරනකොට මට හිතුණා..."

"අයියගේ කියන්න අපට ඉන්නේ එච්චරයි නංගි..."

"සුබ ඉතින් එයා ඉන්නේ ඇඟිලිපිටියේ නෙමේනේ.. සිංගප්පූරුවෙනේ... ඉතින් ඉහළයි..."

නිම්මි නංගි සමඟ වාද කරන්නට ගියේ නැත. කෙල්ල කියනා දේවල් ගැන ඇයට අභිතක්ද නැත.

"කොහේ හිටියත් ඒකා මනුස්සකම් දන්නා අහිංසක කොල්ලේ





නංගී... මං ඒක දන්නවා..."

"ප්‍රියා අයියා එහෙම වුණා කියලා එයාගේ මල්ලිත් එහෙමයි කියලා හිතන්නෙපා... උපන් රටත් අම්මක කරලා දාපු අයගේ මොන මනුස්සකමද..."

"එහෙම කියන්නෙපා වූටි... මිනිස්සු අසරණ වුණාම උපන් රටවල් දාල යන්න වෙනවා... අම්මෙක් තාත්තෙක් නැතුව අනාථ වෙච්ච දෙන්නා... මොනවා උනත් අපේ හරි හැදෙයි..."

"අපට නෙමේ... ඔයාටයි අයියටයි..."

කෙල්ල නපුරු යැයි නිම්මිට සිතුණි.

"මං ආවේ ඔයාගෙන් දෙයක් අහන්න..."

"මේ..."

"මල්ලි එහෙදී මැරි කරලනේ හිටියේ..."

"මං ඔය කතාව දන්නවා... අයියා මට දවසක් කිව්වා... ඒ දෙන්නා අතර ප්‍රශ්න..."

"ඔව් පුංචි දුවෙකුත් ඇත් ඉන්නවා... අවුරුදු එකහමාරයි..."

"ඉතින් ඇත් ඔයා හදන්නේ මෙහේ ඉඳගෙන එයාගේ පවුලේ ප්‍රශ්න විසඳන්නද..."

"නෑ වූටි... එතන විසඳන්න පුළුවන් ප්‍රශ්නයක් නෙමේ තියෙන්නේ... ඒ දෙන්නා වෙත්වෙන්න යන්නේ..."

"මේ..."

මුතු නිම්මි දෙස බලා උන්නාය.

"මල්ලී ඉන්නේ ගොඩාක් අසරණ වෙලා... පිරිමියෙක් එහෙම අසරණ උනාම හරි පව්... ඇරත් දරුවෙක් එක්ක... ගොඩාක් දවසක



Elegantlk.com

ඉඳලා දුක් විඳින්නේ... ඒත් ඒකා අපට කිව්වේ නෑ..."

"ඉතින්..."

"මිනිහෙක්ට උනත් දරාගන්න පුළුවන් ප්‍රමාණයක් තියෙනවනේ... ඒ කෙල්ලව හදාගත්තම බෑ..."

"මෙයාගෙත් මොනාහරි වැරදි ඇති..."

"නෑ බබා... එහෙම කියන්නෙපා... ඒකා එහෙම කෙනෙක් නෙමේ... එහෙම කෙනෙක් නම් අර දුවවත් හදාගෙන ජීවිතේ තනියමම ගත කරන්න හිතන්නෑ.:."

මුතු කතා කළේ නැත.

"ඉතින් මොනාද ඔයාට මගෙන් අහන්න තියෙන්නේ... මං මේ පැත්තක ඉන්න කෙනානේ..."

"නෑ බබා... මධුවන්ත අයියා අපෙන් ලොකු උදව්වක් ඉල්ලුවා..."

"උ..ද..ව්..වක්..."

"ඔව්.. පිහිටක්..."

"ඒ මොකක්ද... ඒ ප්‍රශ්නවලට ඔයාලට කරන්න පුළුවන් මොනාද..."

නිම්මි මොහොතක් මුතු දෙස බලා උන්නාය.

"මල්ලී තීරණයක් අරන් ඉන්නේ... දුවවත් අරන් ලංකාවට එන්න..."

මුතු මවා ගත්තාය. එවැන්නක් සිදු විය හැකිද...

"ම... ඉ..තින්..."

"කොල්ලට එකපාර ජීවිතේ පටන් ගන්න අමාරු වෙයි... දුක් විඳල විඳලා තෙහෙට්ටු වෙලා එන්නේ... ඇරත් තාත්තා කෙනෙක්





කොහොමද එකපාර දුවෙක්ව තනියම හදා ගන්නේ..."

"හරි අක්කේ ඉතින් ඔයා මොනාද කරන්න යන්නේ..."

"නෑ බබා... මාස.. දෙක තුනකට හ..රි අයියටයි මටයි මධුවන්ත මල්ලි වෙනුවෙන් දෙයක් කරන්න වෙනවා... ඒ අයියට ඉන්න එකම මල්ලි... එච්චරමයි ඉන්නේ... කවදහරි මගේ දරුවෙක්ට පුංචි කියන්න ඉන්නේ ඔයා විතරයි... ඒ වගේ තමා බාප්පා කියන්න ඉන්නේ මධුවන්ත විතරයි..."

අක්කා මොනවා කියන්නට යනවාදැයි මුතුට සිතාගත නොහැක.

"ඒකා කටින් ඉල්ලන්නෑ... ඒත් අපෙන් උදව්වක් ඉල්ලන්නේ... ඒ තරම්ම අසරණ නිසා..."

"ම්..."

"එයා ජීවිතේ පිළිවෙලක් කරගන්න කල් මායි අයියයි එයා ළඟ ඉන්න ඕන... එ..ක්කෝ අපි දෙන්නා මල්ලියි දුවයි ඉන්න තැනකට යන්නෝන... ගෙයක් රෙන්ට් කරලා හ..රි..."

"ඔ..ය දෙන්නා මෙහෙන් යන්න... ඔයාට පිස්සුද... මේ සිංගප්පූරුවේ ඉඳලා එන අයගේ තනි රකින්න ඔයා අපිව තනි කරනවද..."

"එ..හෙම කරනවට නෙමේ බබා... ඒත් ජීවිතයක්... එකක් නෙමේ දෙකක්..."

නිම්මි කීවේ තරමක තදිනි. මුතුගේ දෙතෙත් පවා කඳුළින් තෙමුණි.

"සොරි චූටි... මා..ව තේරුම් ගන්න... ඒ මගේ මහත්තයගේ මල්ලී... ඔයා හිතනවද මල්ලි දුක් විඳිද්දී අයියා මෙහේ සැනසීමෙන් බත් කටක් කයි කියලා... එහෙම කරන සිරිතක් ලෝකේ නෑ... ලේ



Freeganta.com

බැඳීම් කියන්නේ ඒවට නෙමේ... උඹට එහෙම දුකක් උනොත් මං අයියා සතුටින් ඉන්නවද... නැනේ..."

"ඒ..ත් ඔ..යාල ය..න්..න ගියාම..."

"මං යන්න හිතුවේ නෑ... වෙන විසඳුමකුත් තියෙනවා..."

"මේක මහ විශාල ගෙයක්... එහා පැත්තේ වෙනමම ඇනෙක්ස් එකකුත් තියෙනවා... මං.. අ..ද අම්මගෙනුයි තා..ත්තගෙනුයි අහන්න ඉන්නේ... ඊට කලින් ඔයාගෙන් අහන්නේ..."

"මො..ක..ක්..ද..."

"මාස හ..ත අටකට ම..ම මධුවන්ත මල්ලිවයි දුවවයි මෙහේ නවත්ත ගත්තට කමක් නැද්ද..."

මුතුගේ දෑස් බිමටම බරවිය... කියන්නේ මොනවාදැයි ඇයට සිතාගන්නට නොහැකි විය.

"ඔ..යා කැමති නැත්නම් මං අම්මගෙනුයි තාත්තගෙනුයි අහන්නෑ... අයියත් කිව්වා මුතුගෙන් වේලාසන අහන්න කියලා..."

"මං.. මං.. මො..නා කියන්න..ද... එක දෙයයි මං කියන්නේ ඔයාලා අපිව දාලා යන්නෙපා... ඉඳලත් මල පාළුයි... ගියාම කොහොම තියෙයිද... තාත්තා බිස්නස්... අම්මා පිංකම්... මං මේ ගෙ..දර තනිවෙයි..."

නිම්මි මුතු ළඟට ගොස් දෑත් එක් කළාය.

"මං ඔ..යාට වැඳලා කියන්නම්... ම..ට මේ උදව්ව කරන්න බ..බා... වෙන කා ගැනවත් නෙමේ මං ගැන හිතලා... ම..ට අ..ර දරුවව බලාගන්න ඕ..න.. මල්ලිට පිහිට වෙන්නෝන..."

"ඔ..යා.. මේ මො..ක..ද අක්කේ... ඇ..යි ම..ගෙ..න් මෙහෙම අහන්නේ... ගහනවා මම... මං කිව්වනේ... කවුරු ආවත් මට කමක් නෑ... ඔයාලා යන්නෙපා..."





"මං එළියෙන් තියෙන ඇනෙක්ස් එක මල්ලිට දෙන්නද කියලා අහන්නේ... ටික කාලෙකට..."

"ඉතින් තාත්තගෙන් අහන්න... මට කමක් නෑ... එයා මට සම්බන්ධ කෙනෙක් නෙමේනේ... ඔයයි අයියයි විතරයි මට ඉන්නේ... ඊට එහා කවුරු උනත් මට පිට කෙනෙක්... එච්චරයි..."

නිම්මිගේ හිතට නිවනක් දැනුණි. මෙහෙම කියාවත් ඇය කැමති වූ එක ඇතිය.

"ටික කා..ලෙකට විතරයි... ම..ල්ලි ඊට පස්සේ පිළිවෙලක් වෙයි..."

"ඒක අපට වැඩක් නැනේ... මිනිස්සු එයාලගේ ජීවිතවල ප්‍රශ්න විසඳගනී... ඔයත් ඔච්චරම හිතන්නෙපා..."

"මේ දේ..ම බ..බා අනිත් පැත්ත වුණානම්... මායි උඹයි දුප්පත් වෙලා මම පෝසත් කොල්ලෙක්ව බැන්දනම්... එදාට උඹට පිහිටක් ඉල්ලන්න වෙන්නේ මගෙන් නේද..."

මුතු බිම බලා ගත්තාය.

"අද ඒ තත්වේ තමා ප්‍රියා අයියා ඉන්නේ... එයා අසරණයි... ම..ට එයා එහෙම අසරණ වෙලා ඉන්නවා බලන් ඉන්න බෑ... සහෝදර කැක්කුම කියන්නේ මොකක්ද කියලා මං හොඳට දන්නවා... ඒ එයාලා නිසා නෙමේ... ඔයා නිසා... කසාද බැඳලා මාස තුනක් යනකල් මට නින්ද ගියේ නෑ... ඒ ඇයි... අවුරුදු විසි දෙකක් මං උඹව තුරුල් කරන් නිදාගත්ත නිසා..."

මුතුගේ ඇස්වලට කඳුළු පිරුණි. ඇය එහෙමම අක්කාව වැළඳගත්තාය. අඬ අඬා වැළඳ ගත්තාය.

# 05

මධුවන්ත අපාට්මන්ට් ගොඩනැඟිල්ල වෙත ආවේ දුවට කවන්නට නූඩ්ල්ස් කප් එකකුත් රැගෙනය. දවසක උදේක කෙල්ලට ඉදුල් කට ගෑවේද මධුවන්තය. එදා ඔහු පුංචි අපාට්මන්ට් නිවසේ කුස්සියට වී පුංචි කිරිබතක් හැදුවේය. කිරි හොදි ටිකක් දමා බත් ලුට්ටක් කවන්නට උණු බත් ටිකක් සමඟ පරිප්පු ටිකක් මාළු ටිකක් කවන්නට මධුවන්ත කැමතිය. එහෙත් ඒවා කෙල්ලට හදා දෙන්නට කෙනෙක් නැත.

මධුවන්ත රෑ ඉඳිද්දී එනෙම දෙයක් හදයි. ඒ දුවට විතරය. ඔහු පරිප්පු ලුට්ටක් හදා බත් කවන දවසට කෙල්ල බත් කටවල් හත අටක්ම කයි. එදාට කෙල්ලගේ බඩට වඩා පිරෙන්නේ මධුවන්තගේ බඩය.





එහෙත් අද එහෙම දෙයක් උයන්නට මධුවන්තගේ හිතට නිවනක් නැත. ඔහු පහළ ෆුඩ් ෂොප් එකෙන් නූඩ්ල්ස් කප් එකක් ගත්තේ ඒකය.

මධුවන්ත යද්දිත් භාෂිණී උන්නේ දිග දුරකතන ඇමතුමකය. මධුවන්ත එයට සවන් දෙන්නට ගියේ නැත. කෙල්ල හාමත් වීම නිදාගෙනය. භාෂිණී උන්නේ ඇඳගෙනමය. ඇය කතා කළේ දුව ඇඬූ නිසාම නොවේ. ඇයට මේ හිර ගෙයින් මිදෙන්නට ඕන නිසාය.

භාෂිණී පමා වන්නේ කතා කරන්නට ඇති නිසා විය යුතුය. භාෂි ඉන්නේ එළියට දුවන්නට බලාගෙනය. මේ ජීවිතයේ අවසානය ගැනවත් නිස්කලංකයේ කතා කරන්නට ඇයට ඕනාකමක් නැත.

"භාෂි දුව කෑවද..."

මධුවන්ත කුඩා සාලයට එබී ඇසුවේය. භාෂිණී උන්නේ සාලයේ දිග වීදුරු කවුළුවෙන් ඈත බලාගෙනය.

"මං බිස්කට් දුන්නා... කෑවේ නෑ..."

මධුවන්තට හිල්ලින. කෙල්ල නිදා ගන්නට ඇත්තේ හාමත් වීය. "ඔහොම නිදාගත්තාවේ... ඇහැරුණාම කවනවා..." මධුවන්ත සිතා ගත්තේය.

"මට පරක්කු වෙනවා... කියන්න තියෙන දෙයක් කියන්න..."

භාෂිණී කීවේය. මධුවන්ත බිත්තියට සිනාසුණේය. "මං කියන්න යන දේ උඹ දන්නවා... ඒකයි උඹට හදිස්සිය..." මධුවන්ත සිතුවේය. මධුවන්ත පැමිණ සාලයේ සැටිය උඩ ඉඳගත්තේය.

"භාෂි ටිකක් ඉඳගන්න..."

"කමක් නෑ ඔහොම කියන්න..."

"උඹට අද බෑ මගේ මූණ දිහා බලන්න..." මධුවන්ත සිතින් කීවේය.

"ජීවිතේ අන්තිම වතාවට අද මං ඔයාගෙන් අහන්නේ භාෂි..."

මධුවන්ත කතා කරන්නට පටන් ගත්තේය.

"එහෙනම් මොනවත් අහන්නෙපා මධුවන්ත... ඔයා ගත්ත තීරණේ කියන්න..."

ඒ හඬ රැදුරුය. මධුවන්තගේ පපුව දැන් අලුතෙන් ඇවිලෙන්නේ නැත. හදවත අළු වී පොඩි වී හමාරය.

"ඔයාට මොනාද කියන්න තියෙනවා කිව්වේ..."

ඔහු ඇසුවේය.

"ඔයාට කියන්න තියෙන දෙයක් කියන්න... මං ඊට පස්සේ කියන්නම්..."

මධුවන්ත සෑහෙන වේලාවක් නිහඬව උන්නේය. ආදරයේ මළගමට පාංශකුලය දීම කොතරම් අමාරුද... කොතරම් දුකද...

"මං තීරණයක් ගත්තා භාෂි..."

"කිය..න්..න..."

"ඔයා ඒක අහල සතුටු වෙයි..."

භාෂිණී කතා කළේ නැත.

"මේ ගමන තව දුර යන්න අපට අමාරුයි භාෂි..."

"මටත් ඒක තමා කියන්න තියෙන්නේ..."

"මොකක්ද කරන්නේ..."

"වෙන්වෙමු..."

මධුවන්තට පුදුම නැත. ඔහුට මුළු ආදර අතීතයම සිහිවිය. ඒ තරම් පහසුවෙන් ඒ වචනය භාෂිණී කියා දැම්මේ කෙසේද...

"පුළුවන්ද..."

ඔහු අමාරුවෙන් ඇසුවේය.





"කෙරෙන දෙයක් ගැන කතා කරන්න මධූ..."

පපුව හිරවූ බවක් මධුවන්තට දැනුණි.

"මං ලංකාවට යනවා... ඒත්..."

"ඇයි..."

"කැමති දවසක එන්න... මං බලන් ඉන්නම්..."

එය පුදුමාකාර දුක්බර ප්‍රකාශයකි. භාෂිණී කතා කළේ නැත.

"දු..ව..."

මධුවන්ත උගුරෙන් මෙන් ඇසුවේය.

"ඔයාගේ දුවනේ... මට කොහොමත් එකතු නෑ..."

"හැමදාම දුවගේ අම්මා ඔයා..."

"මට පුළුවන් විදිහට මං එයාට යුතුකම් කරන්නම්..."

"යුතුකම් ගැන උඹ මොනාද බැල්ලියේ දන්නේ" මධුවන්තට අසන්නට සිතුණේ එයය.

"දන්නෑ කොහොම ජීවිතේ පටන් ගන්නද කියලා... මං ගිහින් කතා කරන්නම්... ඔයා භාෂි..."

"මං තාම මොනවත් හිතල නෑ..."

"දවසක ඔයාට තේරෙයි..."

භාෂිණී කතා කළේ නැත.

"මට ජීවිතයක් නෑ භාෂි... මං දුවව හදාගෙන ඉන්නවා... පුළුවන් දවසක එන්න..."

භාෂිණී යන්නට හැරුණාය.

"ත..ව දෙය..ක් කියන්න තියෙනවා..."

මොකක්ද...

භාෂිණී හැරී ඇසුවාය.

"ම..ගේ ජී..වි..තේට අවුරුදු කුමාරි කරපු දේට ස්තුතියි... ම..ගේ කියන්න ඉතුරු වුණේ අර නිදාගෙන ඉන්න දරුවා විතරයි..."

භාෂිණී කිසිවක් නොකියාම දොර දඩාස් ගා වසාගෙන ගියාය. මධුවන්ත එහෙමම පුටුවේ හාන්සි විය. ඔහුගේ පියවී ගිය දෙනෙත් වලින් කඳුළක් පිට පැන්නේ පුදුමාකාර ලෙසිනි. ඒ කඳුළු පිවිතුරු, අතිශය පිවිතුරු ඔහුගේ ප්‍රථම ආදරය වෙනුවෙන් ගලා ගිය නිර්මල කඳුළකි.

මධුවන්ත සුදු පැන්ටිය පමණක් ඇඳගෙන ඇදේ දෑත් දෙපා විහිදුවාගෙන නිදා ඉන්නා දුව දෙස බලාගෙන ඇඬුවේය.

"ඔ..ය..යි මායි අද ඇත්තටම තනිවුණා පැටියෝ..."

මධුවන්ත ඇඬුවේ දූගේ පුංචි කකුලක් ඉඹගෙනය.

"අපිට අපේ අම්මි නැතිවුණා..."

මධුවන්ත ඇඳේ වැටීගෙන ඇඬුවේය. ඒත් ඒ ඇඬුම බලන්නට අසන්නට කිසිවෙක් මේ සිංගප්පූරුවේ උන්නේ නැත.

* * * * * * * * * * * * * * *

ප්‍රියමන්ත විශාල ගෙදයනේ කොනක සිටගෙන විදුලි පහන් එළියෙන් සුන්දරව දිලෙන විශාල නිවස දෙස බලා උන්නේය. මේ නිවසේ ඔහු නැවතුණේ අබමල් රේණුවක තරම්වත් අහිතකින් නොවේ. එහෙත් ඇතැම් මොහොතක ඔහුගේ සිතට දුකක් නොදැනුණා නොවේ. එවන් දුකක් දැනෙන හැම වතාවකදීම ඔහු නිම්මිට කීවේ ඉඩමක් වත් අරන් දාමු කියායය. නිම්මි ඊට අකමැති වූයේ නැත. "කතා කරන්න.. මං කුලී ගෙදරකට හරි එන්නම්... ඒත





ප්‍රශ්නයක් නෑ... ලෑලි ගෙයක් උනත් මට සැපයි... හැබැයි මගේ මහත්තයා එක්ක..." ගෙවල් ගැන කතා කරන හැම වතාවකදීම නිම්මි කීවාය.

ඒත් අද ප්‍රශ්නය ඊට වඩා බරපතලය. ප්‍රියමන්ත උන්නේ මධුවන්තව නවත්ත ගැනීම ගැන අසන්නට බැරුවය. අනිත් පැත්තෙන් ඔහුට ඉන්නා එකම සහෝදරයා ඔහුය. ඔහුට මේ මොහොතේදී පිහිටක් නැත. අඬ අඬා පිහිටක් ඉල්ලුවේ ඒකය.

"ප්‍රියා..."

නිම්මි ආවේ ප්‍රියමන්තව සොයාගෙනය.

"මං ඔයාව හැමතැනම හොයනවා... ඇයි මෙතන... මොනාද කල්පනා කරන්නේ..."

ප්‍රියමන්ත අසරණ ලෙස සිනාසුණේය.

"මල්ලිගේ ප්‍රශ්නේ ගැනද හිතන්නේ..."

"ම්..."

"මං දවල් චූටිගෙන් ඇහුවා..."

"මොනාද චූටි කියන්නේ..."

"මේ ගෙදරින් යන කතා කියන්නෙපාලු... කවුරු ආවත් එයාට ප්‍රශ්නයක් නැලු..."

ප්‍රියමන්තට සැනසුම් සුසුමක් පිට විය.

"තාත්තගෙනුයි අම්මගෙනුයි අහමු..."

"මොනා කියයිද..."

ප්‍රියමන්ත ඇසුවේ තරමක් චකිතයෙනි.

"එ..හෙම අකමැති වෙන එකක් නෑ..."

"මට කියන්නත් මොකක්ද වගේ බබා..."

"මං අහන්නම්... උදව්වක්නේ ඉල්ලන්නේ..."

"අකමැති උනොත් මං මල්ලිට වෙන පිළිවෙලක් හදල
දෙන්නම්... මේ ළඟ ගෙයක් වත්..."

"ඉ..න්..න..කෝ ටිකක්... මේ සාගරේ වගේ ගෙදර චුට්ටක් දෙන්
බැරිද... ගෙදර නෙමේ... එළියේ ඇනෙක්ස් එක දෙන්න කියමු... ඒ
වහලා දාලනේ තියෙන්නේ..."

"එ..හෙ..න..ම් එහෙම අහලා බලමු..."

"ප්‍රියා..."

"ම්..."

"මල්ලිගේ ප්‍රශ්නේ ඔයාගේ විතරක් ප්‍රශ්නයක් කියල
හිතන්නෙපා... ඒක මගෙත් ප්‍රශ්නයක්... අපට ඉන්නේ චූටියි එයි
විතරයි... සහෝදරයෝ සහෝදරියෝ දහ පහළොවක් නැනේ..."

නිම්මි සිතන විදිහ ප්‍රියමන්තට සහනයක් විය.

මුතු ඉහල මාලයේ සිට නිම්මිත් ප්‍රියමන්තත් කතා කරමින් සිටි
අයුරු බලාගෙනය. දෙන්නාගේම මුහුණු එතරම් හොඳ නෑ
දෙන්නාම මේ කතා කරන්නේ මධුවන්ත ගැන බව ඇය දනී.

අවසන් වරට මුතු මධුවන්තව දැක්කේ ඔහු සිංගප්පූරුවේ සිට
නිවාඩුවකට පැමිණ යළි යද්දීය. එදා රෑ කෑමට ඔහු නැවතුණේය.
මුහුණ මුතුට හොඳින් මතකය.

මේ ජීවිතයේම ඔහු සමඟ කතා කර ඇත්තේ වචන දා
පහළොවක් පමණි. කොහොමත් මේ සිදුවීම් අවසානයේදී ඔහු දුව්
රැගෙන මේ ගෙදර ටික කලකට හෝ පදිංචියට එන බව මුතු දන්
අම්මාත් තාත්තාත් අයියාත් අක්කාත් පිට යනවාට කැමති නැත.

ඔහුගේ පැමිණීම තමා බරක් කරගන්නේ කුමකටදැයි මුතු
සිතුවාය. එහෙත් මධුවන්ත ගැන සිතද්දී හිත බරවෙයි. ඒ ඇයි...





බර ගතිය මුලින්ම දැනුණේ ඔහුගේ අයියාගේ දෙවෙනි මනමාලයා ලෙස ආ දිනයේදීය. එදා ඔහු සිරිත් ලෙස මල් කළඹ ගෙනවිත් දුන්නේ තමාටය.

ඉන් පසුව ඔහු මේ ගෙදරට ආවේ දෙවතාවකි. ඒ දෙවතාවේදීම ඔහු තමා සමඟ කතා කළේ වචනයකි... දෙකකි. එහෙත් ඊට වඩා සමීපතාවයක් ඇය ඔහුගෙන් බලාපොරොත්තු විය... මධුවන්ත සිංගප්පූරුව බලා ගියේ එසේ ඔහු ගැන සිතමින් සිටිද්දීමය... ඉන් පසුව මුතු ඒ මංගල ඡායාරූප ඇල්බමය වත් බැලුවේ නැත. ඒ ඇයි...

මුතුට තමාගේ හදවතේ හැඟීම් සමඟ වංක විය නොහැක... හදවතට එකඟව කතා කරනවා නම් මේ හදවතේ පිරිමියෙක් ගැන මුල්ම වරට ආදරයක් උපන්නා නම් ඒ මධුවන්ත ගැනය. එය යාංතමට වැටුණ පොද වැස්සක් වැනි වූ ආදරයකි. බැඳීමකි. ලෙන්ගතුකමකි. නුහුරු නුපුරුදු හැඟීමකි.

හදවතේ කුළුදුලේම උපන් ඒ පුංචි ආදරය එහෙමම පපුවේ ගල් විය. හිරවිය... ඔහු සිංගප්පූරුව බලා ගිය රාත්‍රියේ හදවතට දැනුණ පාළුව මුතුට තවමත් මතකය. මේ හදවතේ ඔහු ගැන උපන් ඒ ලෙන්ගතුකම කවුරුවත් දන්නේ නැත.

සිංගප්පූරුවට ගිය පසුව වත් ඔහු තමාට විශේෂයෙන් කතා කරතැයි මුතු සිතුවාය. එවැනි හීන් බලාපොරොත්තුවක් මුතුගේ ළයේ විය. එහෙත් එවැන්නක් සිදු වූයේ නැත. දවස ගානේ අයියාටත් අක්කාටත් කතා කර කෑවාද බීව්වාද කියා පවා අසනා ඔහු එක දවසක් වත් තමාව ඉල්ලුවේ වත් නැත.

දෙවියන් ආදරය එක හිතක පමණක් මවන්නේ ඇයිදැයි මුතු සිතුවාය. ඉන් පසුවද නිතර නිතර මුතුට මධුවන්තව සිහිවිය.

එහෙත් යංතමට හෝ හදවතේ තිබූ ඔහුගේ රුව ඇය හදවතින් මකා දැමුවේ මධුවන්ත විවාහ වූ පසුය.

ඉන් පසු මධුවන්ත භාෂිණීත් සමඟ එකට ඉඳ සිංගප්පූරුවේදී ගත් ඡායාරූප අයියාට එව්වේය... ඒ ඡායාරූප අයියාත් අක්කාත් බලන්නට දුන්නෝය...

"එයාව මධුවන්තට ගැළපෙන්නෑ... මකොහොමටත් ගැළපෙන්නෑ..."

ඒ සින්තුර දෙස බලා මුතු දුකින් සිතුවාය. අද සිදුව ඇත්තේ එදා සිතන දේම නොවේද... පුදුමය... දෛවය ඔහු වත් කෙතෙකුට එහෙම දෙයක් දුන්නේ ඇයිදැයි මුතු දන්නේ නැත. ආදරය තොලැබී යන්නේ ආදරය කරන අයටමය.

මධුවන්ත මේ ගෙදරට ආවොත් යළි ඔහුව දැකීම පවා කොතරම් දුකක්දැයි මුතු දනී. පපුවේ ඔහු වෙනුවෙන් සඟවා ගත් දෙයක් ඇත. එය මේ කවුරුවත් දන්නේ නැත. "නෑ බබා... එහෙම කියන්නෙපා... ඒකා එහෙම කොල්ලෙක් නෙමේ.. පව්..." අක්කා කියූ වදන් මුතුට සිහිවෙයි. ඔහු ගැන අක්කා අමුතුවෙන් කිව යුතු නැත. මධුවන්තව මුලින්ම දුටුදාම මේ හදවත ඔහු ගැන දැන ගත්තේය... හැම පිරිමියෙක් ගැනම එසේ සිතෙන්නේ නැත.

කාංචන ගැන නම් කොහොමත් සිතෙන්නේ නැත.

මුතු විවාහ ගිවිස ගන්නට උන්නේ කාංචන සමඟය. කාංචන මුතුගේත් නිම්මිගේත් පියාගේ හොඳම මිතුරෙකුගේ පුතෙකි. මේ විවාහය යෝජනා කළේ මුතුගේ තාත්තාය. මුතුට ඒ ගැන කතා කරන්නට දෙයක් ඉතුරු වූයේ නැත.

කාංචනගේ නංගීගේ විවාහය අවසන් වූ විගසම කාංචනගේත් මුතුගේත් විවාහය කරන්නට දෙගොල්ලෝම කතා කරගෙන උන්නෝය. මේ පවුල් දෙක පුදුම තරම් සමානය. දෙගොල්ලෝම කලේ ඉඩම් වෙළඳාමය... එහෙත් තමාත් කාංචනත් අතර අහසට පොළොව මෙන් දුරක් ඇති බව මුතු දනී. ඒ දුර කාංචන කවදාවත් ඇවිදගෙන නොඑන බවද ඇය දනී. යනවා නම් ඔහුගේ ලෝකයට යා යුත්තේ තමාය.

එහෙම සුදානමක් මේ හදවතේ නැත.

"ඔයා තරම් මං පින් කරලා නෑ..."

මුතු මේ කතාව නිම්මිට කියා ඇත්තේ වරක් දෙවරක් නොවේ.





ඒ දෙන්නාගේ ජීවිත දෙක දෙස බලද්දී එතන ජීවිත දෙකක් කියා මුතුට සිතෙන්නේ නැත. දෙන්නා ඒ තරම් ආදරෙන් ඉඳී...

කාංචන සමඟ ගෙවන ජීවිතයක් ගැන මුතු හිතලාවත් නැත. හිතෙන්නේද නැත. කොහොමත් මේ කසාද තීන්දුවෙන් පසු මුතු ජීවිතය ගැන සිතුවේම නැත.

මධුවන්ත එන්නේ හිත එහෙම ගල් වී තිබියදීය. සමහර විට ඔහුව දැකීම පවා හදවතට දුකක් ගෙනෙනු ඇත. ඔහු වැනි කෙනෙක් ජීවිතයට ලැබුණා නම් සමහර විට මේ ජීවිතය මීට වඩා රසබර වන්නට තිබුණි. එහෙත් දෙවෙනි මනමාලයාත් දෙවෙනි මනමාලියත් වෙන් විය... ඒ වැරැද්ද කළේ ඔහුය. මේ ඇස්වලින් මොනවා හෝ කියවුණු බව මුතු දනී. ඔහුට ඒ වගක් නොපෙනෙන්නට ඇත. එක කාලයකදී ජීවිතයේ උන් අය පසු කාලයේදී හමුවෙද්දී අර පත්තු වූ පත්තුවිල්ල යළිත් පත්තුවේද... මුතු දන්නේ නැත.

# 06

මධුවන්ත කෙල්ලට නූඩ්ල්ස් කැව්වේ ඔඩොක්කුවේ තබාගෙනය. කෙල්ලගේ නිරුවත් චූටි පිටෙන් එන තුනී රස්නය සිනිදු ළඳරු පහස මධුවන්තගේ බඩට එහෙමම දැනෙයි.

"නූඩ්ල්ස් රසයිද මගේ අම්මියෝ..."

මධුවන්ත ඒ හිස සිපගෙන ඇසුවේය.

"ර..සා..යි..."

කෙල්ල කට උල් කර කීවාය. මධුවන්තගේ දෑස් තෙත් විය... හාමිනී අර තරම් පහසුවෙන් මේ රත්තරන් කෙල්ලව ජීවිතයෙන් ඇත් කළේ කොහොමදැයි මධුවන්ත සිතුවේය. බාල දේවලින් මත්වූ පසු කාටත් ජීවිතයේ සංවේදී දේවල් දැනෙන්නේ නැත. තම බිරිඳට වී ඇත්තේද එයම බව ඔහු දනී.

කෙල්ලට මද රස්නේ ඇති වතුරින් ඇඟ සෝදා තුවායෙන්





ඔතාගෙන එද්දීම ඇය නිදිය. බඩ හොඳට පිරුණ නිසා නිදිමත එන්නට ඇත. මධුවන්ත දුවට රෑට අන්දවන කුඩා පිජාමා ඇඳුම ඇන්දවූයේ ඇයව ඇඳමත තබා ඉඹිමිනි. ඒ නිදිබර දෑස් යංතමට ඇරී යළිත් පියවිණි.

ජීවත් වෙන්නට මේ ඇතියැයි මධුවන්ත සිතුවේය. කෙල්ලව කුඩා කොට්ටය මත තබා ඔහු තවත් කොට්ට දෙකකින් ඇයව වට කළේය.

දැන් ඉතින් මේ සිංගප්පූරුව දමා යන්නට සූදානම් විය යුතුය... ජීවිතයට බොහෝ දේ දී ඊටත් වඩා වේගයකින් ඒවා උදුරා ගත් සිංගප්පූරුව තමා යද්දී තමා දෙස බලා සිනාසෙනු ඇත. මේ සිංගප්පූරුවෙන් ජීවිතයට කියා රැගෙන යන්නේ පුංචි දුවව පමණි. අනිත් සියල්ල යන්නේ සිංගප්පූරුවේ ගුවන් තොටුපලේ දමාය.

දුවව ලංකාවට ගෙන ගොස් හදන්නට වෙන්නේ තනිවම බව මධුවන්ත දනී. අයියාටත් අක්කාටත් හැමදාම කරදර කළ නොහැක. ඇරත් අයියා ඉන්නේ නිම්මි අක්කාගේ ගෙදරය. ඒ ගෙදරට ගොස් බරක් වෙන්නටද නොහැක. ටික දවසක් අයියාත් අක්කාත් ළඟ ඉන්නට ඇත්නම් ඇතිය. ඉන්පසු කුමක් හෝ පිළිවෙලක් හදා ගන්නට පුළුවන.

කොහොමත් ලංකාවට යන්නේ සැපක් විඳින්නට නොවේ. සිංගප්පූරුවේ සිටියා කියා මහ සැපක් වින්දේද නැත. සමහර විට මේ ජීවිතයම මවා ඇත්තේ දුකම විඳින්නට විය යුතුය.

එහෙත් දුව ගැන සිතා මධුවන්ත ඒ දුක අහිතකින් තොරව බාර ගත්තේය.

සන්තකයටම අතේ ඉතුරු කරගත් මුදල් ටිකක් ඇත. එය පවා වියදම් කළ යුත්තේ පරිස්සමිනි. ඒ මුදල් ටික යංතම් මාස හය හතක් පිරිමසා ගන්නට ප්‍රමාණවත්ය. ඉන්පසු ජීවත් වන්නටද දෙයක් කළ යුතුය.

කුඩු කඩාගත් විට කුඩුවේ කෑලි සමඟ තනිවෙන කෙනාට දුකය. කරදරය. ප්‍රශ්නය. කුඩුව දමා ඉගිලී යන කෙනාට සැපය. ආදරයත් මහ පුදුමාකාර දඬුවමකැයි මධුවන්තට සිතුණි.



Elephantale.com

දැන් සිංගප්පූරුවේ වේලාව රෑ එකොළහය... ලංකාවේ වේලාව අටහමාරය. ලංකාවේ වේලාව සිංගප්පූරුවේ වේලාවට වඩා පැය දෙකහමාරක් අඩුය.

මධුවන්නගේ දුරකථනයට ලංකාවෙන් ඇමතුමක් ආවේ මේ වේලාවේදීය... මධුවන්න වහා දුරකථනය ගත්තේය. ඔහු දුරකථනය ඇමතුවේ දූගේ හිස අතගාමින්මය.

"ම..ල්..ලි..."

කතා කළේ නිම්මිය. අම්මා කතා කළාක් වැනි හැඟීමක් ඔහුට දැනුණි.

"අ..ක්කේ..."

"දැන් සිංගප්පූරුවේ මහ රෑ නේද... ඔයා නාම නිදි නැද්ද..."

මධුවන්න සිනාසුණේය. පපුව ඇවිලෙන්නේ ඒ අසරණ සිහිනූල් අසන කෙනාගේය.

"දු..ව දැ..න් අක්කේ කාලා නිදාගත්..තේ.. ඇඟ සෝදද්දිම ඇ නිදි..."

"අ..නේ... ඔයා ඕවා කොහොම කරනවද මන්දා... අද මොහැ පැටියට කැව්වේ..."

"රෑට කවන්නේ නූඩ්ල්ස්... ඒකට පුරුදුවෙලා... බඩ උඩ තියාග ලයිට් පෙන්න පෙන්න කවනවා..."

"ඒ..න්..න..කෝ පැටියත් අරන් ලංකාවට... මං කෙල්ලට කවන්නම්..."

මධුවන්නට නිවනක් දැනුණි. ඒ වචන ටිකත් ඇතිය...

"අපි පිළිවෙලක් හදා ගත්තා මහත්තයෝ... මම අම්මගෙනුයි තාත්තගෙනුයි මුතුගෙනුයි ඇහුවා... එහෙම ප්‍රශ්නයක් නෑ... ගෙවල් අල්ලලා පුංචි ඇනෙක්ස් එකක් තියෙනවා... පිළිවෙලක් වෙනකල්





අපි එහෙම ඉමු..."

මධුවන්නට නිම්මි ගැන පුදුමාකාර ආදරයක් ඇතිවිය... ඇය මේ කරන්නේ කරන්න පුළුවන් උදව් නොවේ. නැනා කෙනෙක් නොකරනා උදව්ය.

"අ..ක්..ක..ට පි..න් අක්කේ..."

"ගහනවා මම... මේ මොනාද කියන්නේ... දැ..න් අර්යා දන්නවද මේ ගැන..."

"මං කිව්වා..."

"එතකොට..."

"හරි සතුටුයි... ඒක නමාවු කරන්න තියෙන්නේ... මං වැරදි කෙනාට මුදු දැම්මේ අක්කේ..."

නිම්මි කිසිවක් කීවේ නැත.

"අ..පි ජී..වි..තේ හිමිහිට පටන් ගමු... අයියයි මායි ඉන්නවනේ... ඔයාට වැටෙන්න අපි දෙන්නෑ..."

මේ ජීවිතයේ අමුතුවෙන් වැටෙන්නට දෙයක් නැත. කොහොමත් ඉන්නේ ජීවිතයේ පතුලටම වැටීය.

"අ..ක්..කේ මා..ව..යි දුවයි කරදරයක් වේ..වි..ද..."

ඔහු ඇසුවේ බියෙන් මෙනි.

"පිළිවෙලක් වෙනකල්නේ මල්ලී..."

"මේ උද..වි..ව අක්කේ ම..ට ජීවිතේට..."

"ඔ..න්න ආයෙමත්... ඔයාට පිස්සුද... දැන් මේවද හිතන්නෝන... දැන් කවදද එන්නේ..."

"ඉ..ක්..ම..න..ටම එනවා..."



Elegantta.com

"එ..න්න.. තව දුක් විඳින්නෙපා... මඩේ එරෙන්න එරෙන්න ගොඩට එන්න බෑ..."

ආදරය මඩ වලක් වූ හැටි පුදුමය... විවාහ ජීවිතය ගොහොරුවක් වූ හැටි ඊටත් වඩා පුදුමය...

"ඉ..න්න මල්ලී... අයියා ඉන්නවා..."

නිමිමි දුරකථනය ප්‍රියමන්තට දුන්නාය.

"ඉක්මනට එන්න කියන්න"

දුරකථනය දෙද්දී ඇය ප්‍රියමන්තට කීවාය. එය මධුවන්තටද ඇසුණි. ඇත්තටම ඇය දෙවෙනි අම්මා කෙනෙක් මෙනි.

"අ..යියේ..."

"අ..ක්කා හැමදේම ලෑස්ති කරලා මල්ලී..."

"ඒ අක්කා නෙමේ අයියේ... අපේ අම්මා ඇවිත් ඉන්නේ..."

මධුවන්ත පුදුමාකාර ආදරයකින් කීවේය.

"උ..ඔ ඉක්මනට වරෙන් කොල්ලෝ... අපි ඇවිල්ලා ඉතුරු දේවල් කතා කරමු..."

"නොඳයි අයියේ... මං ටිකට් අරන් අයියටයි අක්කටයි ගන්නම්..."

"උ..ඔ කෑවද..."

"ත..ව ටි..ක..කින් කනවා අයියේ..."

"දැන් ඔහේ වෙලාව කීයද..."

"එ..කොළහ මාරයි..."

මධුවන්ත බියෙන් මෙන් කීවේය.

"ඉතින් බලපන්..."

"අ..ද මගේ ජීවිතේ පුදුමාකාර දවසක් අයියේ..."





"මො..නවා හරි කාලා ඉඳපං..."

"ම.. මං තියන්නම් බුදු සරණයි..."

"බුදු සරණයි... ඉක්මනට මට කතා කරපන්..."

මධුවන්ත දුරකථනය තබා පහත් වී කෙල්ලගේ නළල සිප ගත්තේය. "ඔයයි මායි අපේ මාමි ගාවට යනවා..." මධුවන්ත කීවේය. කෙල්ල මධුවන්තගේ පහසින් ගැස්සී යළිත් වූටි අතක් ඔහුගේ අත මත දමාගෙන නිදා ගත්තාය...

* * * * * * * * * * * * *

රවී ආවේ සිංගප්පූරුවේ ඇති එකම සිංහල හෝටලය වූ "සුමනක්කාගේ බත් කඩයෙන්" ඉදි ආප්ප මුල් දෙකක්ද රැගෙනය. මධුවන්ත ඉන්නේ පිහිටක් විය යුතුම මොහොතක බව රවී දැන උන්නේය. මධුවන්තගේත් භාෂිණිගේත් සම්පූර්ණ කතාවම දන්නේ රවී පමණි.

මුල්ම වරට භාෂිණිව හමුවූ දාත් මධුවන්ත පැමිණ රවීට ඇය ගැන කීවේය... ඉන් බොහෝ දිනකට පසුව කිසිවක් කියාගත නොහැකිව මධුවන්ත රවී ළඟට පැමිණ ඇඬුවේය. භාෂිණි ගැන රවී දන්නේ මධුවන්ත දැන ගන්නට බොහෝ කාලයකට පෙරය. එහෙත් භාෂිණිගේ මේ වැඩ පිළිවෙල ගැන මධුවන්තට කියා ගන්නට නොහැකිව රවී බොහෝ කාලයක් උන්නේය.

"පුළුවන් නම් භාෂිවත් අරන් ලංකාවට පලයන්... ගිහින් එහේ සෙට්ල් වෙයන්..."

රවී වහෙන් ඔරෝවෙන් මධුවන්තට කීවේය. එහෙත් ඒ වෙද්දී ගැහැණියකට යා හැකි නරකම දුරකට ඇය ගොස් හමාරය...

තනිවූයේ අහිංසක කොල්ලෙකැයි රවීට සිතුණි. ඔහුට එසේ විය යුතු නැත.



Elegant

"හොඳ කෙල්ලෙක්ව හම්බවෙන්න තිබ්බ කොල්ලෙක්.. උෆ් මේ ගෑණිට අහිංසක වැඩියි..."

රවී මේ කතාව කීවේ කාගෝ එකේ වෙනත් මිතුරෙකුටය. ඇත්තටම මධුවන්ත භාෂිණී වැනි කෙල්ලෙකුට මෘදු වැඩිය.

සුදු සරමක් හා සුදු වෙස්ට් එකක් ඇඳගෙන දුව ළඟ හාන්සි වූ ඇය දෙස කල්පනා කරමින් බලා සිටිනා මධුවන්තව දකිද්දී රවීගේ පපුව හෝස් ගා පත්තු විය. "ලස්සනට ජීවිතේ හදාගෙන ආපු කොල්ලා... පට්ට බැල්ලියෙක් කොල්ලගේ ජීවිතේ කෑවා..." රවී තනිවම සිතුවේය. හැම සාර්ථක මිනිසෙක් පසුපසම ගැහැණියක් සිටිනැයි කවුදෝ කියා ඇත. එසේම හැම පරාජිත මිනිසෙක් පසුපසමත් ගැහැණියක් සිටී.

"ම..ධූ..."

රවී ශබ්ද නොනැගෙන ලෙස කතා කළේය.

"ආ.. මචං... උඹ ආවද..."

තමා ආ බවවත් ඔහු දන්නේ නැත.

"පොඩි එකී නිදිද මචං..."

"නිදි බං... බලපං... ඒකි මේ මොනවත් දන්නෑ... සැපට නිදි..."

"නාත්තා විදින දුක දන්නවනම් පොඩි එකීගෙත් පපුව පැලෙයි..." රවී සිතුවේය. මධුවන්ත කෙල්ලට පොරවා කාමරයට යාබඩව තිබූ කුඩා සාලයට ආවේය.

"උ..ඔ කාලා නෑ නේ..ද..."

මධුවන්ත සිනාසුණේය. සිංගප්පූරුවට ආ දා සිට තමා කෑවී බීව්වාද කියා සොයා බැලුවේ රවීය. ජීවිතයට ආ අය එහෙමම ගියේය. හොඳ මිතුරන් එසේ නැත.

"සුමනක්කගේ කඩෙන් මං ඉඳි ආප්ප මුල් දෙකක් අරන් ආවා. ක..මු..."





"ට්..කකින් කමු මචං..."

රවී කොල්ලා දෙස බලාගෙනම උන්නේය.

"ම..ධූ... මො..කද වුණේ..."

කුමක් හෝ සිදුවූ බව රවී දැන උන්නේය.

"මං තීරණයක් ගත්තා මචං..."

තීරණයක් ගත්තා නොව තීරණයක් ගන්නට සිදු විය.

"හා..ෂි එ..ක්ක කතා කළාද..."

"ම්..."

"මො..නාද කියන්නේ..."

"වෙ..න්..වෙ..මු..ලු..."

පපුවෙන්ම ආදරය කළ මධුවන්ත ඒ වචන කොහොම දරාගත්තාදැයි රවී දන්නේ නැත.

"උ..ඔ..."

"මං වෙන්වීමක් ගැන දන්නෑ මචං... කාලය මේවා විසඳයි..."

මේ සියල්ල හැරදා භාෂි නැවත ආවද මේ මිනිසා ඇයව බාරගන්නා බව රවී දනී. ඒ තරමටම ඔහු භාෂිට ආදරේය. කොහොමත් සමහර ගෑණුන්ට තමන්ට ජීවිතේ වැඩියෙන්ම ආදරය කරන පිරිමියාගේ පපුව තේරුම් ගත නොහැක.

"මො..නාද මධූ කරන්න හිතන් ඉන්නේ..."

"මං ලංකාවට යනවා මචං දුවවත් අරගෙන..."

රවී කිසිවක් කීවේ නැත. රවීට පුදුම නැත. ඔහුට පුදුම මේ තීරණය මධුවන්ත කළින් නොගත් එකය. ආදරයේදී එහෙමය. තීරණ ගන්න ලෝබය. සිතෙන්නේ ඇලි ඇලීම ඉන්නටය.

තීරණයක් ගත් කෙනෙකුට ඒ තීරණයේ ජීවත් වෙන්නට උදව්



Freesantalks.com

කළ යුතුය. තීරණයේ භයානක කම පෙන්නා බිය ගැන්විය යුතු නැත. රවී එය දැන උන්නේය.

"උ..ඔ..ට මේ ප්‍රශ්න විසඳගන්න පුළුවන්... කොහොමත් ලංකාවට යන එක හොඳයි... ය..න්නෙ කොහාටද මචං..."

"අයියා ඉන්නේ මැරි කරපු අක්කගේ ගෙදරනේ මචං... එතෙ ටික දවසක් ඉන්න පුළුවන්..."

"මාත් ලංකාවට එනවනේ... අපි ඊට පස්සේ බලමු මොනාහරි..."

මධුවන්ත හිස ඔසවා රවී දෙස බැලුවේය.

"උඹ කරපු හැම දේකටම උඹට පින්..."

"මොනාද බං මේ කියන්නේ... මං ගැන උඹ බැලුවා... උඹ ගැන මං බැලුවා..."

"ම..ට කෙල්ලව හදාගෙන සෙට්ල් වෙන්න පුළුවන් වෙයි තේ මචං..."

ඒ වචනවලට රවීගේ පපුව උණුවිය. මෙහෙම අහන්නේ ඒ තරමටම අසරණ නිසාය.

"එහෙම හිතන්නෙපා මචං උඹ වැටිලා නෑ... එක ගෑණියෙක්ට බෑ මිනිහෙක්ගේ ජීවිතේ නවත්තන්න..."

"ඒත් හාමි මට මාවත් නැති කළා මචං..."

මධුවන්ත බිදුණු හඬින් කීවේය.

"දැ..න් අපි ඉස්සරහට කරන්න තියෙන දෙයක් කතා කරමු මචං... උඹ කවදද යන්න හිතන් ඉන්නේ..."

"ඉ..ක්..ම..න..ටම මචං... මං දැන් ඉඳලා වැඩක් නෑ... මං හෙට අස්වීමේ ලිපිය බාර දෙනවා..."





"එ..කපාර මචං... උඹට ලංකාවේ ගිහින් එහේ බ්‍රාන්ච් එකේ වැඩ කරන්න පුළුවන්..."

"බෑ මචං... මං මේ කෙල්ලව හදාගන්න ඕන.. හිමිහිට රස්සාවක් හොයාගන්නවා..."

රවී ඒ ගැන බල කරන්නට ගියේ නැත. පුංචි දරුවෙක් සමඟ කොහොම රස්සාවක් කරන්නද...

"උඹ ඉස්සෙල්ලා ලංකාවට පලයන්... ඉතුරු ඒවා අපි බලමු... මාත් එන්නම්..."

රවී ඉඳි ආප්ප මුලක් මධුවන්ත ළඟ තැබුවේය. මධුවන්ත ඉඳි ආප්ප මුල ලෙහුවේ සිංගප්පූරුවේ ගත කළ මුල් දවස් සිහිපත් කරමිනි. ඒ දවස්වල සිංගප්පූරුවේ කෑමවලට එකවර හුරු වෙන්නට අපහසු විය... කොල්ලෝ ටික කරන්නේ කාමරයේ කුඩා ගෑස් ලිපක් තබාගෙන බත් හදා පොල් සම්බෝලයක් අතේ හදාගෙන කෑමය... අතීතයට යා හැකි නම් බොහෝ දේ වෙනස් කර ගන්නට හැක. ජීවිතයේ වැරදුණු බොහෝ තැන් නිවැරදි කර ගන්නට හැක. එහෙත් දැන් ඊට ප්‍රමාද වැඩිය. බොහෝ වැඩිය.

"මධූ... ඇයි මචං..."

"ඉ..ස්සර අපි රූම් එකේ හදපු මාළු කරිය මතක් වුණා..."

"උඹනේ හදන්නේ... මාර ගති..."

හාෂිණීත් සමඟ ජීවත් වන්නට පටන් ගත් පසු මධුවන්ත බඩු ගෙනවිත් අපාට්මන්ට් නිවසේ වූ කුඩා කාමරයේ ඉව්වේය.

"මං ලංකාවේ කෑමවලට ආස නෑ..."

මධුවන්ත දිනක් කරවල බැදුමකුත් කිරි හොද්දකුත් පොල් සම්බෝලයකුත් බතකුත් සෑදූ දිනයක හාෂිණී කීවාය...

"ර..හයි හාමි..."



Elegantka.com

තමා අසරණව කී අයුරු මධුවන්තට සිහි විය. ඒ දවස්වල දුව ලැබෙන්නට උන් දවස්ය. මධුවන්ත සිතුවේ හාෂිණිට ලංකාවේ කෑම කන්නට ආශාවක් ඇති යැයි කියාය. එහෙත් ඇය දොළ දුකකටවත් ලංකාවට ආදරය කළේ නැත.

ඉන් පසු මධුවන්ත නිවසේ පොල් සම්බෝලයක් වත් හැදුවේ නැත.

"ටික දවසක් අයියයි අක්කයි ගාව ඉන්නවා මචං... ඊට පස්සේ පොඩි ඇනෙක්ස් එකක් හොයාගන්නවා... කෙල්ලයි මායි අලුත්ම ජීවිතයක් පටන් ගන්නවා..."

දුවෙකුටත් තාත්තා කෙනෙකුටත් එසේ ජීවිතය තනිවම පටන් ගත හැකිද...

"ටිකක් කාලයට ඉඩ දීලා බලමු මධූ..."

කාලය බොහෝ ප්‍රශ්න වලට විසඳුම් දෙයි... කන්නට ගත්තද මධුවන්තට කැවෙන්නේ නැත. කොතරම් හිත හදා ගත්තද පපුව උණු වෙමින් ගලයි...

* * * * * * * * * * *

"අපි ඊයේ මල්ලිට කිව්වා චූටි... පව් කොල්ලගේ හිතට හරි සැනසීමයි... අඬ අඬ පින් දුන්නේ..."

නිමේ කීවේ මුතු බැල්කනියෙන් ඈත බලාගෙන ඉඳිද්දීය.

"ඇ..ත්..ත..ද..."

මුතු කීවේ ගණනකට නොගෙනය. එහෙත් මධුවන්තගේ මේ පැමිණීම සිතට බරකි.

"ඒ ජීවිතේ ගොඩ දාලා දුන්නොත් ලොකු පිනක් බබා... එක





ජීවිතයක් නෙමෙනේ... ජීවිත දෙකක්..."

අක්කා කොතරම් හොඳ නැනා කෙනෙක්දැයි මුතු සිතුවාය...

"මා..ස තුන හතරකින් කොල්ලා මොකක් හරි පිළිවෙලක් හදා ගනී... එතකං හිටියට කමක් නෑ නේද බබා..."

නිමේ ඇසුවේ බියෙනි. අක්කා මේ බැල්කනියට එද්දීත් තමා උන්නේ මධුවන්ත ගැන සිතමින් බව ඇය දන්නේ නැත.

"මං ඔ..යාට කි..ව්..ව..නේ... කවුරු ආවත් ගියත් ම..ට කමක් නෑ..."

"අ..නේ පැටියෝ... එහෙම හරහට වගේ කතා කරන්නෙපා... එතකොට මගේ හිතවත් බරයි..."

"මගේ හිතට කොච්චර බරද කියලා ඔයා දන්නෑ අක්කේ..." මුතු කීවේ සිතෙනි.

"ඉ..නි..න් මං කියලා මොනා කරන්නද... එයාව ගේන්නද කියලා ඔයා මගෙන් ඇහුවා... මං කිව්වා මට කමක් නෑ කියලා... තව මොනා..ද..."

"අයියත් මඟින් මඟට කිව්වේ මුතු අකමැති න..ම්..."

"ඇයි දෙයියනේ මේ ඔයාලා මාව අල්ලගෙන... එයා මගෙ කවුරුවත්ද..."

මුතු කීවේ කේන්තියෙනි. එහෙත් ඇත්තටම ඇයට මේ පිටවූයේ වෙන දුකකි. නොවේනම් පපුවේ ඉතිරිව තිබූ හැඟීමකි.

"තා..ත්තගෙන් ඇහුවේ ගෙදර නවත්ත ගන්න කියලම නෙමේ... අ..ර ඇනෙක්ස් එක දෙන්නද කියලා... ඒක ගෙට සම්බන්ධ නැනේ... වෙනමම කිවන් එකකුත් තියෙනවනේ..."

ඔහු හදන්නේ ඔහුම උයාගෙන කන්නද... තනි පිරිමියෙක් එසේ



Freesanti talks.com

කොහොම ජීවත් වන්නද...

"ම..ට මේ ප්‍රශ්නෙදි හරි දුකක් ආවා..."

නිම්මි කීවේ ඇඬුම්බරවය.

"ඇ..යි අ..ක්..කා..."

මුතු ඇසුවේ ඇය දෙසට හැරී ඒ උරතලයට සුරත තබාය.

"මා..යි අයියයි... තනිවුණා... මධුවන්තට ටිකක් මෙහේ ඉන්න දෙන්නද කියලා මං තාත්තගෙන් ඇහුවේ හ..රි බ..යෙ..න්... තා..ත්තා ප්‍රශ්න පන්සීයක් විතර අහලයි ටික කාලයකට ඇතෙක්ස් එක දුන්නේ..."

අක්කාගේ කතාවට මුතුගේ පපුව හෝස් ගා පිච්චී ගියේය. තාත්තා කළ ඒ දේ ගැන මුතුගේ සිතේද අපැහැදීමක් ඇත. එහෙත් ඇය එය පෙන්නුවේ නැත.

"අ..නේ ඉතින් මං ඔයාට.. අයියට එ..හෙම කළාද... මේ.. ගෙ..වල් දොරවල් ම..ගේ නෙ..මේ..නේ..."

"ඔ..යා නෙ..මේ බබා... මේ ප්‍රශ්නෙන් පස්සේ අයියටත් හරි දුකයි..."

මුතු නිම්මිගේ කඳුළු පිරි දෙනෙත් දෙස බලාගෙනම උත්තාය.

"වැටිලා ඉන්නකොට එහෙමයි චූටි..."

"අ..නේ එ..හෙ..ම කියන්නෙපා..."

"ඇත්ත ඒක චූටි... අසරණකමට මං මධුවන්තට මෙ..හෙට එන්න කිව්වා තමා... ඒත් මං හිතන් ඉන්න විදිහට කොල්ලට සළකන්න බැරිවෙයි... කමක් නෑ... අද නෙමේ බබා... ඔයයි කාංචනයි මැරි කරපු කාලෙක අයියයි මායි මෙ..හෙ..න් යනවා..."

මුතුගේ උගුර සිර විය. ඇය කතා නොකරම නිම්මි දෙස බලා





උන්නාය.

"ඔ..යා හදන්නේ තා..ත්තගේ වැරදි වලට මාව තනි කරන්න..."

"දැන්ම කිව්වේ ඒකයි බබා... ඔයා මැරි කළාම..."

නිම්මි කීවාය. මුතු අක්කාගේ ඇස් දෙස බැලුවාය.

"ඒ මැරේජ් එකෙන් මං මී..ට..ත් ව..ඩා තනිවෙනවා..."

නිම්මි මුතු දෙස බැලුවේ ගැස්සී මෙනි. මේ ඇය ඇගේ විවාහය ගැන කතා කළ ප්‍රථම වතාවය.

"ඇ..යි චූ..ටි එ..හෙ..ම..."

"ඔ..යාල කවුරුවත් ම..ගේ ජීවිතේ ගැ..න බලන්නෑ... මං ඇස් පියාගෙන පල්ලමටම වැටෙනවා... සිංගප්පූරුවේ ඉන්න මධුවන්තට පිහිට වෙනවා... ම..ට පි..හිට වෙන්න කවුරුවත් නෑ..."

මුතු කීවේ අඬමිනි. නිම්මි එහෙමම කෙල්ලව වැළඳගත්තාය.

"මේ.. ඔයා මො..නා..ද කියන්නේ... මං උඹ ගැන බලන්නැද්ද... අයියා බලන්නැද්ද..."

"බලාගෙන ඉඳිද්දි චූටි පෝරකේට යන්නේ..."

නිම්මිගේ පපුව දැවෙන්නට විය. මුතුගේත් කාංචනගේත් විවාහය ගැන නිම්මි සිතුවේම නැත... එහෙත් කෙල්ලගේ මේ ඇස්වල කඳුළු නිම්මිට ඒ ගැන අලුතෙන් සිතන්නට බල කළේය.

"මං උ..ඹ..ට දු..කක් වෙන්න තියනවද..."

"ඔයාට කරන්න කිසිම දෙයක් නෑ... පුළුවන් නම් මා..ව දාලා නොගිහින්වත් ඉ..න්..න... එච්චරයි..."

මුතු කීවේ දෑත් එක් කරය. නිම්මි කෙල්ලව වැළඳගත්තේ අඬාගෙනය.



Elegantk.com

# 07

උදෙන්ම මධුවන්ත කෙල්ලට කිරිබත් ටිකක් හදා කැව්වේය. කෙල්ල කිරිබත් කන්නට ආසය. කිරි රහට ඇති බත් කෙල්ල කන්නේ චොක් චොක් ගාය. ඒ මල් පෙති දෙකක් වන් වූ දෙතොල් දෙස ඔහු බලාගෙනම උන්නේය... මධුවන්ත වැඩිපුර කිරිබත් ටිකක් කැව්වේ කෙල්ලට සමහර විට දවල් වන තුරු දෙයක් බඩට නොවැටෙන නිසාය. භාෂිණී දවල්ට උන්නද ඇය හිතාමතා දෙයක් කෙල්ලට කවන්නේ නැත. ඇරත් මුළු රැයක්ම තම අනියම් පෙම්වතා සමඟ ඉඳ එන ඇය දවාලට ඉන්නේ මෙලෝ සිහියකින්ද නොවේ.

බොහෝ වෙලාවට ඇය කරන්නේ දුව ළඟට සෙල්ලම් බඩු ලා කර නිදා ගැනීමය.





"ඉක්මනට ගිහින් වැඩ ටික කරගෙන එනවා... නැත්නම් පව්..."

මධුවන්ත සිතුවේ කුඩා නාන කාමරයේ තබාගෙන කෙල්ලව සෝදමිනි. බේබි සබන් පෙන පිඩු ගොඩක් නංවා මධුවන්ත ඒ මුහුණට මුහුණ තැබුවේය.

"ම්.. ම..ගේ අ..ම්..මා..."

මධුවන්ත කෙල්ලගේ තෙත මුහුණ ඉඹිමින් කීවේය.

"තා..තා... මේ බබන්..."

කෙල්ල බබන් යැයි කීවේ සබන් වලටය. මධුවන්තට හිල්ලින. භාෂිණී එක වචනයකින් ප්‍රතික්ෂේප කළේ මේ තරම් සුන්දර සම්පතය...

මධුවන්ත ඇඳගෙන දුවවද තබාගෙන බලා උන්නේ යන්නට බලාගෙනය. අද කරන්නට දහසක් වැඩ ඇත. භාෂිණී ආවේ වෙනදාටත් වඩා ප්‍රමාද වීය... ඇය ඇඳගෙන එන්නේ ඇඳගෙන ගිය ඇඳුම නොවේ. දැන් ඒ ජීවිතය ගැන සිතා පලක් නැත. ආදරය කළ රත්තරන් භාෂි දැන් මැරිලාය.

"මං දූට කිරිබත් කවලා තියෙන්නේ... දවල් වෙන්න කිරි ටිකක් දෙන්න..."

භාෂිණී කතා කළේ නැත. ළඟදී සිට ඇය ළඟින් එන විලවුන් සුවඳට මධුවන්ත කැමතිම නැත.

"භාෂි..."

ඔහු කතා කළේ උගුරින් මෙනි.

"ම්..."

ඇය ඔහු දෙස බලන්නේවත් නැත. "උඹට බලන්න බෑ..." මධුවන්ත කීවේ සිතෙනි.

"මං ලබන සතියේ ලංකාවට යනවා... අද දුවටත් එක්කම ටිකට් ගන්නවා..."



Freeamka.com

"හොඳයි..."

පුදුමය. පපුවේ සෙලවීමක් වත් නැද්ද... හදවතේ ගැස්මක් වත් නැද්ද... අවුරුදු හතරක බැඳීමක් භූමිදානය කරද්දී ඇහැක් යකඩ වත් නැටවෙන්නේ නැද්ද...

"දුවව අරන් යන්න ඔයාගේ පර්මිෂන් ඕ..න..."

"දෙ..න්..න..ම්..."

මධුවන්ත මොහොතක් ඇය දෙස බලා උන්නේය.

"භාෂි... මේ.. බල..න්..න..."

ඔහු අවසාන වතාවට භාෂිණිගේ උරතලයට සුරත තබා ගත කළේය. භාෂිණි හැරුණේ නැත.

"ටි..ක..කට බලන්න..."

ඔහුගේ පපුව හෝස් හෝස් ගා උණු වෙයි. මේ ශරීරයේ සිදු නොගත් තැනක් නැත. ඒ සුවඳ තවමත් මේ සිතේ ඇත.

"ඇ..යි..."

භාෂිණි එකවර හැරී ඇසුවාය. මධුවන්ත මොහොතක් ඇය දෙස බලා උන්නේය.

"ය..න් අපි එ..ක්..ක..."

භාෂිණි කතා කළේ නැත.

"ඔයා වගේම මාත් තීරණ අරන් ඉන්නේ මධූ... හිතාගෙන හිටපු විදිහට කරන්න..."

එපමණය. මධුවන්ත ඇඳ උඩ උන් දුව දෙස මොහොතක් බලා උන්නේය. කෙල්ල කොට්ටය බදාගෙන ඇස් යාංතමට ඇරගෙන බලා ඉඳියි.

"කුක්කු බයි කාලා අම්මිට දොයිමතද ආ... අම්මි එස්ස





දොයියන්න... හොඳේ... බුදු සරණයි..."

මධුවන්ත කීවේ කෙල්ලව දහ පාරක් පමණ සිපගෙනය... විදුලි සෝපාවේදී ඔහුගේ දෑසින් කඳුළු වැටිණ.

මේ තරම් තීරණයක් ගත් පසුත් භාෂිගෙන් අරම ඇසුවේ තමාම දැයි මධුවන්ත සිතුවේය... ඔහුට ඔහු ගැනම පුදුමය... මේ පපුවේ ඉතිරි වී ඇත්තේ භාෂි වෙනුවෙන් උපන් ආදරයක් නොවේ. අදින් හෙටින් නිමා වන තම පවුල් ජීවිතය ගැන උපන් ලෝබකමය. දුකය.

මේ සිංගප්පූරුවේ ඉන්නා අවසාන දින ඉතර පහය... යළි කිසිම දිනයක මේ බිමට තමාවත් තම දරුවාවත් පය නොතබන බව මධුවන්ත දනී. අසරණ වී තිබියදී ෂැංගි ගුවන් තොටුපලෙන් සිංගප්පූරුවට වට උදෑසන අද මෙන් මධුවන්තට මතකය... වැරදී මේ බිම නොවේ. මේ බිමේදී හමුවූ අයය... ඉනුත් තම බිරිඳය.

එක අතකට භාෂි මේ අන්තිම දවස්වල මේ තරම්ම රුදුරු වීම හොඳය. කුරිරු ලෙස ඇත්වී හිඳීම හොඳය. එවිට ඒ වෙන්වීම හිතට බරක් නැත.

ඔක්කොටම වඩා මධුවන්තට දුක දුව ගැනය. කෙල්ලට ලබන සතියෙන් පසු අම්මා කෙනෙක් නැත. මධුවන්ත මේ තාක් ඉවසුවේ නමට වත් දුවට අම්මා කෙනෙක් තමාට බිරිඳක් සිටිය යුතු නිසාය. එහෙත් මේ බැඳීම කාටත් කලින් විසි කර දැමුවේ භාෂිය.

ලිට්ල් ඉන්ඩියා හි පිහිටි කාගෝ ආයතනයට මධුවන්ත ගියේ දුකෙනි. මේ රස්සාව කළේ පුදුමාකාර ආශාවකිනි. ජීවිතයේ බොහෝ දේ ගොඩනගා ගන්නට මේ පුංචි රස්සාව පුදුමාකාර ලෙස උදව් කළේය. කාගෝ ආයතනයේ ප්‍රධානියාත් එහි සේවකයනුත් එක පවුලේ අය මෙනි. ඒ සියලු දෙනාම ශ්‍රී ලාංකිකයන්ය. දුකේදීත් සැපේදීත් සියල්ලන්ම එකට උන්නෝය. ඒ නිසාම මේ වෙන්වීම වෙන ආයතනයකින් අස්වී යනවාට වඩා දුකය.

"ඉඳගන්න මධුවන්ත..."

කාගෝ ආයතනයේ ප්‍රධානියා වූ මහින්දානන්ද මධුවන්තට



Elegantlk.com

අසුනක් පෑවේය.

"මට රවී කිව්වා..."

"මං සර්..."

"මධුවන්ත යන්න... මං හැමදේම දන්නවා... ඔයා මට නැතිවෙන එක දුකයි... ඔය ඉස්සෙල්ලා ඔයාගේ ප්‍රශ්න විසඳගන්න... ඕන උනොත් මට කතා කරන්න... ඔයාට කැමති දවසක කම්පනි එකට එන්න පුළුවන්..."

"නෑන්කියු සර්... මං මෙහේ වැඩ කළේ හරි සතුටින්... ම..ගෙ..ත් වරදක් වෙලා තියෙනවනම් මට සමාවෙන්න සර්..."

මහින්දානන්ද නැගිට විත් මධුවන්තගේ පිටට සුරත තැබුවේය.

"අපි සහෝදරයෝ වගේ වැඩ කළේ... මට ඔයා යන එක දුකයි.. රවී ඊයේ මට ඔයා යනවා කිව්වේ අඬ අඬා..."

රවී එහෙම කරන බව මධුවන්ත දැන උන්නේය.

"මං ඔයාට මෙතන පොඩි ගානක් ලෑස්ති කළා... මේක තියාගන්න..."

මහින්දානන්ද මහතා සුදු ලියුම් කවරයක් මධුවන්ත අත තැබුවේය.

"නෑන්කියු සර්... මං එ..හෙම බලාපොරොත්තු උ..නෙ..ත් නෑ..."

"පුළුවන් නම් කවදහරි අපි ගාවට එන්න..."

"මං බලන්නම් ස..ර්..."

අස්වීමේ ලිපිය බාරදී මධුවන්ත පාරට බැස්සේ ජීවිතයේ තිබූ තවත් දෙයක් තමාට නැති වූවා නොවේදැයි සිතමිනි. නපුරු කාලය පැමිණි විට එහෙමය. ජීවිතයේ තිබූ සියල්ල අහිමි වෙයි.

ආනන්ද භවන් අවන්හල පිහිටියේ මධුවන්ත සේවය කළ කාලෝ





ආයතනය අසළම වාගේය. ඔහු එයට ගොඩවී තේ එකක් පමණක් ගත්තේය... ආනන්ද භවන් හි උණු උණුවෙන් දමන තෝසේ ඉදි ආප්ප ඉට්ලි ආප්ප දැක දැකත් ඔහු තේ එකක් පමණක් බිව්වේය. දැන් මේ බඩට අමුතුවෙන් බඩගින්නක් එන්නේ නැත.

ඉස්සරම... මේ ආදරයේ මුල්ම දවස්වලම මේ අවන්හලට උදේ කෑමට ආ අයුරු මධුවන්තට සිහි විය... උණු උණු අල මසාල සමඟ මුසු කර උණු තෝසේ තැබූ අයුරු මධුවන්තට සිහි විය...

ඒ අතීතය දැන් සිංගප්පූරුවේම වළ දැමෙනු ඇත... ඒ මතක වල දූවිලි පොදක්වත් දැන් භාෂිගේ හදවතේ නැත... ඒවා ඇයට මතක් වෙන්නේ නැද්ද... නොවේනම් ඒවා බලෙන්ම ඇය අමතක කරලාද කියා මධුවන්ත සිතුවේය.

අතේ ඇති මුදල් ටික පරිස්සම් කරගෙන රැගෙන යා යුතු යැයි මධුවන්ත සිතා ගත්තේය. මොනවා හෝ පිළිවෙලක් කරගන්නා තුරු අතේ ඇත්තේ මුදල් ටිකක් පමණි. එහෙත් අයියාටත් අක්කාටත් මොනවා හෝ දෙයක් රැගෙන යා යුතුය. ඒත් සමඟම මධුවන්තට සිහිවූයේ මුතුවය.

"අන්තිම දවසේ මුතු නංගි මාත් එක්ක හිත හොඳින් නෙමේ කතා කළේ... ඇ..යි ද..න්නෑ..."

මධුවන්ත සිතුවේ තරමක් දුකිනි. එහෙත් හදවතේ ඇය ගැන ඇත්තේ නරක චිත්‍රයක් නොවේ. අයියාගේත් අක්කාගේත් මංගල්‍යය දවස්වල මේ ඇස් ඕනාකමින් ඇය දෙස බැලූ අයුරු මධුවන්තට මතකය. එහෙත් ඒ තරම් හැඩ මලකට අත පොවන්නට එදා මධුවන්තට බියක් දැනුණි. "අයියට තිබ්බ පින මට නෑ..." ඔහු එදා සිතුවේය.

එහෙත් අයියා සිංගප්පූරුවට එවා තිබූ මංගල ඡායාරූප වල තිබූ තමා ඇයට මල් කළඹක් දෙන පින්තූරය දෙස සෑහෙන වේලාවක් බලා උන් බව මධුවන්තට මතකය. "එයා තරුවක් වගේ... මං වගේ කොල්ලෙක්ට හිතන්නවත් බෑ..." එදා සිතුණේ එහෙමය...



Elegant

"මුතුටත් මොනවා හරි දෙයක් අරන් යනවා..."

මධුවන්ත සිනාගත්තේය. මධුවන්ත ටැක්සියේ යන අතරතුර කොළඹ පිහිටි නිවසේ අංකයට ඇමතුමක් ගත්තේ නිම්මි විශේෂයෙන් අවශ්‍ය මොනවා හෝ දෙයක් ඇත්දැයි දැන ගන්නටය. තමාට මේ තරම් උදව් කරන එකේ එහෙම දෙයක් වත් අක්කාත අයියාත් වෙනුවෙන් කළ යුතුය.

මධුවන්තගේ ඇමතුම ගත්තේ නිම්මි නොවේ මුතුය.

"හෙ..ලෝ..."

මුතුගේ කටහඬ මධුවන්ත අඳුනා ගත්තේය. කතා කරන්න පවා බය ගතියක් ඔහුට දැනුණි.

"නං..ගි.. ම..ම ම..ධු..ව..න්..ත..."

ඔහු කිවේ ගොත ගසමින් මෙනි. මුතු ඉහළට ගත් හුස්ම පොඩ්ඩ පහළට වත් යැව්වේ නැත.

"අ..ක්කයි අයියයි ගෙදර නෑ..."

තමාගේ කටහඬ ඕනවටත් වඩා නපුරු බව මුතු දනී. එහෙත් කරන්නට දෙයක් නැත.

"අ..ක්..ක හයට විතර එයිද නංගි..."

"මං දන්නෑ..."

මෙහෙම කතා කරන්නේ ඇයි...

"මං.. මං.. තිය..න්..නම් නංගි එහෙනම්..."

එහෙම්ම ඇය දඩාස් ගා දුරකතනය තැබුවාය. මධුවන්ත සිල්ලින. "ඔයා සල්ලි උතුරන පවුලක ඉපදිච්ච මලක් වගේ කෙල්ලෙක්... එ..හෙම කියලා ම..ට මෙහෙම කරන්නේ ඇයි.." මධුවන්ත කීවේ සිතෙනි.

දුවවද රැගෙන තව දින හතර පහකින් යන්නේ ඇයද ඉන්නා ගෙදරටය. අසරණකමට දුප්පත් කමට නොවේනම් මේ ගමන යන්නේ





නැත. කුලියට ගෙයක් ගන්නට පවා මේ හදිස්සියේ දෙන්නට මුදලක් අතේ නැත. අතේ ඇති මුදල් ටික ගෙයකට දුන් පසු දුවත් තමාත් ටික කාලයක් හෝ ජීවත් වන්නේ කෙසේද...

"ඒත් ටික කාලෙකින් මට මොකක් හරි පිළිවෙලක් හදාගන්න වෙයි... මං දිගටම හිටියොත් ඒක අයියටයි අක්කටයි ප්‍රශ්නයක් වෙනවා..." මධුවන්ත සිතුවේය. සියල්ල සිතන්නට වෙන්නේ මේ දුක්බර දීගය අතහැර ලංකාවට පය තැබූ පසුය...

* * * * * * * * * * * *

ඔහුගේ හඬ අර තරම්ම දුක්බර වූයේ ඇයිදැයි මුතු සිතුවාය. ඒ තරම් අසරණ ලෙස කතා කරද්දීත් තමා අර තරම්ම නපුරු වූ හැටි පුදුමයැයි මුතුට සිතුණි. එහෙත් කරන්නට දෙයක් නැත.

මේ හිත පැරුවේ ඔහුය. ඒ පැරිල්ල මේ තරම් දුරක් කලක් ආවේ කොහොමද... මුතුම දන්නේ නැත.

ඔහු තමා ගැන කොහොම හිතාගෙන ඉන්නවාද කියා මුතු සිතුවාය... සමහර විට තමා මේ සල්ලිවලින් ඔළුව උදම්මවාගත් කෙල්ලෙකැයි සිතනවා විය යුතුය. ඔහු කොහොම සිතුවද දැන් කමක් නැතැයි මුතු සිතුවාය.

මුතු නිම්මිගේ ජංගම දුරකථනයට ඇමතුමක් ගත්තාය. අක්කා අත ජංගම දුරකථනයක් ඇති බව ඔහු නොදන්නවා විය යුතුය. දන්නවා නම් ඔහු ගන්නේ එයටය.

"අ..ක්කා... ඔයා කොහෙද..."

"මං චූටි... මේ ඩොක්ටර් ගාවට ටිකක් ආවා..."

"ඩො..ක්..ට..ර් ගාවට... ඔයා අසනීපෙන්ද..."

"අසනීපයක් නෙමේ ර..න්තරන්... මං ඇවින් කියන්නම්..."



Elegantta.com

"ඇයි අක්කේ..."

"මේ ලේඩි ඩොක්ටර් කෙනෙක් හම්බවෙන්න ආවේ... බබාලා චු..ට්ටක් පරක්කුයිනේ චූටි..."

අක්කාගේ හඬේ චූයේ සඟවා ගත් දුකකැයි මුතුට සිතුණි.

"මං හි..තුවා ඔයාලා බ..බාලට දැ..න්..මම ආස නෑ කියලා..."

"දන්නවද අයියයි මායි ඉන්නේ හරි දුකින්... අපි දෙන්නම වෙතු කළා... එහෙම ප්‍රශ්නෙකුත් නෑ..."

"එ..හෙම වෙනවද ඔය දෙන්නට... ඉතින් දැ..න්..."

"නෑ මේ හොඳ ඩොක්ටර් කෙනෙක්... මං නිකං ආවා හම්බවෙන්න..."

හැමෝගෙම ජීවිතවල ප්‍රශ්නය. නොලැබීමය. මේ ජීවිතයත් පුදුමාකාර ජීවිතයකැයි මුතුට සිතුණි.

"ඇයි චූටි කතා කළේ..."

"නෑ.. මේ.. අ..රයා ක..තා කළා..."

"අරයා කිව්වේ..."

"අර සිංගප්පූරුවේ පිස්සා අ..නේ..."

නිම්මි සිනාසුණාය.

"මල්ලි මොනාද කිව්වේ චූටි..."

"මං යනවද එයත් එක්ක කදේ දාගෙන... කතා කරපු නිසා මං මේ ඔයාට කිව්වේ..."

"මං කොල්ලට ගත්තම්..."

අක්කා ඔහු ගැන කතා කරන්නේ පුදුමාකාර ආදරයකිනි. කැක්කුමකිනි. ඇයට ඔහු පෙනෙනවා ඇත්තේ ආදරබර මල්ලි





කෙනෙක් ලෙස විය යුතුය.

මුතුට බැලුණේ ඇගේ ජංගම දුරකථනය දෙසය. එයට කෙටි පණිවිඩයක් ලැබී තිබුණි. මුතු එය විවෘත කළාය. Call me... පණිවිඩය තබා තිබුණේ කාංචනය. ඔහු එහෙමය. ඔහු ඕනකමක් තිබුණද ඔහු තමාට කතා කරන්නේ නැත. තමා කතා කළ යුතුය.

මුතු ජංගම දුරකතනය වසා දමා ඇදේ පෙරලුණාය.

ජීවිතය පුරා පැතිර ඇත්තේ කොතරම් කටුක පාළුවක්දැයි මුතු සිතුවාය. මේ පාළුව මෙහෙමම අක්කාද විඳින්නට ඇත. ඇය ප්‍රියමන්ත අයියා වැනි ගුණයහපත් දුප්පත් කොල්ලෙක් සොයා ගත්තේ ඒ නිසා විය යුතුය. දෙන්නා පණට පණය. එක්කෙනෙක්ගේ වලිගය අනෙකාය. මහ රැක බැලුවද දෙන්නා ඉන්නේ ඇහැරීගෙන කතා කරමිනි.

එතරම් රෑ වී ඇහැරීගෙන කතා කරන්නට ඇත්තේ මොනවාදැයි මුතු සිතුවාය... කාංචන ආ විට කතා කරන්නට කිසිම දෙයක් නැත. වචන දෙක තුනක් හෝ සොයා ගන්නේ පුදුම දුකක් විඳය.

සුවඳ හමන්නේ අහිංසක මල් වලින් පමණි. ආදරයත් එහෙම යැයි මුතුට සිතුණි.



Elegantbooks.com

# 08

**නිම්මි** මධුවන්තට ගත්තේ ගෙදර ආ පසුය. ඇය ඇමතුම ගත්තේ කාමරයට වී ඇගේ ජංගම දුරකථනයෙනි.

"මල්ලියේ මම..."

"මං අක්කට ගත්තා..."

"මං පොඩ්ඩක් එළියට ගියා මල්ලී... කෙල්ලද ගත්තේ..."

"ඔ..ව්..."

මධුවන්ත කීවේ උගුරින් මෙනි.

"ලංකාවෙන් යන්න කලින් දෙන්නා අතරේ මොනාහරි ප්‍රශ්නයක්





උනාද..."

නිම්මි ඇසුවේ නිකමටය.

"මු..තු එ..ක්ක..."

"ම්..."

"අ..නේ නෑ අ..ක්..කේ... මං.. නංගි එක්ක කතා කරල තියෙන්නෙත් වචන දෙක තුනයි... ඇයි අක්කේ..."

"නෑ... මං නිකං ඇහුවේ..."

"මුතු මා එක්ක වැඩිය ක..තා නෑ..."

"කෙල්ල ගැන අහිතක් හිතන්නෙපා... කෙල්ලත් මං වගේම තමා... ආවම යාළුවෙයි..."

මධුවන්ත සිනාසුණා පමණි.

"ක..තා කළේ අක්කේ සිංගප්පූරුවෙන් මොනාහරි ගේන්නෝනද කියලා අහන්න..."

"අ..නේ.. ඔයා එන්න මහත්තයෝ... මට වෙන මොනාත් එපා..."

"අනේ එහෙම කියන්නෙපා අක්කේ... මං දුවටත් බඩු ටිකක් ගන්න සාප්පු දෙක තුනකට යනවා..."

"අනේ.. මට එහෙම මොනවත් එපා මල්ලි..."

"මං බලලා ගේන්නම්..."

"දැන් එන්න ලෑස්තිද..."

"ඔ..ව් අක්කේ... මං අද රස්සාවෙනුත් අස් වුණා..."

ඔහු එය කීවේ අපමණ දුකකිනි.

"මෙහෙන් ජොබ් එකක් හොයාගන්න පුළුවන් මල්ලි..."



Elegantal.com

"ආවාම ඉක්මනට පිළිවෙලක් කරගන්නවා අක්කේ..."

"හිමිහිට බලමු..."

අක්කා මුතු සමඟ ලංකාවෙන් යන්නට පෙර ප්‍රශ්නයක් වුවාද කියා ඇසුවේ ඇයිදැයි මධුවන්ත සිතුවේය. බැල්මකින්වත් ඇයට වරදක් කළ බවක් මධුවන්තට මතක් නැත.

"බලලා හොඳ තෑග්ගක් අරන් යනවා... එයා තරහ වෙලා ඉඳිද්දී මං කොහොමද ඒ ගෙදර දරුවෙකුත් තියාගෙන ඉන්නේ..."

මධුවන්ත සිතුවේ අසරණවය.

* * * * * * * * * * *

මධුවන්ත එද්දී භාෂිගේ අනියම් පෙම්වතා වූ කුමාර් අපාට්මන්ට් ගොඩනැගිල්ලේ පහළ වාහනය නවතාගෙන උන්නේය. ඔහු මධුවන්තව දැක අහක බලාගත්තේය. "පුංචි පවුලක් කඩා දැම්මාට ස්තුතියි" කියා කියන්නට මධුවන්තට සිතුණි. එහෙත් ඔහු කරබාගෙන ආවේය. අතහැර දමන දීගය රැක ගන්නට දැන් කිසිවෙක් වැඩක් නැත. ඒ දීගය ගියා ගියාමය.

භාෂිණිට වඩා ලස්සන කෙල්ලෙක් කුමාර්ට ලැබුණ දවසට ඔහු භාෂිණිව පාවිච්චි කර ඉවත ලන කඩදාසි සර්වියට් එකක් මෙන් ඉවත දමන බව මධුවන්ත දනී. ඒත් මේ ගැණි එය තේරුම් ගන්නේ නැත.

කවදා හෝ දවසක ඇයට මේ සිංගප්පූරුවෙන් පිට වෙන්නට වෙන්නේ තමාටත් වඩා අඬමිනි. ඒත් ලෝකයේ බොහෝ ගැහැණු මෙන්ම භාෂිණිටද ඇත්ත තේරුම් යද්දී ප්‍රමාද වූවා වැඩිය.

භාෂිණි උන්නේ ඇඳගෙන දොරකඩටම වීය. දුව බිම දණ ගාමින් අඬමින් උන්නාය. "උඹ මේ ජීවිතේ දාලා දුවන්න බලන් ඉන්නේ... පලයන්... ඉක්මනටම පලයන්..." මධුවන්ත කීවේ සිතෙනි.





"මං දන්නවා යන්න හදිස්සියි කියලා... එයා හිටපු විදිහට තව ටිකක් ඉඳී... පොඩ්ඩකට ඉන්න..."

යන්නට ගිය භාෂිණිව මධුවන්ත නවතා ගත්තේය.

"මේ ගේ මොකද කරන්නේ... ඉන්නවද... මං බාර දෙන්නද..."

"දෙන්න... මට ඉන්න තැනක් තියෙනවා..."

"උඹටත් මට වගේ ඉන්න හිටින්න තැනක් නැති වෙයි දවසක..." මධුවන්ත සිතින් කීවේය.

"මං යනවා..."

මධුවන්තට තව මොනවා හෝ කියන්නට තිබුණි. එහෙත් ඇය නොනවතින බව ඔහු දනී. කෙල්ල පැමිණ ඔහුගේ දෙපා වල දැවටෙන්නට විය... මධුවන්ත දුවව වඩා ගත්තේ අඬමින් මෙනි.

"අ..නේ ම..ගේ සත්තරං පැටියා... කෑවද අම්මියෝ..."

"තා..තා බඩ.. මේ..."

කෙල්ල බඩ පෙන්නා කියන්නේ බඩගිනි බවය... මධුවන්තගේ දෑස් තෙමී ගියේය.

"අ..ම්..මියා එ..ක්ක මොනාහරි කන්නෙපායැ මැණික.. ම්..."

"බි..ක්..ක..ට් අපා..."

කෙල්ල කියන්නේ බිස්කට් එපා බවය. භාෂිණි දවල්ට කරන්නේ ඒකය... දුව බඩගිනි වී අඬන කල ඇය මොනවා හෝ විස්කෝතුවක් කෙල්ල අතේ තබයි. කෙල්ලට විස්කෝතු එපා වී ඇත්තේ ඒකය.

"මං පැටියට නූඩ්ල්ස් ගෙනාව... නූඩ්ල්ස් ආසයි නේ..."

කෙල්ලගේ ඇස් බැබලෙයි. මධුවන්ත දුවව ඇඳමත තබාගෙන රැගෙන ආ නූඩ්ල්ස් කප් එක විවර කළේය... කෙල්ල නූඩ්ල්ස් එක කාගෙන කාගෙන යද්දී මධුවන්තගේ දෙනෙත් තෙත් විය.



Elegantaks.com

"රසයි අම්මියෝ..."

"ර..සා..යි..."

ලංකාවට ගිය පසු කෙල්ලට පරිප්පු ටිකක් මාළු ටිකක් සමඟ බත් කැවිය යුතුය. සුදු අල හොද්දක් සමඟ ඉඳි ආප්ප කැවිය යුතුය. කෙල්ලන් තමා වාගේමය. ආස එහෙම කෑම වලටය.

කෙල්ල නිදා ගත්තේ බඩ පිරුණ සතුටටමය... මධුවන්තගේ බඩට වී දඟලමින් උන් ඇය නිදා ගත්තේ මධුවන්තගේ පපුවට උම්මා එකක් දීගෙනමය...

ඔහු ලෝබකමටම කෙල්ලව බඩ උඩ තබාගෙන උන්නේය. ලංකාවට ගොස් මොනවා කරන්නදැයි ඔහු එසේ ඉන්නා අතරතුර සිතුවේය. එකවර කිසිවක් මධුවන්තගේ සිතට එන්නේ නැත.

මේ තීරණය ගන්නට මධුවන්ත මේ තරම් ප්‍රමාද වූයේද ඒ නිසාය. ලංකාවට ගිය සැනින් තමාට හතර මහ නිධානය පහළ වන්නේ නැත. ලංකාවට යන්නේ කරමින් උන් රැකියාවද අතහැර දමාය. "උඹ හාමි මට තිබ්බ හැමදේම නැති කළා..." මධුවන්ත සිතින් කිවේය.

ඒ ගෙදර මහ කාලයක් ඉන්නට බැරි බව මධුවන්ත දනී. එහෙම ඉඳ ප්‍රශ්නයක් ඇති කරන්නටත් ඔහු කැමති නැත. ඒ ඉන්නා මාස දෙකේ තුනේදී ජීවිතය පිළිවෙලක් කර ගත යුතුමය.

වරක් ජීවිතය පිළිවෙලක් කරගත්තා යැයි සිතාගෙන ඒ ජීවිතය සුන්බුන් වූ පසුව යළිත් ජීවිතය පිළිවෙලක් කර ගැනීම කොතරම් දුෂ්කරද... අද මධුවන්ත අත් දකින්නේ ඒ දුෂ්කර බවය.

"මොනා උනත් අපි දෙන්නා ඉන්නවනේ... ඔයාව මං තනි කරන්නෑ..."

මධුවන්ත තම බඩ උඩ නිදාගෙන උන් දුව ඇඳ උන් පිජාමා කමිසය යටින් අත දමා ඇගේ පිට පිරිමැද කීවේය. තාත්තා කියූ දේ තේරුණාක් මෙන් කෙල්ල තව තවත් මධුවන්තට තුරුල් විය.





රවී ආවේ රෑ දහයට පමණය. මධුවන්ත ගැන රවී ඇත්තටම දුක් විය... "අනාථ වෙන්නෝන කොල්ලෙක් නෙමේ සර්..." රවී කාගෝ ආයතනයේ ප්‍රධානියා වූ මහින්දානන්ද මහතාට කීවේ පුදුමාකාර දුකකිනි. "මධුවන්ත කවදහරි නැගිටියි..." මහින්දානන්ද මහතා කීවේය. ඇත්තටම ඔහුට කවදාක හෝ හරියා යුතු යැයි රවීටද සිතුණි.

ඔහු මේ මධුවන්තව බලන්නට ආවේ තව දින කිහිපයකින් ඔහු මේ සිංගප්පූරුවෙන් යන බව දැනගෙනය.

රවී දොර ඇරගෙනම ගියේය. කෙල්ලවද බඩ උඩ තබාගෙන කවුළුවෙන් ඈත සිංගප්පූරුවේ ගොඩනැගිලි දෙස බලාගෙන කල්පනා කරන මධුවන්තව දකිද්දී රවීට හීල්ලින.

"මධූ..."

රවී කතා කළේ හෙමිහිටය.

"ආ.. මචං... උඹ රෑ එයාර් පෝට් යනවා කිව්වා නේද..."

"ෆ්ලයිට් එක අද ඩිලේ මචං... තව පැය දෙකකින් හිටියාම ඇති..."

මධුවන්ත මොහොතක් රවී දෙස බලා උන්නේය.

"මං.. අද කාගෝ එකින් අස් උනා මචං..."

"මට සර් කිව්වා... සර්ටත් දුකයි..."

සර්ටත් වඩා රවීට දුක බව මධුවන්ත දනී.

"ක..ව..දද මධූ යන්නේ..."

"හෙට ටිකට් ගන්නවා මචං..."

"ප්ලේන්ටියක් බොමු..."

මධුවන්ත කෙල්ලව පරිස්සමින් ඇඳ මත තබා ඇයට පෙරෙව්වේය.

"මං එනකොට කෙල්ල හොඳටම බඩගින්නේ... තාත්ති මේ බඩ

කියලා පෙත්තනවා... හාමි දවල් තිස්සෙම බිස්කට් දික් කර කර නිදි..."

රවීට හිල්ලින... මේ වැනි තාත්තා කෙනෙක් ලැබුණ එක කෙල්ලගේ වාසනාවය. දෙවියන් එමහමය. නරක දෙයක් දෙද්දී හොඳ දේකුත් දෙයි.

මධුවන්ත හිටරය ගසා ප්ලේන්ටි දෙකක් හැදුවේය. කාමෙන් ආයතනයේ කොල්ලන්ගෙන් රහටම තේ හදන්නේ මධුවන්තය.

"උඹ ගියාට පස්සේ රහට ප්ලේන්ටියක් බීලත් ඉවරයි..."

රවී කීවේ දුකෙනි. මධුවන්ත අසරණව සිනාසුණේය.

"ඉත්න පුළුවන් තම් මං ඉන්නවා මචං... නැත්නම් මෙහෙම රස්සාවක් දාලා යන්නෑ..."

"හිත හදාගනිං මචං... හිත කෙළින් තියාගෙන ලංකාවට පලයන්... කඩා වැටෙන්නෙපා..."

කඩා වැටී බොහෝ කල්ය. දැන් මේ හදන්නේ ගොඩ එන්නටය.

"කරන දෙයක් ගිහින් හිතනවා මචං..."

"අපි මොනාහරි කරමු... උඩට යන්න මොනාද ඕන..."

මධුවන්ත රවී දෙස බැලුවේ කෘතගුණ පූර්වකවය. ඔහු එසේ අසන්නේ ඇත්තටම බව මධුවන්ත දනී.

"විශේෂ දෙයක් නෑ මචං..."

"මං කෙල්ලට ඇදුම් ටිකක් අරන් දෙන්නම්... ගියාම උඹට දුවත්තෝන නෑ එතකොට..."

"මෙහෙමවත් උඹ මං ගැන බලනවට පින්... ලංකාවට ගියාම උඹත් මට නෑ..."

"මාත් ඉක්මනටම ලංකාවට එනවා මචං... ඇවිත් මාත් සෙට්





වෙන්නෝන..."

"බ..දින..වද..."

මධුවන්ත ඇසුවේ ඒ වචනය බර කරය.

"තනියම ඉන්න එක නිදහස් කියලත් හිතෙනවා මචං..."

"හැම ගෑණිම මෙහෙම නෑ මචං... මං පූරුවේ පවක් ගෙව්වේ..."

"ඒකම උඹත් හිතපං... හැම ගෑණිම මෙහෙම නෑ... උඹට දිගටම තනියම ජීවත් වෙන්න බෑ..."

මධුවන්ත සිනාසුණේය. එය දුක්බර අමිහිරි සිනහවකි.

"ආදරේ දුන්න දුක ආත්ම හතකට ඇති මචං..."

මධුවන්ත කීවේය. ඒ දුකින් මේ පපුව ගිනිගත් හැටි කවුරුවත් දන්නේ නැත. අද මේ ඇත්තේ පපුවක් නොවේ. ගිනිගත් අළු දූලි ගොඩකි.

"අම්මෙක් තාත්තෙක් ගෙයක් දොරක් තිබ්බනම් කියල දැන් තමා හිතෙන්නේ මචං... මට අයියා ගාව මාස දෙකක් ඉන්න පුළුවන්... වැඩිම උනොත් මාස හතරක්... ඊට පස්සේ මං ආයෙත් පටන් ගත්ත තැනටම එනවා..."

"අපි මොකක් හරි ක්‍රමයක් හදා ගමු මචං..."

"දැන් හිතුවට හිතෙන්නෑ මචං... ඔළුවම අවුල්... මෙහේ එයාපෝට් එකෙත් ගියාට පස්සේ හිතනවා..."

"මොකක් හරි මාර්ගයක් තියෙයි මචූ..."

රවී කීවේ කොල්ලාගේ හිත හදන්නටය. කටින් කියනවාට වඩා ජීවිතය දුෂ්කර බව රවීද දනී.

මුතු නිම්මිව ගෙයි හැමතැනම හෙව්වාය. ඇය පෙනෙන්නට නැත. ගෙදර අයත් පෙනෙන්නට නැති විට මළ මූසලය.

"අක්කව දැක්කද පද්මා..."

මුතු ඇසුවේ ගෙදර මෙහෙකාරියකගෙනි.

"සුදු නෝනා එහා පැත්තේ කෑල්ල අස් කරනවා වුටි නෝනා..."

ඇය පෙනෙනන්ට නැත්තේ ඒකය. අක්කා මේ අස් කරත්තේ මධුවන්තට දෙන ඇනෙක්ස් කෑල්ලය. එය කළින් පාවිච්චි කළේ ලැන්ඩ් සේල්ස් එකේ රියදුරන්ය.

සාගරයක් වැනි ගෙදර හිස් කාමර ඕන තරම්ය. ඇතුල් කාමර අවුරුද්දකින් ඇර නැත. ඒ හැම එකකටම ඇතුලෙන් නාන කාමර ඇත. එනෙම නියෙද්දී මධුවන්තට අක්කා ඉල්ලුවේ මේ රියදුරන් සිටි ඇනෙක්ස් කෑල්ලය. එහෙම කළේ ඇගේ අසරණකමට බව මුතු දනී.

මුතු ඒ පැත්තට ගියේ විශාල පෝටිකෝව හරහාය. එය පිහිටා ඇත්තේ ගෙයි වම්පස තණ බිස්සට මුහුණලාය. විශාල අඹ ගස යටින් ගොස් මුතු ඒ කෑල්ලට ආවාය. නිම්මි උන්නේ දූවිලි නාගෙනය. ඇය ගෙදරට වැඩට ඉන්නා කෙනාවද අල්ලාගෙන උදේ පාන්දර සිට මෙක ඇතුලේය.

"මං ඔයාව හැමතැනම හෙව්වා..."

මුතු කීවේ නිම්මි දෙස බලා දුකෙනි. ඇය මේ දුක් විඳින්නේ ඇගේ මස්සිනා නිසාය. ඔහුට ඇති ලෙන්ගතුකම නිසාය.

"හොඳටම ජරා වෙලා වුටි... හිටපු ඩ්‍රයිවර්ස්ලා බල්ලෝ වගේ ඉඳලා තියෙන්නේ... කොල්ලට දෙන්නත් මොකක්ද වගේ..."

ඇය කීවේ අසරණවය. මුතු කිසිවක් කියා ගත නොහැකිව බලා උන්නාය.

"මේ..ක..ත් ඉල්ලගත්තේ දාහක් වැදුම් වැඳලා... පුංචි පැටියෙක් එක්ක කොහොම ඉන්නද..."

එහි ඇත්තේ කාමරයකුත් කුඩා කුස්සියකුත් නාන කාමරයකුත්ය. මේ ඇනෙක්ස් එක මේ සුර විමනක් බදු ගෙදරටම අයිති නැනකැයි





කියන්නටත් බැරි තරම්ය.

"වැඩට ඉන්න කෙනෙක්ටත් දෙන්න බෑ..."

නිම්මිගේ ඇස්වල කඳුළුය.

"අයියට මං පෙන්නුවේ නෑ... එයාට දුක හිතෙයි... ඒකයි මේ එයා නැති වෙලාවේ අස් කරන්න ගත්තේ..."

"ඉ..ති..න් අ..ක්..කා තා..ත්තගෙන් අහ..න්..නෙපැයි ඇතුලේ රූම් එ..ක..ක්..."

"නවත්ත ගන්න තව කවුරුවත් නැද්ද කියලා අහයි... මේක දුන්නෙත් මගේ මූණට බෑ කියන්න බැරි නිසා..."

ඔහු පැමිණ කොහොම මේ ගෙදර ඉන්නදැයි මුතුද සිතුවාය.

"මොනවා කරන්නද වුටි... කොල්ලා අමාරුවේ වැටිච්ච වෙලාවනේ... මං උදව් කරන්නම එපැයි..."

මේ ප්‍රශ්නයේදී අක්කාට මීට වඩා උදව් කරන්නට බැරි වීම ගැන මුතු තැවුණාය. එසේ කරන්නට බැරි මධුවන්ත නිසාය.

"සේ..න එහෙනම් මට හෙට තීන්ත ටි..කක් ගාලා දෙන්න හොඳේ..."

"ගා..න්..නම් සුදු නෝනා..."

"තීන්ත ටිකක් ගාලා බිම හෝදනවා..."

බිමට දමා ඇත්තේ සිමෙන්තිය. මුතුට සිහිවූයේ නිවෙසට අල්ලා ඇති වටිනා ටයිල්ය. ඒවා වලින් මුහුණ පෙනෙන ගාණය.

"කෙල්ලට දෙකට කිට්ටුයිලු... ඇවිදින්න පටන් ගන්න වයස... මේ.. පොළොවේ ගිහින් නංගී..."

අක්කා මේවා තමාට නොකියනවානම් හොඳය. කියන්නට දුක වැඩිය.



Elegantta.com

"මෙහෙම අපෙන් හිඟා කන්න ඔන කොල්ලෙක් නෙමේ... ලස්සනට ජීවත් වෙන්න පටන් ගත්තා... මොනා කරන්නද... ඒකගෙත් තරක කාලේ..."

ඇත්තටම ඔහු එවැනි ආදරයක පැටලුනේ ඔහුගේ තරක කාලයටය.

"එ..යා..ට සිංගප්පූරුවෙම ඉන්න තිබ්බනේ... ඔ.ක්..කො..ම දාලා එ..න්..නේ..."

"ජීවිතේ එහෙම වුණාම වෙන දේවල් උඹයි මායි දන්නෑ වූවි... අර දුවවත් හදාගෙන ජීවත් වෙන්න කොල්ලා හිතුව... ඒකයි මට පුදුම..."

ඇත්තටම පිරිමියෙක් එහෙම සිතූ එක පුදුමය. දිගය වැරදුන විට පිරිමි කරන්නේ ගෑණි සමඟ දරුවෝත් දමා වෙන ගෑණියෙක් අල්ලා ගැනීමය.

"අ..ක්..කේ මේ... කා..ම..රේ බඩු නෑ..නේ..."

ඇත්තේ අබලන් වූ මේසයක් පමණි.

"ම..ම්... මං තාත්තටයි දුවටයි නිදාගන්න ඇඳකුයි කබඩ් එකකුයි මේසෙකුයි ගන්නවා... අයියා සල්ලි දෙයි..."

මේ ගෙදර හැම කාමරයකම සැප ඇඳකුත් අල්මාරියකුත් කබඩ් එකකුත් මේසයකුත් ඇත. ඒවා වල නිදාගන්නට බල්ලෝවත් නැත.

කොහොමත් මධුවන්ත වැඩි දවසක මේ ගෙදර ඉන්න එකක් නැත. ඵුතුට එසේ සිතුණි. ඉක්මනට ඔහු කොහේ හෝ යනවානම් හොඳය. එවිට මේ හිතට බරක් නැත.





# 09

ගුවන් ටිකට් පත් දෙක අතට ගනිද්දී මධුවන්තට හිල්ලින... දුවගේත් තමාගේත් ගුවන් ටිකට් පත් පමණක් මෙහෙම කවදාක හෝ ලබා ගන්නට වේයැයි ඔහු කිසි දිනයක සිතුවේ නැත. එහෙත් දෛවය හිතනා පතනා දේට වඩා නපුරුය. රුදුරුය.

ශ්‍රී ලංකාවට යන්නට තිබුණේ දාහත් වෙනිදාය. සෙනසුරාදා රෑය... සිංගප්පූරුවෙන් පිටත් වෙන්නට ඇත්තේ සිකුරාදා රෑය... සෙනසුරාදා උදේ වෙද්දී ලංකාවේය...

මධුවන්තට ඔහු ගත් තීරණය පපුවටම දැනෙන්නට ගත්තේ ගුවන් ටිකට් පත් දෙක අතට ගත් විටය. මේ සමු දෙන්නේ වසර තුනක ආදර කතාවකටය. එහෙත් ඒ කතාවේ ආදරය බින්දුවක් වත් නොතිබූ බව මධුවන්තට විශ්වාසය. ආදරය කරන්නට ඇත්තේ තමා



Elegantbooks.com

පමණි.

මධුවන්නට පුදුමාකාර වෙහෙසක් තෙහෙට්ටුවක් දැනුණි. ගමන යන්නට ඇත්තේ අනිද්දා රෑටය... පුදුමය... හාෂිණීට දුවත් සමඟ කතා කරනවානම් කතා කරන්නට ඇත්තේ අදත් හෙටත් පමණි.

ඔහු හාෂිණීගේ ජංගම දුරකථනයට ඇමතුමක් ගත්තේ යන දිනය කියන්නටම නොවේ. මේ දවස් දෙකවත් දුවත් එක්ක ආදරෙන් ඉන්නයැයි කියන්නටය. අඩුම ගණනේ අනිද්දා දුවත් තමාත් යන බව අසාවත් ඇයට දුක හිතේයැයි ඔහු යටි සිතෙන් සිතුවේය.

"හා..ෂි ම..ම..."

"කියන්න..."

ඒ වචන වල ආදරයක් සෙනෙහසක් නොව පුංචි හිතවත්කමක් වත් ගෑවිලාවත් නැත.

"ම.. මම ටිකට් දෙක ගත්තා... මේ දැන් ගත්තේ..."

"කවදද යන්නේ..."

හාෂිණි ගත් කටටම ඇසුවාය.

"ෆ්ලයිට් එක තියෙන්නේ අනිද්දා රෑට..."

හාෂිණි කතා කළේ නැත.

"හාෂි..."

ඔහු එවර කතා කළේ අසරණ හඬිණි.

"කි..ය..න්..න..."

"මං නා..ම ටි..ක..ට් ගත්තා විතරයි... ගි..යේ නෑ... ඕ..නනම්.."

"මධූ යන්න..."

ඒ වචන මධුවන්තගේ පපුව හිරි වට්ටවාලීය.

"දු..ව එ..ක්..ක අදයි හෙටයි වත් ටි..ක..ක් ඉන්..න..."





"ම.. මං දුවට ඇදුම් ටිකක් අරන් දෙන්නම්... අරන් යන්න..."

මධුවන්ත සිනාසුණේ මේ අම්මාටය. ලෝකයේ ඉන්නා අකාරුණිකම අම්මා හාෂිණීදැයි ඔහු සිතුවේය.

මධුවන්ත එහෙමම ඉබාගාතේ ඇවිදගෙන ගියේය... වීදියේ විවෘත අවන්හලක දමා තිබූ පුටුවක ඔහු අසුන් ගත්තේ බඩගින්නටම නොවේ. මහන්සියටය.

"ටී ප්ලීස්..."

ඔහු චීන සේවකයාට කීවේය... සිංගප්පූරුවෙන් තේ එකක් පවා බොන අවසාන දවස දෙක අදත් හෙටත්ය.

මධුවන්ත ඒ ඉන්නා අතරම අයියාට ඇමතුමක් ගත්තේය.

"අයියේ... මම..."

"ම..ල්ලි... කොහොමද වැඩ ටික..."

"මං මං අයියේ ටිකට් ගත්තා..."

ප්‍රියමන්ත මොහොතක් නිහඬව උන්නේය.

"ඒ..ක හොඳයි.. කවදද ෆ්ලයිට් එක..."

"අ..නි..ද්දා අයියේ... සිකුරාදා රෑට මෙහෙන් නගින්න තියෙන්නේ... සෙනසුරාදා පාන්දර ලංකාවේ..."

"උ..ඔ ඉක්මනට එන එක හොඳයි... වරෙන්... ම..ට උඹට මහ ලොකු දෙයක් ලෑස්ති කරලා දෙන්නනම් බැරි වු..ණා කොල්ලෝ... ඒත් වරෙන්..."

අයියා එහෙම කීවේ ඇයි...

"ඇයි අයියේ..."

"නෑ මල්ලි... මං ගෙදර තියෙන පොඩි ඇනෙක්ස් එකක් උඹට ඉල්ල ගත්තේ..."



Elegantta

"ම.. ම..ට ඒ ඇති අයියේ..."

"අපි ආවාම පිළිවෙලක් කරගමු..."

"අයියටත් මං නිසා කරදර..."

"උඹට පිස්සුද... නිම්මි අක්ක අරහේ බලන් ඉන්නවා උඹ එනකම්... දුවටත් ටිකට් ගත්තද..."

"ඔ..ව් අයියේ..."

"මොකද ගැණි කියන්නේ..."

"අ..න්තිම මොහොතේවත් හිත වෙනස් කර ගනී කියලා මං බලන් උන්නේ... ඒ ගැණි මඩේමයි ලගින්නේ අයියේ..."

"උඹ වරෙන්..."

"අ..යියේ..."

"මල්ලී..."

"කරදරයක් නෑ නේද..."

මධුවන්ත ඇසුවේ උගුරෙන් මෙනි.

"උඹ වරෙන්කෝ..."

ප්‍රියමන්ත කීවේ එපමණකි. මධුවන්ත සැහෙන්න සිතුවේය. ලංකාවට ගොස් ඉක්මනට පිළිවෙලක් විය යුතුය. එහෙත් ඒ කෙසේද...

මධුවන්ත ආවේ සවස හයට පමණය. ඔහු එද්දී හාෂිණීත් දුවත් අපාට්මන්ට් නිවසේ උන්නේ නැත. හාෂි දුවත් සමඟ එළියට යන්නට ඇතැයි මධුවන්ත සිතුවේය... හාෂිණී තමා ගැන නැතත් දුව ගැනවත් තැවෙනැයි ඔහු සිතුවේය. එහෙමවත් දුක් වෙනවානම් හොඳය.

සියළු බැඳීම් හෙට්ටින් නිමා කළ හැක. එහෙත් හාෂි දුවගේ අම්මා බව අමතක කළ නොහැක. කෙල්ලව අම්මාගෙන් වෙන් කරන්නට ඔහු කෙදිනකවත් සිතුවේ නැත. මේ තීරණය ගන්නට මේ තරම්





ප්‍රමාද වූයේද ඒ නිසාය.

එහෙත් හාෂි බුරුල දෙන්නට දෙන්නට තව තවත් ඇත් වන ගැහැණියකි. දැන් ඒ සරුංගලය අල්ලාගෙන උන් නූල කැඩී අවසන්ය. තමා නූල අතහැරියාද නැතහොත් සරුංගලය තමාව දමා ගියාද කියා දන්නේ නැත.

ජීවිතය මැද ආවාටයක් මෙන් විශාල දෙදරීමක් හට ගත් බව පමණක් ඔහු දනී.

මධුවන්ත හතට පමණ හාෂිගේ ජංගම දුරකථනයට ගත්තේය.

"මං දුවත් එක්ක බඩු ටිකක් ගන්න ආවා..."

"ක..ම..ක් නෑ..."

"ඉක්මනට දුවව ගේන්නම්..."

"එහෙනම් ගේන්නෝන නෑ... දුව මගේ විතරක් නෙමේනේ..."

මධුවන්ත දුරකථනය තැබුවේ එසේ කියාය. මෙහෙම දුවත් සමඟ ඉද්දීවත් ඇගේ හිත මෙලෙක් වෙනවානම් කියා මධුවන්තට සිතුණි. ප්‍රාතිහාර්යකින් වත් එසේ වෙනවානම් අතීතය නම් වූ කුණු කන්දම අමතක කර දමන්නට ඔහු සූදානම්ය.

අද රෑ නිදාගත නොහැක... දුවගේත් තමාගේත් ඇඳුම් සියල්ල පැක් කළ යුතුය. මධුවන්ත ඇඳමත ඇලවුණේ පාළුවෙනි. හාෂිණිගෙන් වෙන්ව ඉන්නට සිදුවූයේ දෙවයේ වරදිනි... ඒ සිදුවීම් වූ මුල් කාලයේ මධුවන්ත එය දරා ගත්තේ පුදුමාකාර අමාරුවෙනි. එහෙත් දුව නැතුව කොහොමටත් තමාට ඉන්නට බැරි බව ඔහු සිතුවේය.

මධුවන්තගේ දුරකථනයට ඇමතුමක් ලැබිණි. කතා කළේ නිම්මිය.

"මල්ලි මට අයියා කිව්වා හෙට එනවා කියලා..."

"ලංකාවට එද්දී අනිද්දා පාන්දර වෙනවා අක්කේ..."

"කතා කළේ මල්ලි අපි එයාර් පෝට් එන්නද කියලා අහන්න...

ඔයාව ගන්න..."

"අ..නේ.. පාන්දරනේ අක්කේ... මට ටැක්සියක් අරන් එන්න පුළුවන්..."

"ඕන්නම් අයියයි මායි එන්නම් මල්ලී..."

"කරදරයක්නේ අක්කේ... ෆ්ලයිට් සිලේ උනොත් අමාරුයි... මං එන්නම්..."

"මී.. ගේ මතකයි නේද..."

"මතකයි අක්කේ..."

"පරිස්සමින් එන්න..."

මේ වෙලාවේ අයියාගේත් අක්කාගේත් උදව් නොලැබුණා නම් තමා වැටෙනා අමාරුව මධුවන්ත සිහි කළේය... තමාගේම අයියා වුවද ඔහු මීට වඩා වෙනස් ලෙස සිතන කෙනෙක් හා විවාහ වී උන්නානම් මේ ප්‍රශ්නය අඩාගෙන අයියාට කිව නොහැක. මෙහෙම කියන්නට පුළුවන් වූයේ නිමිමි අක්කා නිසාය.

මේ ජීවිතයේ ඇය වෙනුවෙන් වත් අයියා වෙනුවෙන් වත් බිංදුවක යුතුකමක් ඉටු වී නැත. ඔවුන් මෙහෙම කරන්නේ එහෙම මල්ලීටය.

"අයියටයි අක්කටයි වැඩි දවසක් කරදර කරන්න බෑ..."

ලංකාවට ගිය පසු ජීවිතය ගැන මුල සිට සිතිය යුතුය... එසේ නොමැකිව කළ යුතු දෙයක් ගැන මේ තොරතෙදී සිතෙන්නේ නැත.

හාෂිණී දුවවත් රැගෙන ආවේ අටට පමණය. එද්දීම කෙල්ලට හාෂිණීගේ අතේ නින්ද ගොසිනි. නිහඬවම කාමරයට ආ හාෂී දුව ඇඳමත තැබුවාය.

"ලොකලට පෆ් එකක් ඉවර වෙනකල් කෑවා..."

හාෂිණී කීවේ මධුවන්ත දෙස යංතමට බලාය.





"නැඟිට්ටොත් මං කිරි හදලා දෙන්නම්..."

"මං.. මේ.. එයාට ඇඳුම් ටිකක් ගත්තා..."

මධුවන්ත එය ගත්තේ හාෂිණී දෙස බලාගෙනමය.

"මං අනිද්දා රෑ එයාර් පෝට් යනවා හාෂි..."

"ම්... ම..ගෙ..න් මොං..නවද කෙරෙන්නෝන..."

කළ යුතුම දේ නොකළ බිරිඳකගෙන් මේ වෙන්වෙන මොහොතේදී මොනවා ඉල්ලන්නද...

"අ..පි ගියාම ඔයාට දුවව මතක් වෙයි..."

මධුවන්ත කීවේ බීම බලාගෙනය. දෙවියෙක් මේ සිදුවීම බලා උන්නා නම් ඔහු පවා අඬනු ඇත. ඔබ වහන්සේගේ ආදරය කියා දෙයක් මවා ඒ ආදරය සමඟ මෙවන් කටුක වෙන්වීමක්ද මැවිවේය. ඒ ඇයි...

"ගි..හි..න් ම..ට නම්බර් එ..ක..ක් දෙන්න... මං දුවට කතා කරන්නම්..."

කතා කරන්නේ දුවට විතරද..." දැන් එහෙම අසා පලක් නැත. ආදර ගසේ මල් නැත. කොළඳ හැලී ගොසිනි.

"මට යන්න තැනක් නෑ... අයියා ගාවට යන්නේ... ගිහින් පස්සේ මොකක් හරි පිළිවෙලක් කරගන්නවා..."

හාෂිණී කතා කළේ නැත.

"හාෂි..."

ඔහු කතා කළේ උගුරිනි.

"කිය..න්..න..."

"ස..ම..හ..ර විට... අ..පි ආයෙත් හම්බ වෙන එ..ක..ක් නෑ... හෙට්ටින් ප..ස්..සේ..."



Freeart.lk

ඇය කතා කළේ නැත.

"ජීවිතේ හැමදාම එක වගේ තියෙන්නෑ භාෂි..."

"මං මෙ..හෙම ජීවත් වෙනවා... මට එන්න විදිහක් නෑ..."

"මං දන්නවා... ඒත්..."

"මධූ... ඔයා යන ගමන යන්න..."

"හෙ..ට අපි එක්ක එයාර් පෝට් යං..."

භාෂිණී උන්තේ බිම බලාගෙනය.

"ඔ..යා යන්..න..."

මධුවන්ත තව මොහොතක් භාෂිණී දෙස බලා උන්තේය.

"පරක්කු වෙනවනේ... ඇඳගෙන යන්න එහෙනම්..."

ඔහු කීවේ කරුණාබරවය.





# 10

මධුවන්ත ඇඳුම් පැක් කරන්නට ගත්තේ මහ රෑය... ඇඳුම් පැක් කරද්දී ඔහුගේ දෙනෙත් තුන් වතර වතාවක්ම තෙත්විය. තමාට තියෙන්නේ පිරිමියෙකුට පිහිටිය යුතු පපුවක් නොවේයැයි මධුවන්තට සිතුණි. වරින් වර මේ පපුව කඩා වැටෙන්නේ ඒකය.

වැඩිපුර තිබුණේ ඔහුගේ ඇඳුම් නොවේ. දුවගේ ඇඳුම්ය. භාෂිණි දුවට ගෙනා ඇඳුම් ටිකද ඔහු ගෙනියන්නට ගත්තේය... ඇයට වැරදීවත් තමාටත් මොනවා හෝ ඇය අරගෙනැයි ඔහු බැලුවේය. නැත. ලේන්සුවක් වත් නැත. කඩා වැටුණ ආදර ගසේත් තමා මල් සොයනවායැයි මධුවන්තට සිතුණි.

ඇඳුම් පැක් කරද්දී මධුවන්තට බැලුනේ මේසය මත තිබූ දුවත් ඔහුත් භාෂිණීත් එකට ඉඳ ගත් ඡායාරූපයය. එය ගත්තේ දුව ඉපදී



Elegantalks.com

මාස හයෙනි... ඒ රාමු කළ ඡායාරූපය අතට ගත් මධුවන්ත එය දෙස ටික වේලාවක් බලා උන්නේය.

මේ ඡායාරූපය ගනිද්දී ජීවිතයේ තිබූ සතුටට කුමක් වීදැයි ඔහු සිතුවේය. දැන් මේ පින්තූරය භාෂිණීට වැඩක් නැති බව මධුවන්ත දනී. මේ අතීත සැමරුම් වලට මොනවා කරන්නදැයි ඔහු සිතුවේය. අවසානයේ ඔහු එය ඇඳුම් සූට් කේසයටම දමා ගත්තේය.

ඇඳුම් සියල්ල අසුරා අවසාන වෙද්දී රෑ දොළහටත් ආසන්නව තිබුණි.

මධුවන්ත රවීට ඇමතුමක් ගත්තේ ඔහු ළඟපාතක ඉන්නවා නම් කෑම එකක් ගෙන්නා ගන්නටය. ඒ තරමටම බඩගිනිය. අද දවසටම බඩට වැටුණේ තේ දෙක තුනක් පමණි.

"කියපං මධූ..."

"උඹ කොහෙද මචං..."

"මං මේ එයාර් පෝට් ඉඳලා එන ගමන්... අද නයිට් තේ මචං... තුනට ආයෙත් ෆ්ලයිට් එක තියෙන්නේ..."

"උඹ කාලද..."

"උඹ කාලද කියපන් ඉස්සෙල්ලා..."

මධුවන්ත සිනාසුණේය.

"ආනන්ද හවන් එකෙන් ඉඳි ආප්ප අරන් එන්නද... නැත්නම් ගාන්ධි එකෙන් බුරියානි අරන් එන්නද..."

"ඉඳි ආප්ප හොඳයි මචං..."

"මං එන්නම්..."

මධුවන්ත රෑ දොළහටත් සුරංගනා ලෝකයක් මෙන් දිස්වන සිංගප්පූරුව දෙස කවුළුවෙන් බලා උන්නේය... සිංගප්පූරුවේ පහන් කරන අවසාන රෑය මෙයය... හෙට දොළහයි පහට ඇති ගුවන් යානය





තමාවත් දුවවත් රැගෙන ලංකාව බලා යන්නේ ජීවිතයේ අලුත්ම යුගයක් උදා කරමිනි.

"හෙට ඉඳලා ඔයාට අම්මිටයි තාත්තියි දෙන්නටම ඉන්නේ මං..."

ඔහු ඇඳේ නිදන දුව දෙස බලාගෙන සිතුවේය. කෙල්ල අද අම්මාත් සමඟ හොඳට සතුටු වන්නට ඇත. චොකලට් පෑ එකක්ම කා ඇත්තේ ඒකය. ඒත් හෙටින් පසු...

දවසක කෙල්ල ලොකු වී අම්මා ගැන අසනු ඇත. එදාට මේ කතාවම දුවට කියන්නේ කෙසේද...

"ඔයා නෙමෙයි හාෂි අසරණ වුණේ මං..."

ඔහු සිතින් කීවේය.

රවී ආවේ ආනන්ද භවන් අවන්හලෙන් ඉඳි ආප්ප රැගෙනය. මහ රෑ වන තුරු විවෘතව තබන සිංගප්පූරුවේ අවන්හල් වල ඕනම වෙලාවක කන්නට උණු උණුවෙන් කෑම ඇත. ඉනුත් ආනන්ද භවන් අවන්හලේ ඉඳි ආප්පත් කිරි හොඳිත් මිරිස් සම්බෝලත් රසය... සිංගප්පූරුවේ ඉඳි ආප්ප ලංකාවේ ඉඳි ආප්ප මෙන් නොවේ. තසිමක් තරම් ලොකුය. ඒ ඉඳි ආප්ප තුන හතරක් කෑ විට බඩ පිරෙයි...

"ඇඳුම් පැක් කළාද මචං..."

රවී ඇසුවේ විශාල සූට් කේස් දෙක දැක දුකෙනි.

"ඔ..ව් මචං..."

"මට හාෂිව හම්බ උනා එයාර් පෝට් එකේදි..."

"ම්..."

"ගෑණිගේ මූණ එච්චරම හොඳ නෑ..."

"දුක ඇති... දුව යනවට... මං යනවට නෙමේ... අද දවසම දුවත් එක්ක එළියේ හිටියේ... මේ ඇඳුනුත් අරං ආවා..."



Elegantta

රවී හිල්ලුවේය.

"උඹත් එක්ක කතා කළාද..."

"ඔ..ව්..."

"උඹ මොනාහරි කිව්වද..."

මධුවන්ත ඇසුවේ සැකයෙනි.

"ඔ..ව්..."

"මොනාද මචං..."

"ඕන නම් උඹව දැන් උනත් නවත්තන්න පුළුවන් කිව්වා... මං උඹ ගැන දන්න තිසා කිව්වේ... ගෑණි කතා කළේ නෑ..."

"එයාට හැරෙන්න බෑ මචං..."

"ඔව්.. මං ඒක දන්නවා... හැබැයි ඉක්මනටම භාෂිට තේරෙයි... වරෙන් කමු..."

"මං හිටරේ ගහලා එන්නම්..."

රවී පුටු සැටියට ගොස් ටීපෝව මත තබා ඉදී ආප්ප පාර්සල් දෙක විවර කළේය.

"ලංකාවට ගියාම මෙහෙම නොකා නොබී ඉන්නෙපා මචං... උඹ ලෙඩ උනොත් කෙල්ලව බලා ගත්තේ කවුද..."

රවී කීවේ ආදරයෙනි.

"මං දන්නවා මචං..."

"කාපං..."

මධුවන්ත ඉදි ආප්ප උඩට කිරිහොදි දමා ගත්තේය.

"මං හෙට හවස උඹ යන තිසාම වැඩක් දාගත්තේ නෑ... මං හවස එන්නම්..."





මධුවන්ත බොඳවූ දෙනෙතින් රවී දෙස බැලුවේය.

"දැන් හිත හිටි එකේ තියාගනින්..."

රවී කොල්ලාගේ පිටට ගසා කීවේය.

* * * * * * * * * * * * *

නිම්මි උදේ කෑම මේසය වෙත ගියේ අම්මාත් මුතුත් එතැන ඉන්නා බව දැනගෙනය. හෙට මධුවන්ත එන බව ඇය ගෙදර කාටවත් කීවේ නැත. විශේෂයෙන් තාත්තාට කියන්නට නිම්මිට බයය...

"අක්කා කෑවද..."

මුතු කෑම කන අතරතුර ඇසුවාය.

"තා..ම නෑ චූ..ටි..."

"එ..හෙනම් ඉඳගෙන කමු... එන්න..."

"මොකද ලොකු දුව බයවෙලා වගේ..."

අම්මා අසද්දී නිම්මි සිනාසුණාය.

"නෑ අම්මේ එ..හෙම දෙයක් නෑ... අම්මා දැන් ගමනක් යන්නද..."

"ඔ..ව් මේ සමිතියේ කෙනෙක්ගේ ඕපනිං එකක්... නොගිහින් බෑ..."

ඇයට කොහොමත් ගෙදර වැඩ වලට වඩා ලොකු සමාජ සේවයය...

"අ..මේ... මං අ..ර කිව්වේ ප්‍රියාගේ ම..ල්ලි..."

"ඉතින්..."

"නෑ.. ඒ මල්ලි අනිද්දා ලංකාවට එනවා..."



Elegantta.com

"ආ.. ඇත්තද... මිනිහා ඔය එන්නේ වයිෆ්ගෙන් ඩිවෝස් වෙලාද..."

නිම්මි නෙත් බිමට බර කර ගත්තාය. මුතු අක්කා දෙස බලා උන්නේ වේදනාවෙනි. ඔහු හෙට ලංකාවට එන බව මුතු දන්නේ දැන්ය.

"නා..ත්..නා..ගෙ..න් මං ඇහුවනේ එ..හා පැත්තෙ ඇතෙක්ස් එක දෙන්නද කියලා..."

"ටික දවසකට දෙන්න කිව්වනේ..."

"ඔ..ව්... අම්මා කියනවද ඒ මල්ලී හෙට එනවා කියලා... නැත්නම් නා..ත්නා දන්නවනේ..."

"ඉතින් ඔයාම කියන්න..."

නිම්මි කතා කළේ නැත.

"ක..ම..ක් නෑ... මං රෑට කියන්නම්..."

නිම්මි එහෙමම හැරුණාය. කසාද බැන්ද දවසෙම කුලියට හෝ ගෙයක් රැගෙන යන්නට තිබුණා යැයි නිම්මිට සිතුණි.

"නා..ත්ති මේ ගෙදර කාවවත් නවත්ත ගන්න කැමතිම නෑ.. ඔය මෙයාගේ කරච්චලේ නිසා හා කිව්වේ... ඇත්තනේ ඉතින් ගෙවල් දොරවල් හැදුවේ අනාථ නිවාසයක් කරන්න නෙමෙනේ..."

මුතුට වී කියා සිතුණි. අම්මාගේ සමාජ සේවය මේකදැයි අසන්නට ඇයට සිතුණි. මිනිහෙක්ට තබා හරකෙකුටවත් දෙන්න බැරි කාමර කැල්ලක් දී මේ කියවන කියවිල්ල මිනිස්කමටත් නිගාවකි.

"අක්කා කොහොමත් මේ ගෙදර ඉන්න එකක් නෑ... එයාලා ගෙයක් හදන් යයි..."

"යයි යයි... තාම හරි හමන් වාහනයක් ගන්න බැරි වුණා





ප්‍රියමන්තට... මොන ගෙවල්ද..."

මුතු එහෙමම කෑම මේසයෙන් නැඟිට ගියාය... අක්කා කියන කතාව ඇත්තය. මේ ගෙදර ජීවත් වීමට හිතෙන ගෙයක් නොවේ.

* * * * * * * * * * *

මුතු කාමරයට ආවේ මධුවන්ත හෙට ලංකාවට එනවා යැයි කියද්දී ඇතිවූ මානසික කලබලයද සමඟිනි. එනවා යැයි කීවාට ඔහු මේ තරම් ඉක්මනට එතැයි මුතු සිතුවේ නැත. ඔහු හෙට සිට මේ ගෙදර අර පුංචි කාමරයේ ඉන්නවා කියා සිතද්දී පපුවට මේ තරමම බරක් දැනෙන්නේ ඇයි...

ඒ පුංචි කාමරයේ ඔහු දුවත් සමඟ ජීවත් වන්නේ කෙසේද... ඊටත් ඔහු උදේ හවා මුණගැසෙද්දී මේ පපුවට පුංචි හෝ දුකක් නොදැනේයැයි කොහොම සිතන්නද... හිත ගලක් කරගෙන ඉන්නවායැයි මුතු සිතා ගත්තාය. ඔහු උන්නද ඉන්නේ නැතුවාක් මෙන් ඉන්නවා යැයි ඇය සිතා ගත්තාය.

මුතු පහළට ගියේ නිම්මිව සොයාගෙනය. අම්මා ඇයට අද කතා කළ අයුරු ඇත්තටම හරි නැත. ඇය බැඳීම් ගැන දන්නේම නැත. ඊටත් ජීවිතයේ සියල්ලම සල්ලි වලින්ම මනින අම්මාත් තාත්තාත් ප්‍රියමන්ත දෙස බලන්නේ හිඟන්නෙක් දෙස බලන ගානටය.

අක්කාට ලැබුණේ මේ ලෝකයේ ඇයට ලැබිය හැකි හොඳම පිරිමියාය. ඔහුව නොබැන්දා නම් අදටත් ඇය දුක් විඳින ගැහැණියකි. මේ ජීවිතයේ මොන දේ නැතත් ඇය ආදරය නම් අන්තයටම විඳින බව මුතු දනී.

දවසක මේ සල්ලි වලින් හැදූ මාළිගා දමා ඇය ඇගේ සැමියා සමඟ පුංචි කාමර කැල්ලකට හෝ යන බව මුතු දැන උන්නාය.

මුතුට බය ඇය ඒ තීරණය හෙට අනිද්දාම ගනී යැයි කියාය.

නිම්මි උන්නේ අයුත් කොට්ට දෙකකට කොට්ට උර දම්මිනි.



Elegantlk.com

ඇගේ ඇස්වල වූ කඳුළු මුතු දැක්කේ ඉඳගත් පසුය.

"ඇ..යි අක්කේ..."

නිම්මිගේ උරතලයට සුරත තබා මුතු ඇසුවාය.

"අ..ම්මා ඔයාට කියපු එක මටත් ඇහුණා චූටි... එයා ඔය කිව්වේ කොහොමත් මට ඇහෙන්නත් එක්කම තමා..."

මුතුගේ පපුවම උණු වී ගියේය. තම සැමියා ගැන එසේ කියනු අසා සිටිය හැක්කේ කුමක බිරිඳටද...

"එ..යා..ලගේ කතා හිතන්නෙපා අක්කේ..."

"මෙච්චර කල් හිතුවේ නෑ චූටි... ඒත් දැන් හිතනවා... උඹ නැත්නම් මං යනවා..."

මුතුගේ දෑසින් කඳුළු වැටිණ.

"මේ සැප සම්පත් වල මට ඇති සතුටක් නෑ චූටි... මගේ මිනිහත් එක්ක කොහෙහරි වැටිලා බතක් උයාගෙන කාලා මීට වඩා සතුටින් උන්නැකි..."

"මං ද..න්..න..වා..."

"අර කොල්ලවයි දරුවයි අරම තියන්න දුකයි... ඒත් කරන්න දෙයක් නෑ..."

"අපි ටිකක් ඉවසමු..."

මුතු කීවේ නිම්මිගේ සුරත පිරිමැදය.

"මල්ලී හෙට රෑ එහෙන් ෆ්ලයිට් එකට නගිනවා... උදේ එයි... මට ඔයාට කියන්න බැරි වුණා..."

"ම්..."

"කොල්ලා අපිට කරදර කරන එකක් නෑ... ඉඳලා මොකක් හරි





ප්‍රශ්නයෙක් හදා ගනී..."

අක්කා එහෙම කීවේ මධුවන්ත එනවාට තමාත් අකමැති බව පෙන්නූ නිසාද... එහෙත් ඇත්ත කාරණය අක්කාට කිව නොහැක.

"ඒකත් මොනවා කරන්න හිතාගෙන ඉන්නවද දන්නෑ... දරුවෙකුත් එක්ක කොහොම ජීවිතේ පටන් ගන්නද..."

මේවාට මොනවා කියන්නදැයි මුතුට තේරෙන්නේ නැත.

"බ..බා... පො..ඩි..ද..."

"දෙකක් විතර ඇති මං හිතන්නේ... දුවෙක්නේ..."

මුතු යටි සිතෙන් හීල්ලුවාය. ඔහුගේ ජීවිතයම අපතේ ගියා යැයි ඇයට සිතුණි.

"එ..යාට ති..යෙ..න්..නේ ආයේ මැරි කරන්න..."

"ඒ කොල්ලා එහෙම කරයි කියලා උඹ හිතනවද... දුවවත් හදාගෙන ජීවත් වෙන්න හිත හදාගෙන ඔය එන්නේ..."

පිරිමියෙකු එසේ කරන්නේ කෙසේද... දරුවන් වෙනුවෙන් පරිත්‍යාග කරන අම්මලා මිසක තාත්තලා ගැන අසන්නට නැත.

"ජීවිතේ එහෙම දෙයක් වුණාට පස්සේ ජීවිතේට මොනවද වෙන්නේ කියලා උඹයි මායි දන්නෑ..."

මුතු නිම්මි දෙස බලා උන්නාය.

"අ..ක්කේ..."

"චූටි..."

"අක්කා හිතනවද මට කාංචන එක්ක සතුටින් ඉන්න පුළුවන් කියලා... ජීවිත කාලෙම තියා පැයක් වත් එයා එක්ක ගත කරන්න හිතෙන්නෑ... ගත කරන්න බෑ..."

"මං වැ..ඩි..ය කා..ංචන ගැ..න ද..න්..නෑ චූටි..."



Elegantbooks.com

"ඔයා දන්න තරමම තමා මාත් දන්නේ... මං ඇස් පියාගෙන මේ පානාලෙට පනින්නේ... මං ඉන්නේ ලොකු දුකක් හිර කරගෙන... කියන්න තේරෙන්නෑ අක්කේ... ඇයි මගේ ජීවිතේ එහෙම හිර කළේ..."

නිම්මි කෙල්ලව තුරුල් කර ගත්තේ පුදුමාකාර දුකකිනි. කෙල්ලට තවම විසි දෙකකි. මේ තරම් අඩු වයසකින් කෙල්ලට ජීවිතේ සතුට නැති වුවහොත් එය පව්ය.

"මං මොං..නා..හරි කරන්නෝන නම් කියාපන් වුටි..."

"සමහර විට හිතාගන්න බැරි තීරණයක් මං ගනී... එතකල් මෙහෙමම ඉන්නවා..."

නිම්මිගේ දෙපතුල්ම සීතල වීගෙන ගියේය... කෙල්ල මේ තරම් දුක් ගොඩක ඉන්නවායැයි ඇය සිතුවේ නැත.

"ටි..කක් අපි බලමු වුටි... මා..යි අයියයි බලන්නම්..."

බලන බලන තැන ප්‍රශ්නය... කෙල්ලගේ ජීවිතයට කුමක් හෝ වුවහොත් වැඩක් නැතැයි නිම්මිට සිතුණි.

"මේ ගෙදර ඔයාට අද එපා වුණේ... මට ඊට කලින් එපා වෙලා තිබ්බේ... ඒත් මං අසරණ වෙලා ඉන්නේ..."

නිම්මි දිගටම කෙල්ලව තුරුල් කරගෙන හිස පිරිමැද්දාය... "උඹට ලැබෙන්න තිබ්බේ මධුවන්ත වගේ කොල්ලෙක්ව..." නිම්මි කීවේ සිතෙනි...





# 11

**මධුවන්ත** සිංගප්පූරුවේ ගෙවන අවසාන දවසට පහත් විය. මධුවන්ත කිරි එක හදාගෙන බලා උන්නේ කෙල්ල නැඟිටින තුරුය. ඒ තරමට පාළුය. රෑත් නැඟිට කිරි බිවූ නිසා කෙල්ල නිදිය.

අද කරන්නට විශේෂ දෙයක් නැත. දැන් ඇත්තේ ඇඳගෙන දුවවද අන්දවාගෙන බැග්ද රැගෙන එයාර් පෝට් යන්නට පමණි.

සිංගප්පූරුව දමා යන්නට බැරි දුකක් මධුවන්තගේ සිතේ නැත. එහෙත් තුනී සාංකාවක් ඔහුට දැනෙයි. ජීවිතය පටන් ගත්තේ මේ බිමේදිය... පළමු රැකියාව කළේ මේ බිමේදිය. ප්‍රථම ප්‍රේමය යැයි සිතාගෙන ආදරය කරන්නට ගත්තේ මේ බිමේදිය.



Elegantalks.com

දොරට ගසද්දී මධුවන්තට පුදුම සිතුණි. හාෂිණී මේ තරම් පාන්දර එන්නේ නැත. මධුවන්ත ගොස් දොර ඇරියේ ඇහැරුණු දුවද වඩාගෙනය.

"අම්මි අද පුතාට බලන්න උදෙන්ම ඇවිත්... අපි බලමු..."

මධුවන්ත හියේ කෙල්ලව සිප ගනිමිනි. දොර ළඟ වූයේ හාෂිණිය... ඒ මුහුණ අමුතුය.

"අ..ද වැ..ඩ ඇති කියලා ආවේ..."

අවසාන දවසේවත් ඇය මෙහෙම කතා කරන එක සැනසීමකි.

"එ..හෙම කියලා වැඩක් නෑ හාෂි... තේ බීලද ආවේ..."

හාෂිණී කතා කළේ නැත.

"මාත් බීලා නෑ... තේ හදන්නම්... ආ දුවට මේ කිරි එක දෙන්න..."

හාෂිණී දුවව හාෂිණී අතට ගත්තාය. ඒ දෙද්දී ඔහු ළං ළංව ඇගේ මුහුණ බලා ගත්තාය.

"අ..මි..මි කු..ක්..කු..."

"ඉන්න පැටියෝ..."

මධුවන්ත නිහඬවම තේ හැදුවේය. හාෂිණී දුවව ඇඳ මත තබාගෙන ඇයට කිරි බෝතලය දුන්නේ ඒ මුහුණ දෙසම බලාගෙනය.

මධුවන්ත කවදාටත් වඩා හොඳින් තේක හැදුවේය. ඔහු හාෂිණීගේ කෝප්පයට තේ එක දැමුවේ ඒ කෝප්පය දෙස විශේෂයෙන් බලමිනි. සුපුරු වලස් පැටියෙක් රතු හාට් එකක් තුරුල් කරගෙන ඉන්හා මේ කෝප්පය ඇයට අරගෙන දුන්නේ මධුවන්තය. ඒ සිංගප්පූරුවේ සාප්පු සවාරියේ යන ගමනකදීය.

"ආ.. තේ..ක... මගෙන් බොන අන්තිම තේක..."

ඔහු තේක දුන්නේ එසේ කියාය. හාෂිණී එය අතට ගත්තේ මධුවන්ත දෙස බලාගෙනය.





"ම..ධු..."

හාෂිණී කතා කළේ පහත් හඬිනි.

ඇයට මොනවා හෝ කියන්නට ඇති බව මධුවන්ත දැනගත්තේ ඒ මුහුණු දුටු මොහොතේමය. මේ අවසාන මොහොතේ ඇය කියන්නට යන්නේ මොනවාද...

"කි..ය..න්..න හාෂි..."

හාෂිණී එකවර කතා කළේ නැත.

"ගි..හි..න් මො..නාද කරන්නේ..."

හාෂිණී ඇසුවේ අසන්නට ගිය දේ නොවන බව මධුවන්ත දනී.

"එ..ක..පාර ජීවිතේට හෙණ වැදුනා වගේනේ... මො..නා කරන්නද කියලා හිතා ගන්නේ කොහොමද... මට සිංගප්පූරුවේ ඉන්න බෑ හාෂි... ලංකාවට ගිහින් මොනාහරි හිතනවා..."

"දු..ව..ව දා..ලා ජොබ් එකක් කරන්න බෑ නේ..ද..."

"මී.. මං මොනවා හරි කරලා දුවව ලොකු මහත් කරනවා..."

මධුවන්ත කීවේ අධිෂ්ඨානයෙනි. ජීවිතේ සමහර තීරණ ගන්නේ එය කොහොම කරනවාද කියා හිතාගෙන නොවේ. කොහොම හරි කරනවා යැයි සිතාගෙනය.

"ම..ම ස..ල්..ලි ටි..ක..ක් එ..ව..න්..න..ද වි..ය..ද..ම..ට..."

මධුවන්තට දුක සිතුණි. මේ ජීවිතේ තමාටත් දුවටත් දෙන්නට ඕනා තරම් දේ ඇය ළඟ තිබියදී සල්ලි කුමකටද...

"එ..පා හාෂි..."

"ඒ..ත් ම..ධු..."

"මං කො..හො..ම හරි කරගන්නම්... ගියාම මං දුවට පොතක් පටන් ගන්නවා... තියෙන සල්ලියක් පොතට දාන්න හාෂි... එයාට

කවදහරි ඕන වෙයිනේ... ම..ට එ..පා..."

මධුවන්ත කීවේ නරහින් නොවේ.

"ද..ව..ස..ක ඔයාට අපි දෙන්නවම ඕන වෙයි... එ..හෙම දවසක් එන්න හාමි... එ..ද..ට කියන්න කතා කරලා මං එනවා කියලා... මම කට්ටනායකට එන්නම් ඔයාව ගන්න..."

එය විවාහ ආරාධනයකි. ආදරය දමා යන මිනිසුන් මෙහෙම කරන්නේ නැත. යන යකා යන්නේ කොරහත් බිඳගෙනය. එහෙත් මධුවන්ත එහෙම කළේ නැත.

"ම..ට ගි..හි..න් නම්බර් එ..ක..ක් දෙ..න්..න..."

"ම්..."

මධුවන්ත මේ මොහොතේ අතීතය ගැන කිසිවක් කතා කළේ නැත. දැන් ඒ ගැන කතා කර පලක් නැත.

* * * * * * * * * * * * * *

මධුවන්ත අයියාටත් නිම්මිටත් සිංගප්පූරුවෙන් ඇඳුම් ටිකක් ගත්තේය. අතේ යහමින් මුදල් ටිකක් තිබ්බානම් මීට වඩා දෙයක් රැගෙන යන්නට මධුවන්තට ආසය. එහෙත් අතේ ඇති මුදල් ටික වියදම් කළ යුත්තේ හරි පරිස්සමිනි.

කාප්පුවේ ඇඳුම් තෝරමින් යද්දී එහි එල්ලා තිබූ තද රෝස පැහැයත් සාක්කුත් ලා රෝස පසුබිමේ සුදු මල් වැටුණ බ්ලවුසයකුත් දෙක මධුවන්තගේ දැස් ගියෙ ඉඹෙටමය. ඔහු ඒ දෙස ටික වේලාවක් බලා උන්නේය... මධුවන්තට සිහිවූයේ මුතුවය... ඇයට දෙයක් අරන් යා යුතුමය. එසේ නොකළහොත් එය නොසළකා හැරීමකි.

මධුවන්ත මුතුට නරියටම ගැළපෙන ප්‍රමාණය සිතින් සිතා බැලුවේය... අවසානයේ මධුවන්ත මධ්‍යම ප්‍රමාණයෙන් සාය





බ්ලවුසයත් ගත්තේය. දෙනවා නම් ඒ දෙක විතරක් මදිය. ඔහු සුවඳ විලවුන් කුප්පියකුත් මුහුණේ ගල්වන ආලේපනයකුත් ඇයට ගත්තේය.

පසුගිය දිනවල ඒ ගෙදරට කතා කළ බොහොමයක් අවස්ථාවල දුරකථනය ගත්තේ මුතුය... ඇය තමා සමඟ හිතවත්ව කතා කරතැයි සිතුවද ඒ තරම් හිතවත්කමක් ගෑවිලාවත් තිබ්බේ නැත. ඇය ඒ සල්ලිවලින් ඔළුව උදුම්මවාගත් යුවතියකැයි සිතන්නට මධුවන්ත කැමති නැත. එහෙත් තමා සමඟ ඇති අමනාපය කුමක්ද කියා ඔහු දැන උන්නේද නැත.

"එයා තරහවෙලා උන්නොත් ඒ ගෙදර ඉන්නත් බැරි වෙයි..."

මධුවන්ත සිතුවේ දුකෙනි.

සාප්පුවෙන් පිටතට එද්දී මධුවන්තට දැනුණේ අතරමං වූ හැඟීමකි. එසේ දැනෙන්නේ මේ සිංගප්පූරුවේ ගෙවන අවසාන පැය කිහිපය නිසාද... යළි ජීවිතේ කිසිම දවසක මේ බිමට පය නියන්නේ නැත. එසේ සිතද්දීත් පුදුමයැයි මධුවන්තට සිතුණි. ජීවිතයේ ලස්සනම දවසුත්... කාලකණ්ණිම දවසුත් උදා වූයේ මේ සිංගප්පූරුවේදීය.

මධුවන්ත රවීට කතා කළේ පයින්ම ලිට්ල් ඉන්ඩියා පෙදෙසට ඇවිදගෙන එමිනි.

"මධූ..."

"උඹ කොහෙද මචං..."

"මං ඔෆිස් එකේ මචං..."

"උඹ බිසීද..."

"නෑ මචං... කියපංකෝ..."

"වරෙන් අද මාත් එක්ක ලන්ච් එක ගන්න..."

රවී මොහොතක් නිහඬව උන්නේය. ඔහුට ඇත්නටම දුකය... සිංගප්පූරුවේදී වැඩිපුරම එකට උන්නේ මේ මිතුරන් දෙන්නාය.

"යමු මචං..."

"එහෙනම් ගයත්‍රි එකට වරෙන්..."

"ම්.. මං ඉක්මනට එන්නම්..."

ටිකක් නිවී සැනසිල්ලේ කෑම වේලක් කෑ යුතු දවසට ඔවුන් ගියේ ගයත්‍රී අවන්හලටය. එය ඉන්දියානු අවන්හලකි. ගයත්‍රී අවන්හලෙන් සිය වතාවක් පමණ කෑම කා ඇත... අද කන්නේ අවසාන වරටය. යළි මේ ජීවිතේ කිසිම දවසක මේ අවන්හලට එන්නේ නැත.

ජීවිතයේ සමහර දේවල් එහෙමය. හිතද්දී පුදුමය... ඒත් ඒවා වෙන්නේත් මේ ජීවිතයේමය.

* * * * * * * * * * * * * * *

මධුවන්තට දෙන කාමරයේ බීමට දමා තිබුණේ සිමෙන්තිය... ඒ බීමද කිළුටු වී ගොසිනි. සේදුවද ඒ කුණු ගියේ නැත. නිම්මි ඇය අත තිබූ මුදල් වලින් පුංචි කාපට් එකක් ගෙනවිත් දැම්මේ සිමෙන්ති බීම වැසී යන ලෙසිනි.

මුතු ඒ දෙසට ආවේ නිම්මි එය කරද්දීය.

"මේ මෙතනටත් කෑල්ලක් දාන්න ඕන..."

අක්කා මේ සියල්ල කරන්නේ මධුවන්ත වෙනුවෙනි. ඒ අතින් මධුවන්ත විශ්වාසවන්තයැයි මුතුට සිතුණි. මෙහෙම නැතලා හම්බවෙන්නේ නැත.

"කා..පට් එකක් ගෙනත් දැම්මා නංගී..."

මුතුව දැක නිම්මි කීවාය.

"ඇ..න් ටි..කක් කාමරේ පිළිවෙලයි නේද නංගී..."

"ම..."





"අර පොළොට තියෙද්දී දෙන්න ලෝබයි... දුව ඇවිදින්න ගන්න වයසනේ..."

"මේකෙ එහෙනම් මේ කර්ටින් එකත් දාන්න..."

"මං දාන්නම් ලොකු බේබි..."

නිම්මිත් මුතුත් කාමරයෙන් පිටවී කොරිඩෝව දිගේ ඇවිදගෙන විත් එහි වූ කවිච්චියේ වාඩි වූවෝය. වටිනා ටයිල් ඇල්ලූ කොරිඩෝව දිගටම කවිච්චි තබා මල් පෝච්චි තබා ඇත...

"ඇයි චූටි..."

"නෑ..."

"දුකෙන් වගේ..."

මුතු බිම බලාගෙන සිනාවක් මවා ගත්තාය. ඇගේ මුහුණේ මේ ඇත්තේ දුක නොවේ. හිතේ කලබලයය. හෙට උදේ වෙද්දී මධුවන්ත මේ ගෙදර බව ඇය දනී...

"මං.. කාංචන ගැන ඔයා කිව්ව කතාව අයියට කිව්වා..."

"එ..ත..කොට..."

"අයියා කියනවා එයා එක්ක කාංචන කතා කරන්නෑලු එච්චර... මූණට මූණ මේ ගෙදරදී හය හත් සැරයක් හම්බ උනාලු..."

"ඉ..තින්..."

"එ..ච්..චර ගණන් ගන්නැතුව ගියාලු..."

කාංචන එසේ කරන්නේ ඔහුගේ ඇති සල්ලි බලය පෙන්වන්නටද... නොඑසේනම් ප්‍රියමන්ත අයියා හිඟන්නකු යැයි සිතාද....

"අයියා මං ගැනත් මො..න..ව හරි හිතනවා ඇති..."



Elegant Books.com

"ඔ..ය දෙන්නා දෙන්නෙක් කියලා අයියා දන්නවා..."

මුතු කතා කළේ නැත. ආදරයක් නැතුව එක්වන දෙන්නෙක් සදාකාලයටම දෙන්නෙක් වනවා මිසක එක්කෙනෙක් වත්තේ නැත.

"චූටි..."

"මී..."

"බෝයි කෙ..නෙ..ක් ගැ..න හි..තිලම නැ..ද්ද..."

"හිතුණා... එකම එක පාරක්... ඔයාගේ මස්සිනා පොඩ්ඩ ගැන..." මුතුට කියන්නට සිතුණේ එහෙමය.

"ආ චූටි..."

මුතු කතා නොකර බිම බලාගෙනම උන්නාය. ඇගේ දෑස් පෙඟී ඇත.

"හි..තු..ණා..."

"කා ගැ..න..ද..."

"කෙ..නෙ..ක් ගැ..න ඒත්..."

"ඇයි චූටි..."

"ඒ..ක එ..හෙම සිද්ධ උනේ නෑ..."

"ඇයි ඒ.. උඹට කැමති නොවෙන කොල්ලෙක් ඉන්නවද..."

"එ..හෙ..මම නෙමේ... ම.. ම..ට කියාගන්න බැරි වුණා..."

"ඉතින්..."

"ඒක ගැන දැන් කතා කරලා වැඩක් නෑ..."

මුතු බිම බලාගෙනම කීවාය. නිම්මි ඇගේ සුරත පිරිමැද්දේ දුකිනි.





"ක..වු..ද චූටි..."

"මං ප..ස්..සේ ද..ව..ස..ක කියන්නම් ඔයාට... දැන්මම බෑ..."

නිම්මි හාර හාර අසන්නට ගියේ නැත.

"උ..ඔ..ට මටවත් කියන්න තිබ්බා..."

"ම්.. කියන්න තිබ්බා තමයි..."

මුතු කිවේ දුකෙනි.

Elegantt talks.com

හීන හතක්

# 12

**රවී** මධුවන්ත දෙස බලාගෙනම උන්නේය. අදින් පසුව ඔහු මේ සිංගප්පූරුවේ නැති බව රවී දනී...

"ඔ..ක්..කොම ලෑ..ස්තිද මචං..."

"ඔ..ව් මචං..."

"උඹ දුකින්ද යන්නේ..."

ඒ ප්‍රශ්නයට කොහොම උත්තර දෙන්නද...

"ම..ට ඒවා දැනෙන්නෑ මචං... මා..ව හිරිවැටිලා ගිහින්..."

දෙවයේ මේ දුෂ්කර මොහොතේදී එසේ වන බව රවීද දැන





උන්නේය.

"හාෂි අද කාලෙකට පස්සේ ගොඩාක් හොඳට කතා කළා... මට පුදුමයි මචං..."

"ඒ ගැණි කවදහරි තේරුම් ගනී උඹේ චිටිනාකම..."

"හාෂි එහෙම කෙනෙක් නෙමේ මචං... එයා මේ රැල්ලේ ගහගෙනම යයි..."

රවී මේසය මත තිබූ මධුවන්තගේ අතට තට්ටු කළේය... ගයත්‍රී අවන්හලේ වේටර්වරයෙක් පැමිණ ප්ලාස්ටික් ට්‍රේ එක තබා ඒ මත විශාල කෙසෙල් කොළ තැබුවේය. ඉන් පසු ඒ මතට බත් බෙදුවේය.

මධුවන්ත දෙහි යුෂ වීදුරුවේ පිටත බැඳුණ සීතල දිය බිංදු අතින් පිරිමැද්දේය.

"ර..වී..."

"මචං..."

"උඹ සිංගප්පූරුවේ ඉන්නවනේ..."

"ඉතින්..."

"පු..ළුවන් විදිහට හාෂි ගැන බලපන්..."

රවී මධුවන්ත දෙස බලා උන්නේ පුදුමාකාර දුකකිනි. මේ තරම් අපරාධයක් ජීවිතයට කළ ගෑණි ගැනත් "බලන්න" යැයි කියන එකම මිනිසා මධුවන්ත විය යුතුය. හාෂිණි එහෙම කළේ එවැනි මිනිසාටය. දවසක ගෑණිට පෙරලි පෙරලි අඬන්නට සිදු වනු ඇත.

"මං.. බ..ල..න්..න..ම් මචං..."

"උදව්වක් ඉල්ලුවොත් කරපං... මහ ලොකු මිනිස්සු එයාට ඉන්නවා කියලා හිතාගෙන හිටියට කවුරුවත් නෑ..."

"මං දන්නවා මධූ..."



Elegantkaar.com

"මොන දේ උනත් උඹට හිතවත්..."

මධුවන්තගේ මේ උතුම් හදවත තේරුම් ගන්නට හාමිණිට බැරි විය. ඔහුට ඇත්තේ තාත්තා කෙනෙකු බඳු හදවතකි.

"ක..මු මචං..."

"සිංගප්පූරුවෙන් කන අන්තිම බත් කට..."

මධුවන්ත කන්නට ගත්තේ එසේ කියාගෙනය.

"එහෙම කියන්නෙපා මචං... ජීවිතේ මොන දේ වෙයිද දන්නෑනේ..."

මධුවන්ත කතා කළේ නැත. මොනවා වුවද මේ බිමට ආයේ එන්නේ නැත.

"ගිය ගමන් ලංකාවෙන් සිම් එකක් ගනිං... නම්බර් එක මට දීපන්..."

"මං ගන්නම් මචං..."

"උඹ සිංගප්පූරුවේ නැති උනාට මං උඹ ගැන බලනවා..."

රවී පොරොන්දු විය. මේ දුෂ්කර ජීවන කලබලයේදී හොඳ මිතුරෙකුගේ පිහිට බුදු කෙනෙකුගේ පිහිටක් මෙනි.

"මධූ..."

"මී..."

"හොඳ කෙල්ලෙක් හම්බ උනොත් උඹටයි දුවටයි ආදරේ... බැඳපං..."

මධුවන්ත සිනාසුණේය.

"සිංගප්පූරුවෙන් යද්දී පපුවේ ඒ පැත්ත එහෙමම වහලා ආනවා මචං..."





හදවතේ වසා දැමූ බොහෝ පැති පසු කාලයේදී විවර වන්නේ හදවත පවා නොදැනය. මධුවන්ත ඒ බව දැන උන්නේ නැත.

මධුවන්තගේ ජීවිතයට මීට වඩා ලස්සන අවසානයක් දෙවියන් දිය යුතුය. එසේ නොවේනම් මේ ඉහට ඉහළින් දෙවියන් කියා කෙනෙක් නැත. රවී සිතුවේ මධුවන්ත දෙස බලාගෙනමය.

"උඹ ලංකාවට එන්න හිතන් ඉන්නේ කොයි කාලේ වගේද මචං..."

"ඉක්මනටම එනවා මචං... ආව ගමන් එන්නේ උඹව බලන්න..."

එහෙම මිතුරෙක් වත් ලංකාවේ ඉන්නවා නම් හදවතට සැනසීමකි. කල්‍යාණ මිතුරෙක් නැති අඩුව ලංකාවේදී තදින්ම දැනෙනු ඇත.

"උ..ඹට අමාරුවක් උනොත් කතා කරපං මචං... මං සල්ලි ටිකක් එවන්නම්..."

"දැනට තියෙනවා මචං... ඕන උනොත් මං උඹට කතා කරන්නම්..."

කොහොමත් මධුවන්ත අත සල්ලි ටිකක් තබන්නට රවී හිතාගෙන උන්නේය. එය සිංගප්පූරුවෙන් යන මොහොතට ඔහු අත තැබිය යුතුය.

"මොකක් හරි පොටක් පැදෙයි මචං... බය නැතුව ඉඳපං..."

"ගියාම කෙල්ලවත් අරන් පන්සලකට ගිහින් බාරයක් වෙනවා මචං..."

"ඒක හොඳයි..."

රවීට දුක මධුවන්ත සිංගප්පූරුවෙන් යන එකට නොවේ. ගොස් ඔහු තනිවෙන තනිවිල්ල ගැන සිතෙද්දීය...

"ගිහින් ටික කාලයක් අයියයි අක්කයි ගාව ඉඳලා පොඩි



Elegantalks.com

ඇනෙක්ස් එකක් හොයාගන්නවා..."

"හොයාගෙන..."

"කෙල්ලව දාලා ගිහින් රස්සාවල් කරන්නත් බැනේ මචං... ගෙදර ඉඳගෙන කරන්න පුළුවන් දෙයක් බලනවා..."

ඔහු කොහොම මේ ජීවිත සටන කරන්නද... කොහොම කළඳ කොල්ලාට ජයක් මිස පරාජයක් නම් අත් විඳින්නට එපා යැයි රවී පැතුවේය... මෙපමණම දුක් දුන් පසු තවත් දුක් දෙන්නට දෙවියන්ටවත් අයිතියක් නැත. කොහෙත්ම නැත.

* * * * * * * * * * * *

රවී මධුවන්තගේත් දුවගේත් ඇඳුම් බෑග් පහළට රැගෙන එන්නට ගත්තේය. භාෂිණී උන්නේ අපාට්මන්ට් නිවසේ වූ කුඩා සාලයේය. පහළට යන්නට පෙර රවී භාෂිණී දෙස මොහොතක් බැලුවේය.

"නවත්ත ගන්නවා නම් දැන් උනත් කොල්ලව නවත්ත ගන්න පුළුවන්" රවීට එසේ කියන්නට සිතුණි. එහෙත් භාෂිණී එසේ නොකරන බව රවී දනී. ඒ නිසා කියා පලක් නැත.

"මං පහළ ඉන්නවා මචං..."

රවී පහළට ගියේ එහෙම කියාගෙනය. මධුවන්ත දුවට අත්දහාගෙන ඇයවද වඩාගෙන අවසාන වරටත් පුංචි කාමරය දෙස බැලුවේය. ජීවිතයේ උදාවූ මිහිරිම ලස්සන රැයවලුත් කටුකම දුක්බරම රාත්‍රිනුත් උදාවූයේ මේ කාමරයේ සිටියදීය...

යළිත් ජීවිතේ කිසිම දිනයක ඒ දුක් විඳින්ද තාත්තාත් දුවත් මේ කාමරයට එන්නේ නැත.

"භාෂි..."

මධුවන්ත කතා කළේ උගුරින් මෙනි. භාෂිණී උන්නේ බිම





බලාගෙනමය.

"ම්... අම්මි ගාවට ටිකක් යන්න..."

මධුවන්ත දුවව භාෂිණී අතට දුන්නේය. භාෂිණී දහ දොළොස් වතාවක් කෙල්ලව සිප ගත්තාය.

"තා..ත්..තිට වද දෙ..න්..නෙ..පා..."

ඇය කීවේ කැඩුණ හඬිනි.

"අ..ම්..මි න..න්.. බෑම්..."

ඇඳුමක් ඇන්ද වූ පසු කෙල්ල යන්නට හදන්නේම එළියටය.

"අ..පි එ..හෙ..නම් ය..නවා භාෂි..."

මධුවන්තගේ අත භාෂිණීගේ හිස මතට ගියේ ඉබේටමය. ඔහු ඒ හිස අතගා එය මොහොතකට ළං කරගෙන සිප ගත්තේය. මේ සිපගත්තේ වර්තමානයේ මේ ඉන්නා භාෂිව නොවේ. අතීතයේ උන් රත්තරන් භාෂිවය.

"ප..රි..ස්..ස..මි..න් ඉන්න භාෂි..."

භාෂිණී කතා කළේ නැත. ඇය කතා නොකරන තරමට හොඳයැයි මධුවන්තට සිතුණි.

"ගි..හි..න් ම..ට න..ම්..බ..ර් එ..ක..ක් දෙ..න්..න..."

"ක..තා ක..ර..න්..න..ම්.. යන්නම්... බුදු සරණයි..."

භාෂිණී තොල් පට තද කරගෙන බලා උන්නාය. මධුවන්ත එහෙමම නිවසින් පිට විය.

මොහොතකට කලින් සිදුවූයේ කොතරම් වටිනා බැඳීමක අවසානයද... මධුවන්තට පුදුමය. ජීවිතයේ තිබූ එකම ආදර බැඳීම තත්පර කිහිපයකට පෙර නිමා විය.

වෙන්වීමේ කඳුළු තිබුණේ භාෂිණීගේ දෙනෙත් වල නොවේ. මධුවන්තගේ දෙනෙත්වලය. ඔහු විදුලි සෝපානයේ යද්දී දුවගේ මුහුණ



Piyasara.lk.com

ඕප ගත්තේ ඒ වාවාගත නොහැකි දුකටය...

මේ කදුළක දියවී ගලා යන්නේ ජීවිතයේ ලස්සනම දවස්වල මතකයද... නොවේනම් දුෂ්කරම දවස්වල මතකයද... මධුවන්ත දන්නේ නැත. ඔහු දන්නා එකම දේ ආදර විමානයෙන් තමා පිටවූ බවය... සදාකාලයටම පිටවූ බවය...

පහළට ආ පසු මධුවන්ත උඩ බැලුවේ නැත. බලා උන්නා නම් අපාට්මන්ට් නිවසේ වීදුරුවෙන් භාෂිණී බලා ඉන්නා බව ඔහු දකිනු ඇත. "අදින් පස්සේ උඹ නිදහස්..." මධුවන්ත සිතින් කීවේය.

වාහනයට ගොඩ වූ මධුවන්තගේ බොඳ වූ ඇස් ඔහු කොතරම් ආදරබර මිනිසෙක්දැයි ඔප්පු කළේය... මේ තරම් දෙයක් ජීවිතයට කළ ගැණිගෙන් වෙන්ව යද්දීත් කොල්ලාට දුකය. රවී මධුවන්තත් දුවත් දෙස මොහොතක් බලා උන්නේය.

"ම..ධූ..."

"අ..පි යන් මචං..."

"ම..ක්..කො..ම ග..ත්තද මචං..."

"ම්.. අරන් යන්න බැරි දේවලුත් තියෙනවනේ මචං..."

මධුවන්ත කීවේ දුවව ඔඩොක්කුව මත තබාගෙන දෑස පිසදමමිනි. රවී ඔහුගේ පිටට තට්ටු කළේ දයාබරවය.

"තීරණයක් ගන්නවා නම් අදත් හාෂිට ඉඩ තිබ්බා..."

මධුවන්ත කීවේ කළකිරුණු හඬිනි.

"මා..ත් හිතුවා..."

"පුදුමයි..."

උණුවෙන පපුවක් නම් දැන් උණුවිය යුතුය. උණුවී වැගිරිය යුතුය.

"අ..පි යන් මචං..."





රවී වාහනය පාරට දැම්මේය.

භාෂිණී උඩ සිට බලාගෙනය... වාහනය හරවද්දී මධුවන්ත යංතමට ඇයව දැක්කේය. "මේ දුක කවදහරි උඹටවත් පත්තු වෙන්නෙපා... එච්චර දුකක් අද මං විඳින්නේ... හතුරෙකුටවත් මේ දුක පත්තු වෙන්නෙපා..." මධුවන්ත සිතුවේය.

"දුවා කෑවද මචං..."

රවී ඇසුවේ කෙල්ලගේ හිස අතගාය.

"එයාර් පෝට් එකේදී කනවා මචං..."

අදින් පසුව මධුවන්තට කියා ජීවිතයක් නැත. ඔහු ඇහැට ඇහිබැම සේ කෙල්ල ළඟම සිටිය යුතුය. කෙල්ල මේ මොනවත් දන්නේ නැත. ඇය විදුලි බුබුළු දස අත දැල්වෙන සිංගප්පූරු නගරය දෙස බලමින් තනිවම සිනාසෙයි... තාත්තා අද විඳින දුක දුව දන්නවානම් ඇය කෑ ගසා අඬනු ඇත...

මධුවන්ත බොඳ වූ දෙනෙතින් අවසන් වරටත් සිංගප්පූරු වීදි දෙස බලා උන්නේය. මේ හැම පාරකම... මේ පසුවන හැම සාප්පු සංකීර්ණයකම මේ ආදරයේ මතක වැටී ඇත... අදින් පසුව මේ සිංගප්පූරුවේ ඒ මතක සුරකින්නට කෙනෙක් නැත... ඒ මතක එහෙමම මේ පපුවේ ගල් වනු ඇත...

"ර..වී..."

"මචං..."

"මං මචං... ග..ත්..තේ වැරදි තීරණයක්ද..."

ජීවිතයේ දුක්බරම මොහොතේදී කෙනෙකුට එහෙම සිතෙයි. අවුල්ව අනාථව සිටියදී ගන්නා තීරණ හරිම තීරණ නොවන අවස්ථා ඇත...

"උ..ඔ..ට ගන්න තීරණ දෙක තුනක් තිබ්බේ නැනේ මචං..."

"ඔ..ව්... මං රෑ නිදි මරාගෙන හිතුවා මචං..."



Elegantlk.com

"දැන් හිතේ ධෛර්යෙන් ඉඳපං... උඹට වරදින්නෑ..."

ජීවිතයේ මේ තරම් වැරදුන පසු තවත් මොනවා වරදින්නද...

"හිතේ නිදහසේ ලංකාවට පලයන්... අවුල් වෙන්නෙපා මචං..."

"අවුල් වෙලා බෑනේ මචං..."

"ම්..."

"සිද්ධ වෙච්ච දේ හොඳයි කියලත් දවසක උඹට හිතෙයි..."

"කොහොමත් මං අලුත් මිනිහෙක් වෙනවා මචං... මට වටින්නේ මගේ ජීවිතේ නෙමේ... මේ ජීවිතේ..."

මධුවන්ත කීවේ දුවගේ හිස ඉඹගෙනය. එහෙමම ඔහු දුව තවත් පපුවට ළං කර ගත්තේය... අදින් පසු ජීවිතයට ඇත්තේ මේ වත්කම පමණි. ඒත් ඇතිය. ජීවත් වන්නට...

* * * * * * * * * * *

සිංගප්පූරුවේ චැංගි ගුවන් තොටුපල පර්යන්තය ඉදිරිපිටින් බහින්දී මධුවන්තගේ පපුව මොකක්දෝ ගින්දරකින් ඇවිලිණ. මධුවන්ත කාගෝ ආයතනයේ රැකියාව කරද්දී උදේ හවා මේ චැංගි ගුවන් තොටුපලට ආවේ ගියේය. එහෙත් මේ ගුවන් තොටුපළින්ම ජීවිතයේ දුක්බර සමුගැන්මක් සටහන් කරන්නට වේයැයි ඔහු කෙදිනක වත් සිතුවේ නැත. දෛවය ඒ දුක්බර කටුක සමුගැන්ම ජීවිතය මත මවා ඇත. බාරගත යුතුමය... වෙන කුමක් කරන්නද...

මධුවන්ත දුව දෙස බැලුවේය. ඇය කිසිවක් නොදැන සිනාසෙයි.

"පැටියා ප්ලේන් බෑම එකේ යනවා... ආ පුතු..."

"තා..ත්..තා ගියා.. ඒ..."

කෙල්ල මොනවාදෝ කියන්නට හදයි. මධුවන්ත ඇයව තදින්



සිප ගත්තේය.

රවී ගොස් ට්‍රොලියක් ගෙනවිත් මධුවන්තගේ බෑග් දෙක එහි තැබුවේය.

"ය..න් මචං..."

රවී කීවේ දුකෙනි... ගුවන් තොටුපලේ ගුවන් ටිකට් පත් පරීක්ෂා කරන කවුන්ටරයෙන් එහාට රවීට යන්නට ලැබෙන්නේද නැත. ජීවිතයේ හමුවූ දයාබරම මිතුරාටත් තව අඩි දහයකදී සමු දිය යුතුය.

"මචං..."

රවී මධුවන්තගේ උරතලයට සුරත තැබුවේ ඇත්තටම දුකෙනි.

"මා..ව..යි කෙ..ල්..ල..වයි බ..ල..න්..න ව..රෙන් මචං..."

මධුවන්ත කීවේ අඬන්නාක් මෙනි. ඇත්තටම ඔහුගේ දෙනෙත් බොඳව තිබුණි.

"ඉ..ක්..ම..න..ටම එනවා මචං..."

"ම..ට කර..පු හැම දේකටම උඹට පිං මචං..."

මධුවන්තගේ දෑස් දෙස රවී බලා උන්නේ ඇවිලෙන හදිනි... තම ආදරණීය මිතුරාට සමු දීම මේ තරම් දුකකැයි ඔහු සිතුවේ නැත.

"ප..රි..ස්..ස..මින් ඉඳපන් කොල්ලෝ... ඕන දේකට කතා කරපං..."

රවී කීවේ ඔහුව වැළඳගෙනය. මධුවන්ත ඇත්තටම ඔහුව සිපගත්තේය.

"මා..මි..ට උ..මිමා එකක් දෙන්න පැටියෝ..."

කෙල්ල රවීට ආදරේය. ඇය ඔහුගේ බෙල්ල බදාගෙන රවීට හාදුවක් දුන්නාය. රවීගේ දෙනෙත් කඳුළින් තෙත් විය. ඔහු කෙල්ලගේ හිස පිරිමැද්දේ පුදුමාකාර දුකකිනි.

"ම..ට ක..තා කරපං මචං..."

"මං ගන්නම් මචං..."

"මේ..ක මචං... අ..තේ තියාගනිං... උඹට ඕන වෙයි..."

රවී සාක්කුවේ තබාගෙන උන් මුදල් කවරය මධුවන්තගේ සාක්කුවට දැම්මේය.

"මං.. ළ..ඟ තියෙනවා මචං..."

"උඹට ඕන වෙයි... ඕන දෙයක් තිබ්බොත් කියපන්... උඹ වගේ හොඳ යාළුවෙක් මේ සිංගප්පූරුවේ නෑ... මං ඉක්මනට එනවා.. ම්..."

මධුවන්ත රවීගේ අතකින් අල්ලාගෙන උන්නේ අසරණවය.

"ජීවිතේ වෙන හැම දෙයක්ම නරකටම වෙන දේවල් නෙමේ මචං... තේරුණාද... දරාගනිං... කෙල්ලට ලෙඩක් දුකක් හැදෙන්න දෙන්නෙපා..."

රවී කෙල්ලගේ මුහුණ අතගෑවේය.

"මා..මි පැටියව බලන්න එනවා.. හොඳේ..."

ගුවන් ටිකට් පත් කවුන්ටර් විවෘත කළ බව නිවේදනය කෙරිණ. මධුවන්තත් රවීත් අවසාන වරට වැළඳ ගත්තෝය.

"බු..දු සරණයි..."

රවී මධුවන්තගේ උරතලය පිරිමැද කීවේය.

"මං එහෙනම් යන්නම් මචං..."

මධුවන්ත හැරෙද්දී ඔහුගේ ඇස්වල කඳුළුය. ඔහු ඇතට ගොස් හැරී බැලුවේය. රවී උන් තැනම බලාගෙන උන්නේය. මධුවන්ත රවීට අත වනද්දී දුවාද අත වැනුවාය.

ජීවිතයේ නපුරු දවස් පැමිණි විට වෙන්නේම දුක්බර දේවල්මය.





# 13

සිංගප්පූරුවේ චැංගි ගුවන් තොටුපළ සුරංගනා ලෝකයක් බඳුය... එහෙත් ඒ සුරංගනා ලෝකයේ ලස්සන බලන්නට අද ඔහුට හිතක් නැත. ආගමන විගමන කටයුතු නිම වීමෙන් පසු මධුවන්ත දුවවද වඩාගෙන ඔහේ ගුවන් තොටුපළේ ඇවිද්දේය.

"මගේ පැටියට බඩගිනිද... ම්.. චූටි බඩ කුං කුං ගානවද..."

කෙල්ල ඇඟරී සිනාසුණාය. අද දුවා ලස්සනය. මධුවන්ත ඇයට ඇන්දවූයේ අලුතින්ම ගත් පුංචි ඩෙනිම් කලිසමකුත් චූටි ටී ෂර්ට් එකකුත් ජැකට් එකකුත්ය... කොණ්ඩය කොටට කපා ඇති නිසා



Freeantitalks.com

කෙල්ල කොල්ලෙක් වාගේය.

ගුවන් තොටුපළ පුරාම තැනින් තැන අවන්හල්ය. ඒ අවන්හල් වල පුටු දමා ඇත්තේ ගුවන් යාන සිය ගණනක් නවත්වා ඇති වැහි ගුවන් තොටුපලේ ගුවන් පථ වලට මුහුණලාය. ඒවා වල සිය ගණන් විදේශීය සංචාරකයෝ ඉඳගෙන කෝපි බොති. නිදාගෙන සිටිති. විශාල රූපවාහිනී තිරවලින් රූපවාහිනී බලති.

මධුවන්ත දුවව කවන්නට සැන්ඩ්විචස් එකක් ගෙන පසුව ඔහුගේ කරේ තිබූ බෑගයේ දමා ගෙන උන් කෙල්ලගේ කිරි බෝතලයද පිටතට ගත්තේය. ඔහු එද්දී එයටම පිටි හැදි පහක් දමාගෙන ආවේය. දැන් ඇත්තේ උණු වතුර ටිකක් දමා සොලවා නිවා දෙන්නටය.

"සම් හොට් වෝටර් ප්ලීස්..."

කෝපි අවන්හලේ උන් සේවිකාව කිරි බෝතලය ගෙන එයට උණු වතුර දමා දුන්නාය. මධුවන්ත සියල්ල රැගෙන ගියේ එක දිගට ඕකිඩ් වවා තිබූ තැන පිහිටි කුෂන් පුටු වෙතය... සිංගප්පූරු ගුවන් තොටුපළ අභ්‍යන්තරයේ මෙසේ ඕකිඩ් වර්ග සෑහෙන ගණනක් වවා ඇත. සිංගප්පූරුවට ආ මුල්ම දවසේ මධුවන්ත සිතුවේ ඒවා ප්ලාස්ටික් ඕකිඩ් මල් කියාය. එහෙත් ඒවා ඇත්ත ඕකිඩ්ය.

"අ..පි ඉදගෙන ප්ලේන් බෑම් බල බල සැන්ඩ්විචස් කමු.. ම්..."

"නා..ත්..ති.. ප්ලේන් බෑ..ම්..."

"ඔව් පැටියෝ... අපි යන්නෙත් ඒකේ..."

කෙල්ල ඇඹරී සිනාසුණාය.

ජීවිතයේ උදාවූ දුෂ්කරම දවසේ සිත එක්තැන් කරගෙන ඉන්නට හයිය දෙන්නයැයි මධුවන්ත දෙවියන්ගෙන් ඉල්ලුවේය... කෙල්ල ඉන්නට ඇත්තේ බඩගින්නෙන් බව මධුවන්ත දැන ගත්තේ ඇය සැන්ඩ්විචස් එක කාගෙන කාගෙන යද්දීය.

"රසයි පැටියෝ..."

"ර..සා..යි..."





මධුවන්තගේ පපුවම ඇකිලී යයි... මේ ඉන්නේ අම්මෙක් නැති දුවෙක් යැයි සිතද්දී ඔහුගේ පපුව වාවන්නේම නැත.

කෙල්ල සැන්ඩ්විචස් එකෙන් බාගයක්ම කෑවාය. මධුවන්ත පිඹුරු එකක් ගෙන කට පිසදා ඇයව කුෂන් පුටුවේ හාන්සි කර කිරි බෝතලය කටට ළං කළේය.

බාගයක් බොද්දීම ඇයට නින්ද ගොසිනි. හොඳට බඩ පිරුණ විට එහෙමය... මධුවන්ත කිරි බෝතලය ගෙන වසා දමා කෙල්ලව කුෂන් පුටුවේ පහසුවෙන් ඇල කළේය... ඔහු බෑගයේ දමාගෙන උන් කුඩා බිලැන්කට්ටුව ගෙන කෙල්ලට පෙරෙව්වේ තව පැයක් එකහමාරක් මෙතනට වී සීතලේ සිටිය යුතු නිසාය.

මධුවන්තගේ පපුව පාළුවෙන් අසරණකමින් මිරිකෙන්නට වූයේ දුවත් නිදාගත් පසුය. ඉවසා දරා ගත නොහැකි කටුක තනිකමකින් ඔහුගේ දෑස් තෙත් විය... ඔහු එක් අතකින් කෙල්ලගේ අතක් අල්ලාගෙන ඇත ගුවන් පථයේ නවත්වා ඇති ගුවන් යානා දෙස බලා උන්නේ බොඳවූ දෙනෙතිනි.

අද දවස පුරාම හඳවතට දැනුණු අමිහිරි අසරණ දුක මිරිකා ගෙන මෙන් ඔහුගේ දෙනෙතින් කඳුළක් පෙරලී ගියේය.. අඩ අදුරේ ගලාගෙන ගිය ඒ කඳුළ ෂැංගි ගුවන් තොටුපළේ සතුටින් එහේ මෙහේ යන කිසිවෙක් දුටුවේ නැත.

තව හරියටම පැය දෙකකින් සිංගප්පූරු ගුවන් සේවයට අයත් ගුවන් යානයකින් ඔහුත් දුවත් මේ රටින් පිටවෙයි... ඉනුත් පැය තුනහමාරකට පසු එම ගුවන් යානය කටුනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළට බස්සවයි...

දෛවය උදා කළ මේ මොහොත පුදුමාකාරය...

මෙහෙම තීරණයක් ගන්නට මධුවන්ත සිතුවේ නැත. එහෙත් හාෂිණි ඒ තීරණය ගන්නා තැනටම නමාව පැන්නුවේය... නමාවත් දුවවත් මේ රටින් යවා අද ඇය විඳිනා සැනසුම කුමක්ද...

දන්නේ නැත...



Elegant

මධුවන්තට තද පිපාසාවක් දැනුණි. ඔහු කෝපි අවන්හලේ සිංගප්පූරු ජාතික සේවිකාවකට කතා කළේය.

"කොෆි ප්ලීස්..."

කුසට යමක් දමාගන්නට මධුවන්තට හිතක් නැත. මධුවන්ත කෝපි එක තොල ගාමින් බලා උන්නේ කිසිවක් නොදැන නිදන දුව දෙසය.

ලංකාවට ගිය පසු ඉන්නා තැනකට වී දුවගේ කෑම ටික තනිවම හදාගන්නට මධුවන්ත සිතාගත්තේය. ඒ නිසාම ඔහු සිංගප්පූරුවෙන් පුංචි සාස්පාන් තුන හතරක් ගත්තේය. අවශ්‍ය වුවහොත් ඉන් තමාටද මොනවා හෝ හදාගත හැක. සියල්ල හිතන්නට වෙන්නේ එහෙට ගිය පසුය.

සිංගප්පූරුවෙන් බොන අවසාන කෝපි එක නිසාදෝ කෝපි එකින් ඔහුට පුදුමාකාර රහක් දැනුණි.

ගුවන් යානයට ගොඩ වෙන්නට තව පැයක් ඇත... මධුවන්ත උන්නේ උහුලාගත නොහැකි පාළුවකිනි. දුවවත් ඇහැරී උන්නානම් කියා මධුවන්තට සිතිණි. අදින් පසුව උදාවන හැම රෑකම මේ පාළුව දැනෙනු ඇත. ඒ පාළුව එහෙමම තමාට දරාගන්නට සිදුවනු ඇත.

මධුවන්තගේ ජංගම දුරකථනයට ඇමතුමක් ලැබිණ. ඒ ලංකාවෙනි.

"ම..ල්ලී..."

කතා කළේ ප්‍රියමන්තය.

"මං.. එයාර් පෝට් එකේ අයියේ... තව ටිකකින් ෆ්ලයිට් එකට නගිනවා..."

"මං බලන්න මල්ලී කතා කළේ... උඹ පරිස්සමින් වරෙන්..."

"මං බැහැලා අයියට කෝල් එකක් ගන්නම්..."

"කෙල්ල ඉන්නවද..."





"ඔව් අයියේ.. නිදි..."

භාෂිණී මොනවාද කිව්වේ කියා අසන්නට ප්‍රියමන්තට සිතුණද ඔහු ඇසුවේ නැත.

"එහෙනම් පරිස්සමින් වරෙන් මල්ලී..."

අයියා කතා කළ පසු මධුවන්තගේ හිතට තුනී නිවතක් දැනුණි. තමා තනිවී නැහැයි ඔහුට මොහොතකට සිතුණි. ගුවන් යානයට ඇතුල් කිරීම ඇරඹුණ බව කියන "බෝඩිං අනවුන්ස්මන්ට්" එක නිවේදනය කෙරිණ. මධුවන්ත ඔහුගේ බෑගය කරට දමාගෙන දියණියව පරිස්සමින් වඩා ගත්තේය. කෙල්ල එහෙමම මධුවන්තගේ උරතලය බදාගෙන යළිත් නින්දට වැටුණි.

මධුවන්ත ගුවන් යානයට ගොඩ වූවේ දුක්බර අතීතයකින් අවිනිශ්චිත අනාගතයට යන ඉබ්බෙකු ලෙසිනි. ඔහුට ලැබුණේ ගුවන් යානයේ පුංචි කවුළුවක් අද්දර ආසනයකි. අවුරුදු දෙකෙන් පහළ බබාලා සඳහා ආසනයක් ලැබෙන්නේ නැත. මධුවන්ත එහෙමම දුව පපුවේ තබාගෙනම ආසනයට බර විය.

සිංගප්පූරු ගුවන් සේවයේ සුන්දර ගුවන් සේවිකාවන් නිදාගෙන සිටිනා දුවගේ මුහුණ බලමින් සිනාසෙමින් ඇවිද යයි...

රවී කතා කළේය.

"මං ෆ්ලයිට් එකේ ඉන්නේ මචං... එ..හෙ..නම් යනවා මචං..."

මධුවන්තගේ කටහඬ ඇඬුම්බරය.

"හි..ත හදාගෙන පලයන් මචං... ලංකාවට ගිහින් මට කතා කරපං... හොඳේ... බුදු සරණයි..."

"ය..ත්..නම් මචං..."

තව මොහොතකින් ජංගම දුරකථන ක්‍රියා විරහිත කළ යුතුය... මධුවන්ත භාෂිණීට ගත්තේ ඊට මොහොතකට පෙරය... මේ ඇයට කතා කරන අවසාන වාරයද විය හැක...

"අ..පි එ..හෙ..නම් යනවා හාෂි..."

ගැහැණියකගේ නම් මේ හඬට පපුවේ පතුරු ගැලවී යා යුතුය.

"දු..ව කෝ..."

"නි..දි... එහෙනම් මං තියනවා... හොඳින් ඉන්න... බුදු සරණයි.."

මධුවන්ත ඒ ටික කියා එහෙමම දුරකථනය විසන්ධි කළේය. තව දහස් වරක් කතා කළද හාෂි තමාටත් දුවටත් නතර වන්නට යැයි කියන්නේ නැත.

ජීවිතයේ එක් යුගයක් අදින්... මේ රැයින්... තව මොහොතකින් අවසානය... දෛවය තමන්ට ඕනා දේ කළේය...

"පාසිං යෝ සීට් බෙල්ට් ස..ර්..."

ගුවන් සේවිකාවක් පැමිණ කියා ගියාය. මධුවන්ත දුවවද ඔහුගේ ඩඩට තබා තද කරගෙන ආසන පටිය පැළඳ ගත්තේය. ගුවන් යානය තුළ සීතල වැඩිය. ඔහු ගුවන් සේවිකාවකගෙන් බ්ලැන්කට් එකක් ඉල්ලාගෙන කෙල්ලව වැසෙන්නට දැමුවේ ඒ නිසාය.

ගුවන් යානය ගුවන් පථයේ සෙමෙන් සෙමෙන් ඇදෙන්නට විය... විශාල සිංගප්පූරු ගුවන් තොටුපළ දෙස අවසාන වරටත් මධුවන්ත බලා උන්නේය. මීට වසර තුන හතරකට පෙර ශ්‍රී ලන්කන් ගුවන් යානයකින් මේ ගුවන් තොටුපළට ආ මුල්ම අවස්ථාව මධුවන්තට සිහිවිය. එදා මෙදා තුර කොතරම් නම් දේවල් සිදු වූවාද...

දැන් ඒ සියල්ල අවසානය. ජීවිතයට කියා ඉතිරි වූයේ පපුව කෑඩී යන අදුරු මතකයකුත් මේ පපුව බදාගෙන නිදා ඉන්නා දුවත් පමණි.

ගුවන් යානය ගුවන් ගත කරන්නට යන බව නිවේදනය කෙරිණ.

"අපි ඔයාගේ අම්මව දාලා යනවා... එයා අපි එක්ක යන්න ආවේ නැතේ..."

මධුවන්ත දුවව බදාගෙන ඇගේ හිස සිපගනිමින් කීවේය. ගුවන්





යානය ඉහළ අහසට ඇදුනේත් මධුවන්තගේ දෙනෙතින් කඳුළක් ගිලිහී ගියේත් එක විටය.

දැනුත්... ජීවිතයේ මේ තරම් දේ වූ පසුත්... ජීවිතයට ඇය මේ තරම් දේ කළ පසුත් හිතෙන්නේ මේ හාෂිව දමා යනවා නොවේද කියායි... ඇය මෙහෙම කළේ එහෙම ඇය වෙනුවෙන් කකියන පපුවටය. අනේ ඇය මේ රටේ තනිවී ඉන්නවා නොදැයි සිතන පපුවටය...

අද මේ ගෙවන්නේ ආදරය නොදන්නා හිතකට පැලීගෙන මැරීගෙන ආදරය කළ පවය... මේ ආදරයේ සුන්බුන් නටබුන් තව කොපමණ කාලයක් මේ පපුවේ රැඳී තමාට දුක් දේදැයි මධුවන්ත දන්නේ නැත. ආදරයේ මතක මිහිරි විනි නම්... සුන්දර විනිනම් ඒ මතක මියෙන මොහොත වන තුරුත් පපුවේ තිබුණාට කමක් නැත. එහෙත් මේ නපුරු රුදුරු බියකරු ආදරයේ වියරු මතක මේ ගුවන් යානය කටුනායකින් බහිද්දී අමතක වන තරමට නොඳය.

ගුවන් යානය ගුවන් ගත කර මොහොතකින් ගුවන් මගීන් සඳහා පිරිනමන ආහාර පාන පිළිගැන්වීම ඇරඹිණි. වෙනදා නම් මේ ගුවන් යානයෙන් ලබා දෙන ආහාර වේල ගන්නට මධුවන්ත ආසය. එහෙත් අද ඒ ආශාව නැත.

මධුවන්ත ආසන අතර යමින් ආහාර පාන පිළිගන්වන ට්‍රොලියෙන් දොඩම් යුෂ වීදුරුවක් පමණක් ගත්තේය... කොහොමත් දුව තබාගෙන කෑම කන්නට නොහැක. ආහාර පාන ගන්නා ට්‍රේ එක ඇත්තේ ආසනයටම සවි කරය.

"යෝ ඩිනර් සර්..."

ගුවන් සේවිකාව රෑ කෑම ට්‍රේ එක දෙන්නට යද්දී මධුවන්ත ඔනාසුණේය.

"නෝ තැන්ක්ස්... ජස්ට් කොෆී ප්ලීස්"

ගුවන් සේවිකාව පවා ඔහු දෙස බැලුවේ තරමක් දුකිනි. බබාගේ අම්මා කොහේදැයි ඇය නැසූ එක පුදුමය. ගුවන් සේවිකාවන් එහෙමය.

මධුවන්ත කවුළුවෙන් පහළ බැලුවේය. දස ලක්ෂ ගණත් වීදුලි පහන් දැල්වෙන සිංගප්පූරුව යංතමට දිස් වෙයි. තව මොහොතකින් එයද නොපෙනී යනු ඇත. මධුවන්තට හීල්ලින. උපන් මව්බිමේ පුංචි රස්සාවක් කරගෙන ජීවිතය පටන් ගත්තා නම් අද මේ ගිත්දර නැත.

අතීතයට ගොස් යළිත් එන්නට පුළුවන් නම් එසේ ජීවිතය වැරදුන කොතරම් නම් තැන් හදාගෙන එන්නට පුළුවන්ද... එහෙත් එවැනි වරමක් දෙවියන් දී නැත. අතීතයේ වූ හැම වැරැද්දක්ම දරාගෙන අනාගතයට යන්නට සිදුවෙයි.

කෙල්ල මොනවත් නොදැන නිදිය. මේ යන්නේ කොහේද කියාවත් ඇය දන්නේ නැත. ඇයට නොතේරෙන වයසේදී මේ වෙන්වීම වූ එක හොඳය... මීටත් වඩා දුර ගොස් මේ වෙන්වීම සිදු වූවා නම් කෙල්ලටද එය දරාගන්නට අමාරු වනු ඇත.

මධුවන්ත තවත් දොඩම් යුෂ වීදුරුවක් ඉල්ලා ගත්තේ පිපාසය නිසාය. ඔහුට නිදිමතක් තිබුණේම නැත. කොහොමත් පහුගිය කාලයේම රෑට ඔහු නිදාගත්තේ නැත.

තම බිරිඳ වෙනත් පිරිමියෙකු සමඟ සිංගප්පූරුවේ සුපිරි හෝටලයක රැය පහන් කරන බව දැන දැන නිදාගත හැකි පිරිමියෙක් ලොව නැත. මුල් කාලයේදී ඒ දුක පුපුරු ගැසෙන තරමට මධුවන්තට දැනුණි. පසුව ඒ දුකටම ඔහු හුරු විය.

ගුවන් යානය කටුනායකින් බස්සන්නට තව පැය තුනක් පමණ ඇත... අනාගතය ගැන සිතා තීරණ ගන්නට ඒ පැය තුන මදිය. එහෙත් මධුවන්ත ආසනය සුව පහසු ලෙස සකසාගෙන හිතන්නට ගත්තේය...

ජීවත් වන්නට මාර්ගයක් හදාගත යුතුය. ඊටත් පෙර ජීවත් වන්නට තැනක් හදාගත යුතුය. අලුත් නිවසක් ගන්නට තරම් මුදලක් අතේ නැත. අමාරුවෙන් සොයා ගන්නට වෙන්නේ කුලී නිවසකි. ජීවිතය පටන් ගන්නට වෙන්නේ එහෙමය.

ඒ සියල්ල කළ යුත්තේ මේ පණ රැකගෙනය. දුවව ඒ තරම්





ආදරයකින් බලාගත යුතුය. ඇයට තාත්තා කෙනෙකුගේ ආදරය පමණක් නොව අම්මා කෙනෙකුගේ සෙනෙහසද දිය යුතුය.

මේ සියල්ලම ජීවිතයට අභියෝගයකි. ඒ අභියෝගවලට බොහෝ විට මුහුණ දෙන්නට වෙන්නේ තනිවමය. මේ ජීවිතයේ බර සහෝදරයෙකුටවත් දෙන්නට නොහැක. ඔවුන්ටද ජීවිතයක් ඇත.

මේ දුප්පත් ජීවන ගමනට කෙනෙක් ඒ යැයි කිසිවිටක සිතිය නොහැක. එහෙම බලාපොරොත්තුවක් මධුවන්තගේ සිතේද නැත. ආදරය දුන් දුක එක ආත්මයකට නොව ආත්ම හතකට ඇතිය...

ජීවිතය කොහොම හරි ජය ගන්නවා යැයි ඔහු සිතාගත්තේය. දුව ලොකු වෙද්දී ඇය දකින්නේ මේ අනාථ ජීවිතය නම් තමා පරාදය. දවසක භාෂිණී ලංකාවට නිකමට හෝ එනු ඇත. එදාට මේ අනාථයා මෙහෙමම ජීවත් වුවහොත් තමා පරාදය...

එහෙම පරාද වුවහොත් යළි යන්නටද තැනක් නැත. එක් වරක් ජීවිතය පරාද වූ පසු මේ යන්නේ ලංකාවටය. ලංකාවේදී පරාද වුවහොත් යන්නට තැනක් ඇත්තටම නැත.

ජීවිතයේ එක් වරක් දෙවය බාරගත් ලෙස තවත් වරක් දෙවයේ තීරණ බාරගන්නට තමා සූදානම් නැතැයි මධුවන්ත සිතුවේය. දෙවයේ තරු පොඩි පට්ටම් කර හෝ ජීවිතය දිනා ගත යුතුය.

මේ බඩ බදාගෙන නිදනා කෙල්ලගේ ජීවිතය දිනවිය හැක්කේ එවිටය... ලංකාවේදි මොන දුකක් විඳින්නට වුවද යන ගමන යනවා යැයි මධුවන්ත සිතා ගත්තේය. එසේ සිතා ගත්තේ අඩි තිස්තුන්දාහක් උඩින් පියාසර කරන ගුවන් යානයේ සිටය.



Freeantiks.com

# 14

මධුවන්ත කල්පනා දැහැනින් පිබිදුනේ ගුවන් යානයේ නියමුවා කළ නිවේදනයෙනි. තව මොහොතකින් ගුවන් යානය කටුනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලින් ගොඩබස්සන බව ඔහු නිවේදනය කළේය.

මධුවන්ත පුංචි කවුළුවෙන් පහළ බැලුවේය. තාම මව්බිමට එළිය වැටී නැත. එහෙත් තම දුප්පත් මව්බිමේ තැනින් තැන දැල්වෙන පුංචි පුංචි එළි ඔහු අපූරුවට දැක ගත්තේය... ලංකාව උඩින් බලන කෙනෙකුට පෙනෙන්නේ එසේය. සිංගප්පූරුවේදී නම් පෙනෙන්නේ විදුලි පහන් එළි ලක්ෂ ගණනාවක් පමණි. එහෙත් ලංකාවේ බලන බලන තැන කොළ පාටය. විදුලි පහන් එළි පෙනෙන්නේ තැනින් තැනය.





ජීවිතයේ එක යුගයක් එහෙමම දමා දැන් තමා තවත් යුගයකට පැමිණ ඇති බව මධුවන්තට සිතුණි. තව මොහොතකින් ගොඩ බහින්නේ උපන් බිමටය. මධුවන්තගේ සිතට සතුටක් දැනුණි. ඒ සතුට කාලාන්තරයකට පසු මව්බිමට එන ඕනම කෙනෙකුගේ හදවතට දැනෙන උපන් බිමට ඒමේ සතුටය. නිදහසය.

ලෝකේ කොහේ ගියත් හදවතට නිවනක් දැනෙන්නේ උපන් බිමට පය ගැසූ පසුය. මධුවන්තට ඒ සතුට උපන් බිමට ඉහළ අහසේ සිටම දැනෙන්නට විය.

දුව තවමත් නිදිය... ගුවන් යානයෙන් පිටතට එද්දී ඇය ඇහැරෙනු ඇත... ගුවන් තොටුපළින් යන්නට පෙර කෙල්ලට කිරි ටිකක් පෙවිය යුතුය.

දැන් ගුවන් යානය පියාසර කරන්නේ ඉතාමත් පහළිනි. පාන්දර කළුවර මැදින් මධුවන්ත පුංචි පුංචි ගෙවල් පාරවල් දැක ගත්තේය.

මොහොතකින් පය තබන බිමේදී තමාටත් දුවටත් දුකක් නම් විඳින්නට නොවේවායි මධුවන්ත පැතුවේය.

තව මොහොතකින් හිරු පායනු ඇත... ඒ බව කියාපාන ලකුණු අහසේ විය... මේ ඉර උදාවන්නේ අලුත් දවසකට නොවේ. අලුත් ජීවිතයකටය.

මධුවන්ත දිග හුස්මක් ගෙන දුවව ආරක්ෂාකාරී ලෙස අල්ලා ගත්තේය. යානය ගොඩ බහින්නට යන බව ඔහු දනී...

යානය ලතාවකට ගුවන් තොටුපලේ ගොඩ බස්සවනු ලැබීය. මධුවන්ත ආශාවෙන් ඇතින් පෙනෙන ගුවන් තොටුපළ පරිශ්‍රය දෙස බලා උන්නේය.

දුවවත් රැගෙන ලංකාවට එන්නට තමා ගත් තීරණය හරිම තීරණයක් යැයි මධුවන්තට සිතුණේ ගුවන් යානය බැස්සවූ පසුය... තොරටකදී හදවතට දැනෙන තනිකමට වඩා සැනසීමක් දැන් ළයට දැනෙයි...

* * * * * * * * * * * * * * *

මුතුට ඇහැරුණේ පාන්දරමය... අවදි වූ මොහොතේම ඇයට සිහිවූයේ මධුවන්තවය. ඔහු ලංකාවට එන්නේ අද බව ඇය දැන උන්නාය. මුතු ඇඳේ පැත්තකට හැරී ඇඳ අද්දර වූ ඔරලෝසුව දෙස බැලුවාය. වේලාව පාන්දර පහමාරය.

ඔහු මේ වෙද්දී ලංකාවට පැමිණ ඇති බව ඇය දනී... හිතට බරත් ඒකය... ඔහු තව පැයකින් දෙකකින් මේ ගෙදරට එනු ඇත.

ඔහුගේ පැමිණීම ගැන මේ තරමටම හිතෙන්නේ මොකටදැයි ඇය ඇගේ සිතින්ම ඇසුවාය... ඔහු ගැන රිදුම් දෙන මතකයක් ඇත්තේ මේ හදවතේය. ඒ ගැන ඔහු දන්නේ නැත.

ඔහුව දකින දකින වාරයට මේ හිතට දුකක් දැනේයැයි මුතුට බයය... එහෙම වන්නේ ඇයි... අතීතයේදී ඔහු ගැන මොහොතකට සිතා පිබිදුණ ආදර හදවත තවමත් ඇත්තේ එදා තිබූ හුදෙකලාවේමය.... කිසිවෙකුත් මේ හදවතේ එදා තිබූ ඉඩ පුරවා නැත.

කාංචන වැනි කෙනෙකුට කවදාවත් කෙනෙකුගේ හදවතේ ඇති ඉඩක් පිරවිය නොහැක. එහෙම සිතීමත් මෝඩකමකි. ඔහු මේ හදවත පුරවනවා තබා හදවතේ අහලකටවත් නොඅා කෙනෙකි. එහෙත් මේ ජීවිතය අයිති වන්නට යන්නේ ඔහුටය... ලියවිල්ලකින් මේ ජීවිතය ඔහුට දෙන තුරු තමා බලාගෙන ඉන්නවා නොවේදැයි මුතුට සිතුණි.

"ම..ට ඔයා වගේ කෙනෙක් ලැබෙන්න තිබ්බා... එහෙම වුණානම් අද ඔයා දුක් විඳින්නෙත් නෑ මං දුක් විඳින්නෙත් නෑ... අපි එහෙනම් මේ ඔක්කොම දාලා කොහේහරි ලස්සනට ජීවත් වෙනවා... පිටරටක හරි..."

ඒ අත්වැරදීම වූයේ ඔහුටද... නැත්නම් තමාටද... නොවේනම් දෙවියන්ටද... සමහර විට ඔහු තමා ගැන සිතන්නට වත් බය වන්නට ඇත.

"අන්තිමට ඔයා දුවෙක් එක්ක තනිවුණා... එහෙම වෙලා ඔයා ආයෙත් එන්නේ මේ ඇස් ඉස්සරහට... ඒ ඇයි මධුවන්ත... ඇයි..."





හිත නම් හදා ගත හැක. එහෙත් දුක නම් පපුවේ තිබෙනු ඇත.

"ආ... ඔයත් අද පාන්දරම ඇහැරුණාද... මං මේ නිකං උඩට ආවේ..."

නිම්මි ආවේ එහෙමම කියාගෙනමය... මුතු අලස ලෙස සිනාසුණාය.

"වෙනදට ටිකක් දවල් වෙනකං ඔයා නිදිනේ..."

නිම්මි කීවේ මුතුගේ ඇඳ මත ඉඳගෙනය. ඇය කෙල්ලගේ රෑ ඇඳුමෙන් පිටට පැමිණ තිබූ සුදු දෙපා ආදරයෙන් පිරිමැද්දාය.

"දැ..න් ඇහැරුණේ අක්කේ... ආයෙත් නින්ද ගියේ නෑ..."

"මො..නා..ද ඇඳට වෙලා හිත හිත හිටියේ..."

මුතු ඇස් පහත් කළාය. හිතූ ඒවා ඇයට කිව නොහැක.

"නිකං අක්කේ කල්පනා කර කර හිටියේ..."

නිම්මි මොනවාදෝ කියන්නට හදා පසුව ගිලි ගත්තාය... කෙල්ලගේ මුහුණ කොහොමත් මේ දවස්වල එච්චර හොඳ නැත. ඇය සිතුවේ ඒ කාංචන නිසා කියාය.

"අ..ද මධුවන්ත එනවනේ චූටි..."

"ම්..."

හිත බරත් ඒකය.

"දැන් ෆ්ලයිට් එක ඇවිල්ලත් ඇති..."

අක්කාට මොනවා කියන්නද කියා මුතුට තේරෙන්නේ නැත.

"මං ලලිතා එක්ක කිරිබත් චුට්ටක් හැදුවා... ලංකාවේ කෑමක් කන්නත් ආස ඇතිනේ... හොඳ වෙලාවට අද අම්මයි තාත්තයි දෙන්නම නෑ... ඊයේ කැන්ඩි ඉඩමක් බලන්න ගිහින් දෙන්නම නැවතිලා... මං උදේ මේසේ දාන්නම්... චුට්ටකට එන්න හොඳේ..."

මුතු අසරණ විය. අක්කා කරන්නට යන්නේ හිත එපා කියන



Elegantlk.com

දේමය. දැන් උදේම පපුව පුච්චා ගත යුතුය.

"මං.. මං ඉන්නෝන නෑ..නේ නේ..ද..."

"එ..හෙනම් කමක් නෑ... මං නිකං කිව්වේ..."

නිම්මි නැඟිට්ටේ මූණ දුක් කරගෙනය. මුතු එහෙමම ඇඟේ අතක් අල්ලා ගත්තාය.

"එ..න්..න..ම් ඉ..නි..න්..."

"අ..ද විතරක් චූටි... පස්සේ කොල්ලා අර ඇනෙක්ස් කැල්ලට වෙලා ඉදී..."

මුතු බිම බලාගත්තේ ඒ කතාවට හදවත ඒ තරමටම ඇවිලෙන නිසාය...

"මධුවන්තට චූටි මේ තරම් අකමැති ඇයි... ඒකට මොකක් හරි හේතුවක් තියෙන්නෝන... කෙල්ල එහෙම කරන කෙල්ලෙක් නෙමේ..."

නිම්මි පහළට ගියේ එසේ සිතමිනි.

* * * * * * * * * * * *

මධුවන්ත ආගමන විගමන කටයුතු නිම කිරීමෙන් පසු පහළට ආවේ ඔහුගේ ගමන් මලු ගන්නටය. දුවාට ඇහැරී තිබුණි. ඇය මධුවන්තගේ අතට වී වටපිට බැලුවේ නිදිබර ගතියෙනි.

"සුදු පැටියට කුක්කු තිබහද... ආ අම්මියෝ..."

මධුවන්ත කෙල්ලව සිප ගනිමින් ඇසුවේය... කෙල්ල ඉන්නේ තවමත් නිදිබර ගතියෙනි. දීර්ඝ ගුවන් ගමනකින් පසු එහෙමය. සිහිමද ගතියක් ඇතිවේ... මේ පැමිණ ඇත්තේ මව්බිමට බව කෙල්ල දන්නේ නැත.

මධුවන්ත පහළ ගමන් මලු එන "බැගේජ් බෙල්ට්" එක අසළට





වී ඉඳ ඔහුගේ ගමන් මලු දෙක ගත්තේය. ගමන් මලු දෙක ට්‍රොලියක තබාගෙන මධුවන්ත ගුවන් තොටුපලෙන් පිටතට ආවේ දුවවද වඩාගෙනය.

ඒ වෙද්දී එළිය වැටී තිබුණි.

"ඔ..න්..න පැටියෝ අ..පි ආවා... දැන් අපි නැන්දිවයි මාමිවයි බලන්න යං..."

"යං..."

කෙල්ලද කට උලුක් කර කියද්දී මධුවන්තගේ පපුව ඉහිරී යන ගානය.

ඔහු ගුවන් තොටුපලේ දොරකඩ ඇති ටැක්සි ඇණවුම් කරන තැනට ගොස් නාවලට යන්නට කැබ් රියක් කතා කර ගත්තේය.

ජීවිතයේ අලුත් නවාතැන්පළට තාත්තාවත් දුවවත් රැගෙන කැබ් රිය ගුවන් තොටුපල පරිශ්‍රයෙන් පිට විය... මධුවන්ත වාහනයට පසුවන පරිසරය දෙස බලා උන්නේ දුවවද ඔඩොක්කුවේ තබාගෙනය.

වාහනය මීගමු පාරේ ඇදී යද්දී මධුවන්තට සිහිවූයේ භාෂිණීවය... මේ මව්බිමේදී තව කී වරක් ඇයව සිහිවේදැයි දන්නේ නැත. "ආවනම් අපිත් එක්ක ලස්සනට ජීවිතේ පටන් ගන්නවා..." ඔහු සිතෙන් කීවේය.

"තා..ත්..ති... කු..ක්..කු බඩගිනියි..."

කෙල්ල කට උල් කර කියද්දී මධුවන්තගේ පපුවම දුකින් බර විය... උදෙන්ම කෙල්ලට කිරි ඕන නිසාම මධුවන්ත ගුවන් යානයේදීම ඇඟේ කිරි බෝතලයට පිටි දමාගෙන ගුවන් සේවිකාවකගෙන් උණු වතුර ඉල්ලාගෙන ඊට දමා ගත්තේය.

"බොමු පැටියෝ... ඉන්න තාත්ති ගන්නම්..."

"තා..ත්..ති කු..ක්..කු කෝ..."

"කුක්කු තියෙනවා මැණි.ක ඉ..න්..න..."

මධුවන්ත බෑගයෙන් කිරි බෝතලය ගත්තේය.

"හරි.. අපි බොමු..."



Elegantlk.com

කෙල්ල වාහනයේ පිටුපස අසුනේ ඔකුල් දෙක දිග හැර මධුවන්තගේ උකුලට හිස තබාගෙන කිරි බෝතලය කටේ තබා ගත්තාය. මධුවන්ත ඒ හිස අතගෑවේ "උඹ විතරනේ මට ඉතුරු උනේ" යැයි කියන්නාක් මෙනි.

මීගමු පාරේ පසුවන කඩ සාප්පු දෙස මධුවන්ත බලා උන්නේය. තවමත් උදෑසන නිසා බොහොමයක් ඒවා වසා ඇත.

හිතට පුංචි නිවනක් දැනෙන්නේ ලංකාවට ආ පසුය. එහෙත් හදවතේ බර එහෙමමය. මේ ගමන ආවේ ජීවිතයේ එසේ මෙසේ අවධානමක් ගෙන නොවේ. හිතාගත් ලෙසම අධිෂ්ඨානයෙන් ජීවිතයට මුහුණ දිය යුතුය...

"තා..ත්..නි කුක්කු වාරයි..."

කෙල්ල කිරි බෝතලයම බිව්වේ බඩගිනි නිසාය. මධුවන්ත ඇගේ මුව පිසදා කිරි බෝතලය බෑගයේ දමා ගත්තේය.

නාවලට ළං කර කෙල්ලගේ ඇඳුම මාරු කර ලස්සන ඇඳුමක් අන්දවා පවුඩර් ටිකක් දමා කොණ්ඩය පීරනවා යැයි මධුවන්ත සිතා ගත්තේය. දැන් ලෝකයට ආසාවෙන් පෙන්වන්නට ඇත්තේ ඇගේ ලස්සනය.





# 15

**මධුවන්ත** එනවා මුලින්ම දුටුවේ නිම්මි නොවේ. මුතුය. ඇය උන්නේ ඉහළ මාලයේ බැල්කනියේය. මධුවන්තව දැක මුතු එහෙමම කුළුණකට මුවා වූවාය. දුවවද වඩාගෙන ඔහු බසිද්දී මුතුගේ පපුවේ පැත්තක්ම කඩා වැටුණි. "ලස්සන හුරතල් පාට දුවෙක්" මුතුට සිතුණි.

මුතු ඔහු දෙස බලාගෙනම උන්නාය. ඔහු චුට්ටක්වත් වෙනස් වී නැත. ඒ මුහුණ එහෙමමය. වෙනස් වී ඇත්තේ ඔහුගේ දෛවය පමණි.



Elegantalks.com

මධුවන්ත බැස විශාල නිවස දෙස බැලුවේය... නිවස ඒ තරම් ලස්සනය... මේ ගෙදර ටිකකට හෝ තමාට නවාතැන් දුන්නායැයි සිතන්නටද අමාරුය... මධුවන්ත ඉහළ මාලයේ කුළුණකට මුවා වී උන් මුතුව දැක්කේ නැත.

ඉහළ මාලයේ ඉඳගෙන ඔහු දෙස බලමින් මුතු සිතුවේ ඔහුගේ ජීවිතය ගැනය. ඔහු මේ දුවවද රැගෙන ලංකාවට ආවේ ලේසියෙන් පිරිමියෙකු ගන්නා තීරණයක් රැගෙන නොවේ. දුෂ්කර අමාරු තීරණයක් රැගෙනය. බොහෝ පිරිමි කරන්නේ කසාදය පමණක් නොව දරුවන්ද අතහැර දමා කැඳැල්ලෙන් පියඹා ඒමය.

ඒ දේ ඔහු කළේ නැත. එහෙම කළේ ඒ තරම්ම ඔහු හොඳ කෙනෙක් නිසාය... දුව තාත්තාට පණ වාගේ ඇතැයි මුතුට සිතුණේ කෙල්ල තාත්තාව බදාගෙන වැළඳගෙන උන් ආකාරයටය.

මේ තරම් හොඳ සැමියෙකුත් මේ තරම් හුරතල් දුවෙකුත් සිටිද්දී ඔහුගේ බිරිඳ අරම කළේ ඇයිදැයි මුතුට සිතාගත නොහැක. දුවගෙන ගොස් ඔහුගෙන් දුවව ටිකක් ඉල්ලාගෙන වඩාගෙන ඉඹින්නට තරම් මුතුට සිතුණි. එහෙත් දැන් මේ පපුව වාවාගත යුතුය... තමා දැන් ඉන්නේ ඔහුට එසේ ළං වෙන්න පුළුවන් දුරක නොවේ. මුතුට පුදුම ඔහු මෙහෙම තනිවම ජීවත් වන්නට හිත හදා ගත්තේ කොහොමද කියාය. සමහර විට ඔහු එහෙම හිත හදාගන්නට ඇත්තේ ඔය පපුවේ එල්ලීගෙන ඉන්නා කෙල්ල දෙස බලාම විය හැක...

මධුවන්තව ගේට්ටුවෙන් ඇතුළට ගෙන සේන ඇතුළට දිව්වේය. දැන් අයියාත් අක්කාත් එන බව මුතු දනී. ඇය එහෙමම කාමරයට පැමිණ ඇඳමත ඉඳගත්තාය.

"ලොකු බේබි රට ඉඳලා එන මහත්තයා ආවා..."

සේන පැමිණ කීවේය. නිම්මි ප්‍රියමන්ත දෙස බලද්දීම ඇගේ දෑස් තෙමී අවසානය.

"අ..නේ ඇවිත් ප්‍රියා..."

දෙන්නාම පිටතට දුවගෙන ආවෝය. මධුවන්ත දුවවද වඩාගෙන





උන්නේ විශාල ගෙමිදුල මැදය... ඒ දර්ශනය දකිද්දී නිම්මිට ඇත්තටම වාවාගන්නට බැරි විය... ප්‍රියමන්තගේ පවා පපුව ඇකිලී ගියේය.

"අ..ක්..කේ..."

නිම්මි දුවගෙන විත් ඔහුගේ අතින් කෙල්ලව ගත්තාය... දුවව දකිද්දී ඇයව වාවන්නේම නැත...

"ය..න් මල්ලී..."

ප්‍රියමන්ත පැමිණ මධුවන්තව වැළඳ ගත්තේය. දෙන්නාගේම ඇස් බොඳව තිබුණි.

"උ..ඔ ආපු එක ලොකු ලො..කු දෙයක් ම..ල්ලී..."

ප්‍රියමන්ත කීවේ හැඟීම්බරවය.

"බ..ල..න්..න ප්‍රියා මල්ලිමයි..."

නිම්මි උඩට ඉඹිමින් කීවේය. ඇගේ ඇස්වල කඳුළය.

"උඹ පුංචි කාලේ වගේ..."

ප්‍රියමන්ත කීවේය.

"අපි හිමිහිට කතා කරමු... ය..න් ම..ල්ලියේ..."

නිම්මි ඔහුගේ අතකින් අල්ලාගෙනම කීවාය.

"තා..ත්ති එක්ක චූටි මැණික නැන්දියි මාමිවයි බලන්න ආවා... ආ චූටි මැණික..."

කෙල්ල සිනාසුණේ අසරණවය.

"අක්කවයි අයියවයි දන්නවා... මං ෆොටෝ පෙන්න පෙන්න කියලා දෙනවා..."

"ම..ගේ ස..ත්..තරං පැටියනේ..."

ගේ කොයි තරම් ලස්සනදැයි මධුවන්ත දැක්කේ නිවසට ඇතුල් වූ පසුය... නිවසේ ලස්සන ඔහු බලද්දී නිම්මිට දුකය... ඔහුට දෙන්නට



Elegantlk.com

වෙන්නේ මේ ගේ ඇතුලේ ලස්සන කාමරයක් නොවේ...

"ඉ..දගන්න මල්ලී..."

මධුවන්ත ඉදගත්තේ වටපිට බලමිනි...

"මුතු නංගී නැද්ද අක්කේ..."

ඔහු එහෙම අහනවා උඩු මහලේ සිට මුතුද අසාගෙනය. ඇය ගත් හුස්ම පපුවේ හිර කර ගත්තාය. "දැන් ඔයා ඇය මාව හොයන්නේ..." මුතු සිතෙන් කීවේය.

"උ..ඩ ඇති මල්ලී... පැටියා කිරි බීලද ඉන්නේ..."

"මං එද්දී කැබි එකේදී පෙව්වා අක්කේ... නැගිට්ට ගමන් කිරි එක ඕන... මං ෆ්ලයිට් එකේදිම හදාගෙන ආවේ..."

"අපි පස්සේ කුක්කු බයි කමු... මී.. නැන්දි එක්ක..."

නිම්මි මේ කෙල්ලව ඉඹගත් දහවෙනි වතාවය. ප්‍රියමන්ත කොල්ලා ළඟින්ම ඉඳ ගත්තේය.

"අපි හිමිහිට මේ ප්‍රශ්න විසඳගමු මල්ලී... උඹ ආවතේ..."

මධුවන්ත සිනාසුණේ අසරණ ලෙසිනි.

"මං.. ඔ..ක්..කො..ම දාලා අයියේ ආවේ... ක..සාදේ ර..ස්සාව.. ඔ..ක්කොම... ම..ට අ..ක්..කේ ටික දවසක් ඉ..න්න දෙ.න්න... හිමිහිට පිළිවෙල කරගන්නම්..."

නිම්මිගේ දෑස් කඳුළින් පිරුණි. ඊටත් වඩා කඳුළු පිරුණේ උඩු මහලේ සිට මේ කතාව අසාගෙන උන් මුතුගේය.

"අපි ඉ..න්..න..වනේ මල්ලී ඔයාට..."

"මං අ..ක්..කටයි අයියටයි කරදර කරන්න හිතුවේ නෑ. ඒත්.. ම..ට..."

"උඹ අපිට කරදරයක්... මේ දුව කරදරයක්..ද...





මධුවන්ත බිම බලාගෙන උන්නේ ඇස්වල කඳුළු නිසාය...

"ඔයා කඩා වැටිලා වගේ ඉන්නෙපා... එතකොට කොහොමද මේ දුවව හදා ගන්නේ... ජීවිතේ එක්කෙනෙකුට දීලා ආවා නෙමේනේ මල්ලී..."

"එ..හෙ..ම වෙ..න්නෑ අක්කේ... මං ඉක්මනට නැගිටිනවා..."

"ඔයා වැටිලා කියලා හිතන්නවත් එපා...."

"ගොඩක් දේවල් හදාගන්නෝන අක්කේ..."

"ඒ ඔක්කොම ඔයාට පුළුවන්... දවසක ඔයා ලස්සනට ජීවත් වෙයි..."

නිම්මි එහෙම කීවේ බොරුවටම නොවේ. මූනිච්චාටම නොවේ. ඔහු වැනි කොල්ලෙකුට එහෙම ජීවිතය දෙතුන් පාරක් නොවරදින නිසාය...

"තේ ටිකක් බීලා ඉමු මල්ලී.... අද ඔයා එන නිසාම මං කිරිබත් හැදුවා... දෙන්න ලලිතා මහත්තයට... මේ ඉන්නේ මධුවන්ත මහත්තයා... ප්‍රියා මහත්තයගේ මල්ලී..."

මධුවන්ත ඇය හා සිනාසුණාය.

"මගේ මැණිකත් කුක්කු බොනවද... මී..."

"බ..බා කු..ක්..කු බී..ව්වා..."

කෙල්ල කට ඇරියේ දැන්ය.

"අ..නේ දැන් කතාත් කරනවා..."

"ළඟදී ඉඳන් කතා කරන්න ගත්තේ... මීට වඩා කතා කරනවා... මං විතරනේ කෙල්ල එක්ක කතා කරන්නේ..."

නිම්මිත් ප්‍රියමන්තත් එකිනෙකා දෙස බැලුවේ දුකෙනි. නිම්මි දුවවද වඩාගෙන උඩු මහලට පිය මැන්නේ මුතුට දුවව පෙන්වන්නටය.



Elegantlk.com

"අපි ගිහින් චූටි නැන්දිව බලමු... මෙහේ අපේ දුවට නැන්දිලා ගොඩයි..."

අක්කා උඩට එන බව දැන මුතු බොරුවට අල්මාරිය ඇර ගත්තාය. මේ බොරුව කොතරම් කාලයක් කරන්නද... ඇය උඩට එන්නේ මධුවන්තගේ දුවවද රැගෙන බව මුතු දනී. කෙල්ල දකින්න නම් ඇයටද ආසය.

"චූටි මේ... මල්ලිගේ දුවා..."

අක්කා අතේ උන් දුවව දකිද්දී මුතුට ඇත්තටම ඇය ගැන ආදරයක් ඇති විය. ඇයට ඇත්තේ මධුවන්ත සේම අහිංසක මුහුණය.

"මල්ලි වගේමයි නේ..ද..."

"ම්..."

මුතු කීවේ ඇස් වහන් කරගෙන මෙනි.

"ඔයා තමා කොල්ලා එක්ක තරහ වෙලා ඉන්නේ... බලන්න ආපු ගමන් ඇහුවේ කෝ මුතු නංගි කියලා..."

මුතු ඊට පිළිතුරු නොදී ඇගේ මේසය මත තිබූ පුංචි හා පැටියෙක් අතට ගත්තාය.

"දූ..ට ඕ..න..ද ම්..."

"හා..වා..."

කෙල්ල හුරතලයෙන් කියද්දී මුතු ඇගේ කම්මුල් අතගා හා පැටියා ඇයට දුන්නාය.

"චූ..ටි..ට..ක් පහළට එන්න චූටි... හොඳ නෑ..නේ..."

"මං.. මං.. එ..න්..න..ම් අ..ක්..කේ..."

මේ අරෝව කුමක්දැයි නිම්මි දන්නේ නැත.

උඩට ගිය අක්කා එන්නේ තනිවමය. මුතු පහළට නොඑන්නේ ඇයිදැයි මධුවන්ත ඔතුවේය.





"නංගී දැන් ආවේ බාත් රූම් එකේ ඉඳලා... මේ දුවාට හාවෙක් දුන්නා..."

නිම්මි පැමිණ ඉඳගත්තේ මධුවන්ත ළඟින්මය.

"ම..ල්ලී..."

"අක්කේ..."

"අ..පි..ට ම..ල්ලි අපි හිතපු තරම් දෙයක් ලෑස්ති කරගන්න බැරි වුණා... ඒකට ම..ට සමාවෙන්න..."

නිම්මි කීවේ කඳුළු පිරුණු දෑසිනි.

"අ..නේ අ..ක්කේ ම..ට..."

"ඉතින් අහන්නකෝ... මේ ගෙවල් දොරවල් මගේ නෙමේ... මේවා මගේ න..ම් මීට වඩා දෙයක් ඔයාට ලෑස්ති කරලා දෙන්න හිබ්බා... ගෙට අල්ලලා තියෙන පොඩි ඇනෙක්ස් එකක් ම..ට ඔයාට ලෑස්ති කරන්න පුළුවන් උ..නේ..."

"ම..ට ඒ ඇති අක්කේ... අ..ක්කා ඒක හිතන්නෙපා... මං එහෙදි සැප විඳපු මිනිහෙක් නෙමේ... අපි උන්නේ චූටි ෆ්ලැට් එකක... ඉ..ව්වේ කාමරේ..."

"මෙහෙම ඉඳලා පස්සේ පිළිවෙලක් බලමු මල්ලි..."

ප්‍රියමන්ත කීවේය. මධුවන්තට තිබූ දුක තමාගේ පැමිණීමෙන් ඔවුන්ට කරදරයක් වුවාද කියාය.

"අ..පි ඉන්නේ මල්ලි හිමිහිට හදාගන්න... එ..හෙම හදාගෙන උන්න නම් මෙහෙම නෑ..."

"අ..ක්කා මං නිසා..."

"ම..ට ඉන්න ඔක්කොම නෑයන්ට වඩා ඔයාව මට වටිනවා...



Elegantlk.com

මං පුළුවන් හැමදේම කරන්නම්... ම..ට දු..කයි ඔයාට මෙහෙම පුංචි තැනක් ලෑස්ති කරන්න වුණාට.... මෙ..ච්..චර සැප ගෙදරක් තියෙද්දි..."

මධුවන්ත අසරණව ප්‍රියමන්ත දෙස බැලුවේය.

"ම...ට..යි කෙ.ල්ලටයි වැටිලා ඉන්න තැනක් තිබ්බම ඇති අක්කේ..." ටි..ක දවසකටනේ..."

"ඔ..ව් ඔයාව විතරක් නෙමේ මං අයියව වත් මෙතන තියාගන්නෑ..."

අක්කාත් අයියාත් මේ මහා විශාල මන්දිරයේ ජීවත් වන්නේ එතරම්ම කැමැත්තකින් නොවේයැයි මධුවන්තට සිතුණි.

මුතු පියැගට පෙළ බැසගෙන ආවේ ඒ මොහොතේදීය... මධුවන්තගේ දෑස් එහෙමම එසවිණ. ඇය අවසාන දවසේ දැක්කාටත් වඩා අද ලස්සනය. මුතු ඔවුන් අතරට ආවේ අමාරුවෙන් තුනී සිනාවක් නගාගෙනය.

"කො..හො..ම..ද නංගී..."

මධුවන්ත කතා කළේ කෙල්ලගේ පපුව පැලී යන තරමේ හිතවත්කමකිනි. ඔහු දෙස බලා ඇය අමාරුවෙන් සිනාසුණාය. "ඇයි ඔයා මෙහෙම" මධුවන්ත සිතුවේ ඇතුලාන්තයෙනි.

"ම..ල්ලි ටික දවසක් මෙහේ ඉන්නවා චූටි..."

ප්‍රියමන්ත මුතු දෙස බලා කීවේය.

"ම..ට අක්කා කිව්වා අයියේ..."

අයියා සමඟ මේ තරම් ආදරයෙන් කතා කරන ඇය තමා සමඟ කතා නොකරන්නේ ඇයි...

"අපි යන් චූටි නැන්දි එක්ක කුක්කු බයි කන්න... ම්..."

නිම්මි මුතුද එක්කාගෙනම මුළුතැන්ගෙය පැත්තට ආවාය.

"චූටි..."





"ම්..."

"ම..ල්ලි ඉන්නවට බබා කැමති නැද්ද... එ..හෙමනම් කියන්න..."

නිම්මි ඇසුවේ කෑම කාමරයේදීය.

"මං එ..හෙ..ම කිව්වද... ඇයි ඔයා මේ..."

"එ..හෙ..නම් ඇයි ඒකා එක්ක කතාවත් කරන්නැ..ත්තේ..."

"මං දන්නෑ..."

මුතු කීවේ මවාගත් හිතුවක්කාරකමිනි.

"ඒකා අහිංසකයෙක් චූටි..."

"දන්නවා..."

"එ..හෙනම්..."

මුතු එහෙමම හැරී නිම්මි දෙස බැලුවාය. ඇගේ දෑස් බොඳවී තිබුණි.

"එයාට කරන්න පුළුවන් දෙයක් කරන්න... ම..ගෙන් වෙන මොනවත් අහන්නෙපා..."

මුතු කීවේ බිම බලාගෙනය. නිම්මි මුතු දෙස බලා උන්නේ අසරණවය.

"උඹ මොනවා හරි මට හංගනවා..." නිම්මි සිතුවාය. එහෙත් ඇය අහන්නට එපා යැයි කියූ නිසා නිම්මි ඉන් එහාට ඇසුවේ නැත.

හේතුවක් නැතුව මුතු මහෙම නොකරන බව නිම්මි දනී. කෙල්ල ප්‍රියමන්තට කොතරම් ආදරේදැයි නිම්මි දැන උන්නාය. එහෙම එකේ ඇය මධුවන්තට වෙනස් කමක් කරයි කියා සිතන්නත් අමාරුය. "පස්සේ හිමිහිට කතා කරනවා"යැයි නිම්මි සිතාගත්තාය.

මුතු ලලිතා සමඟ එක්ව මේසය දැම්මේ නිහඬවමය. මේසය දමන අතරතුර කෙල්ල සිතුවේ ඒ මුහුණ අද කොතරම් අසරණ වී ඇත්ද කියාය.



Elegantlanks.com

ලලිතා උණුවෙන්ම මිරිස් මාළු කරියද මේසයට ගෙනවිත් තැබුවාය.

"චූටි..."

"ම්..."

"මෙහෙම පැටියෙකුයි අර වගේ අහිංසක කොල්ලෙකුයි දාලා ගෑණියෙක් ගියා කියලා හිතන්නත් අමාරුයි නේද චූටි..."

"ම්..."

"හොඳ කෙල්ලෙක්ව හම්බ වුණා නම් අද ලස්සනට ජීවත් වෙනවා..."

මුතු දෑස් සඟවාගෙනම ගොස් කට්ට සම්බෝලය ගෙනවිත් තැබුවාය.

"ල..ලිතා..."

"චූටි බේබි..."

"මේකට හැන්දක් තියන්න..."

කෙල්ල තමාගෙන් දෑස් වසන් කරන බව නිම්මි දනී.

"අ..ක්..කේ..."

"චූටි..."

"මං උඩට ය..න්..න..ම් හොඳේ..."

"ක..ම..ක් නෑ චූටි..."

නිම්මි කීවේ දුකෙනි. මුතු දුවගේ මුහුණ අතගෑවාය. කෙල්ල සිනාසුණේ හුරතල් ලෙසිනි. මුතුගේ පපුවම ඇවිලී ගියේය. "තාත්තගේ අහිංසක හිනාවමයි" ඇය සිතුවාය.

මුතු ආවේ සාලය හරහාය. ඇය සාලයට එද්දීම වාගේ මධුවන්ත





දෑස් එසෙව්වේය. තත්පර කිහිපයකට ඔහුගේත් මුතුගේත් දෑස් ගැටිණි. මුතුගේ දෙපාන්තයේ සිට මොනවදෝ ගින්දරක් පපුව කරා ආවේය.

"චූටි..."

ප්‍රියමන්ත කතා කළේය. මුතු එතනට ගියේ දෙනෙත් ප්‍රියමන්ත වෙත නබාගෙනය.

"අයියේ..."

"අද නංගි කොහේ හරි යනවද..."

"එ..හෙ..ම..ත් නෑ අයියේ... නුගේගොඩට නම් ටිකකට යනවා.. ඇයි..."

"නෑ චූටි මං නිකං ඇහුවේ..."

"කෑ..ම ලෑ..ස්..තියි අයියේ..."

මුතු කීවේ යංතමට ඔහු දෙසද බලාය. මධුවන්ත ඒ බැලූ ටිකට සිනාසුණේය. මුතු එහෙමම උඩට ආවාය. කාමරයට ආ ඇය එහෙමම ඇඳට වැටී දෑසින් පිටට ආ කඳුළට ගලා යන්නට දුන්නාය. "ඔයා වගේ කෙනෙකුට මෙහෙම කරන්න උනාට මට සමාවෙන්න..." ඇය සිතින් කීවාය.

* * * * * * * * * * *

නිම්මිත් ප්‍රියමන්තත් මධුවන්තව ඔහුට සූදානම් කළ කුඩා ඇනෙක්ස් එකට එක්කාගෙන ගියේ තරමක් දුකෙනි. නිවසේ වම් කොරිඩෝව දිගේ ඇවිදගෙන ගිය පසු හමුවන බට් අඹ ගස් පේළිය කෙළවර ඒ කුඩා ඇනෙක්ස් එක ඇත. විශාල අඹ ගසකින් දොරකඩ හෙවණ වූ ඒ කුඩා ඇනෙක්ස් එක මේ ගෙදර කොටසක්යැයි කියන්නට බැරි තරමිය.

නිම්මි දොර ඇරියේ මධුවන්තත් කෙල්ලක් දෙස බලාගෙනය.



Elegantlk.com

නිම්මි දොර ඇර බිම බලා ගත්තාය.

"මෙ..ත..න තමයි ම..ල්ලී අ..පට ලෑස්ති කරන්න පුළුවන් උනේ..."

ප්‍රියමන්ත කීවේ දුකෙනි.

"මේක ෂෝක් අක්කේ... අපි දෙන්නට හොඳටම ඇති..."

කොල්ලා කියන්නේ ඇත්තටමද නැත්නම් තමාගේ හිත හදන්නටද කියා නිම්මිට තේරෙන්නේ නැත.

"හො..ඳද ම..ල්ලී..."

මධුවන්ත ප්‍රියමන්ත දෙස බලා සිනාසුණේය.

"අපි සිංගප්පූරුවේ හිටියේ මීටත් වඩා පොඩි කෑල්ලක අයියේ... කාමරේ මේකෙනුත් බාගයක් ඇති... දුවා සෙල්ලම් කරන්නේ ඇද උඩ..."

නිම්මිගේ සිතට සහනයක් දැනුණි.

"මං මේ තරම් දෙයක් බලාපොරොත්තු උ..නේ නෑ අක්කේ..."

"පුළුවන්කමක් තිබ්බ නම් ගේ ඇතුලෙම කාමරයක් ලෑස්ති කරනවා මල්ලී..."

"මෙ..හෙම හොඳයි අක්කේ..."

"ඔ..යාට හොඳ නම් ඒ ඇති..."

නිම්මි කීවේ ප්‍රියමන්ත දෙස බලා සැනසුම් සුසුමක් හෙලාය.

"මෙතන තව පොඩි කෑල්ලක් තියෙනවා මල්ලී... මේ බාත්රූම් එක..."

"ම..ටයි කෙ..ල්ලටයි පිළිවෙලක් කරගන්න කල් මෙහේ ඉන්න දෙන්න අක්කේ..."

නිම්මිගේ දෑස්වල කඳුළු පිරුණි.





"අ..නේ එහෙම කියන්නෙපා... ඔයා මෙහෙන් යන එකක් ගැන හිතන්නෙපා..."

"අපි ටිකක් ඉඳලා හිතමු මල්ලී කරන දෙයක්... කලබලයක් නෑනේ..."

ප්‍රියමන්ත මෘදු හඬින් කීවේය.

"මල්ලි ටිකක් එහෙනම් රෙස්ට් කරන්න... මං දුවාව ගන්නද..."

"පුතු නැන්දි එක්ක යනවද.. ම්..."

කෙල්ල එහෙමම මධුවන්තව බදා ගත්තාය. නිම්මි සිනාසුණේ ආදරයෙනි.

"මං වොෂ් දාලා නිදි කරන්නම් අක්කේ... අද ටිකක් මහන්සියි වගේ..."

"මං ටවල් එකක් ගෙනත් දෙන්නද මල්ලී..."

"ඔක්කොම ගෙනාව අක්කේ... මං හිමිහිට අස් කරගන්නම්..."

නිම්මිත් ප්‍රියමන්තත් ආවේ හිතේ බරිනි. කාමරයට එනතෙක්ම දෙදෙනාම කතා කළේ නැත. කාමරයට ආ පසු නිම්මි ප්‍රියමන්ත දෙස බැලුවාය.

"මල්ලි කොහොම ජීවිතේ පටන් ගන්නද කියලා මට තේරෙන්නෑ පුතා... දැන් දුවාගේ වැඩ ඔක්කොම කරන්නෙපැයි... ඒකට කියලා ජීවිතයක් නැතිවෙයි..."

"කොල්ලට ඒ දුක පුරුදුයි නිම්මි..."

"මාත් පුළුවන් හැම වෙලාවෙම බලන්නම්... ඒත් මල්ලිව ඒ පුංචි කෑල්ලේ තනිකරලා කෙල්ලව උස්සන් එන්නත් බෑනේ..."

"බලමු... මල්ලිත් මොනවා හරි හිතාගෙන ඇතිනේ බබා..."

එහෙම කීවද කොල්ලා වැටී ඇත්තේ කොතරම් අමාරු

නැනකටදැයි ප්‍රියමන්තටත් සිතෙන්නේ දැන්ය.

"ප්‍රියා..."

"ම්..."

"චූටිගේ අමුත්තක් තියෙනවා නේද..."

"මාත් ඔයාගෙන් අහන්න උන්නේ... මල්ලී එක්ක වචනයක් කතා කළේ නෑ... මටත් හරි පුදුමයි... අපේ එකාගේ මූණ මේන් මෙච්චර වෙලා තිබ්බේ..."

"මටත් හිතාගන්නම බැහැ... මුතු එහෙම කරන කෙල්ලෙක් නෙමේ..."

"ඒකම තමා පුදුම..."

"ඔතන මොකක් හරි දෙයක් තියෙනවා... අපි දන්නේ නැති..."

"මොනවා තියෙන්නද... මේකා මේ සිංගප්පූරුවේ ඉඳලා ආපු එකානේ..."

"ඒත් ප්‍රියා අපේ වෙඩින් එක දවස්වල... දෙ..න්..නා අ..ත..ර..."

"මං.. හි..ත..න්..නෑ..."

"බලමුකෝ..."

නිමිති සුසුමක් හෙලා කීවාය.





# 16

මුතුගේ කාමරයට පිටින් ඇති කුඩා බැල්කනියට පිවිසි කල පහළ මධුවන්ත ඉන්නා ඇනෙක්ස් කැල්ලේ කතා කරන සියල්ල ඇසෙයි. කාමරයේ උන් මුතු පහළ මධුවන්ත දුවත් සමඟ කතා කරන සියල්ල අසා උන්නාය... බැල්කනියේ වූ වේවැල් පුටුවට බර වූ විට කත තිබ්බාක් මෙන් සියල්ල ඇසෙයි.

"චූටි නැන්දි පුතුට හාවෙක් දුන්නද... ආ මැණික..."

"හා..වා ෂෝ..යි තා..ත්..තියෝ..."

මුතු තනිවම සිනාසුණාය. ඔහු තමාට නමකුත් දා ඇත. "චූටි නැන්දි..."

"චූටි නැන්දි පුතුට මොනාද කිව්වේ.. ම්..."



Elegantta

"උ..ම්..මා දු..න්..නා..."

"උම්මා දුන්නා... ඉතින් මගේ සත්තරනුත් උම්මා එකක් දෙන්නෙපැයි..."

කෙල්ල කිසිවක් කීවේ නැත.

"අපි වොෂ් දාමු... ම්.. වොෂ් දාලා කුක්කු බොමු..."

ඔහු මේ සියල්ල කරන්නේ කෙසේද... මේවා කළ යුත්තේ අම්මා කෙනෙකුගේ අතිනි. කෙල්ලට දැන් සදාකාලයටම අම්මා කෙනෙක් නැත. ඒත් ඇය වාසනාවන්තය. ඔහු වැනි තාත්තා කෙනෙක් ලබන හැම දුවක්ම වාසනාවන්තය.

"ජෝ සීතයිද අම්මියෝ... ම්..."

ඔහු කෙල්ලට කොතරම් ආදරේදැයි මුතු ඇයට ඇසෙන වදන් වලින්ම තේරුම් ගත්තාය. තාත්තා කෙනෙක් දරුවන්ට මේ තරම් ආදරේ කරනු ඇය දැක නැත. "මටත් එහෙම තාත්තා කෙනෙක් උන්නනම්..." කියා මුතුට සිතුණි.

"මැණිකට මෙහේ ෂෝයිද..."

"ෂෝයි.. කෝ.. හා..වා..."

කෙල්ල ඔය හොයන්නේ තමා දුන් හාවා බව මුතු දනී... ඇය ඒ හාවාට මේ තරම් ආදරය කරනැයි ඇය සිතුවේ නැත.

"කෝ චූටි නැන්දිගේ හාවා... ආ මේ ඉන්නේ... හාවාට ආසද..."

ඔහු දුවගෙන් අසන්නේ ආදරයෙනි.

"ම්.. දැන් හාවා එක්ක සෙල්ලම් කර..න්න හොඳේ... තාත්ති කුක්කු හදලා දෙන්නම්.. ම්..."

මුතුට හීල්ලින... කිරි ටික පවා ඔහු තනියෙන් හදාගත යුතුය... ඒ දුකට ඔහු පුරුදු වී ඇතැයි මුතුට සිතුණි.

මුතු බැල්කනියෙන් මෑත් වූයේ තාත්තාගේත් දුගේත් කතා අසා





සිටිද්දී දුක වැඩි නිසාය. කොහොමත් ඉස්සරහට දිගටම පපුව පිච්චෙනු ඇත.

නිම්මි උඩට ආවේ මුතුට කිරිබත් බෙදාගෙනය. කෙල්ල උඩට ගියේ නොකා බව ඇය දනී.

"ම්.. කෑවේ නැනේ ඔයා..."

මුතුගේ පපුව ඇවිලිණ. අක්කා තමා ගැන මොනවා හිතනවා ඇද්දැයි ඇය සිතුවාය. නිම්මි ට්‍රේ එකේ තබාගෙන ආ කිරිබත් පිඟානට පුංචි දිසියෙන් ගෙන මාළු ටිකක් දැම්මාය.

"ක..න්..න..."

නිම්මි ඊට වඩා දෙයක් කතා කළේ නැත. මුතුට දුකය.

"ඇ..යි ඔ..යා තරහෙන් වගේ..."

මුතු ඇසුවේ ඇත්තටම දුකෙනි.

"එ..හෙම දෙයක් නෑ චූටි..."

"කිරිබත් රහයි... ඔයාද හැදුවේ..."

"ම්.. ලලිතගෙන් අහගෙන හැදුවේ... ඉස්සරහට උයන්න හොඳටම ඉගෙන ගන්නවා..."

"හ..දිස්සියේ..."

"ඉක්මනටම අලුත් ජීවිතයක් පටන් ගන්නෝන චූටි... මේක ජීවිතයක් නෙමේ... කිසි ල..ස්සනක් නෑ..."

මුතු කිරිබත් පිඟාන අතේ තබාගෙන නිම්මි දෙස බලාගෙන උන්නාය.

"ම..ගෙ..නු..ත් වරදක් උනා ව..ගේ..නේ ඔ..යා ක..තා කරන්නේ..."

නිම්මි සිනාසුණාය.

"කොල්ලට හරි බයේ කාමරේ දුන්නේ... ඒකට ඒ හොඳයිලු..."

Elegant Talks.com

"එ.. එ..ත..කොට අ..ක්..කේ කෑම බීම..."

නිම්මි ඇඳ මත ඉඳගෙන දිග සුසුමක් හෙළුවාය.

"මං ල..ලි..ත..ට කිව්වා... මෙයාලා ඉන්න වෙලාවට තමා බය... මොකක් හරි කට කැඩිච්ච කතාවක් කිව්වොත් අපිටත් මෙහේ ඉත්න එපා වෙයි..."

"අ..පි ඉවසමු..."

"මි... සමහර විට කොල්ලා මොකක් හරි පිළිවෙලක් හදා ගනී..."

අක්කා ඉන්නේ ලොකු හිතේ බරකින් බව මුතු දනී. ඒ දුක සාධාරණයි. මුතු කිරිබත් කමින්ම බැල්කනිය අද්දරට ආවාය. දැන් තාත්තගේ දූගේ සද්දයක් නැත. කෙල්ල නිදාගන්නට ඇතැයි මුතුට සිතුණි.

ලලිතා උඩට ආවේ තේ අරගෙනය.

"ලලිතා..."

"චූටි බේබි..."

"මේ.. අ..ර ආපු මහත්තයට තේ දුන්නද..."

"නා..ම දු..න්..නෑ චූටි බේබි..."

"තේ..ක..ක් දෙ..න්..න ලලිතා..."

"හොඳයි බේබි..."

ඔහු ගැන මේ තරමටම කැක්කුමක් එන්නේ ඇයි... හිතාගෙන උන්නේ ඔහු මේ ගෙදරට ආ විට අහක බලාගෙනම ඉන්නට නොවේද...

* * * * * * * * * * *





මේ ලෝකේ දෙයක් නොදැන නිදාගෙන ඉන්නා දුව දෙස මධුවන්ත බලා උන්නේය. ඊයේ සිංගප්පූරුවේ අපාට්මන්ට් නිවසේ ඇඳ මත සැපට නිදාගත් කෙල්ල අද මේ පුංචි ඇතෙක්ස් එකේ ඒ සැපෙන්ම නිදා ගනී.

මධුවන්ත පුංචි ඇතෙක්ස් එක පුරා ඇවිද්දේය. අක්කාත් අයියාත් මේ පුංචි ඇතෙක්ස් එක තමාට පෙන්නුවේ කැමැත්තෙන් නොවේ. එහෙත් ජීවිතයේ දුෂ්කරම දවස්වලදී තමාට හෙවණක් දුන් මේ පුංචි ඇතෙක්ස් කෑල්ලට මධුවන්ත ආශා කළේය. ගේ ඇතුලේ කාමරයක් ලැබුණොත් මේ තරම්ම නිදහසක් නැත. ඊට වඩා මේ ඇතෙක්ස් කෑල්ල ලැබුණ එක හොඳය. නිදහස්ය.

කාමරයට යාබධව පුංචි කුස්සි කෑල්ලක් ඇත. දූගේ කෑම ටික හදන්නට ඒ කුස්සි කෑල්ල ප්‍රමාණවත්ය. පුංචි ලිපක් අරගෙන ආ එක හොඳයැයි මධුවන්තට සිතුණි.

මධුවන්ත තවමත් ඉන්නේ එයාර් පෝට් එකේ සිට ආ ඇදුම්න්මය. පස්සේ නා ගන්නවා යැයි ඔහු සිතා ගත්තේය. තවමත් ඔළුවේ පිළිවෙලක් නැත. හිමිහිට හිසටත් පෑදෙන්නට දිය යුතුය.

ලලිතා ආවේ තේ රැගෙනය. මධුවන්ත ඇය හා සුහදව සිනාසුණේය.

"අ..තේ ලලිතා තේත් ගෙනාවද... මං තේ ඉස්සෙල්ලා බිව්වනේ ලලිතා..."

"චූටි බේබි කි..ව්..වේ මහත්තයා..."

ලලිතා චූටි බේබි කිව්වේ මුතුට බව මධුවන්ත දනී.

"කමක් නෑ දෙන්න.. තිබහයි නමා..."

ලලිතා තේ එක මධුවන්තට දී නිදාගෙන උන් දුව දෙස බැලුවාය. ඇගේ පපුව දරු සෙනෙහසින් පිරී ගියේය.

"අ..තේ බේබි නිදි නේද මහත්තයා... මහන්සි ඇති.."

"ඔව් ලලිතා... ඊයේ හවස ඉඳන්නෙ එන්නේ..."

"බේබි මොනවත් බිව්වද මහත්තයා..."

"මං කිරි හදලා දුන්නා ලලිතා... කිරි බිව්ව ගමන් නිදාගන්නවා... ඒකට පුරුදු වෙලා..."

"ම..හ..ත්..තයා කිරි හැදුවද... උණු වතුර කොහෙන්ද ගත්තේ... අනේ මං දන්නෑනේ..."

"මං ළඟ හීටර් එකක් තියෙනවා ලලිතා... එයාගේ බඩු ඔක්කොම අරගෙන ආවේ... නැත්නම් කරදරයිනේ..."

ලලිතාගේ පපුව උණු වී ගියේය.

"අ..නේ ඉතින් මහත්තයා ඔක්කොම කරගන්නේ කොහොමද... හදන වෙලාවට ඉල්ලන්න මහත්තයා..."

"මං ඕන උනොත් ඉල්ලන්නම් ලලිතා... ඒක එච්චර අමාරු නෑ... එහෙදිත් මම තනියම තමා මේවා කරගන්නේ..."

මධුවන්ත තේක බොමින් බලා උන්නේ කෙල්ල දෙසය. ඇය ඕනවට වඩා වද දෙන දරුවෙක් නොවේ. ඒ නිසා මේ පුංචි කාමරයේ කෙල්ලව තබාගෙන බලා ගත හැක. හවස් වරුවක එළියට යද්දී කෙල්ලවත් අරගෙනම යනවා යැයි මධුවන්ත සිතුවේය.

"ඔයයි මායි අන්තිමට මේ පුංචි කාමරේ තනිවුණා..."

මධුවන්ත කෙල්ලගේ පුංචි දෙපා පිරිමදිමින් කීවේය.

"අම්මි දැන් සිංගප්පූරුවේ තනියම... අපි එක්ක ආවනම් අපි කුන්දෙනාට පුංචි ගෙයක් අරන් ඉන්න තිබ්බා... එහෙනම් අපි දෙන්නා මෙහෙම අනාථයෝ දෙන්නෙක් වෙන්නෑ... අම්මිට කවදහරි තේරෙයි..."

මධුවන්ත කෙල්ලගේ දෙපා පිරිමදිමින් කල්පනා කරනු නිම්මි මොහොතක් බලා උන්නේ සංවේගයෙනි.





"ම..ල්ලී..."

"අ..ක්..කේ..."

නිම්මිද පැමිණ ඇඳ මතින් වාඩි වූවාය.

"අ..නේ තාම ආ..පු ඇදුම් පිටින්නේ... මල්ලී වොෂ් එකක් දාගන්නේ නැද්ද..."

"හිමිහිට දාගන්නවා අක්කේ... ආපු ගමන් දුවාව නාවලා කිරි දුන්නා..."

"ඒක තමා සනීපෙට නින්ද ගිහින් තියෙන්නේ... මල්ලී හීටරයක් ගෙනාවද..."

"ඔව් අක්කේ... මං එයාගේ බඩු ඔක්කොම ගෙනාවා... කෑම හදන ඒවත් ගෙනාවා..."

"ල..ලි..තට කියලත් හදාගන්න පුළුවන් මල්ලියේ..."

"අ..නේ එ..හෙම දෙයක් නෙමේ අක්කේ... එයා කන විදිහක් තියෙනවා... එහෙම හදලා දුන්නැත්නම් කන්නෙම නෑ..."

ඔහු හිතාගෙන උන්නේ එසේ මෙසේ දුකක් විඳින්නට නොවේ. කෙල්ල වෙනුවෙන් ජීවිතයම දෙන්නටය. සමහර විට අම්මා කෙනෙක්වත් ඒ තරම්ම දරුවෙකුට කැප වෙන්නේ නැත.

"මොනාහරි ඕනද කියලා අහන්න ආවේ මල්ලියේ..."

"අ..නේ නෑ අක්කේ.. මං හැම දෙයක්ම අරගෙන ආවේ... මං අක්කේ අක්කටයි අයියටයි බඩු වගයක් ගෙනාවා... අස් කරගෙන එන්නම්..."

"අ..නේ.. ඔයා කරදරත් තියාගෙන නැගිත් ගෙනාවද..."

"මං අ..ක්..කේ මුතු නංගිටත් පොඩි ප්‍රසන්ට් එකක් ගත්තා..."



Elegantbooks.com

"ම්..."

"මා..ත් එක්ක වැඩිය කතාවක් නෑ... මං බයේ ඉන්නේ තරහ වෙලාද කියලත්..."

"තරහ වෙන දෙයක් රට යන්න කලින් උනාද..."

"මං.. අ..ක්..කේ දැ..නුවත්ව එ..හෙම දෙයක් ති..බ්බේ නෑ..."

"ම්.. ඒත් කෙල්ල ගැන අහිතක් හිතන්නෙපා... එහෙම කෙල්ලෙක් නම් නෙමේ..."

"මං දන්නවා අක්කේ..."

හොඳ කෙනෙකුට එහෙම බලෙන් නරක කෙනෙක් විය නොහැක. ඇය තරහ යැයි පෙන්නන්නේ බොරුවට බව මධුවන්තද දනී. ඒ ඇස්වල එහෙම තරහක් නැත.

"මල්ලී... මං ලලිතට කියන්නම් මල්ලිට කෑම ගෙනත් දෙන්න කියලා..."

"අ..නේ අක්කේ... මගේ කෑම ගැන හිතන්නෙපා... ඒක මහ දෙයක් නෙමේ..."

"එහෙම කොහොමද ඔයා මෙතන බඩගින්නේ ඉඳිද්දී අපි කන්නේ කොහොමද..."

"මං.. ම..ගේ ජීවිතේ පිළිවෙලක් කරගන්න ඕන අ..ක්..කේ... තනියම අපි දෙන්නා ජීවත් වෙන්න පුරුදු වීගෙන ආවේ... නැත්නම් අමාරුයි..."

නිම්මිගේ දෑස්වල කඳුළු පිරී තිබුණි.

"අ..නේ අ..ක්..කා මේ..."

"මං.. පුළුවන් වෙලාවට එවනවා කෑම හොඳද... ඒකට එපා





කියන්නෙපා..."

ඔහු පොඩි එකෙකු සේ හිස වැනුවේය. මධුවන්ත මෙහෙම කියන්නේ අහිතකින් නොවන බව නිම්මි දනී. ඔහුගේ ජීවිතය හදාගත් පිළිවෙල බිඳේ යැයි ඔහුටම බයය. ඉන්නා කවුරුවත් සදාකාලයටම මේ ජීවිතයේ නැත. ඒ අය නැතිවූ විට ආයෙත් පරණ ජීවිතයට පුරුදු වීම අමාරුය.

* * * * * * * * * *

මධුවන්ත අයියාටත් අක්කාටත් දෙන්නට ගෙනා ඇඳුම් ටිකත් පුංචි පුංචි කළමනා ටිකත් එක බෑගයකට දමා ගත්තේය. මුතුට ගත්තේ ලස්සන සායකුත් එයටම ගැළපෙන බ්ලවුසයකුත් විලවුන් බෝතලයකුත් පමණි. ඒ මදි යැයි දැන් මධුවන්තට සිතෙයි. ඔහු දූට ගෙනා ජොන්සන් ක්‍රීම් එකකුත් චොකලට් එකකුත් ඒ බෑගයට දැම්මේය.

"චූටි පැටියෝ... මේ.. අපි යන් නැන්දිලටයි මාමිටයි තෑගි දෙන්න..."

කෙල්ල මධුවන්තගේ අතට පැන්නේ දඟලමිනි. මධුවන්ත ඇයවද වඩාගෙන බෑග් දෙක අතට ගත්තේය. මේ ගෙනාවා මදිය. එහෙත් ඊට වඩා යමක් ගන්නට වියදම් කරන්නට පුළුවන්කමක් නොවීය.

මධුවන්ත විශාල නිවසට ඇතුල් වී තව වරක් නිවසේ හැඩ බැලුවේය. අක්කාටත් අයියාටත් දුක මේ ගෙදර කාමරයක් තමාට දෙන්නට නැති වූ එකටය. සමහර විට ඇගේ තාත්තාත් අම්මාත් එහෙම කාමරයක් දෙන්නට අකමැති වන්නට ඇත. අයියාටත් අක්කාටත් එහෙම බාල්දු වන්නට වූයේ තමා නිසාය.

"අ..ක්..කේ අයි..යේ..."

මධුවන්ත ඔවුන්ගේ කාමරයේ දොරකඩ සිට කතා කළේය.

"නැ..න්..දි කියන්න මැණික..."

"නැ..න්..දී..."

කෙල්ල කට උලුක් කර එහෙම කීවාය. නිම්මි ආවේ ඒ හඬටය.

"එ..න්..න ම..ල්..ලී..."

ඒ කාමරය ලස්සනය.

"මං මේ අක්කටයි අයියටයි පොඩී තෑග්ගක් ගත්තා... මහ දෙයක් ගන්න නම් බැරි වුණා..."

"උඹට පිස්සුනේ බං... මේ කරදර අස්සේ මොකට තෑගි ගන්න ගියාද... නේද පැටියෝ..."

ප්‍රියමන්ත දුවව ඉඹගෙන කීවේය. කෙල්ල කිති කැවී ගොස් ඇඹරුණාය.

"අ..ක්..කේ මේ මුතු නංගිගේ එ..ක..."

"අනේ මහත්තයෝ ඉතින් නංගිට ගත්ත එක මට දීලා හරියන්නැතේ..."

"න..ංගී කෝ..හෙද ද..න්..නෑ..."

"මං කාමරේ පෙන්නන්නම්... ගිහින් දෙන්න... අද ගෙදර කවුරුවත් නෑ... බය නැතුව ඇවිදින්න..."

නිම්මි නොකියා කීවේ අනිත් දවස්වලට මේ ගෙදර මේ තරම් නිදහස් නැති බවද...

"අ..ර තියෙන්..නේ.. කෙල්ල උඩ ඉන්නවා... මල්ලී ගිහින් දෙන්න..."

මධුවන්ත ලස්සන පියගැට පෙළ දිගේ උඩට ගියේ තරමක් චකිතයෙනි. "චූටි නැන්දි අපිත් එක්ක තරහ වෙලානේ පැටියෝ..."

මුතු උන්නේ උඩ සැටියේ ඇලවීගෙන මෙනි. මොහොතකට





කලින් ඇය කියවමින් උන් සඟරාව එහෙමම ඇගේ පපුව මතය...

"චූ..ටි නැ..න්දි දොයිද කොහෙද..."

මධුවන්ත රහසින් මෙන් දුවාට කීවේය.

"නංගි..."

මධුවන්ත කතා කළේ බිම බලාගෙනය. මුතු බැලුවේ ගැස්සී මෙනි. ඔහු දුවවද වඩාගෙන උඩ සිටිනවා දකිද්දී ඇය එහෙමම සැටිය මත ඉඳගත්තාය.. මධුවන්ත අඩි තුන හතරක් ඇවිදගෙන ආවේය. මුතු යංතමට හිස ඔසවා ඔහු දෙස බැලුවාය.

"නංගි මේ.. මං එ..ද්දි අ..රන් ආවේ.. නංගිට පොඩි ප්‍රසන්ට් එකක්..."

මධුවන්ත ඒ ටික කීවේ පුදුමාකාර අමාරුවකිනි. එසේ කියා ඔහු ඇය දෙසට පිටරට බෑගය දිගු කළේය. ඉන් වහනය වන සුවඳක් හරි ඉක්මනින් අවට පැතිරිණි. ඒ එන්නේ රට ඇදුම් වලින් එන සුවඳය.

තාම කෙල්ල අත එසෙව්වේ නැත. මධුවන්ත බලා උන්නේ දුකෙනි.

"අපි ආවේ හ..දිස්සියෙන් නංගී... වෙලාවක් තිබ්බේ නෑ මොනවත් ගන්න... මං මේ.. නංගිට කියලමයි තේරුවේ..."

පපුව මේ තරමටම කඩා හැලෙන්නේ ඇයි...

"නෑ..න්..කියු..."

මුතු රොබෝ කෙනෙකු මෙන් අත ඔසවා ඔහුගේ අතින් ඒ බෑගය ගත්තාය.

"චූටි නැන්දිට ටටා කියන්න පුතු..."

කෙල්ල දැතින්ම ටටා කීවාය. මුතු සිනාසුණේ ඇය සමඟ පමණි.

"ය..න්..නම් නංගී..."

ඔහු පහළට බසින තුරු පපුවේ හුස්ම වැටුනේ නැත.

"ග..ත්..ත..ද..."

පහළදී නිම්මි මධුවන්තගෙන් ඇසුවේ රහසින් මෙනි.

"ග..ත්..තා අක්කේ... දුව එක්ක හිනාවුණා... මා එක්ක නෑ..."

ඒ කතාව දුක හිතෙන කතාවකි.

"කෙල්ලට මේ දවස්වල වෙන ප්‍රශ්නයක් තියෙනවා මල්ලී... මං හිමිහිට කියන්නම්කෝ..."

"මං යන්නම් අක්කේ..."

"දුවාට මොනාද අපි කවන්නේ..."

මධුවන්ත සිනාසුණේය.

"හවසට ගිහින් එයාගේ බඩු ටික ගන්නවා අක්කේ..."

"මං ලලිතට කියන්නම් මොනා හරි දුවාට හදන්න කියලා..."

මධුවන්ත හිස වැනුවේ අසරණවය.





# 17

**මුතු** මධුවන්ත තෑගි දුන් බෑගය විවර කළේ කාමරයේ දොරද වසාගෙනය. මොකක්දෝ හේතුවක් නිසා ඇගේ හිතට තුනී මිහිරක් දැනෙයි. "එයාට මාවත් මතක් වුණා එහෙනම්" මුතු සිතුවාය.

ඔහු තෝරා ගෙනවිත් තිබූ සායත් බ්ලවුසයත් ඇත්තටම ලස්සනය. එය අතට ගනිද්දී ඇයට දුක සිතුණි. ඔහුත් සමඟ මීට වඩා හිතවත් කමකින් කතා කරන්නට බැරිවීම ඇත්තටම දුකකි.

ඇඳගෙන උන් ඇඳුම උනා දමා මුතු ඔහු ගෙනා ඇඳුම ඇඟට දමාගෙන බැලුවාය. තමාව අරන් ගොස් තේරුවාක් සේ ඒ ඇඳුම ගැණට තමාට හරිය. පුදුමය. මුතු කැඩපත ළඟට ගොස් ඒ ඇඳුමේ හැඩ බැලුවාය. පහළට ගොස් අක්කාට පෙන්වන්නට හිතෙනා තරම්ය.



Elegantalks.com

එහෙත් දැන් ඒක කරන්නට ලැජ්ජය.

ඔහු ගෙන ආ විලවුන් කුප්පිය ඇය විවර කළේ ඇඳමත ඉඳගෙනය. මුතු ඉන් බිඳක් අත්ලට විද සුවඳ බැලුවාය. ඉන් එන්නේ කෙදිනකවත් විඳ නැති අහිංසක සුවඳකි.

මුතුට හිල්ලීගෙන ගියේය. ඔහු තැගි ගෙනෙද්දී පවා ගෙනාවේ අයියාටත් අක්කාටත් පමණක් නොවේ. සිංගප්පූරුවේ සිට ඔහු කතා කරද්දීවත් ඔහු සමඟ සුහදව කතා කළේ නැත. ඔහු මෙහෙම අරගෙන ආවේ එහෙම තිබියදීය.

ඔහුටවත්... අක්කාටවත් මේ හදවතේ ඇති ඇත්ත දුක කිව නොහැක. ඒ දුක එහෙමම පපුවේ තිබෙනු ඇත.

මුතු ඒ අලුත් ඇඳුම උනා දමා පරිස්සමින් අල්මාරියේ තැන්පත් කළාය. මෙහෙම කාටත් නොපෙනෙනා ලෙස ඇන්දාට ඒ ඇඳුම ඔහුට පෙනෙන්නට ඇඳගෙන යා නොහැක.

හදවතට දුකක් ආ පසු කල්පයක් ගියද ඒ දුක පහව යන්නේ නැත. පුදුම ඒකය... අද ඔහුව දකිද්දී පෑරෙන්නේ අදින් වසර කිහිපයකට පෙර ඔහු නිසාම රිදුණ පපුවය. එසේ ඔහු නිසා මේ පපුවට දුකක් ආ බව වත් ඔහු දන්නේ නැත. දුකත් ඒකය.

ඔහු ලංකාවට ආ පසු... ඔහු අද උදේ දුටු පසු... හදවතේ පතුලේ ඔහු වෙනුවෙන් ඉතිරිව තිබූ මොකක්දෝ හැඟීමක් යළිත් ඇවිස්සුණාක් මෙන් විය... ඒ හැඟීම උපදින්නේ ඔහු වෙනුවෙන් පමණක් නොවේ. චූටි දුව වෙනුවෙන්ද එවැනිම හැඟීමක් පපුවේ කැලතෙයි.

ඒ තනිවූ ජීවිත දෙකට කාගේ හෝ රැකවරණයක් ආදරයක් ඉක්මනින්ම ඕනේ යැයි මුතුට සිතුණි. එසේ නොවුවහොත් ඒ ජීවිත දෙකම අපරාදේය. ඔහුට ඇත්තේ ඒ තරම් අපතේ යැවිය යුතු නොවටිනා ජීවිතයක් නොවේ...

ඒත් දැන් ඔහු දුවත් හදාගෙන තනිවම ජීවත් වන්නට අමාරුවෙන් හිත හදාගත් කෙනෙකි. වඩාත් වටින්නේ එහෙම හිත හදා ගන්නට ඔහුට ඉඩ හැරීමය. ඔහු මේ ගෙදරට ආවේ එකවර සියල්ල පිළිවෙලක්





කරගන්නට අමාරු නිසාය...

ඔහු එහෙමවත් හිත හදාගෙන සතුටින් ජීවත් වන්නට කවදාක හෝ පටන් ගනු ඇත... එහෙත් තමාගේ මුළු ජීවිතයම අගාධයකට ගසාගෙන යනවා නොවේදැයි මුතුට සිතුණි. ඒ අගාධයෙන් තමාව ගලවා ගන්නේ කවුද...

මුතුට හිල්ලින.

කෙල්ල නිදාගත්තේ කිරි ටික පවා නොබීය. ඒ තරමටම අද දුවගේ බඩ පිරී ඇත. අද ඇය කෑවේ ලලිතා හදා දුන් බතුත් අල සුදු කරියත් සමඟය. ඒ රහට කෙල්ල බත් යහමින් කෑවාය. සිංගප්පූරුවේදී නූඩ්ල්ස්ම කෑ ඇයට අල හොද්ද රස බෝජුනක් මෙන් විය. දුවත් තමා වගේම යැයි මධුවන්තට සිතුණි.

එහෙම වූ එක හොඳය. භාෂිණි ලංකාවේ කෑම වලට කැමතිම නැත. සිංගප්පූරුවේ සිටිද්දී මධුවන්ත ඉඳහිට සිංහල ක්‍රමයට බත් ඉව්වේය. ඔහු බොහෝ විට හදන්නේ කරවල බැදුමකුත් පරිප්පු හොද්දකුත් පොල් සම්බෝලයකුත්ය. ඒ කෑම භාෂිණි කෑවේ කැමැත්තකින් නොවේ.

එහෙම එකේ දුව මෙහෙම කන්නට ආස තමාගේ ලේ නිසා යැයි මධුවන්තට සිතෙයි.

"බඩු ටිකක් හිමිහිට ගෙනත් මාළු චුට්ටක් වගේ හදලා දෙන්න ඕන..."

මධුවන්ත සිතුවේය... ලංකාවේ කඩයකට යන්නටත් ආසය... කොහොමත් දැන් ජීවිතය බිංදුවේ සිට පටන් ගත යුතුය.

මධුවන්ත ඇඟ සෝදාගෙන සරමත් සම්සයත් දා ගත්තේ දුව හොඳටම නිදාගත් පසුය. ඇඟ සෝදාගෙන ආ ඔහු දිග සුසුමක් හෙලා දුව ළඟ ඉඳගත්තේය.

මේ උදාවී ඇත්තේ ලංකාවේ උදාවන ප්‍රථම රැයය. විශේෂ දුකක් හෝ සතුටක් මධුවන්තට දැනෙන්නේ නැත. ජීවිතය එහෙමය... ඒ

විදිහට ජීවත් වෙනවා මිසක ජීවිතයෙන් විශේෂ සතුටක් සැනසීමක් දැන්මම බලාපොරොත්තු විය නොහැක.

ලලිතා ආවේ ට්‍රේ එකක තබාගෙන කෑම රැගෙනය.

"ලලිනටත් කරදරේ..."

මධුවන්ත කීවේ දුකෙනි... ලලිතාට ඔහු ගැන ඊට වඩා දුකය... "දරුවෙකුත් හදාගෙන කොහොම තනියම ජීවත් වෙන්නද..." ඇය සිතුවේ හූල්ලමින් මෙනි.

"ඒක මොකක්ද මහත්තයා... බේබි කෑවද..."

"ලලිනගේ අල හොද්ද රහ කර කර කෑවා... එහෙම කන්න ආසයි..."

"මං දිගටම බේබිට මොනවහරි වෙනමම හදලා දෙන්නම්... ඒක මොකක්ද මහත්තයා... එහෙම හදන්නත් ආසයි..."

දුප්පත් ගෑණිට තමාගේ දුක තේරෙනවායැයි මධුවන්තට සිතුණි. දැන්මම කන්නට බඩගින්නක් ඇත්තටම නැත. මධුවන්ත එහෙමම ඇද විටිමටම බර විය...

නිම්මිත් ප්‍රියමන්තත් ආවේ ඒ මොහොතේය.

"කෑම කාලා නෑනේ මල්ලී..."

"මං ප..ස්..සේ ක..න්..නම් අක්කේ... දැන්ම බඩගිනි නෑ..."

නිම්මිත් ප්‍රියමන්තත් ඇද මතින් වාඩි වූයේ දුව දෙස බලාගෙනමය.

"සිංගප්පූරුවේදීත් මේ වෙලාවට නිදිද..."

"ඔව් අක්කේ... සමහර දවස්වලට කවලා ඇඟ සෝදද්දිම ඇස් පියවෙනවා..."





"ප..ච්.. කෙල්ල මොනවත් දන්නෑනේ..."

නිම්මි කීවේ වේදනාවෙනි.

"දැන් ඉතින් ප්‍රශ්නම හිත හිත ඉන්නෙපා මල්ලී... ටිකක් සැහැල්ලුවෙන් ඉන්න බලපං..."

ප්‍රියමන්ත කීවේය. මධුවන්ත අසරණ ලෙස සිනාසුණේය.

"තා..ම වෙ..ච්..ච දේ පුදුමයි අයියේ... මං එද්දිත් එයාගෙන් ඇහුවා... නවතින්නද කියලා... යන්න කිව්වේ..."

නිම්මිට පුදුමය. මේ මිනිසාත් සමඟ ගෑණියෙක්ට ජීවත් වෙන්නට බැරි නම් පුදුමය.

"මට..යි කෙල්ලටයි ජීවත් වෙන්නත් මොකක් හරි ක්‍රමයක් ඇතිනේ අයියේ... මං ඒ..ක හිතනවා..."

"ටිකක් ඉඳලා හිමිහිට හිතමු මල්ලී..."

නිම්මි ඔහුගේ දෙනෙත් දෙස බලා කීවාය.

"ගොඩක් කල් ගන්නත් බෑ අක්කේ... අපි දෙන්නා ඉක්මනටම පිළිවෙලක් වෙන්නෝන..."

"මල්ලී මොනා හරි හිතාගෙනද ආවේ..."

මධුවන්ත හූල්ලා මෙන් සිනාසුණේය.

"කොහොම හරි නැගිටිනවා කියලා හිතාගෙන ආවා මිසක් පිළිවෙලක් හිතුවේ නෑ අක්කේ..."

ඔහු තනිවම ආවා නම් කෙසේ හෝ ජීවත් වන්නට තිබුණි. එහෙත් දරුවෙක් සමඟ තනිවූ විට පිරිමියෙක් ගෑණියෙක්ට වඩා අසරණය.

"මෙයාව ලොකු කරගන්න කල්නේ ඉතින්... ඒ දුක මම විඳිනවා..."



Freeantha.com

ඔහුට මොනවා කියන්නදැයි නිම්මිටත් තේරෙන්නේ නැත.

"ඉතුරු කරගත්ත සල්ලි ටිකක් තියෙනවා... බලලා හිමිහිට මොනවා හරි කරනවා..."

"ඒ කිව්වේ බං..."

"මං පොඩියට ගෙයක් වත් කුලියට ගන්නෝනනේ අයියේ... දුවව දාලා රස්සාවක් කරන්නත් බැහැනේ... එයාවත් බලාගෙන මොනවා හරි කරනවා..."

ඔහු මුහුණ දී ඇති ප්‍රශ්නයේ බරපතලකම තේරෙන්නේ එහෙම හිතද්දිය.

"මොන දේ කළත් අපි උඹට ඉන්නවා..."

"නැත්නම් මං ලංකාවට එන්නෑ අයියේ... දුක විඳගෙනම එහේ ඉන්නවා... අයියයි අක්කයි ඉන්නවා නේද කියලා හිතලා ආවේ... මගේ කෙල්ලට නැත්නම් කවුරුවත් නැනේ..."

"එ..හෙම වෙ..න්..න දෙන්නෑ ම..ල්ලී..."

නිම්මි කීවේ ඇඬුම්බරවය.

"මුතුට කෙනෙක්ව ප්‍රොපෝස් කරලා තියෙන්නේ... එයාලා මැරි කරලා සමහර විට මෙහේ ඉඳියි... නැත්නම් මේ ගේ එයාලට දීලා අම්මයි තාත්තයි නාවල ගෙදරට යයි... එදාට අපිත් ගෙයක් අරන් යනවා..."

නිම්මි කීවාය. මුතු විවාහ වන්නට යන බව මධුවන්ත දන්නේ අදය.

"මුතු නංගි කාවද අක්කේ මැරි කරන්නේ..."

නිම්මි සුසුමක් හෙලා සිනාසුණාය.





"අපේ තාත්තා වගේ ඉඩම් සේල් කරන කෙනෙක්ගේ පුතෙක්... කාංචන කියලා..."

මධුවන්ත සිනාසුණේය.

"ඒත්.. කෙල්ල ඉන්නේ එච්චර සතුටකින් නෙමේ... හරි බයෙන්... වෙලාවකට එයාගේ ජීවිතේ ගැනත් මට බයයි... ඔය කසාදෙට කලින් කෙල්ල මොනවා කරගනීද දන්නෑ..."

"ඇ..යි අක්කේ..."

"මුතු බලාපොරොත්තු වෙන්නේ එයත් එක්ක අහිංසක ජීවිතයක් හදාගන්න පුළුවන් කොල්ලෙක්ව... ඉඩම් සේල් කාරයන්ගේ පුත්තු එක්ක මොන අහිංසක ලව්ද... ආදරේ මණින්නෙත් පර්වස් වලින්..."

නිම්මි හූල්ලා කීවාය.

"ඒත් ඒ කසාදේ මේගොල්ලෝ කරයි... එදාට අපිත් තීරණයක් ගන්නවා... මේවල හැමදාමත් ඉන්නෑ... ඉන්නත් බෑ... ඔයාට ඉදිද්දී තේරෙයි... අයියයි මායිත් යනවා..."

ප්‍රියමන්ත සිනාසුණේ උපේක්ෂා සහගත ලෙසිනි.

"එදාට මීට වඩා උඹට දෙයක් කරන්න පුළුවන්... ඒකයි අක්කා කියන්නේ..."

"මී..ට ව..ඩා දෙ..ය..ක් නෑ අක්කේ... මේ ක..රපු දේ ම..ට කො..ච්චර දෙයක්ද... මං... සිංගප්පූරු එයාර් පෝට් එකෙන් එද්දී අනාථයෙක්..."

"එහෙම නම් වෙන්න දෙන්නෑ... මගේ දරුවෙක්ටත් ඉන්නේ ඔයයි මුතුයි විතරයි... ඔය දෙන්නම මට එකයි..."

ඒ කතාවට ප්‍රියමන්තද හිස වැනුවේය...



Freeanttas.com

* * * * * * * * * * * *

නිම්මි උදෙන්ම පැමිණ කෙල්ලව ගත්තාය... ඇය උන්නේ රෑට අදින සිනිඳු දිග කලිසමත් පුංචි ටී ෂර්ට් එකත් ඇඳගෙනය... කොල්ලා අම්මා කෙනෙක් දුවව බලාගන්නවාට වඩා ආදරයෙන් කෙල්ලව බලා ගන්නවා යැයි නිම්මිට සිතුණි.

"දුවා කිරි බිව්වද මල්ලී..."

"ඔව් අක්කේ... අයියා ගියාද අක්කේ..."

"තව නෑ මල්ලී... ඇඳගන්නවා... යන්න කලින් එයි... මල්ලිට රෑ නින්ද ගියාද..."

මධුවන්ත ඊට සිනාසුණේය. ජීවිතයේ කරදර දවස්වල නින්ද යන්නේ කාටද...

"මං දුවාව ටිකක් අරන් යනවා මල්ලී... අපි නැන්දි එක්ක යං... ආ... මාමි සූට් අදිනවා... අපි ගිහින් බලමු.. ම්..."

කෙල්ල නිම්මිව බදාගෙන යන අයුරු මධුවන්ත බලා උන්නේ සැනසීමෙනි. අම්මා නැති කෙල්ලට එහෙමවත් ආදරයක් ලැබෙනවානම් හොඳය.

"තාත්ති කුක්කු පෙව්වද..."

"කු..ක්කු රසායි..."

කෙල්ල කට උල් කර කීවාය. නිම්මි කෙල්ලව ඉඹගත්තේ දරු සෙනෙහසින් පපුව ඇකිලෙද්දීය.

"කුක්කු රහද පැටියෝ... මගේ පැටියා කුක්කු ඔක්කොම බොනවද.. ම්..."





කෙල්ල චූටි දත් දෙක පෙන්නා සිනාසුණාය. මධුවන්තගේ මුණමය. නිම්මි කෙල්ලවත් වඩාගෙන එද්දී ප්‍රියමන්ත උන්නේ යට ඇදුම පිටිනි.

"මා..මිට හූ කියන්න පැටියෝ... බබී නම් එහෙම නෑ නේ..ද..."

"හූ..."

ප්‍රියමන්ත පැමිණ මුහුණම කෙල්ලගේ බඩට තබා ඇයව ඉඹගත්තේය.

"මල්ලිමයි... ඒකා පොඩි කාලේ ඔහොමමයි..."

"යද්දී කිරිත් හදලා පොවලා... මේවා කොහොම කරගන්නවද දන්නෑ ප්‍රියා..."

"තාත්තනේ.. දුකක් නෑ..."

"මං උඩට ගිහින් එන්නම් ඇඳගෙන කතා කරන්න හොඳේ..."

"ම්..."

"අපි යන් චූටි නැන්දිව බලන්න..."

"හා..වා දු..න්..නේ..."

කෙල්ල මතක් වී කීවාය.

"ඔව් සුදු පැටියෝ... හාවා දුන්නේ චූටි නැන්දි තමා..."

මුතු උන්නේ ඇඳ මතටම වීය... ඊයේ රෑ නින්ද ගියේ සෑහෙන රෑ වීය... ප්‍රමාද වන තුරු නින්ද නොගියේ ඒකය. අක්කා අතේ උන් කෙල්ලව දකිද්දී මුතුට සතුටක් දැනුණි.

"චූටි නැන්දි බලන්න යං කිව්වම හාවා දුන්නේ කියලා කියනවා..."

නිම්මි කෙල්ලව ඇඳ මත තැබුවාය. ඇය මුතු දෙස බැලුවේ



Elegantlk.com

හුරතල් සිනාවක් පාය. මුතුගේ පපුවම සෙනෙහසින් පිරුණි.

"නැ..න්..දි දුන්න හාවා කෝ පැටියෝ..."

මුතු ඇයව බඩ උඩට ගෙන ඇසුවාය.

"තා..ත්..නි දො..යි කලලා..."

"අ..නේ හාවා දොයිද..."

"බ..බ..ත් දො..යි හා..වත් දොයි..."

මුතු එහෙමම කෙල්ලව පපුවට තද කර ගත්තාය. නිම්මි එදෙස බලා උන්නේ සිනාබරවය. "දුවව ඉඹිනවා දූගේ තාත්තගේ මූණ බලන්නෑ" නිම්මි සිතුවාය.

"අ..ක්..කේ..."

"ම්..."

"අ..ද උ..දේ වරුවේ ඔයා කොහේ හරි යනවද..."

"එ..හෙම කොහෙවත් යන්නෑ චූටි... ඇයි..."

"නෑ.. මේ.. කාං..චන උදේ එනවා කියලා කිව්වා..."

"ඉ..නින්..."

"ඔයා කොහේවත් යන්නෙපා..."

නිම්මි කතා නොකරම හිස වැනුවාය.

"චූටි..."

"අක්කේ..."

"මේ මැරේජ් එකට ඇත්තටම ඔයා..."

"කැමති නෑ... කොහොමටවත් කැමති නෑ..."





නිම්මි අහන්නටත් පෙර මුතු කීවාය.

"හිතට ගැළපෙන කෙනෙක් එක්ක යාළුවෙන්නෙපැයි එහෙනම්... අඩුම ගානේ එහෙනම් පැනල වත් යනවනේ..."

මුතු දෙනෙත් බිමට බර කළාය. ඒ කතාව කොහොම කියන්නද...

"දැන් ඒවා කතා කරලා වැඩක් නෑ... හැම දේකටම ලැබීමක් තියෙන්නෝන... මෙහෙම ටික දවසක් ගියදෙන්... මං හිමිහිට තීරණයක් ගන්නවා..."

"ඒත් චූටි..."

"පැයක් කතා කරන්න හිතෙන්නේ නැති කෙනෙක් එක්ක ජීවිත කාලයක් ඉන්න පුළුවන්ද..."

මුතුගේ දෙනෙතින් කඳුළක් වැටිණ. දුව පුංචි ළපටි අතින් මුතුගේ මුහුණ අතගෑවේ හුරතල් ලෙසිනි. මුතු එහෙමම ඇයව සිප ගත්තාය.

* * * * * * * * * * * * * * *

මධුවන්ත දුවවද අන්දවාගෙන ඇයවද රැගෙන ඇනෙක්ස් එකෙන් පිටතට ආවේ දුවට අවශ්‍ය බඩු ටිකක් ගන්නටත් දුරකථනයට සිම් කාඩ් පතක් ගන්නටත්ය. රවීට කතා කර ආ බව වත් කිව යුතුය.

ඔහු සරල කලිසමට උඩින් කමිසයක් දමා ගත්තද දුවට නම් ලස්සනට අන්දවා ගත්තේය. සිංගප්පූරුවෙන් ගෙනා ලස්සනම කලිසමකුත් ටී ෂර්ට් එකකුත් ඇයට අන්දවා ඔහු රෝස පාට සපත්තු දෙකක්ද ඇයට දැම්මේය.

"තා..ත්..තියෝ..."

"ම්..."



Freeantbooks.com

"සද්ද පාපු..."

ඇය සද්ද පාපු යැයි කියන්නේ කකුල බිම තබද්දී සද්ද එන සපත්තු දෙකටය.

"ම.. අපි යන් රවුමක්..."

මධුවන්ත කෙල්ලව වඩා ගත්තේය. මුතුත් නිම්මිත් උන්නේ සාලයේය. මධුවන්ත අලංකාර කොරිඩෝව දිගේ ඇවිදගෙන ගොස් ගෙට ගොඩ වූයේ යන බව කියන්නටය. ගෙට ගොඩවෙද්දීම මධුවන්තගේ දෙනෙතේ ගැටුණේ මුතුවය. ඇයට එවර දෙනෙත් ගන්නට බැරි විය. දෙදෙනාගේ දෙනෙත් තත්පර කිහිපයක් නතරව තිබුණි. මධුවන්ත සිනාසුණේ වෙනසක් නැතිවය.

"ආ... තාත්තියි දූයි මේ කොහේ යන්නද..."

"චුට්ටක් ටවුමට යන්න කියලා අක්කේ... දුවාගේ බඩු වගයක් තියෙනවා ගන්න..."

"සේනට කිව්වත් ගේනවා මල්ලී..."

"කමක් නෑ අක්කේ... මෙහේ පාරක යන්නත් ආසයි..."

"දැන් ඉතින් මොකේද යන්නේ..."

මුතු කෙල්ල හා සිනාසුණාය. ඇය මුතු සමඟ සෙල්ලම් කරමින් සිනාසෙයි.

"මං ත්‍රීවිල් එකක් අරගෙන යනවා අක්කේ..."

"නැන්දිලට ටටා කියන්න..."

කෙල්ල අත් වැනුවාය. ඇය ටටා කියන්නේ අත් දෙකින්මය.

"යන්නම් අක්කේ... යන්නම් නංගී..."

මුතු උන්නේ බිම බලාගෙනමය. නිවසේ ගල් ඇල්ලූ විශාල





පෝට්කෝවේ සුදු පැහැ ගත් ජීප් රියක් නතර වූයේ ඒත් සමගමය. ඉන් බැස ආවේ කාංචනය. ඔහු පැළඳ උන් අව් කණ්ණාඩිය ගලවා මධුවන්ත දෙස අමුතුම බැල්මකින් බැලුවේය. දොරකඩට ආ මුතුත් නිම්මිත් මුහුණට මුහුණ බලා ගත්තේ නිහඬවමය.

නිම්මි එහෙමම මිදුලට බැස්සේ කාංචන සමඟ මද සිනාවක් පාය.

"කවුද ඒ මැන්..."

කාංචන ඇසුවේ ගෙට ගොඩවෙන ගමන්ය. එය ඇසූ ආකාරයට මුතුට ඔහු ගැන පිළිකුලක් දැනුණි. ඔහු කතා කරන්නේ වැදගත් කොල්ලෙක් කතා කරන අයුරින් නොවේ.

"ආ මුතු... කවුද ඒ..."

"ප්‍රියමන්ත අයියගේ මල්ලී..."

මුතු බිම බලාගෙන කීවාය. ඉන් එහා දෙයක් ඔහුට කිව යුතු නැතැයි මුතුට සිතුණි.

නිම්මි මධුවන්තත් සමඟ ගේට්ටුව ළඟටම ආවාය.

"ඒ ආවේ නංගිව බඳින්න ඉන්න කාංචන..."

නිම්මි කීවාය. ඔහුව කොහොමටවත් මුතුට ගැළපෙන්නේ නැතැයි මධුවන්තට සිතුණි.

"ටිකක් සල්ලිවල උණ අරගෙන ඉන්නේ..."

මධුවන්ත සිනාසුණා මිසක කිසිවක් කීවේ නැත.

"මල්ලිට ඩ්‍රයිවිං පුළුවන්ද..."

"ඔ..ව් අක්කේ..."

"එළියට යන වෙලාවට අයියගේ කාර් එක අරගෙන යන්න..."

"කමක් නෑ අක්කේ..."

මධුවන්ත පාරේ ඇති ත්‍රීවීලරයකට අත දමා එය නවත්වා ගත්තේය.

"යන්නම් අක්කේ..."

ඔහු කෙල්ලත් සමඟ ත්‍රීවීලරයට ගොඩ වෙන අයුරු නිම්මි බලා උන්නේ දුකෙනි. මේ තාත්තාත් දුවත් දෙස ඉක්මනටම දෙවියන් බලනවා නම් හොඳය. පමා වන තරමට දුක තාත්තාටය.





# 18

**කාංචන** ඉදිරියේදී මුතුට දැනෙන්නේ පුදුමාකාර අපහසුතාවයකි. ඔහු ඉක්මනට යනවා නම් හොඳය.

"අන්කලුයි ඇන්ටියි ගෙදර නැද්ද..."

"නෑ.. නුවර ගිහින් තාම එයාල ඇවිත් නෑ... මොනාද ලෑන්ඩ්ස් වගයක් බලන්න ගිහින්..."

"අන්කලුත් දැන් කොළඹින් පිටත් සේල්ස් පටන් අරන් වගේ..."

ඒ කතාව කෑදර කතාවකි.

"මං ඒවා ගැන වැඩිය මොනාත් දන්නෑ..."



Elegantta
talks.com

"දැනගන්නෙපැයි..."

මුතු දුබල සිනාවක් පෑවාය.

"අපේ තාත්තගේ බිස්නස් නම් දැන් මං බලන්නේ... අපි කෝට්ටේ අලුතින් හවුසින් එකක් පටන් ගන්නවා..."

"ඇ..ත්..ත..ද..."

"ගෙවල් කොච්චර තිබුණත් මදි දෙන්න..."

"ම්.."

"සැටඩේ යං මාත් එක්ක කන්ඩලම... හවස එන්න පුළුවන්..."

මොනවා කියන්නදැයි මුතුටම තේරෙන්නේ නැත.

"මං.. මං.. බ..ලලා කියන්නම්..."

"ඕනනම් මං අන්කල්ගෙන් අහන්නම්... ඕක මොකක්ද..."

"මං කියන්නම්... මො..නවද බොන්නේ..."

මුතු උන්නේ ගැලවෙන්නට පොටක් හදා ගන්නට බැරුවය.

"මුකුත් එපා..."

ඒ ඇස්වලින් බේරෙන්නටම අමාරුය.

"යං උඩට ටිකක්..."

කාංචන හිටිවනම පුටුවෙන් නැගිට කීවේය. මුතුගේ පපුව ඇතුලාන්තයෙන් දැවෙන්නට විය. ඇය ඔහුත් සමඟ උඩට ගියේ හදවතින් හඬා වැටෙමිනි. කාංචන මුතුටත් කලින් කාමරයට ඇතුල් විය.

මුතු කාමරයට ඇතුල් වූයේ වෙව්ලමින් මෙනි... දොරින් ඇතුල් වෙනවාත් සමඟම කාංචන ඇයව තදින් වැළඳ ගත්තේය. ඒ හිර කිරිල්ල කොහොමටවත් ආදරය නොවන බව මුතු දනී.





ඇය හිත් පිත් නැති මළ මිනියක් සේ දෑස් පියා ගත්තේ ඔහුගේ ගිනිගත් දෙතොල් මුහුණ පුරා අසංවරව දුවද්දීය.

"ම.. ම..ට ස..නීප නෑ..."

කෙල්ල අමාරුවෙන් කීවාය. එහෙත් ඔහු දිගටම ඇයව වැළඳගෙන තද කරගෙන යහන කරා යමින් උන්නේය.

මුතුගේ ජංගම දුරකතනයට ඇමතුමක් ආවේ ඒ මොහොතේදීය.

"ම.. ම..ට කෝල් එ..ක..ක්..."

කාංචන ඇයව ලිහිල් කළේ එවිටය. මුතු ඔහුගෙන් මිදී දුරකථනය අතට ගත්තේ යක්ෂයෙකු අවුල් කළ කොණ්ඩය අතින් හදමිනි.

"හෙ..ලෝ..."

කෙල්ල කතා කළේ උගුරෙන් මෙනි.

"චූටි.. මං කතා කළේ..."

අක්කා තමාව ගලවා ගන්නා බව මුතු දනී.

"ආ... දැ..න් එ..නවද... හා.. මං එන්නම්..."

මුතු එහෙම බොරුවක් කීවාය. කාංචන උන්නේ බලාගෙනමය.

"කවුද..."

"ම..ගේ යාළුවෙක්... දැ..න් මේ ගෙවල් ගාවලු ඉ..න්..නේ..."

කාංචන මේසය මත තිබූ ඔහුගේ ජංගම දුරකතනයත් වාහනයේ යතුරත් අතට ගත්තේය. ඔහු යන්නේ දඩයම වැරදුන කොටියෙකු මෙනි.

"සැටඩේ මාත් එක්ක එන්නම ඕන නොඳද... මං එනවා උදේ හයට... ඇඳගෙන ඉන්න..."

ඔහු කීවේ එපමණකි. ඔහු පහළට යද්දීම වාගේ මුතු අඬාගෙනම

ඇඳට වැටුණාය. කෙල්ල ලේ රහ දැනෙන තරමට තොල් පට හපාගෙන මේ දුක දරාගන්නට බැලුවාය. එහෙත් ඇගේ දෙනෙත් පලාගෙන මෙන් කඳුළු ගලා ආවේය.

නිම්මි උඩට ආවේ කාංචන යනවාත් සමඟය. කෙල්ල ඇඳේ අඬමින් උන් අයුරු දැක ඇගේ පපුවම පිච්චී ගියේය.

"ඇ..යි කෙ..ල්ලේ..."

"අ..නේ අ..ක්..කේ..."

මුතු ඇඬුවේ නිම්මිව බදාගෙනය.

"මේ.. මො..න ස..ක්..කි..ලි දු..ක..ක්ද අ..ක්..කේ මං වි..දි..න්..නේ..."

කෙල්ල ඇඬුවේ ඉකිබිඳිමිනි. නිම්මි ඇගේ දෙදරන පිට අත ගෑවේ කඳුළු පුරවාගෙනය.

"මේ.. දු..ක..ද මං ජී..විත කා..ලෙම වි..දි..න්..නෝ..න.. ෂික්..."

"දැ..න් මෙහෙම අඬන්නෙපා චූටියෝ..."

"මං.. වෙ..න මො..නවා කරන්නද... අවුරුදු විසි දෙකක ජීවිතේ ප්‍රතිඵලේ මේකද... ත..ව ජීවත් වෙන්න කොච්චර කල් තියෙනවද..."

කෙල්ල කියන්නේ ඇත්තය. අකමැති කෙනෙක් සමඟ පැයක් ඉඳිමත් දුකක් නම් ජීවිත කාලයක් ඉඳීම කවර නම් අපරාධයක්ද...

"වි..ස..දුමක් කියපන් ර..ත්..ත..රන්... මම උඹට උදව් කරන්නම්... කෙතෙකුට ආදරේ කළා කිව්වා නේද උඹ... ඒ කවුද... එයා කෝ දැන්... කවුද එයා..."

නිම්මි ඇසුවේ කෙල්ලගේ මුණම දෝතින් අල්ලාගෙනය.

"මං.. කෙ..නෙ..කු..ට ආ..දරේ ක..ළා ත..මා.. එ..යා ඒ..ක දැනගෙන උ..න්..නෑ... දැන් ගොඩක් කාලෙකට කලින්..."





"දැනං උන්නෑ..."

"ඔව්.. එයා එ..යා ගියා... මං කා..ම..ත් ඒ ගැ..න දුක් වෙනවා..."

"ක..වු..ද ර..ත්..ත..රන් ඒ..."

නිම්මි ඇසුවේ ආදරයෙනි.

"කියන්නම් අක්කේ කියන්නම්... ඒත් දැන් කිව්වා කියලා..."

"ඒ..ත් මට කියපන්..."

"පොරොන්දු වෙන්න කාටවත් කියන්නෑ කියලා... කා..ට..ව..ත්..."

නිම්මි කෙල්ලගේ සුරත මත සුරත තැබුවාය. නිම්මි කඳුළු පුරවාගෙන ගොස් නැඟිට්ටාය. අල්මාරිය ඇරියාය. නිම්මි බලා උන්නේ කිසිවක් සිතාගත නොහැකිවය.

කෙල්ල ආවේ එහි තිබූ පොතක් තුරුල් කරගෙනය.

"මං.. මේ ජී..වි..තේ දැ..ක..පු අහිංසකම කෙනා එ..යා... හරියට ආදරේ හිතුණා එයා දැක්ක දවසේ... ගොඩක්... ඒ ද..වස්වල මං එ..යා දිහා බලාගෙනම හිටියා... ඒ..ත්..."

"ඇයි චූටි..."

"ඒ.. පි..ස්..සා ඒ..ක තේ..රුම් ග..න්නේ නෑ... ඒ..කෙ..න් එයත් අ..ද දු..ක් විඳිනවා මා..ත් දු..ක් විඳිනවා..."

"ක..වුද චූටි..."

මුතු පොත දිග හැර එහි වූ පින්තූරයක් පිටතට ගත්තාය. ඇය ඒ දෙසම මොහොතක් බලා හිඳ එය නිම්මිට පෑවාය.

"මං ජීවිතේ ආදරේ කළා නම් කළේ මෙයාට විතරයි..."

මුතු කීවේ අඬමිනි.

ඒ පින්තූරයේ උන් කෙනාව දැක නිම්මිගේ අත වෙව්ලන්නට විය. ඇගේ ඇස් කඳුළින් පිරී ගියේ පුංචි උල්පතකින් කඳුළු උන්නතාක් මෙනි.

"දෙ..යි..ය..නේ මේ.. ම..ධු..ව..න්..ත ම..ල්ලි නේ..."

නිම්මි කිවේ වෙව්ලමිනි. මුතු අඬමින් හිස වැනුවාය.

"ඔ.. ඔ..ව් එ..යා ත..මා.. එ..යා..ට ව්තරයි ආදරේ ක..ළේ මේ ජීවිතේ..."

නිම්මි උන්නේ කිසිවක් අදහාගත නොහැකිවය. ඇය පින්තූරය දෙස බලා උන්නේ කඳුළු පුරවාගෙනය. එය තමාගේත් ප්‍රියමන්තගේත් විවාහය දා ගත් පින්තූරයක් බව නිම්මි දනී. කෙල්ල ඒ පින්තූරයට යටින් නිල් ප්ලැටිග්නම් පෑනකින් I Love You කියා ලියා තිබුණි. ඒ රතු අකුරු බොහෝ පරණ එකකි. කෙල්ල කියන්නේ බොරුවක් නොවන බව නිම්මි දනී.

"අ..තේ ර..ත්..ත..ර..න් උඹ ම..ට ඇ..යි කි..ව්..වේ නැ..ත්..තේ..."

"මං කොහොම කියන්නද ඔයාට... එයාට වත් කියාගන්න බැරි වෙච්චකොට..."

මුතු කිවේ අසරණවය. දෙවය එහෙම දෙයක් කළේ ඇයිදැයි නිම්මි සිතුවාය.

"ම..ට අදහාගන්නවත් බෑ... උ..ඹ මධුවන්තට..."

"ඊ..ත් ඇත්ත ඒක අක්කේ... මට එයාව කොච්චර මතක් වුණාද..."

"ඒකා මේ මොනවත් දන්නැද්ද..."

"නෑ... මොනවත් එයා දන්නෑ... ඒක මගේ වරද... එතකොට ම..ට දහඅටයි..නේ... ම.. ම..ට බය හිතුණා එ..කපාර කියන්න... එයා මෙහෙම රට යයි කියලා මං හිතුවේ නෑ... එ..ක දවසක් රෑක ආවා





එයා... මත..කද අක්කට... හ..රි හ..දිස්සියෙන් ආවේ එයා..."

"ම..ත..කයි වූටී..."

"ඇවිත් කිව්වා සිංගප්පූ යනවා කියලා... ම..ට මො..න..ව..ත් හිතාගන්න බැරි වුණා... එ..හෙම යන කෙ..නෙක්ට කොහොම..ද මං කියන්නේ ම..ම එයාට..."

මුතු අඬමින් කියන්නට ගිය දේ ගිල ගත්තාය.

"ඒ..ත් එ..දා උඹ කිව්වනම්... අ..ද ම..ධුවන්ත මෙ..හෙම දුක් විඳින්නෑ..."

"ද..න්නවා අක්කේ.. දන්නවා... එයා ගියා... යන්නම් කියලා ගියා... එයා ලංකාවෙන් යන දවසේ රෑ ම..ට හරියට ඇඩුණා... මට උණ ග..ත්තා... මං රෑ එයාගේ නම්බර් එකට කෝල් එ..ක..ක් ගත්තා... ඒත් ඒ වෙනකොට එයා ඒක ඕෆ් කරලා... එච්චරයි... ම..ගේ පළවෙනි ආදරේට ඒක තමයි උනේ... ඒක උපන් ගෙයිම මැරිලා ගියා..."

මුතු ඇඬුවේ පොඩි දැරියක මෙනි. නිම්මි ඒ දෙස බලා උන්නේ වාවාගත නොහැකිවය.

"ඒත් මං.. බලාපොරොත්තු තියාගෙන හිටියා... එ..යා කතා කරයි කියලා... එ..යා ක..තා කළා... ඒ.. එ..යා එ..හෙ..දි මැ..රි ක..ළා කියලා කියන්..න..."

මුතු කිවේ තොල් පට තද කරගෙනය.

"මං ගොඩක් දුක් වින්දා අක්කේ... ඇහැටවත් දැක්කේ නැති දරුවෙක් වෙනුවෙන් අම්මා කෙනෙක් දුක් විඳිනවා වගේ මං දුක් වින්දා... එ..යා..ට.. මේ දේවල් වෙද්දී... ඒවා ඔයාලා මට කියද්දී මං හරියට තැබුණා... එයාව ම..ට ලැබු..නා නම්.. ම..ම ඒ දු..ක එයාට



Eeganta

දෙ..න්..නෑ... ඒත් දෙයියෝ මො..නාද මේ කල්ලේ..."

ජීවිතවල සිදුවන සමහර දේවල් වෙනස් කරන්නට දෙවියන්ට වත් නොහැක.

"මං.. එ..ච්..චර ආදරේ කරපු කෙ..නා... අ..ද මේ ව..හ..ල යට ඉඳිද්දී.. මං විඳින දුක ඔයා දන්නවද... එයාගේ මූණ දකින දකින පාරට මාව පිච්චෙනවා... ඔයා අහනවා ඇයි කියලා... මං කොහොම කියන්නද ඔයාට..."

"ම..ට තේරෙනවා චූටි..."

"මේ ලෝකේ දැකපු අහිංසකම කෙනා එයා... මූණ බලන් ඉන්නකොට හරියට දුක හිතෙනවා... ඒත් මං දැන් කොහොම එයා දිහා බලන්නද..."

නිම්මි කෙල්ලගේ හිස පිරිමැද්දේ තොල් පට තද කරගෙනය.

"උ..ඔ එහෙම කරද්දී ම..ට දැනුණා චූටි... ඔයා එහෙම කරන කෙනෙක් නෙමේනේ..."

"අපි දෙන්නම පව් කරලා ඇති... ඒකයි... දැන් දුක් විඳිනවා... ජීවිතේ සිද්ධ වෙච්ච වැරදි දැන් හදන්න බෑ... මං එයාගෙන් ඈත්වෙලා ඉන්නේ ඒකයි... එයා වැරදි නෑ... ඒත් මා..ත් වැරදි නෑ... මේ හම්බවෙච්ච එකෙන් එයාට දුකක් නෑ... ඒත් ම..ම..."

"ම..ට සමාවෙයන් චූටි.. මෙ..හෙම දෙයක් දන්නවනම් මං.. ම..ධුවන්තව මෙහෙම ගෙන්න ගන්නෑ..."

"එ..හෙම හිතන්නෙපා... ඔයාට මං වගේ මල්ලි කෙනෙක් උන්න නම් එයාවත් ඔයාට මධුවන්ත තරම් ආදරේ වෙන්නෑ... අපට ගොඩක් කට්ටිය නෑ... එයාව රැකගන්න..."





"ඒත් චූටි උ..ඹ..."

"මං ජීවිතේ ගැන තීරණයක් ගන්නවා අක්කේ... මොනවා හරි දෙයක්..."

නිම්මිගේ හදවතට දැනුණේ අසීමාන්තික බියකි.

"ත..ව පා..ර..ක් ජීවිතේ ගැන හිතපං කෙල්ලේ..."

"හිතනවා අක්කේ... එයා යන්න කලින් මේක උනානම් මං මධුවන්ත එක්ක යනවා..."

"එ..හෙම වුණානම් කොච්චර හොඳද..."

"ජීවිතේ හිතපු දේ හැම කෙනාගෙම ජීවිතවල වෙන්නෑ අක්කේ..."

මුතු පිටි අත්ලෙන් දෙනෙත් පිස දමමින් කීවාය.

"මේක ප්‍රියමන්ත අයියටවත් කියන්නෙපා... මං ඔයාට වැදලා කියන්නම්..."

"මං කියන්නෑ..."

"ඔයා අහන නිසා කිව්වේ... අපි අපේ දෛවය දැන් බාරගන්නෝන්න... බැරිනම්..."

"බැරිනම් මොකද..."

"විසඳුමක් ඇති අක්කේ... දැන් ඔය මධුවන්ත ඇවිත් ඉන්නේ දුවත් එක්ක... එයා ජීවිතේ කොහොම හරි හදා ගනී... ඒ තාත්තයි දුවයි කොහොම හරි ජීවිතේ හදා ගනී... එයා වගේ කෙනෙක්ට වරදින්නෙත් නෑ..."

"උඹ නාම මධුවන්තට ආදරෙයි... උඹේ ඇස්වලින් ඒක

පේනවා..." නිම්මි සිතුවාය.

"සමහර විට එයා ආයෙත් බදියි..."

"කොල්ලා ගැන එහෙමත් හිතන්නෙපා චූටි... ජීවත්වෙන අමාරුව මායි දන්නේ..."

"මේ අමාරු දවස් එයා පන්න ගනී අක්කේ... ම..ටයි බැරි... මං හිරවෙලා ඉන්නේ..."

"කාංචන ගැන තාත්තටයි අම්මටයි කියමු..."

"වැඩක්න නෑ... හිරිවැටිලා එයාලා ඉන්නේ... ඔයාටත් කෙනෙක්ව ප්‍රොපෝස් කළා මතකද... එදා ඔයා මේ ගේ දෙවනත් වෙන්න කෑ ගැහුවා... ඇයි ඒ... ඔයාට රත්තරන් කොල්ලෙක් උන්න නිසා... ගේට්ටුවෙන් එළියට බහින්න විතරයි ඔයාට තිබ්බේ... කොල්ලා ඔයාව ආදරෙන් අරන් යනවා... ඒ නිසා එදා ඔයාට බයක් තිබ්බේ නෑ... ඒත් ම..ට ක..වු..ද ඉ..න්..නේ... මං කාත් එ..ක්ක ය..න්..න..ද..."

මුතු කිවේ අඬමින්ම නොවේ. දුක දරාගෙනය.

"අයියට මේවා කියන්නෙපා... මට අහද්දි ලැජ්ජයි... හොඳේ..."

"ම්..."

"ඒක අනිතේ සිද්ධ වෙච්ච පුංචි දෙයක්... ඒක එහෙමම වැළලිලා ගිය දෙන්... අපේ ජීවිත දැන් වෙනස්..."

නිම්මි නැගිට්ටේ හූල්ලමිනි. ඇය පහළට ආවේ බරවූ හදිනි. මොහොතකට කලින් මුතු කියූ සියල්ල තවමත් ඇයට අදහාගත නොහැක. ඒත් එය එසේ සිදු වූ බව නිම්මි දනී. "කෙල්ල ඒ දවස්වල පොඩියි. මාත් උන්නේ වෙඩිත් එකේ සිහියෙන්. අපරාදේ..." ඇය සිතුවාය.





අක්කාට වසර තුනක් තිස්සේ හදවතේ හංගාගෙන උන් රහස කියූ පසු මුතුටද සැනසිල්ලක් දැනුණි. "දැන්වත් එයා තේරුම් ගනීනේ ඇයි මං මධුවන්තට මූණ දෙන්නේ නැත්තේ කියලා..." ඇය සිතුවාය.

ඒත් අක්කාට එක බොරුවක් කී බව මුතුගේ හදවත දනී. ඒ ඇත්ත ඇයට කිව නොහැක.

"දෙවෙනි පාරට ඔයා මේ ගෙදරට එද්දිත් මට ඔයා ගැන මොකක්ද දෙයක් පපුවට දැනෙනවා... ඒක මහ පුදුමාකාර දෙයක්..."

එයත් එහෙමම පපුවේ මැරී ගියදෙන් කියා ඇය සිතුවාය. ඔහු ඉන්නේද ජීවිතයෙන් හොඳටම බැට කාය. එපමණක් නොව දරුවෙක්ගේ ජීවිතයද දෝත දරාගෙනය. තමා ඉන්නේ ජීවිතයේ දෙවෝපගත ඉරණමක් කර පින්නාගෙනය.

"අපි මෙහෙමම ඉමු... වෙන ආත්මෙක මට ඔයාව හම්බවෙයි..."

මුතු සිතුවේ හූල්ලමින් මෙනි.

# 19

නිම්මි පුටුපැන්ගෙය පැත්තට ගියේ තාත්තා දෙස බලාගෙනමය. විජේනායක මහතා උන්නේ පුවත්පත බලමිනි. මධ්‍යවන්ත ආ බව යනුටත් අම්මාටත් කිව යුතුය. නිම්මි සාලයට ආවේද එය කියන්නටය. ඒත් බොහෝ වුදු පසු එය කියන්නට බැරි ගතියක් නිමවට ඇතුණි. ඇය පුටුපැන්ගෙය පැත්තට ආවේ ඒ නිසාය.

"මේක තාත්තටද ලලිනා..."

"ඔව් ලොකු බෙබී..."

"දෙන්න මං ගිහින් දෙන්නම්..."





නිම්මි සාලයට ආවේ තේ එකද රැගෙනය. උඩු මහලේ සිට විජේනායක මහත්මියත් මුතුත් පහළට එමින් උන්නෝය.

"අ..ම්..ම..ටත් තේකක් ගේන්නද..."

"දැන් එපා..."

නිම්මි තාත්තාට තේක දී මොහොතක බලා උන්නාය.

"ලැන්ඩ් එක හොඳද තාත්තේ..."

ඇය අසද්දී අම්මාද පැමිණ පුටුවකට බර වූවාය.

"ම්.. මං හිතන් ඉන්නේ ඒක විකුණන්නේ නැතුව අපට මගයක් හදන්න..."

"කෑ..න්..ඩි ව..ල..."

"ඇයි නරකද..."

"නෑ හොඳයි... දවල්ට මේ ගෙවලුත් පාළුයි... කවුරුවත් නෑ..."

"ඒකම තමා අපිත් හිතුවේ... දැන් පොඩි දුවත් බැඳලා ගියාම මෙහෙට වෙලාම පාළුවේ ඉන්න බැනේ..."

නිම්මි බිම බලාගත්තාය.

"කෝ නාම ප්‍රියමන්ත ආවේ නැද්ද..."

"නෑ තා..ත්..තේ මේ අ..ද ඔෆිස් එකේ ටිකක් රෑ වෙනකල් වැඩක් තිබ්බා... නමය වෙද්දි එයි..."

"එයා දිගටම ඔය රස්සාව කර කරද ඉන්න යන්නේ... අයින් වෙලා බිස්නස් එකක් කරන්න කියන්නැත්තේ ඇයි..."

ලොකයේ ඉන්නා සියලුම දෙනා ව්‍යාපාරම කළ යුතුද...

"ප්‍රි..යා ඒ ජොබ් එකට කැ..මතියි තා..ත්..තේ... ළඟදී ප්‍රමෝෂන් එකකුත් ලැබෙන්න යන්නේ... වෙහිකල් එකකුත් එක්ක..."



Freetalks.com

තාත්තා සිනාසුණේ අම්මා දෙස බලාය. නිමේ අසරණව බැලුවේ මුතු දෙසය... අක්කා වෙනුවෙන් කතා කරන්නට හිතුණද මුතු කට පියාගෙන උන්නයා. එවිට වන්නේ ඇගේ හිත තවත් රිදෙන දෙයක් තාත්තා කීමය.

"තා..ත්..තටයි අම්මටයි මං මේ කියන්න ආවේ... ප්‍රියාගේ මල්ලි... ඊයේ ආවා.."

"ම්.. ආවද..."

"ඔය ආවේ ඉතින් දරුවෙකුත් උස්සගෙනද..."

එසේ ඇසුවේ විපේතායක මහත්මියය. මුතු අසරණව නිමේ දෙස බැලුවාය. අම්මා එය ඇසුවේ අසන්නට ඕනා විදිහට නොවේයැයි මුතුට සිතුණි.

"ඔ..ව් මල්ලි මැරි කරපු කෙනා එක්ක ඉන්න අමාරුයිලු... දුවට ආදරේ නිසා දුවවත් අරන් ආවේ..."

"ටික දවසකින් එයාගේ වයිෆුත් මෙහේ දුවත් එයිද දන්නෑ..."

නිමේගේ ඇස්වල කඳුළු පිරුණි. ඇය බිම බලාගෙන මොහොතක් උන්නේ අසරණව දෙයක් කියාගන්නට නොහැකිවය.

"ම..ල්ලි ටික දවසකින් යයි තාත්තේ... එකපාර ආපු නිසා ප්‍රියාටත් පිළිවෙලක් කරගන්න බැරි වුණේ..."

මුතු උන්නේ තොල් පට තද කරගෙනය. "මේ තරම් පාච්චල් වෙන්න ඇයි අනේ මේ ගෙදරට ආවේ මධුවන්ත" මුතු බිම බලාගෙන සිතින් කීවාය.

"කරීහෙන්ත් නෑදෑයෙක් උන්න නම් ඔහොම වෙන්නෑනේ... කොහොමත් පිළිවෙලක් කරගන්න කියන්න ඉක්මනට... මේ ගෙදර තනිකඩ මිනිහෙකුයි ළමයෙකුයි ඉන්නකොට මිනිස්සුත් බලනවනේ... මේ ගෙදරටත් මිනිස්සු එනවනේ... ඇරත් මේ මඟුලත් කටේ





තියාගෙන..."

"මං.. මං කි..ය..න්..න..මි..."

නිමේ ගියේ තොල්පට තද කරගෙන ඇඬුම් වාවාගෙනය... කාමරයට යන්නටත් පෙර ඇයට ඉකි බිඳුණි.

"අ..ක්..ක පව්..."

මුතු ගියේ කේන්තියෙන් එසේ කියාය.

ඉක්මනටම ජීවිතය ගැන තීරණයක් ගත යුතු යැයි නිමේට සිතුණි. තාත්තා අද මේ දේ කියන බව් දන්නවා නම් කියටවත් මධුවන්තව මෙහෙට ගෙන්නා ගන්නේ නැත. අද ප්‍රියමන්ත ගෙදර උන්නේ නැති එක කොතරම් හොඳද... ඔහු ඒවා ඇහුවානම් පුදුමාකාර ලෙස පපුවෙන් දුක් විඳිනු ඇත.

* * * * * * * * *

මධුවන්ත වැටී ඇත්තේ කොතරම් අසරණ තැනකටදැයි මුතු සිතුවාය. තාත්තා කියූ කතාව මධුවන්තට ඇසුණා නම් ඔහු මේ දැන්ම කෙල්ලත් සමඟ පිටවෙනු ඇත. දෙවය ඔහුව ඒ තරම් අසරණ කළේ ඇයිදැයි මුතු දෙවියන්ගෙන් ඇසුවාය.

ඔහුට දුවවත් රැගෙන යන්නට තැනක් නිබ්බා නම් ඔහු මේ අඟුපිලේ නවතින්නේ නැත. සිංගප්පූරුවේ සිටිද්දී ඔහු සිතන්නට ඇත්තේ තමන්ගේ කෙනෙක් ළඟට යනවා කියා විය යුතුය.

එහෙත් අක්කාටවත් අයියාටවත් මීට වඩා දෙයක් ඔහුට කරන්නට නොහැක... ඔහුට නිබ්බේ ජීවිතය පිළිවෙලක් කරගෙනම ලංකාවට එන්නටය... එහෙත් එකපිට එක කරදර එද්දි කෙනෙක් කොතරම් අවුල් වෙනවාද කියාත් මුතු දනී. පවුල් ජීවිතයක් අවුල් වීම තරම් කරදරයක් කෙනෙක්ට තවත් නැත.

මුතු බැල්කනියට වීත් වාඩි වූයේ හූල්ලමින් මෙනි. පහළින්

දූගේත් නාත්නාගේත් කතාව ඇසෙයි.

"නා..ත්..තියෝ... කු..ක්..කු..."

කෙල්ල කෑ ගසන්නේ කිරි එක ඉල්ලාය. දුවගෙන ගොස් ඇයට කිරි එක හදා දෙන්නට තරම් මුතුට සිතුණි.

"දෙන්න පැටියෝ... නාත්ති නිවලා අරන් එන්නම්... නැත්නම් මගේ මැණිකගේ කට පුච්චා වෙනවනේ... එතකොට පව්නේ..."

ඔහු කියන වචනයක් වචනයක් පාසා මුතුගේ හදවත කඩා වැටෙයි... ඔහු තරම් හොඳ නාත්නා කෙනෙක් කාටවත් නැතැයි ඇයට සිතුණි.

"කුක්කු බඩගිනි ආවද.. ම්..."

කෙල්ල කතාවක් නැත්තේ කිරි බෝතලය කඩේ ගසාගත් නිසා බව මුතු දනී. ගිහින් බලන්නට ආසය... දවසක උඩට ගෙනවිත් කිරි පෙවිය යුතුය... කිරි බොද්දී ඒ මුහුණ බලන්නට ආසයි.

"නා..ත්..ති..යෝ... හාවට කු..ක්කු..."

මුතුට තුනී සිනාවක් ගියේය. කෙල්ල තමා දුන් හාවාට පුදුම ආදරේය.

"මං හාවටත් කුක්කු දෙන්නම්... චූටි නැන්දිගේ හාවනේ... නේද පුතු..."

ඔහු චූටි නැන්දි කියන්නේ තමාටය. මුතු දිග සුසුමක් හෙලා බැල්කනියේ වූ විශාල කවාකාර කණුවකට බර වූවාය.

ටික වෙලාවක් යන තුරු දෙන්නාගේම සද්දයක් නැත. කෙල් කිරි බීබීම නිදා ගන්නට ඇත.

දුවත් නිදාගත් පසු ඔහු ඉන්නේ කොතරම් පාළුවෙන්දැයි මුතු සිතුවාය. සමහර විට ඒ පාළුවට ඔහු හුරුවන්නට ඇත. ඔහුගේ බිරිඳ ඔහුව දමා වෙනතක් බලන්නට ඇත්තේ සෑහෙන කාලයකට පෙරය. එදා සිට මධුවන්ත මේ රැඳුරු තනිකමට පුරුදු වෙන්නට ඇත.





එහෙත් මේ ජීවිතයේ පුරුදු වෙන්නට අමාරුම නපුරුම දුක තනිකම බව මුතු දැන උන්නේ නැත.

දුවට නින්ද ගිය පසු ඇය ළඟට වී ඒ පුංචි අත්පා අතගාමින් මධුවන්ත ඉන්නේ ඒ පාළුව දරාගන්නට බැරි නිසාය.

මධුවන්ත ඔහුගේ ජංගම දුරකතනයට අලුත් සිම් කාඩ් පත ඇතුල් කළේ දැන්ය. ඔහුට කතා කරන්නට ඉන්නේ රවී පමණි.

"ර..වී ම..චං මම මධූ..."

මධුවන්ත කතා කළේ ආශාවෙනි.

"ම..ධූ උඹ කතා කරනකම් බලන් උන්නේ මචං... උඹට කොහොමද... කෙල්ලයි උඹයි සනීපෙන් නේ..ද..."

"අපි දෙන්නා සනීපෙන් ඉන්නවා මචං... අදයි සිම් එක ගත්තේ... කෙල්ල නිදාගන්නකල් උන්නේ මචං කතා කරන්න..."

ඔහු මේ කතා කරන්නේ සිංගප්පූරුවේ ඔහුගේ මිතුරෙකුට බව මුතු හැඳින ගත්තාය. ඔහුට එහෙමවත් කෙනෙක් ඉන්නවානම් හොඳය.

"උඹව හරියට මතක් වෙනවා මචං..."

මධුවන්ත කියද්දී රවීට පමණක් නොව එය උඩ සිට අසාගෙන උන් මුතුටද දුක සිතුණි. ඔහු කොතරම් හෘදයාංගම මිතුරෙක්දැයි මුතු තේරුම් ගත්තාය.

"මං ඉක්මනට උඹව බලන්න එනවා... දැන් උඹ මොනාද කරන්න හිතන් ඉන්නේ මධූ..."

"පුංචි කාමරේ කෙල්ලවත් තියාගෙන මං උදේ රෑ හිතනවා මචං... මෙ..හෙම ඉ..න්..න..ත් බෑනේ..."

"හාෂි මට කතා කළා... ඇහුවා උඹ කතා කළාද කියලා..."

"මගේ නම්බර් එක හාෂිට දෙන්නෙපා මචං... මං.. මං හිත හදාගෙන ඉන්නේ..."

මුතු තොල් පට සපා ගත්තාය. ඔහු හාෂි යැයි කිව්වේ ඔහුගේ බිරිඳට බව ඇය දනී. "හාෂි... ඔයා වගේ මෝඩ කෙල්ලෙක් ලෝකෙම නැතුව ඇති..." මුතු සිතින් කීවාය.

"අක්කා කෙල්ල බලන්න උදව් කරනවා නේද මචං..."

"අනේ ඔව් මචං... අක්කයි අක්කගේ නංගියි අයියයි හරියට උදව් කරනවා මචං..."

මුතුගේ පපුව සිරවිය. ඔහු ආ දා සිට ඔහුගේ මුහුණවත් නොබැලූ තමා ඔහුට උදව් කරනවායැයි කියන්නේ කෙසේද...

"ඒත් මචං... මං ඉක්මනටම පොඩි ගෙයක් හොයා ගන්නවා... හිමිහිට අපි දෙන්නත් අලුත් ජීවිතේකට පුරුදු වෙනවා මචං..."

"මං උඹට උදව් කරන්නම් මධූ..."

"චුට්ටක් ඔළුව උස්සගන්න ඕන මචං... තාම හිතේ පිළිවෙලක් නෑ..."

එහෙම කියද්දී මුතුට දුක සිතුණි. ඔහුගේ ජීවිතය කවදා කොහොම පිළිවෙලක් වෙන්නද... මේ රටේ කවුරු ඔහුට උදව් කරන්නද...

මුතු කාමරයට ගියේ බරවූ හදිනි... ඇඳ මත පෙරලී ඇය මොහොතකට දෙනෙත් පියා ගත්තාය. "හිමිහිට අපි දෙන්නා අලුත් ජීවිතයකට හුරු වෙනවා මචං..." ඔහු මිතුරාට කියූ කතාව මුතු සිහි කළාය. ඔහු හෙමින් හෙමින් හෝ මේ පාළු ජීවිතයට පුරුදු වෙනු ඇත. ඔහු දුකක් වින්දද අර පුංචි දුවත් එක්කය. එක අතකට ඒ දුක පවා ලස්සනය. එහෙත් මේ තමා යන පාරේ ඇත්තේ කුණු දහජරා දුකකි.

* * * * * * * * * * * * * * * * *





දුරකථනය නාද වෙද්දී එය ගොස් ගත්තේ මුතුය. ගෙදර උන්නේ ඇය පමණි.

"හෙලෝ..."

මුතු ඇමතුවාය.

"ම..ට මධුවන්තට ටිකක් කතා කරන්න පුළුවන්..."

කතා කළේ යුවතියකි.

"කො..හෙ..න්..ද ඔ..ය ක..තා කරන්නේ..."

"ම..ම සිංගප්පෝ වලින් කතා කරන්නේ... මධුවන්ත ඉන්නේ ඔහේ නේ..ද..."

මුතු කතා කරන්නේ කවුදැයි අනුමාන කළාය. ඔහුට මේ තරම් දේවල් කළ පසුත් ඇය තවත් කතා කරන්නේ ඇයි...

"ටි..ක..ක් ඉන්න..."

මුතු දුරකථනය තබා මුළුතැන්ගෙට ගියේ ලලිතා අතේ ඔහුට පණිවිඩයක් යවන්නටය.

"ල..ලි..තා ල..ලිතා..."

ලලිතා පෙනෙන්නට නැත. සමහර විට ඇය මාකට් එකට යන්නට ඇත. මුතු කොරිඩෝව දිගේ ගොස් ඔහු ඉන්නා ඇනෙක්ස් එකේ දොරකඩට ගියේ බිම බලාගෙනමය.

මධුවන්ත උන්නේ බිම වාඩිවී කෙල්ලවද බිම තබාගෙන ඇයට තේ වල පොඟවා බිස්කට් කවමිනි. ඒ දසුන දකිද්දී ඇගේ පපුව කඩාගෙන මෙන් ගියේය... "මධුවන්තටයි දුවටයි මෙච්චර දුකක් දුන්නට පස්සෙත් ඒ ගෑණි කතා කර කර වද දෙන්නේ ඇයි..." මුතු සිතුවේ කේන්තියෙනි.

"මේ කෝ..ල් එ..ක..ක්..."

ඇය බිම බලාගෙන කීවාය. මධුවන්ත ඇයව දැක්කේ එවිටය.

ඔහු දුවවද වඩාගෙන නැගිට්ටේ කලබලයෙනි. කවදාවත් ඇය මේ දොරකඩ දකින්නට ඔහු බලාපොරොත්තු වූයේ නැත.

"ම..ට..ද නංගී..."

මුතු හිස වැනුවේ බිම බලාගෙනමය. ඒ දැස් දෙස බැලිය නොහැක.

"මං කා..ට..වත් මේ ගෙ..දර න..ම්බර් එක දීලා නෑ..නේ..."

"මං ද..න්..නෑ..."

මධුවන්න දුවවද වඩාගෙන නිවස දෙසට යද්දී මුතු බිම බලාගෙන ගෙට ආවාය. ඔහු දුරකථනය අතට ගත්තේ කෙල්ලව අසළ වූ පුටුවක් මත තබාය.

"හෙලෝ..."

මුතු සාලයේ කොනක පුටුවකට බර වූයේ ඔහුත් ඇයත් කතා කරන දේ අහන්නටම නොවේ.

"ම..ධූ මම..."

කතා කළේ හාෂිය.

"ඇයි මෙහෙට කතා කළේ...."

ඔහු කතා කරන්නේ හිත හොඳින් නොවේ. මුතු රහසින් මෙන් කෙල්ලට කතා කළාය. කෙල්ල මුතු වෙත ආවේ පුටු අල්ලාගෙන වැටි වැටී මෙනි. ළඟටම ආ කල මුතු කෙල්ලව ගෙන සැටිය මත තබා ගත්තාය.

"මං නිකං කතා කළේ..."

"දැන් මොනවත් කතා කරලා වැඩක් නැනේ නේද... දුවයි මායි සතීපෙන් ඉන්නවා... අපි දෙන්නා ගොඩාක් හොඳට ඉන්නවා... එච්චරයි... ආයේ මෙහෙට කතා කරන්නෙපා... අපි දෙන්නට පාඩුවේ ජීවත් වෙන්න ඉඩ දෙන්න..."





මධුවන්න කියාගෙන ගියේය. මේ හදවතට කුරිරු සතුටක් දැනෙන්නේ ඇයිදැයි මුතු නොදනී.

"නව බිස්කට් ඔන..ද ම... බික්කා..."

"බි..ක්..කා කෑවා..."

"බඩ ඉෝයිද දැන්..."

කෙල්ල ඇඟරී සිනාසුණාය.

"මාවයි දරුවවයි මේ තත්වෙට ඇදලා දාලා දැන් හාමි කෝල් එකක් දීලා ඒ පව් හෝදගන්න යන්නෙපා... අපේ නිබ්බ ඔක්කොම බැඳීම් මං සිංගප්පෝ එයාර් පෝට් එකේ දාලා ආවේ... මෙහෙට කතා කරන්නෙපා... මේ ගෙදර ඉන්නේ වැදගත් මිනිස්සු... එයාලට වද දෙන්නත් එපා..."

මධුවන්න එහෙමම දුරකථනය තැබුවේය. ඔහු ඇයට ඒ තරම්ම දරුණු ලෙස කතා කරනැයි මුතු සිතුවේ නැත. ඔහු දුරකථනය තබා පුටුසෙට් එක ළඟට ආ බව මුතු දනී. හිස එසවීමට අමාරු ඒකය.

"ම..ට සමාවෙන්න නංගී..."

ඔහු තමාගෙන් සමාව ඉල්ලන්නට හේතුවක් නැත.

"ඒ.. ක..තා කළේ දුවගේ අම්මා... අපිට නිකං වද දෙනවා... පව් කර කර..."

මුතු බිම බලාගෙනම උන්නාය. ඔහු ඇයව "මගේ එයින්" කියා හඳුන්වා දුන්නේ නැත.

"චූටි.. නැ..න්දිට උම්මා දීලා එන්න..."

මුතු බලා සිටිද්දීම කෙල්ල සැටියේ හිටගෙන ඇගේ බෙල්ල බදාගෙන උම්මා එක්ක දී මධුවන්න අතට පැන්නාය.

"ම.. ම..ට උ..ද..ව්වක් කරනවද නංගී..."



Elegantta.com

මුතු නෙත් එසෙව්වාය.

"මේ.. ෆෝ..න් එකට ක..තා කරලා ක..වුරු මා..ව ඉල්ලුව..ත් එ..හෙම කෙතෙක් නෑ කියතවද..."

මුතු බිම බලාගෙන හිස වැනුවාය. "අදත් එහෙම කරත්ත මට හිතුණා..." ඇය සිතින් කීවාය.

"වූටී නැන්දි මොනාද කිව්වේ... ම..."

ඔහු කෙල්ලගෙන් අසමින් යන හඬ මුතුට ඇසෙයි... ඇය තනිවම සිනාසුණාය. "මං හිතුවා ඔයා තාම එයාට ආදරෙයි කියලා" මුතු සීවේ සිතෙනි.

මුතු කැම කන්නට පහළට බැස්සේ සැමහන රෑ වූ පසුය. අද තිම්මිත් ප්‍රියමන්තත් වෙඩින් එකකට ගොස්ය. ඒ නිසා මුළු නිවසම පාළුය. අම්මා කොහොමත් වේලාසනම කැම කා නිදාගන්නට යයි. තාත්තා ගෙදර එත්තේ බොහෝ විට පිටින් කැම කාය. ඔහු අද තවමත් නැත. මේ ගෙදර නැටී එහෙමය.

මුතු වේලාසන කැම කන්නට පහළට නාමවිද තනිවම කන්නට බැරි නිසාය...

"ඕත්තරේකුත් බැදලා ගේන්නද පොඩි මඩම..."

ඉදි ආප්ප තුන හතරක් මඩා ගනිද්දී ලලිතා පැමිණ ඇසුවාය.

"එපා ලලිතා... මේ ඇති..."

මුතු මස් හොද්ද මඩා ගත්තේ නැත. ඇය කෑවේ පොල් සම්බෝල ටිකක් ඉදි ආප්පයක තවරාගෙනය. ඉදි ආප්පයක් දෙකක් කද්දීම මුතුට තිරවිය. ඉඩෙටම මෙන් ඇයට සිහිවූයේ මධුවන්තවය.

"ල..ලිතා..."

එතුර ටික තීගෙන තීගෙන යමින් මුතු ලලිතාට කතා කළාය.

"පොඩි මඩම..."





"ම..ධුවන්ත මහත්තයට කැම දුන්නද..."

ලලිතාගේ දෑස් බිමට බර විය.

"ඇයි ලලිතා..."

මුතු ඇසුවේ ලලිතා කතා නොකර සිටිද්දීය.

"කියන්නකෝ... ඇයි... එයාට කැම දුන්නෑ..."

"නෑ මේ.. පොඩි මඩම..."

"කියන්නකෝ ඔයා..."

"අ..නේ මන්දා පොඩි මඩම..."

ලලිතා කතා කළේ වටපිට බලමින් අසීරුවෙනි.

"ම..ට කි..යා..න්..න ල..ලිතා..."

"ම..ධුවන්..ත මහත්තයට කැමත් මෙහෙත් යවන්නෝන නෑ කිව්වා..."

"ක..ව්..ද..."

"මලා..කු නෝ..නා..."

මුතුගේ දෑස්වල කඳුළු පිරුණි. කන්නට ගත් කට හිරවූයේ ඒ නිසාය. මුතුට මේ ගෙදර ගැන දැනුණේ කිට නොහැකි තරම් පිළිකුලකි.

"ප..ව්..."

ඇය කීවේ දෑස් පිසදමමිනි.

"ම..ට..ත් දු..කයි පොඩි මඩ..ඩි.. මං කියලා මොං..නවා කරන්නද..."

"එ..යා මොං..නා කෑවද දන්නෑ..."

"දැ..න්..නෑ... මාත් අද ආසාවෙන් උන්නේ බබාට ඉදි ආප්ප ටිකක් දෙන්න කිරි හොදි එක්ක..."

මුතු තොල් පට හපාගෙන සැහෙන වේලාවක් උන්නාය. ලෝකෙට පෙන්නන්නේ මහා ලොකු සමාජ සේවිකාව කියාය. එහෙත් ගෙදර ඉන්න අහිංසකයන් දෙන්නාට කෑම ටිකක් දෙන්නේ නැත.

"ල..ලිතා..."

"පො..ඩි බේ..බි..."

"ගිහින් අහන්න ලලිතා... කෑවද කියලා... මං කිව්වා කියලා කියන්නෙපා..."

"ම්.. මං බලන්නම්..."

ලලිතා ගියේ රහසින් මෙනි. මුතු කන්නට ගත් ඉදි ආප්ප ටිකද පැත්තකට කර කුස්සියේ දොරකඩට විත් දෑත් බැඳ ගත්තාය.

ලලිතා යද්දී මධුවන්ත උන්නේ දොරකඩ බිම ඉඳගෙන අහස දෙස බලාගෙන කල්පනා කරමිනි. විදුලි පහනද නිවා දමා තිබූ නිසා ලලිතා ඔහුව දැක්කේද ළඟටම ආ පසුය.

"ල..ලිතා..."

"චූටි බේබි නිදිද මහත්තයා..."

"ඔව් ලලිතා... අද මාත් එක්ක සෙල්ලං කර කර ඉඳලා කෙල්ලට මහන්සියි... කාපු ගමන් නිදාගත්තා..."

"අ..නේ මොනාද චූටි බේබිට කැව්වේ මහත්තයා..."

"මං එයාට නූඩ්ල්ස් හදලා දුන්නා ලලිතා... එහෙදි කාපු එක... ඒකට ආසයි..."

ලලිතාගේ පපුවට දැනෙන්නේ එසේ මෙසේ ගින්දරක් නොවේ.

"ම..හ..ත්..තයා මො..න..වත් කෑවේ නෑ නේද..."

"ම..ට අද බඩගිනි නෑ ලලිතා... පස්සේ තේ එකක් හදාගන්නවා... ම..ගේ කෑම ගැන හිතන්නෙපා ලලිතා... ඒක කරදරයිනේ... මට





පුරුදුයි මෙහෙම... එහෙදිත් කන්නේ ඔය මොනාහරි ඉක්මනට හදාගෙන..."

ලලිතාගේ ඇස්වල වූ කඳුළු අන්ධකාරයේ මධුවන්ත දැක්කේ නැත.

"මං යන්නම් මහත්තයා..."

"හොඳයි ලලිතා..."

ලලිතා ආවේ දෑස් පිසදමමිනි. මුතු ඇය දෙස බැලුවේ දවා ගිය දෙනෙතිනි.

"ඇයි ලලිතා..."

ලලිතා මධුවන්ත කියූ සියල්ල කීවාය. ඒ ටික කියද්දීත් ඇගේ ඇස්වල කඳුළුය.

"බේ..බි ක..න්..නෑ..."

"එපා ලලිතා... ගෙදර කෙනෙක් බඩගින්නේ ඉන්නකොට කොහොමද කන්නේ..."

"මං තේකක් හදන්නද... නැත්නම් කිරි කෝපි එකක්..."

"ම්.. එයාටත් දෙන්න... මොනවා හරි උනොත් මං බලාගන්නම්..."

"යනකොට දොරකඩ ඉඳගෙන අහස දිහා බලාගෙන ඉන්නවා..."

ලලිතා කියන කතා ඇහෙද්දී පපුවේ මොනවාදෝ පෙරලෙයි. "ඔයාටත් තියෙන්නේ ජීවිතයක්නේ" මුතු සිතුවේ ඇවිලෙමිනි.

"ල..ලිතා... මේ බිස්කට් ටිකක් එක්කම දෙ..න්..න..."

"හා..."

"කෑම දෙන්නෙපා කිව්ව නම් දෙන්නෙපා... ඒ මහත්තයත් මෙහෙම ඉඳුල් කන්නෝන කෙනෙක් නෙමේ..."



Elegantbooks.com

"නපුරු කාලේ ආවම එහෙමනේ බේබි... විෂ්ණු දෙයියන්ටත් බටකොළ කන්න උනාලුනේ..."

"ම්..."

මුතු උඩට ආවේ ඇත්තටම හදවත රිදුම් දෙද්දීය. මේ ගේ දෙවනත් වෙන්නට කෑ ගසන්නට ඇයට සිතෙයි. එහෙත් වැඩක් නැත.

මුතු අන්ධකාරයේම බැල්කනියට ආවාය. පහළ හැල හොල්මනක් නැත. කෙල්ලද නිදා ගත් පසු ඔහු ඉන්නේ පාළුවෙනි. "ඔයා ඉක්මනට ජීවිතේ පටන් ගන්න මධුවන්ත... මෙහෙම වැටිලා ඉන්නෙපා..." මුතු කීවේ සිතෙනි.

"මං කිරි කෝපි එකක් හදන් ආවා මහත්තයා..."

ලලිතා පහළ කියනා හඬ උඩ ඉන්නා මුතුට ඇසෙයි.

"අනේ ලලිතා කරදර වෙනවනේ... මට රෑ වෙලා හදාගන්න පුළුවන්නේ..."

"ඌට් බේබිත් නිදාගත්තම මහත්තයට පාළුයි නේද..."

"එහෙදිත් එහෙමයි ලලිතා... රෑට තේකක් හදාගෙන බිල්ඩින් දිහා බලන් ඉන්නවා..."

මහු කියනා කතාවලට ඇවිලෙන්නේ උඩ ඉන්නා මුතුගේ පපුවය. මුතු බැල්කනියේ පුටුවකට බර වූයේ හිතේ බරිනි... "ඔයාට බත් කටක් නොදෙන මේ ගෙවල්වලට මෙච්චර හරියන්නේ කොහොමද කියලා දන්නෑ..." මුතු සිතුවාය.





# 20

දුප්පත් ගෑණි දුවට කෑම එක අරගෙන ආවේ ආශාවෙන් බව මධුවන්ත දනී. ඇය සුදු අල හොද්දක් සුදට පරිප්පු හොද්දක් විශේෂයෙන්ම හැදුවේ කෙල්ලටය. ඇය නමාට පවා කෑම එක අරගෙන විත් තැබුවේ ආශාවෙනි. කෑම ගෙන ආ පසුත් තුන් හතර වතාවක් පැමිණ "මහත්තයා කෑවා"දැයි ඇය අසයි. එහෙම ඇය දැන් කෑම නොගෙනෙන්නේ හේතුවක් ඇතිවය. මුතු ගැනවත් නිම්මි ගැනවත් මධුවන්ත අහිතක් සිතුවේ නැත. ඒ හදවත් ගැන ඔහු හොඳට දනී. එහෙත් මේ ගෙදර මහ කට්ටිය ළඟ ඒ මිනිස්කම් නැත.

මධුවන්ත ඒ ගැන දුරදිගට හිතන්නට ගියේද නැත. කොහොමත් අමුතු බඩගින්නක් දැන් එන්නේද නැත. දුවට මොනවා හෝ හදා



Elegantkaiks.com

ගත්තොත් ඇති යැයි මධුවන්ත සිතුවේය.

සිංහල කෑම හදන්නට අමාරුය. හෙට ගොස් නූඩ්ල්ස් පැකට් එකක් අල ටිකක් බිත්තර ටිකක් ගෙන ආ යුතුය. කෙල්ලත් තමා මෙන්ය. තියෙන දෙයක් ඇය බඩගින්නට කයි.

මේ ජීවිතයේ පව්වලට කවුරුවත් පළි නැත. ඒ නිසා අඩුම ගණනේ මේ ජීවිතයට මෙහෙම කළ භාෂි ගැනවත් මධුවන්ත වෛරයෙන් සිතුවේ නැත. මේ තමාත් කෙල්ලත් ජීවිතය පතාගෙන ආ නැටිය. ඒ දෛවය වෙනස් කර ගත යුතුය. එය කළ යුත්තේ ද තමාමය.

තවම හිතට හිතන තරම්ම නිවනක් නැත. මධුවන්ත ඇතුළට ගොස් තවත් තේ එකක් හදා ගත්තේය. හදාගෙන විත් ඔහු දොරකඩට විත් වාඩි වූවේය.

අද හඳ නැති කළුවර දවසකි. නිවසේ ඉදිරිපිට දැල්වූ විදුලි පහන් වල එළිය පමණක් අලංකාර ගෙමිදුලට වැටී ඇත... මධුවන්ත පුරුදු පාළුවෙන් අහස දෙස බලාගෙන උන්නේය.

දැන් මේ ජීවිතයේ ඇත්තේ බෙදා ගන්නට දුකක් නොවේ. දරාගත යුතු දුකකි. ජීවිතයේ දුක දැන් තනිවම දරාගත යුතුය. හැමෝගෙම ජීවිත වල ප්‍රශ්නය. කරදරය.

මධුවන්ත අත තිබූ දුරකථනයෙන් රවීට ගත්තේ කතා කරන්නට වෙන කෙනෙක් නැති නිසාය.

"ම..ච්..."

"උ..ඔ එයාර් පෝට් යන ගමන්ද මචං..."

කාගෝ ආයතනයේ සේවය එහෙමය. රෑ පුරා ගුවන් තොටුපලේ ලැගිය යුතුය.

"මචි කොල්ලෝ... මං උඹට ගන්නත් උන්නේ..."

"ඇයි මචං..."



"සනීපෙන් ඉන්නවද කියලා බලන්න..."

"ඉන්නවා මචං..."

"දුවා..."

"කෙල්ල මොනවත් දන්නෑනේ මචං... සෙල්ලම් කර කර ඉන්නවා මං එක්ක..."

"උඹට පාළු ඇති..."

මධුවන්ත සිනාසුණේය.

"භාෂි උඹට කතා කළා නේද..."

"ඔව්.. මං කිව්වා කතා කරන්නෙපා කියලා..."

"මට කිව්වා... ඊයේ එයාර් පෝට් එකේදී හම්බ උනා..."

මධුවන්ත ඒ ගැන දිග දුරට අහන්නට ගියේ නැත.

"දවල් ආනන්ද භවන් එකෙන් ඉඳිආප්ප කෑවා... කද්දි උඹවත් මතක් උනා..."

මේ ජීවිතයේ එහෙමවත් මතක් වෙන්නට මිතුරෙක් ඉතුරු වූ එක පුදුමය.

"උඹ කාල බීලා ඉන්නවා නේද මචං..."

"ඔ..ව් මචං..."

"උඹ ආපු එක හොඳයි මචු... මෙහේ වෙන දේවල් උඹ නොදකින්න නොහිටපු එකම හොඳයි..."

"මං දන්නවා මචං..."

"හිතේ හිට එකේ ඉඳපං... හොඳද..."

Elegant

"ම..."

හිතට ටිකක් හෝ සැනසීමක් දැනෙන්නේ එහෙම කතා කළ පසුය. මධුවන්ත තේ උගුරු දෙක තුනක් බීගෙන බීගෙන ගියේය.

ලංකාවට පැමිණ හෙටට සතියකි. ඒ සතියට හිතූ දෙයක් නැත. නොසිතූ දෙයක්ද නැත. වෙලාවකට හිතට හිතෙන්නේ හිතෙන්නට ඕනා දේ නොවේ. නොහිතා ඉන්නට ඕනා දේය. හිත එහෙමය.

හෙට කෙල්ලටත් අන්දවාගෙන කොහේ හෝ යනවා යැයි මධුවන්ත සිතා ගත්තේය. උපන් බිමේ වුව යන්නට තැනක් නැත.

* * * * * * * * * * * *

නිමේ මුතුව සොයාගෙන ආවේ පාන්දරමය. ඇය එද්දී මුතු ඇඳටම වී කල්පනා කරමින් උන්නාය... නිමේව දැක මුතු සිනාසුණාය.

"ඊයේ වෙඩින් එක හොඳද අක්කේ..."

"දුප්පත් කොල්ලෙක්ගේ වෙඩින් එකක් වුවි... කෙල්ල ඊට වඩා දුප්පත්... අයියගේ ඔෆිස් එකේ ළමයෙක්..."

නිමේ ඇඳට බරවී රැගෙන ආ වෙඩින් කේක් කැල්ල ඇයට පෑවාය.

"මාවත් මතක් උනා එහෙනම්..."

මුතු වෙඩින් කේක් කැල්ල ගත්තේ සතුටිනි.

"රෑ වුණා නේද එන්න..."

"අවිස්සාවේල්ලෙනේ වුවි... එතනිනුත් තව ඇතුළට යන්නෝන... දොළහත් පහුවෙලා එනකොට... හැබැයි වුවි කෑම නම් මරු... මේ හෝටල් වල වෙඩින් වලට ගියාම එන්නේ බඩගින්නෙනේ... මේසෙට





දාලා තිබ්බා ඇතිවෙන්න කන්න... කෑම පුදුම රසයි... කාලා එද්දී මට නිදිත් මතයි..."

නිමේ කියාගෙන ගියේ ආශාවෙනි.

"ඒ..ත් අ..ක්..කේ..."

කියන්නට ගිය දේ මුතු ගිල ගත්තාය.

"ඇයි වුවි..."

"එ..හෙම ඔයාලා කාලා එද්දී... එක්කෙනෙක් මේ ගෙදර බඩගින්නේ නිදාගත්තේ..."

කෙල්ල කීවේ උගුරෙන් මෙනි. නිමේ කෙල්ල දෙස බලාගෙනම උන්නාය.

"ඇයි නංගී... ක..වු..ද බඩගින්නේ හිටියේ..."

"ම.. ම..ධුවන්..ත..."

"ඇයි.. ම..ල්ලී කෑවේ නෑ..."

මුතු සියල්ල කීවාය. නිමේගේ දෑස්වල කඳුළු පිරුණි. මේ දේ වන බව ඇය දැන උන්නාය.

"පව්.. ද..න්..න..වනම් කන්නෙත් නෑ..."

නිමේ කීවේ අඬමින් මෙනි.

"මේ අසරණකමට නමක් නෑ වුවි... කමක් නෑ... මල්ලි වැඩි දවසක් මෙහේ ඉන්න එකක් නෑ... විදින දුකම මිනිස්සුන්ට යන පාර කියනවලුනේ... උඹත් ඊයේ කෑවේ නැද්ද..."

නිමේ අසද්දී මුතු බිම බලාගත්තාය.

"අහන්නෙපා එයාගෙන්... දුක හිනෙයි..."



Elegantalks.com

"ම්..."

"අයියා දන්නවනම් පැලෙයි..."

"මේ ගෙවල් වල ඉඳුල් දෙන්න යන්නත් එපා..."

මුතු නෙත් බර කර කීවාය. කෙල්ල මෙහෙම කියන එක ගැන නිමේට පුදුම නැත. "උඹ ඒකා ගැන කොච්චර හිතනවද කියලා මං දන්නවා..." නිමේ කීවේ සිතෙනි.

"අ..ක්..කේ..."

"ම්..."

"කාලෙක පොඩි ඉඩම් කැල්ලක් අරගෙන ගෙයක් හදන්න ගන්න..."

"අයියා කොහොමත් එහෙම කරනවා චූටි... එයාට ගොඩක් දේවල් දැනෙනවා... ඒත් පෙන්නන්නෑ... පුදුම කෙනෙක්..."

නිමේ යන්නට නැගිට්ටේ දෑස් පිසදමමිනි.

"මේ..ක එ..යා..ට දෙන්..න..."

"උඹ කාපත්... මං මල්ලිටත් එකක් ගත්තා..."

නිමේ කීවේ එසේ කියා කෙල්ලගේ හිසද අතගාය.

* * * * * * * * * *

නිමේ යද්දී මධුවන්ත උන්නේ ඇඳගෙන කෙල්ලටත් අන්දවමිනි. කෙල්ල නිමේව දැක අත ගැසුවාය.

"නැ..න්..දි ආපු සතුටට ඔය..."





මධුවන්ත කීවේය.

"ම..ගේ සුදු බෝ..ලේ.. කොහෙද ය..න්..නේ තාත්ති පැටියා එ..ක්ක ම්.. සූට් ඇඳගෙන..."

"පා..පු ස..ද්ද පා..පු..."

කෙල්ල සද්ද නැගෙන සපත්තු හඬ නංවමින් පෙන්නුවාය.

"අ..නේ.. කුක්කු බිච්චද පැටියෝ..."

නිමේ කෙල්ලව වඩාගෙන ඉඹගෙන ඉඹගෙන ගියාය.

"අන්දන වෙලාවට කතා කරන්න මල්ලී... මං ඇවිත් අන්දන්නම්... මල්ලිටත් ඇඳගන්න බෑනේ..."

"මට පුරුදුයි අක්කේ... ඉපදුන දවසේ ඉඳලා මංනේ ඉතින් බලන්නේ... ඊයේ පරක්කු උනාද අක්කේ එනකොට..."

"ඔ..ව් රෑ වුණා... අයියා තාම නිදි..."

"ටිකක් ගන්න ඇති..."

"ම්.. ඔහොම වෙලාවටනේ ඉතින්... මං බැණ බැණ ආවෙත්..."

නිමේ සිනාසී කීවාය.

"මල්ලී උදෙන්ම කොහේ යන්නද..."

"බැංකුවට යන්නත් තියෙනවා අක්කේ... තව වැඩ දෙක තුනකුත් තියෙනවා..."

"අනේ ඉතින් මේකිවත් අරන් ගිහින් පුළුවන්ද..."

"දැන් පුරුදුයි... නැතිඋනාමත් පාළුයි..."

"ඕන වෙලාවට තියලා යන්න... නැන්දියි චූටි නැන්දියි එක්ක



Elegantta

ඉම්... හොඳද..."

කෑම ගැන කියන්නට නිම්මිට මොකක්ද වාගේය.

"ම..ල්..ලිගේ කෑ..ම ටි..ක..ව..ත්..."

නිම්මි කියන්නට හදද්දීම මධුවන්ත ඇය දෙස බැලුවේ යමක් කියන්නටය.

"අනේ ඒක ප්‍රශ්නයක් නෑ අක්කේ... ම..ට මේ ගෙදර ටික දවසක් ඉන්න දෙන එකම ඇති... ඒක ගැන අක්කා හිතන්නෙපා... ඒක කරදරයි... අපි දෙන්නතේ..."

බිම බලාගෙන උන් නිම්මිගේ ඇස්වල කඳුළය.

"අ..ක්..කේ..."

"මට මල්ලී..."

මධුවන්තත් නිම්මිත් මිදුලට ආවේ කනාබහකින් නොරවය.

"නෑ..න්..දිට උම්මා දෙන්න පැටියෝ..."

කෙල්ල ඇයව බදාගෙන සිප ගත්තාය. නිම්මි කෙල්ලව දුන්නේ ඇස් පිසදමමිනි.

"කොහොමද යන්නේ මල්ලී..."

"ඒ ගේනට කිව්වා අක්කේ ත්‍රීවීල් එකක් කතා කරලා දෙන්න කියලා..."

බහුත් දුවත් යන දෙස දුකෙන් බලා උන්නේ නිම්මි පමණක් නොවේ. උඩු මහලේ උන් මුතුද එදෙස බලා උන්නේ දුක්බරවය.





* * * * * * * * * * * *

මධුවන්ත කෙල්ලට කැව්වේ රාජගිරියේ මැක්ඩොනල්ඩ අවන්හලේ මේසයක් මත කෙල්ලව තබාගෙනය. උදෑසනට එහි ඇති සොසේජස් දැමූ බනිස් දෙකක් ගෙන මධුවන්ත පාර පෙනෙන තැනක මේසයකට බර වූයේ දැන් ටික වේලාවකට කලිනි.

සෝස් ටික ටික දමා බනිස් කවද්දී කෙල්ල එය කෑවේ කට උල් කරමිනි.

"රසයිද පැටියෝ..."

කෙල්ල ඇඹරී සිනාසුණාය. මධුවන්ත ඒ වූටී දෙපා අතගා ඒ මුහුණ දෙස මොහොතක් බලා උන්නාය. මුළු ලෝකයම නැති වුවත් එක අතකට මොකදැයි ඔහුට සිතුණි.

ඇය හදිස්සියේවත් සිහිවී අම්මා ගැන අසතැයි මධුවන්තට එද්දී සිතුණි. එහෙත් එසේ වූවේ නැත. ඇයත් තමා සේම අම්මාව අමතකම කර ජීවත් වන්නට සිතුවා සේය.

"තා..ත්තිත් කන්නම්... ම්..."

මධුවන්ත බත් එක කන්නට ගත්තේ කෙල්ලට කැවූ පසුය. ඊයේ දවසටම බඩට බරට දෙයක් වැටී නිබුනේ නැත. ජීවිතයේ ඇති ගින්දර ගැන හිතද්දී බඩගින්දර මහ ගින්දරක් නොවේ.

එහෙමම දුවවද රැගෙන මධුවන්ත ගියේ බැංකුවටය. අත තිබූ සිංගප්පූරු මුදල් ටිකද ඔහු පොතකට දැම්මේය. ඒත් සමගම මුදල් ටිකක් මාරුද කර ගත්තේය.

බැංකුවෙන් පිටතට එද්දීම කෙල්ලට මධුවන්තගේ අතේම නින්ද ගොස්ය. ඇයට එහෙමය. පැය දෙකක් කියවමින් උන්නොත් ඊළඟ පැයේ තද නිදිමතක් එයි.

එළියට ආ ඔහු ත්‍රීවීලරයකට ගොඩ වූයේ යා යුතු තැනක් නිශ්චය



Elegantlk.com

කරගෙනද නොවේ. බඩු ටිකක් ගන්නවා නම් ගත යුත්තේ අන්තිමටය.

* * * * * * * * * * *

මධුවන්ත හවස එද්දී මහ වැස්සය. ගේට්ටුව අසළ ත්‍රීවීලරයක් නවත්වද්දීම ඒ මධුවන්ත බව මුතු දැන ගත්තාය. මේ මහ අනෝරා වැස්සේ දැන් ඔහු කෙල්ලවද ඔසවාගෙන තෙමී තෙමීම එනු ඇත. ඇය එහෙමම කාමරයෙන් පිටතට පැමිණ පහළට බැස්සාය.

"ල..ලිනා..."

"පොඩි බේබි..."

"ම..ධුවන්ත මහත්තයා ඇවිත්... වැස්ස... එන්න විදිහක් නැතුව ඇති... මේ කුඩෙත් අරන් දුවන්න..."

"හා... නැත්නම් චූටි බේබිවත් තෙමෙයි..."

ලලිතා එක කුඩයක් ඉහලාගෙන තවත් කුඩයක් රැගෙන ගේට්ටුව ළඟට දිව්වාය. මුතු දොරකඩ දැත් බැඳගෙන උන්නේ උඩට යා නොහැකිවය.

"එ..න්..න මහත්තයා... දුවව මං ගන්නද..."

මහ වැස්සේ ත්‍රී වීලරයට එබී ලලිතා ඇසුවේ කෑ ගසමිනි.

"මං ගන්නම් ලලිතා... මේ බෑග් දෙක පුළුවන්නම්..."

"ආ.. මහත්තයා මේ කුඩේ අරන් යන්නකෝ..."

ලලිතා කුඩය ඉහලා ඔහු අතට දුන්නාය. මධුවන්ත දුවවද වඩාගෙන එය අල්ලාගෙනම බැස්සේය.

කොන්ක්‍රීට් අතුරණය මැදින් ඔහු එන අයුරු මුතු බලා උන්නේ අඬාගෙනය... මහ වැස්සේ පුංචි කුඩයක් යටින් එන තාත්තාත් දුවත්





දෙස එහෙම බලා ඉන්නට අමාරුය.

මධුවන්ත මුතු හා සිනාසුණේ වැස්ස අතරිනි. මුතු බැලුවේ කෙල්ල දෙසය. ඇය කෙල්ලට අත වැනුවේ හැඟීම් මැඩගෙනය. කෙල්ලද මධුවන්තගේ කරේ එල්ලීගෙන මුතුට අත වැනුවාය.

"ලලිතා..."

"පොඩි බේබි..."

"මො..නා..ද ඒ අරන් ඇවිත් තියෙන්නේ..."

"මං හිතන්නේ චූටි බේබිට කවන්න ඒවා... ඔය නූඩ්ල්ස් පැකට් බිස්කට් එහෙම..."

දරුවාට ඒවා කවා ඇත්ද... මේ කාලයේදී වැඩෙන දරුවෙකුට මාළු කැල්ලක් මස් චුට්ටක් අල ටිකක් සමඟ බත් ටිකක් කැවිය යුතු නොවේද...

"හ..දපු වෙලාවට මාළු ටිකක් මස් ටිකක් එ..හෙම දෙන්න ලලිතා..."

"මං දෙ..න්..න..ම් දැක්කොත් බනී..."

මුතුට හිල්ලින... ඇය මහ වැස්ස දෙස මොහොතක් බලා හිඳ උඩට ගියාය... එක අතකට ඔහු කෙසේ හෝ මේ ජීවිතයට පුරුදු වෙනු ඇත. විය යුත්තේද එයමය.

"චූටි..."

නිම්මි උඩට ආවේ පුංචි පාර්සලයක්ද රැගෙනය.

"ම්..."

"පැටිස් එකක් කනවද..."

ඇය පැටිස් පාර්සලය මුතුට පාමින්ම ඇසුවාය. මුතු පැටිස් එකක් ගත්තේ පුංචි බඩගින්නක්ද නිබූ නිසාය.



Elegantalks.com

"කොහෙන්ද අක්කේ..."

"ම..ල්ලී ගෙනත්..."

මුතුගේ දෙතෙත් බිමට බර විය.

"අ..ද බ..ඩු ගෙ..න..ත් නේ..ද..."

මුතු ඇසුවේ දුකෙන් මෙනි.

"ම..."

"අ..ක්කේ..."

"චූටි..."

"කො..හොම ජීවත් වෙනවද දන්නෑ නේ..ද..."

"ම..ටත් පුදුම ඒකයි චූටි..."

"තනියම... දුවගේ වැඩක් කරගෙන... අර පුංචි කැල්ලේ..."

"ම.. ඒත් යද්දි හිනාවෙනවා... අපි නම් බලාගත්ත අත බලාගෙන අඬයි..."

"ඔයාට කවදාවත් එහෙම අඬන්න වෙන්නෙපා" මුතු පැතුවේ සිතෙනි.

"පොඩි බේබි..."

ලලිතා උඩට දුවගෙන ආවාය.

"ඇයි ලලිතා..."

"කාංචන මහත්තයා ඇවිත්... වාහනේ ඉඳන්ම කතා කළා... ඇඳුමක් දාගෙන එන්නලු ටිකක්..."

මුතු නිමිම් දෙස බැලුවේ නුල්ලා මෙනි.





ජීවිතය නරකම තැනකට හිරවී ඇති බවක් මුතුට ඇතුණි. ඇත්තටම මේ ආවේ හදවතින්ම ආදරය කරන කෙනා නම්... දුවන්නේ ඇදි වත පිටිනි. එහෙත් හදවතේ අහලකවත් නැති කෙනෙක් සමඟ කොහේ යන්නද... මොනවා දොඩන්නද...

"මේක මහ කුණු දුකක් අක්කේ..."

මුතු ඇඳෙන් බැස්සේ එහෙම කියාගෙනය. නිමිම් කෙල්ලගේ උරහිස පිරිමැද්දේ කියන්නට දෙයක් සොයා ගත නොහැකිවය.

නිමිම් මුතුත් සමඟ පහළට බැස්සාය. කාංචන වාහනය පණ ගන්වාගෙන දොරකඩ පෝට්කෝව යට උන්නේය.

"කො..හේ ය..න්..න..ද..."

වාහනයේ දොර ඇර මුතු ඇසුවේ අසරණ හඬිනි.

"නගින්නකෝ..."

ඇය වාහනයට ගොඩ වූයේ තවත් වරක් නිමිම් දෙස බලාය. කෙල්ල යන්නේ කොතරම් අකමැත්තෙන්දැයි නිමිම් දනී. මේ ජීවිතයේ මින් පසු කෙල්ලට සැනසීමක් නම් නොලැබෙන බව නිමිම් දනී.

එහෙත් ඒ ජීවිතයට දිය හැකි විසඳුමක්ද නැත.



Elegant

# 21

කාගේදෝ දුක්බර අතක් නළලතින් පටන් ගෙන හිස හරහා දුවන බවක් මුතුට දැනුණි. කෙල්ල ඇස් පියාගෙනම උන්නේ ඒ පහස ඒ තරමටම සනීප පහසක් වූ නිසාය... ඒ උණුසුම් අත්ල නළලත මත තියෙද්දි හදවතට දැනුණු සැනසීම පුදුමාකාරය... නළලත මත තිබූ ඒ අත්ල එහෙමම වම් කම්මුල වැසෙන සේ පතිත විය... ඒ අත්ලෙන් දැනෙන තුනී රස්නය දැස් පියාගෙනම ඇය විඳ්දාය. ඊටත් පසු ඒ අත්ල මත ඇය සුරත තැබුවාය...

"නිදාගන්න මං ළඟ ඉන්නම්..."

ඒ හඬ පුරුදුය... එහෙත් දැස් අලවා ඇතිවාක් මෙනි... දැස් ඇර නොබලාම මුතු ඒ අත පිරිමැද්දාය.





"මධුවන්ත අයියා නේ..ද..."

ඇය තුනී සිනහවක් සහිතව ඇසුවාය.

"ම්..."

"නින්ද යන්නෑ..."

"ම්හ්..."

"එහෙනම් මෙතනින් ඇලවෙන්න..."

ඔහු ළඟින් ඇලවූ උණුසුම පවා මුතුට දැනෙන්නට විය... ඔහු ළඟින් ආවේ දුවාගේ හිස ගල්වන ඔඩි ක්ලෝන් සුවඳය...

මුතු ඔහු ඉන්නා ඇලයට හැරුණාය.

"පාළුවෙන්ද ඉන්නේ.. ම්..."

"කොහොමද දන්නේ..."

"මට පේනව නේ..."

"මේ මගේ දෛවය... මොනා කරන්නද..."

"දෛවය වෙනස් කරගන්න පුළුවන්..."

"කොහොමද..."

"දුවාට අම්මා කෙනෙක් ඕන නේද..."

"ම්..."

"එච්චරද..."

ඔහු කතා කළේ නැත.

"ඔයාට හොඳ නෝනා කෙනෙක් එපාද..."

"මට ආදරේ කරන්නේ කවුද දැන්..."

"කෙනෙක් ඉන්නවා... අද නෙමේ ගොඩක් කල් ඉදලා ඔයාට



Elegantlk.com

ආදරේ කරන..."

"කවුද..."

ඒ ඇස් දෙසම මුතු බලා උන්නාය... දුවා ඇහැරී අඬන්නට වූයේ ඒත් සමගමය. ඔහු එහෙමම ඇඳෙන් බැස්සේය.

"මං බලන්නම්..."

මුතුට එහෙමම ඇහැරිණ. ඇය කළුවර කාමරය පුරා නෙත් ඇරියාය. නැත. ඔහු පෙනෙන්නට නැත... ඔහු ළඟට ආවේ හීනෙන්ද... මුතු දෙපා ඇඳෙන් පහළට දමා දිග සුසුමක් හෙළුවාය.

"මෝ..න..ව..ද ම..ට මේ පේ..න්..නේ දෙයියනේ..."

මුතු ඔහුගේ අත්ල තිබූ කම්මුලට සුරත තැබුවාය. පුදුමය. තාම ඒ කම්මුල උණුසුම්ය... ඇය නැගිට ගොස් බැල්කනියට පිවිසෙන දොර විවර කළාය. පුදුමය. මධුවන්තගේ දුව ඇහැරී හඬන හඬ නිහඬ රැය අතරින් ඇයට ඇසෙන්නට විය.

"ඇ..ත්..ත..ට..ම දුවා ඇහැරිලා... එ..ත..කො..ට..."

මුතු තොල් පට තද කර ගත්තේ හදවතට නැග ආ මොකක්දෝ හැඟීමකිනි.

"ඇ..යි පැටියෝ... පැටියට කුක්කු බඩගිනිද... ම්.. තාත්ති කුක්කු හදලා දෙ..න්..න..ම්... අඬන්නෙපා..."

මධුවන්තගේ නළු පහළින් ඇසෙද්දී මුතු දිග සුසුමක් හෙළුවාය. කෙල්ල තත්පරයක් දෙකක් තුළ නැලැවිණි. ඔහු පුදුම තාත්තා කෙනෙක්යැයි ඇයට සිතුණි.

මුතු බැල්කනියටම වී අසාගෙන උන්නාය. ඔහු කිරි හදන හඬ පවා ඇයට ඇසෙන්නට විය.

"අපි කුක්කු බීලා දොයියමු... ගොඩක් බඩගිනි ආවද... ම්... ඉතින් ඇහැරිලා කියන්නෙපැයි තාත්තිට... අඬන්නෝනයෑ... අපි හදලා දෙනවනේ මගෙ රත් කඳට..."





මොකක්දෝ හේතුවකට මුතුගේ දැස් තෙත් විය. ලොවටම රහසේ මෙන් ඇගේ දෙනෙතින් කඳුළක් ගලා ගියේය.

මොහොතකට කලින් දුටු සිහිනයේ රූප රාමු ඇගේ දෙනෙත් ඉදිරිපිට චිත්‍රපටයක රූප රාමු පෙළක් මෙන් මැවෙන්නට විය. "ඔයා ඇත්තටම එහෙම ආවා වගේ මට දැනුණේ..." ඇය සිතින් කීවාය.

ඉන් පසු සද්දයක් නැත්තේ කෙල්ල එහෙමම කිරි බී නිදාගත් නිසා විය යුතුය...

"ඔයත් ඇහැරිලා මාත් ඇහැරිලා... ඔයත් දුකින් මාත් දුකින්..."

මුතු කාමරයට පැමිණ ඇඳට බර වූයේ බරවූ හදිනි. ඇය යංතමට දෙනෙත් පියා ගත්තාය. ඒ සුරත මේ හිස පුරා දුවන සෙයක් ඇයට දැනෙයි.

"හීනෙන් එහෙම දේවල් ජේන්නේ ඇයි..."

මුතු තෙත දෙනෙත් කොට්ටයට තද කර ගනිමින් සිතුවාය... "මට ආදරේ කරන්නේ කවුද දැන්..." ඔහු හීනෙන් කියූ අයුරු මුතුට සිහිවෙයි...

"මේ ජීවිතේ සිද්ධ වෙච්ච හැම දෙයක්ම සිද්ධ නොවුණා නම්... සමහර විට මං ඔයාට..."

මුතු හිතෙන්නට ගිය දේ පවා ගිල ගත්තාය. තද කර ගත්තාය... ඔහු දුක් විඳින්නේ අමාරුවෙන් ජීවිතය හදා ගන්නටය... ඒ අසරණ උත්සාහය දවසක මල්ඵල දරණු ඇත...

"දවසක ඔයාල ඔක්කොටම වඩා මං දුක් විඳියි... එදාට ඔයත් මට පව් කියයි... සමහර විට එදාට ඔයා ජීවිතේ මේ තියන ඔක්කොම ප්‍රශ්න විසඳගෙන ඉඳී... ඔයා එහෙම කරනවා... මං දන්නවා..."

ඔහු වැනි කෙනෙකුට කොහොමටවත් වරදින්නට හේතුවක් නැත. ආත්ම අධිෂ්ඨානයෙන් ඉන්නා අයට දකිද්දී දෙවියන් පවා බිය වෙයි... ඔහු දරුවාද රැගෙන සිංගප්පූරුවේ සිට එන්නට ඇත්තේ එහෙම හිත තද කරගෙන විය යුතුය...

අද කාංචන සමඟ ගෙවුණු කටුක හවස් යාමය සිහි කරන්නට පවා මුතු අකමැතිය... ඒ ගමන ගොස් ඇය ආවේ එක දෙයක් සිතාගෙනය...

"මං උඹව බදින්නෑ..."

එහෙම සිතාගෙන ආවද මේ ජීවිතය මැද තමාට කරන්නට පුළුවන් දෙයක් නැතැයි ඇයට සිතෙයි.

"ජීවිතේ ගැන පුංචි හරි බලාපොරොත්තුවක් තිබ්බ නම් ඔක්කොම අත්අරින්න මට හිතෙයි... ඒත් ම..ට ක..වු..ද ඉ..න්..නේ..."

මුතු ඇඳෙන් බැස විත් ඇය නිතර පාවිච්චි කරන වේදනා නාශක පෙති දෙකක් බී යළි ඇඳට වැටුණේ හිස තද කරගෙනය. "ආයෙත් හිනෙන් වත් ඇවිත් මගේ ඔළුව ටිකක් අතගාන්න මධුවන්ත... චු..ට්..ට..ක්..." මුතු සිතින් කීවේ වැළපෙමිනි.

* * * * * * * * * * *

ලලිතා උදේට හදා තිබුණේ සුදු කැකුළු කිරිබත්ය. මුතු එද්දී අම්මාත් තාත්තාත් දෙන්නාම කෑම මේසයේ කමින් උන්නෝය. කිරිබත් පිඟාන දකිද්දී මුතුට සිහිවූයේ ඔහුවත් දුවත්ය.

"අම්මයි තාත්තයි කොහේ හරි යන්නද..."

"ම්... අද කොස්වත්ත ඉඩමේ සේල්ස් පටන් ගන්නවනේ... තාත්තා මටත් එන්න කිව්වා..."

දෙන්නාම යන එක හොඳය.

"කාංචන ඊයේ ආවද පොඩි දූ..."

"ඔ..ව් තා..ත්..තේ..."

"කොල්ලා දක්ෂයා... හවුසින් ප්‍රොජෙක්ට් එක තනියම කරන්නේ...





ගෙවල් ටික මල් වගේ... කවදහරි ප්‍රොපටි මාකට් එකම කොල්ලා අල්ලයි..."

ඒත් ඔහුට මේ හදවත ඇල්ලිය නොහැක. තාත්තා ඔහු ගැන කතා කරන්නේ පුදුමාකාර සතුටකිනි.

"කොහොමත් මේ අවුරුද්දේ මේ වැඩ ඉවර කරලා දාන්න ඕන..."

මුතු බිමට නෙත් බර කළාය. එහෙනම් ජීවිතය ගැන ඉක්මනින්ම තීරණයක්ද ගත යුතුය.

"ඒ වෙඩින් එක නම් හිල්ටන්වත් එකේම ගන්නෝන... කොහෙද එක්කෙනෙක් මඟුලක් කර ගත්තේ හිතුවක්කාරෙටනේ... හංගලා වගේනේ බන්දලා දෙන්න උනේ..."

තාත්තා ඔය තවමත් බණින්නේ අක්කාගේත් ප්‍රියමන්ත අයියාගේත් එක්වීමටය. මුතු අම්මාත් තාත්තාත් යන තුරුම කෑම කාමරයට වී උන්නාය.

"උදෙන්ම අක්කා කොහේ ගිහින්ද ලලිතා..."

"පාන්දරම ගියේ පොඩි බේබි... මට කියන්නත් කිව්වා... ඩොක්ටර් කෙනෙක් හම්බවෙන්නයි කිව්වා..."

අක්කාත් අයියාත් ඔය වෛද්‍යවරුන් පසුපස දුවන්නේ බබාලා ප්‍රමාද නිසාය. ඔවුන් දෙන්නාට එහෙම නොලැබීමක් තිබිය නොහැක.

"ල..ලිතා..."

"පොඩි බේ..බි..."

"එ..න්..නකෝ..."

මුතු පිඟානකට ලස්සනට කිරිබත් කැලි දෙකක් බෙදුවාය. ඊටත් පසු එයටම සීනි සම්බෝල ටිකකුත් මාළු ඇඹුල් තියල් කැලි දෙකකුත් බෙදුවාය.



Elegantta

"ම..ධු..ව..න්..ත ම..හත්තයට දෙන්න..."

මුතු එය දෙන්නට යද්දීම මධුවන්ත කෑම කාමරය අද්දරය... ඔහුව දැක මුතුගේ දෙනෙත් එහෙමම බිමට බර විය... මධුවන්තගේ හදවත ඇය ගැන උපන් ලෙන්ගතුකමකින් බර විය.

"මං නංගි ටිකක් බොරැල්ලට යන්න..."

"කාලා යන්නෙපැයි" නොකියවෙන්නේ ඇයිදැයි මුතුටම තේරෙන්නේ නැත.

"මහත්තයා කිරිබත් කෑල්ලක් කාලා යන්න..."

ලලිනා කීවේ ඇය වෙනුවෙනි.

"නමයට එතන ඉන්නම ඕන නංගී... අක්කා නැද්ද නංගී..."

"ඩො..ක්..ට..ර් කෙනෙක් හම්බ වෙන්න ගිහින්..."

"චූටි නැන්දිට ටටා කියන්න..."

මුතු දෙනෙත් එසවූයේ එවිටය. කෙල්ල අත් දෙකින්ම ටටා කීවාය. ඇගේ ළය වේදනාවෙන් බර විය.

"ද..වා කා..ල..ද..."

මුතු ඇසුවේ උගුරෙන් මෙනි.

"මං.. ය..ද්දී ක..ව..නවා මෝ..නවා හරි... යන්නම් නංගී..."

"ද..වා..ව තියෙලා ය..න්..න.. මං කිරිබත් ක..ව..න්..නම්..."

ඒ වචන ටික පවා ඇය පිට කළේ අමාරුවෙනි.

"ඒ..න්..න..."

ඔහු යමක් කියන්නටත් පෙර ඇය කෙල්ලට දෑත් දිගු කළාය.

"චූටි නැන්දි එක්ක එහෙනම් කුක්කු බයි කාලා ඉන්න... තාත්ති ඉක්මනට එන්නම්..."





ඔහු කෙල්ලව දුන්නේ ඇයව සිපගෙනය. කෙල්ල අත් දෙකම දිගු කර මුතු අතට පැන්නාය.

මධුවන්ත යන අයුරු මුතු බලා උන්නේ පපුව මිරිකී යද්දීය...

"පව්... එයා බඩගින්නේ යන්නේ..." ඇය සිතුවේ වේදනාවෙනි.

"ලොකු බේබි මධුවන්ත මහත්තයට කියලා මං හිතන්නේ පොඩි බේබි..."

"මෝ..නාද ලලිනා..."

"කෑම ගැන..."

ඔහු එහෙම කාගේවත් ඉඳුල් කෑ යුතු කෙනෙක් නොවේ...

"කුක්කු බයි වලට ආසද ම්..."

"නා..ත්..ති..යා කැ..ව්..වේ..."

"අ..නේ.. මගේ පැටියට තාත්ති කුක්කුබයි කැව්වද..."

ඔහු දුවාට කිරිබත් හදා දෙන්නට ඇත. කෙල්ලට මතක ඒකය. මුතු පිඟානකට කිරිබත් කෑලි තුන හතරක්ම බෙදාගෙන උඩට ගියේ ආශාවෙනි.

"චූටි නැන්දිට උම්මා ඕන..."

ඇය පඩිපෙළ නගිද්දී කීවාය. කෙල්ල ඇයව බදාගෙන දිගටම උම්මා දුන්නාය.

"මේ වගේ රත්තරන් පැටියෙකුයි අර වගේ හොඳ කොල්ලෙකුයි අර ගෑණිට මොකට එපා වුණාද දන්නෑ..." මුතු සිතුවාය.

මුතු පුංචි කිරිබත් කටක් කෙල්ලට කවා ඒ පුංචි මුහුණ දෙස බලාගෙනම උන්නාය. "එයාමයි... ඒ අහිංසක මූණමයි..."

"පව් ලලිනා බඩගින්නේ ඉදලා තියෙන්නේ... රහ කර කර කනවා..."

උඩට වතුර රැගෙන ආ ලලිනාට මුතු කීවාය.



Elegantlk.com

"මහත්තයා පව්... අම්මා කෙනෙක් නැතුව මේ දුවෙක්ව කොහොම හදන්නද..."

"ම්... කුක්කු බයි රහයිද පැටියෝ..."

"ර..සා..යි..."

කෙල්ල කියද්දී මුතුගේ පමණක් නොව ලලිතාගේද දැස් තෙත් විය.





**නිම්මි** එද්දී දහයාමාර පමණ විය. ඇය ආ හැටියේම ආවේ කුස්සියටය.

"හරි බඩගිනියි ලලිතා... මොනාද කන්න තියෙන්නේ..."

"කිරිබත් තියෙනවා ලොකු බේබි..."

"අනේ එහෙනම් කැලි දෙකක් දාලා ගේන්න ලලිතා... මං උඩට යනවා..."

නිම්මි උඩට ගියේ මුතුව සොයාගෙනය. කාමරයට යද්දීම දුටු දෙයින් ඇගේ පපුවම පිරී ගියේය. කෙල්ල නිදා උන්නේ මුතුගේ වත බදාගෙනය. ඒ පපුවට මුහුණම තියාගෙන ඇය මුතුද බදාගෙන මෙන් නිදාගෙන උන්නාය. මුතුව ඇයව බදාගෙන නෙත් පියාගෙන උන්නාය.



Elegantalks.com

මේ දකින දේ සදාකාලික වේ නම්... එහෙනම් ජීවිත තුනක් ගොඩය. සුරංගනා කතාවක් ඇත්ත ජීවිතයේ ලියවෙන්නේ කලාතුරකිනි.

"චූ..ටි..."

නිම්මි කතා කළේ රහසින් මෙනි. කෙල්ලගේ සැප නින්ද බිඳේයැයි ඇයටද බයය. මුතු දෑස් ඇරියේ යංතමටය.

"අ..ක්..කේ..."

දෙන්නාම බලා උන්නේ පපුව උඩ නිදා උන් දුව දෙසය.

"කිරිබත් කටවල් විස්සක් විතර කෑවා... කිරි තේ එකකුත් බිව්වා... මෙච්චර වෙනකල් මාත් එක්ක සෙල්ලම් කර කර ඉඳලා එයාම ඇවිත් ඔඩ උඩ නැගලා නිදා ග..ත්..තා..."

මුතු කීවේ ආදරබර හඬිණි. නිම්මි දුවාගේ පිට අතගෑවේ ආදරයෙනි.

"නි..දා..ගන්..නේ ඔහොම තමා... මල්ලිවත් බදාගෙන..."

"ඒක.. තමා..."

"කො..හො..ම..ද උඩට ආවේ චූටි..."

"මං.. මං එයාට කිරිබත් ටිකක් දෙන්න ගියේ... බෙද බෙද ඉන්නකොට දුවවත් වඩාගෙන ආවා... ගමනක් යන්න... මං කිව්වා දුවට තියලා යන්න කියලා..."

"ප..ච්..."

"එයා ගියේ බඩගින්නේ..."

"කමක් නෑ චූටි..."

"ම්..."

මුතුද දෙනෙත් පුංචි කර කීවාය.





"පව්... කට උල් කර කර කිරිබත් ටික කෑවා... මගේ පස්සෙමයි... මං පස්සේ ඇඟත් හේදුවා... මෝක් තේ..."

නිම්මි මුතු දෙස බලා සිනාසුණේ හද දැවී යද්දීය. "උඹ ඔය බලාගන්නේ උඹ ආදරේ කරපු කොල්ලගේ දුවවනේ..."

"අ..ක්..කේ..."

"චූටි..."

"අ..ද හිතට හරි නිවනයි..."

"මට පේනවා චූටි ඒක..."

ලලිතා උඩට ආවේ නිම්මිට කිරිබත් බෙදාගෙනය.

"පොඩි බේබි කිරි හොද්ද නම් හැදුවා... තව මොනාද හදන්නේ..."

නිම්මි නෙත් බිමට බර කරගෙන අසා උන්නාය.

"මාළු චුට්ටක් තම්බලා අරගෙන ලලිතා..."

"ම්..."

"බටර් චුට්ටක් දාලා මේවා කරලා ගමු..."

"හා..."

නිම්මිට පුදුමය... කෙල්ල මේවා කරන්නේ මුළු හදවතින්මය... ඇත්තටම මේ කෙල්ලගේ අම්මා මුතු නම්... එසේනම් මේ ලෝකයේ වාසනාවන්තම දරුවා ඇයය.

"ටිකක් දවල් වෙනකල් කෙල්ල නිදා ගනී... කිරිබත්නේ කෑවේ..."

"එයාට කැව්වට පස්සේ මට කැවුණෙත් නෑ..."

එහෙම හැඟීම් එන්නේ අම්මලාටය.

"ම්.. කටක් කාපන්..."

නිම්මි මුතුට කිරිබත් කටක් කැව්වාය.



Elegant talks.com

"කොහෙද මල්ලි හදිස්සියේ ගියේ..."

"ම..ට අහන්න පුළුවන්යැ..."

"කොල්ලා එක්ක කතා කරන්නෑ... දුවව පපුවේ තියාගෙන බලනවා..." නිම්මි සිතුවාය.

"ජීවිතේ මොකක් හරි පොටක් පාදගන්න පිස්සා වගේ එහෙට මෙහෙට දුවනවා ඇති..."

මුතු කිසිවක් කීවේ නැත.

"හොඳ කෙල්ලෙක් කොල්ලට උන්නනම් බන්දලා මං ආයෙත් සිංගප්පූරුම යවනවා... එහේ රස්සාවක් කොල්ලට තියෙනවනේ..."

නිම්මි කීවේ මුතු දෙස බලාගෙනමය. මුතු නෙත් බර කළාය.

"ඩොක්ටර්ව හම්බ උනාද අක්කේ..."

"ම්.. මේ පාර නම් හරියයි... ඩොක්ටර් පැයක් විතර වෙක් කරලා බෙහෙත් දුන්නා..."

"බබෙක්ට ආසයි නේද..."

"මේකිව දැක්කට පස්සේ ආසාව වැඩි වුණා..."

නිම්මි කීවේ දුව දෙස බලාය. "මටත් ආස හිතුණා මේකිට..." එසේ කියන්න මුතුටද සිතුණි. මුවින් නොකීවද ඇත්ත එය බව නිම්මිද දනී.

* * * * * * * * * * *

ඔහු ගෙදර ආ බව මුතු දනී. දැන් දුවව දෙන්නට ඇයට ලෝබය. කෙල්ල උන්නේ මුතුගේ ඔඩොක්කුවේ සැපට වාඩිවී කාටුන් බලමිනි.

නිම්මි මධුවන්තගේ කාමරයට ගියේ කීතාව කියන්නටය...





"දුවාට අද තාත්තාව මතකම නැති වෙලා... කෙල්ල එක්ක හරි සැපට හිටියා..."

මධුවන්ත සිනාසුණේ අහිංසක ලෙසිනි.

"උදේ මං එද්දී කෙල්ල කිරිබත් කවලා ඇඟ සෝදලා නිදිත් කරලා... නංගිගේ පපුව බදාගෙන නිදි එද්දී..."

මධුවන්තට පුදුමය.

"දුවාට පු..දුම ආදරෙයි... අද කිරි හොදි හදලා මාළු බැදලා එහෙම බත් කැව්වේ... දැන් අන්න ඔඩොක්කුවේ වාඩිවෙලා කාටුන් බලනවා..."

"නං..ගිට පින්... අක්කේ..."

"මං දුවව ගෙනත් දෙන්නද..."

"කමක් නෑ අක්කේ..."

"ඔහොම ටිකක් හිටපුවාවේ... ම්.. කෙල්ලත් ආසාවෙන්නේ බලන්නේ... කොහෙද අද දිව්වේ..."

"ම..ගේ එහේ බෑන්ක් එකක තියෙන සල්ලි ටික මෙහෙට මාරු කරගන්න අක්කේ... වැඩේට ටිකක් වෙලා ගියා..."

"හදිස්සියේ මොනවත් හිතන්න යන්නෙපා... හිමිහිට ඉඳලා තීරණයක් අරන් දෙයක් කරන්න..."

"ඔව් අක්කේ..."

"මල්ලි කාලද..."

"කෑ..වා..."

එහෙම කීවද ඔහු කන්නට නැත.

"මං කෑම ටිකක් ගේන්නද..."



Elegantalks.com

"මං කෑවා අක්කේ..."

"එහෙනම් වොෂ් එකක් දාගන්න... මං දුවාව ගේන්න කියන්නම්..."

නිම්මි ගියේ එසේ කියාය. ඇය උඩට ගියේ මොනවාදෝ සිතමිනි...

"දු..වා..ව ඉල්ලනවද..."

මුතු ඇසුවේ නරමක දුකිනි.

"නෑ.. චූටි.. උඹට පින් දුන්නා..."

ඇය ඇස් බිමට බර කර ගත්තාය. මුතු කෙල්ලගේ හිසට දෙතොල් තබා සිපගෙන උන්නේ කල්පනා බරවය...

ටික වේලාවකට පසු මුතු පහළට ආවේ දුවාව දෙන්නට කියා නිම්මිට ඇයව දෙන්නටය. එහෙත් නිම්මි හිතාමතාම නාන්නට නාන කාමරයට ගියාය.

"නා..ත්..ත බල..න් ඇති... අපි ය..න්..."

ඇය මධුවන්තගේ කාමරය දෙසට යන්නට පා එසෙව්වේ තරමක් වකිතයෙනි.

කොහොමත් ඊයේ අර හීනය දුටු පසු යළින් නිතර නිතර ඔහුගේ රුව හද පුරා ඇදෙයි. උදේ ඔහුව දකිද්දීත් පපුවට මොනාද වූවාක් වැනිය.

මුතු දුවව්ද වඩාගෙන යද්දී මධුවන්ත උන්නේ පුංචි කාමර කැල්ලේ වාඩි වී තේකක් බොමිනි. "මේ ගිනි දවල් තේ බොන්නේ කාල නොමේද ආවේ..." මුතුට එසේ අසන්නට සිතෙනා තරම්ය.

මුතු දොරකඩින් එබෙද්දී මධුවන්තට එහෙමම නැගිට්ටවිණි. "සුරාගනාවියක් දුවව අරන් ගිහින් ආයෙත් ගෙනත් දෙනවා වගේ..." ඔහුට සිතුණේ එහෙමය. ඇත්තටම එහෙමය.

"බ..ත් ක..ව..ලා කි..යෙ..න්..නේ..."





මුතු කීවේ බිම බලාගෙනය. තාමත් ඔහු දෙස බැලිය නොහැක. සමහරු දකිද්දී ඇස් හංගෙන්නේ හදවතින් ඒ කෙනා දෙස බැලෙන නිසාය.

"නංගිට වද දුන්නද..."

"න්..නෑ..."

"චූටි නැන්දිට උම්මා දෙන්නෑ..."

කෙල්ල මධුවන්ත අතට පැන්නේ ඇයව බදාගෙන සිපගත් පසුය. මුතු බිම බලාගෙනම යළි ආවේ පාළුවෙනි...

කෙල්ල එනතුරු නිම්මි බලා උන්නාය. ඒ බිමට බර වූ ඇස් දෙස නිම්මි හිමිහිට බලා උන්නාය. "උඹ මධුවන්ත ගැන තාම හිතනවා..." නිම්මි කීවේ සිතෙනි.

"දු..න්..න..ද..."

"ම්.. යද්දි තේ බොනවා..."

"කාල එන්නැතුව ඇති..."

"ම..ට..ත් හිතුණා..."

නිම්මි සැටියට බර වූයේ මුතු දෙස බලාගෙනමය. ඇයද ඒ ළඟින්ම වාඩි වූවාය.

"අ..ක්කේ..."

"ම්..."

"තාත්තා හදන්නේ මේ අවුරුද්දේම කාංචනගෙයි මගෙයි වෙඩින් එක ගන්න..."

"කිව්වද..."

"ඔව්... උදේ කිව්වා... හිල්ටන් එකේම ගන්නෝන කිව්වේ..."

නිම්මි දෑස් බර කළාය. තාත්තා නමාගේත් ප්‍රියමන්තගේත් මඟුල



Elegantlk.com

ඒ තරම් ජයට ගත්තේ නැත. ඒ ගැන අහිතක්ද නිම්මිට නැත.

"ඉසින් ඛුටි..."

"කාංචනව මැරි කරන්න කොහොමටත් හිත හදාගන්න අමාරුයි... ඒත් මං තාත්තටයි අම්මටයි කියන්න යන්නෑ..."

"එතකොට ඛුටි..."

"මං මොකක් හරි හිතනවා... හිතල තීරණයක් ගන්නවා..."

"හිතන දෙයක් කියපන් ඛුටි..."

"තාම මොනවත් හිතන්නෑ... ඒත් දැන් බලන් උන්නා ඇති..."

"කාංචනව බඳින්න බෑ කියලා කිව්වොත්..."

"වැඩක් නෑ... තාත්තා එයාට මත් වෙලා වගේ ඉන්නේ... පුදුම දෙය කොල්ලෙක්කු..."

"ඒකත් එහෙමද..."

"අඩුරුදු විසි දෙකෙන් ජීවිතේ ඉවර කරගන්න මට ඕනේ නෑ... ජීවිතේ ලස්සනට පටන් ගන්නයි මට ඕන..."

කෙල්ල උන්නේ මේ කසාදයට අකමැත්තෙන් හෝ කැමති වීය. ඒ තීරණය වෙනස් වූයේ මධුවන්ත ලංකාවට ආ පසුද... නිම්මිට සිතා ගන්නට නොහැක.

* * * * * * * * * * *

උක්කටනය නාද වූයේ මුතු පහළට එද්දීමය. ඇය ගොස් එය ගත්තාය.

"හෙලෝ..."





"මට මධුවන්තට කතා කරන්න පුළුවන්ද..."

මුතුගේ පපුව ගැස්සිණ. මේ කතා කරන්නේ ඔහුගේ බිරිඳ බව ඇය දනී. "ආයේ එයා ගත්තොත් මං මෙහේ නෑ කියන්න නංගී..." එදා ඔහු කියූ අයුරු මුතුට සිහිවිය.

"මධුවන්ත දැන් මෙහේ නෑ..."

මුතු පපුව තද කරගෙන කීවාය.

"මධුවන්ත ඔහේ ඉන්නේ... කරුණාකරලා එයාට දෙන්න..."

"මධුවන්ත නෑ කිව්වනේ... නැත්නම් කාට දෙන්නද..."

හදිස්සියේ එන තරහට කුමක්දැයි මුතුටම තේරෙන්නේ නැත.

"හදිස්සියකට කතා කරන්නේ... මං එයාගේ වයිෆ් කතා කරන්නේ..."

මුතු සිතින් සිනාසුණාය. "වයිෆ්ලු... දරුවයි මිනිහවයි තනි කරලා ආලා වල් කමේ ගිහින් දැන් වයිෆ්ලු..."

"මධුවන්ත නෑ..."

"ම..ට නිම්මිට දෙන්න කරුණාකරලා..."

හාෂිණී කීවාය.

"අක්කා නෑ..."

එහෙම කියද්දීම මේ කතා කරන්නේ මුතු බව හාෂිණී තේරුම් ගත්තාය.

"ක..වුද මේ මුතුද කතා කරන්නේ..."

"මං කවුද කියලා වැඩක් නැනේ නේද... මධුවන්ත නෑ... එයාව ඉල්ලලා මෙහෙට ගන්නත් එපා..."

"ඇයි බොරු කියන්නේ මධුවන්ත ඔහේ නමා ඉන්නේ..."



Elegantt

"ඔ..ව් මධුවන්ත මෙහේ තමා ඉන්නේ.. කාටවත් කතා කරන්න එයා කැමති නෑ... ෆෝන් කෝල්ස් ආවම දෙන්නෙපා කියලා කියන්නේ..."

"මං එයාගේ වයිෆ්.. භාෂිණී..."

භාෂිණී තරමක් තදින් කීවාය.

"එයාගෙන් ආවොත් කොහොමත් දෙන්නෙපා කියලා කියන්නේ..."

මුතු කීවේ තොල් පට තද කරගෙනය. "ඔයා බැඳලා තියෙන්නේ පුදුම ගෑණියෙක්ව..." ඇය සිතින් මධුවන්තට කීවාය.

"ඒකත් එහෙමද..."

"ඔ..ව් ආයෙත් මෙහෙට ගන්නත් එපා..."

"හරි බලමු..."

"මොනා බලන්නද... දරුවවයි මිනිහවයි දාලා ගියා නම් ඒ විදිහට ඉන්න... අපිට වද නොදී..."

"ඔයාට මොකක්ද තියෙන කැක්කුම මධුවන්ත ගැන..."

"කැක්කුමක් නෙමේ... එයා ගැන දුකයි... තමුසේ වගේ වල් ගෑණියෙක්ට අහුවෙච්ච එක ගැන... වටින කොල්ලෙක්ව..."

එසේ කියා තව වචනයක් වත් ඇය කියන්නට පෙර මුතු දුරකථනය තැබුවාය. ඉන් පසු ඇය භාෂිණීට කතා කරන්නට බැරි ලෙස රිසීවරය පසෙකින් තැබුවේ වෙව්ලන අතිනි.

ඇයට එහෙම කතා කළේ ඇයි... පුදුමය. ඒ තරම්ම කේන්තියක් ඇය ගැන දැනෙන්නේ ඇයි... ජීවිතයේ ආදරය කළ එකම වස්තුව ඇය හිමි කරගෙන ඒ ජීවිතයම නාස්ති කළ නිසාද...

මුතුගේ හිස කරකැවෙන්නට විය... ඇය නිවසින් පිටත





කොරිඩෝවේ වූ පුටුවට බර වූයේ නළලත මිරිකමිනි. "ඔයාට මොකක්ද තියෙන කැක්කුම මධුවන්ත ගැන..." ඇය එහෙම අසද්දී පපුවට ආ ආවේගය මුතුට මතකය.

කෙල්ල එකවර හුස්ම අල්ලා කෑ ගැසුවේ මුතු කෝරිඩෝවේ ඉදිද්දීය. මුතුව උඩ ගොස් බිම වැටිණි. ඇය එහෙමම ඒ පැත්තට දිව්වාය. කෙල්ල තාමත් ඉන්නේ හුස්ම අල්ලාගෙනය.

"පුතු... පුතු... චූටි පුතු... හරි අම්මා හරි... හරි අම්මා..."

ඔහු දුවව වඩාගෙන කෑ ගසමින් උන්නේය. ඒ සිදුවීම දැක මුතුගේ දෑස් තෙත් විය. ඇය එහෙමම දුවගෙන ගියාය.

"දිගටම හුස්ම අල්ල..න..වනේ..."

මුතු කලබලයෙන් කීවාය.

"හරි පුතු... හරි අම්මා... හරි..."

කෙල්ල එකවර ඇඬුවේ මුතුව දැකය... එය පුදුම ඇඬිල්ලකි.

"හරි පැටියෝ... හරි.. කාක්කා කන්නෑනේ අම්මියෝ... හරි මේ චූටි නැන්දිත් ඇවිත්..."

කෙල්ල හුස්ම අල්ලන්නට ඇත්තේ මොනාට හෝ බය විය.

"ම..ට දෙ..න්..න..."

මුතු දෝත පෑවාය. ඔහු කෙල්ලව ඇයට දැන්නේ අසරණවය.

"හරි මැණික... හරි.. දැන් හරි..."

කෙල්ලට ඇඬුම් ආවේ ඇය අතට ගිය පසුය... මධුවන්ත ඇය දෙස බැලුවේ හති අරිමිනි.

"මෙතන හිටියේ... එකපාර කාක්කෙක් ආවා ළඟටම... අතේ තිබ්බ බිස්කට් එක ගන්න... ඒකට බයවෙලා නංගී..."

ඔහු අසරණව කියාගෙන ගියේය. ඒ මුහුණ පුරා දාඩියය. මුතුගේද තවමත් පපුව ගැහෙයි.

*  *  *  *  *  *  *  *  *  *

නිමේ හවස ආවේ කෙල්ලට දවල් ගත් ගවුම් පොඩි දෙක රැගෙනය. ඇඳුම් ගනිද්දී ඇයට කෙල්ලවද සිහි විය.

නිමේ යද්දී මධුවන්ත කෙල්ලවද වඩාගෙන පුංචි කුස්සි කෑල්ලේ මොනවද හදයි. ඇයට ආවේ අමුතුම සුවඳකි. පුංචි ලිප ඔහු ගෙනෙන්නට ඇත්තේ සිංගප්පූරුවෙන් විය යුතුය.

"අනේ... මොනාද මේ තාත්තයි දුවයි හදන්නේ..."

නිමේ කෙල්ල අතට ගනිමින් ඇසුවාය.

"දුවට පොඩි ෆ්‍රයිඩ් රයිස් එකක් හැදුවා අක්කේ... එයා ඒකට ආසයි... මං එහෙදින් හදලා දෙනවා..."

ඔහු පුදුම තාත්තා කෙනෙකි. මෙහෙම තාත්තලා ලබන්නට දරුවන් පින් කළ යුතුය.

"මේ මොනාද මල්ලී..."

"මේ අක්කේ විකන් කැට කියලා ජාතියක්... ඒක දැම්මාම ෆ්‍රයිඩ් රයිස් එක විකත් රහයි..."

"ම.. හරි සුවඳයි තමා... බබී ආසද බයි වලට ම.."

"අ..පි කෑ..වේ..."

"ම.. නාත්ති ඇරියට් කැව්වනේ නේද... මං බිත්තරේකුත් තම්බලා එවන්නම් මල්ලී... නිකම්ම බත් විතරක් මදි..."

මධුවන්ත සිනාසුණේ අභිංසක ලෙසිනි.

"මං මේ දුවට ගවුම් දෙකක් ගත්තා... මේ නැන්දි හෝයි සූට් ගත්තා බබීට..."

"නැන්දිට උම්මා දෙන්න පැටියෝ..."





කෙල්ල ඇයව සිප ගත්තාය.

"නංගිට හතරක් දෙනවා බදාගෙන..."

මධුවන්ත සිනාසී කීවේය.

"අද කෙල්ල හුස්ම ඇල්ලුවවු නේද..."

"ඒකනේ අක්කේ... හරියට බයවුණා... නොද වෙලාවට නංගි දුවගෙන ආවා... නංගිව දැකලා හුස්ම ආවේ..."

"කෙල්ලව හුරුයි..."

"අක්කේ..."

"ම්..."

"නංගි හ..රි දුකක් හිතේ හිර කරගෙන නේද ඉන්නේ..."

"ඒ දුක පටන් ගන්නේ ඔයාගෙන්..." නිමේට එසේ කියන්නට සිතුණි.

"එයත් මොකක් හරි තීරණයක් ගනී මල්ලී..."

"එයා ගැන බලන්න අක්කේ..."

"මං ඔය දෙන්නා ගැනම බලනවා මල්ලී..."

නිමේ දිග සුසුමක් හෙලා කිවාය.

"අද දවල් භාෂිණි කතා කරලා මල්ලී..."

"මෙහෙට..."

මධුවන්ත ඇසුවේ කේන්තියෙනි.

"ම.. නංගි අරන් නියෙන්නේ..."

"මං එදා එයාට කිව්වා මට කරදර කරන්නෙපා කියලා... කරපු පව් වලින් බේරෙන්න නිකං නියෙන හෝන් එක ඔබනවා..."



Elegant talks.com

"ම.. නංගි මුලින් ඔයා නෑ කියලා..."

"මං එදා නංගිට එහෙම කියන්නයි කිව්වා අක්කේ..."

"ඒක තමා... ඒත් ඒ ගෑණි පැටලි පැටලිම ඇවිත්... පස්සේ වුවිත් බැණලා..."

"නංගිට මං ගැ..න..ත් තරහ ඇති..."

"එ..හෙම නෑ මල්ලී..."

"ඒකි බණින්න ඇත්තේ වෙන තරහකට..." නිම්මි සිතින් කීවාය.

"මං වෙලාවක අරන් කියන්නම් එයාට... ඒත් කතා කරන්නවත් ආස නෑ අක්කේ..."

"කතා කරන්න ඕන නෑ... නිකං හිත අවුල් කරගන්නේ මොකටද..."

"ම..."

"මල්ලී..."

"අක්කේ..."

"එයා ආයෙත් ආවොත්... ආයෙත් එකතු වෙනවද..."

"එ..හෙම හිතක් නෑ අක්කේ... ඒ..ත් දුව ගැන දුකයි..."

"ම..."

ජීවිතය පුදුමාකාරය. දෛවය කොයි අතට පෙරළේදැයි දන්නේ දෛවියන්ම පමණි.







ලංකාවට පැමිණ අදට මාසයකි. මධුවන්ත දොරකඩ ළඟ පුටුවට බරවී සිතුවේය. සඳ එළිය යංතමට අඹ ගසට වැටී තිබුණි. ඒ පැත්තේ සිට එන සුළඟ නිසා තරමක සීතලක් දැනෙයි.

මේ මාසයට ජීවිතයේ අමුතු වෙනසක් වූයේ නැත. ජීවිතයට ටික ටික හුරු වන බව ඇත්තය. එහෙත් සිතූ තරම් සහනයක් පසුවට දැනුණේ නැත.

ජීවිතය ගලා යන්නේ මෙහෙමම නම්... ජීවිතයේ කිසිදු දෙයක් නොවන බව මධුවන්ත දනී. කොහොමත් උපන් බිමට අමුතුවෙන් පුරුදු වන්නට දෙයක් නැත. පුරුදු විය යුත්තේ මේ ජීවිතයටය.

මධුවන්ත දහ අතේ සිතුවේය. ඔහු පසුගිය දිනවල නොසිතුවා නොවේ. හැම රාත්‍රියකම ඔහු ඇඳට බර වන්නේ රෑ දොළහත් පසු වූ



Pleasant talks.com

පසුය. එහෙත් තවමත් ජීවිතය තිබූ තැනමය.

"රස්සාවක් කරගන්න විදිහක් ඇත්තෙම නෑ... අනේ තියෙන සල්ලි ටික මෙහෙම වියදම් කරන්නත් බෑ..."

මධුවන්ත දහ අතේ සිතුවේය. තමා ගත්තේ වැරදි තීරණයක්දැයි ඔහු බියෙන් සිතුවේය. ඒත් හාමි එක්ක එහෙම ජීවත් වෙලා ඇති තේරුම මොකක්ද... කොහොමත් ඇයත් මේ තීරණය ගන්නට තමාව පල්ලු කළ බව මධුවන්ත දනී.

"ඔයා නිසා ජීවිතේ හිර වුණා කියලා හිතන්න මට බෑ පැටියෝ..."

මධුවන්ත නිදා ඉන්නා දුව දෙස බලා සිතුවේය. මේ තරම් දෙයක් වූ පසුත් ජීවත් වන්නට හිත හදා ගත්තේ ඇය නිසාය. එහෙම කෙල්ල දැන් බාධකයක් විය යුතු නැත.

කොහොමත් දැන් මේ ජීවිතයේ දුකත් කරදරත් සියල්ල තමාගේය. එයට ලේසියෙන් මුහුණ දෙන්නට බැරි බව ඇත්තය. එහෙත් මේවා අනුන්ගේ නොවේ.

"කාගෝ එකේ මෙහේ බ්‍රාන්ච් එකේ රස්සාව ගන්න පුළුවන්... ඒත් කොහොමද යන්නේ..."

රස්සාවක් කරනවා නම් උදේ හතට වත් ගෙදරින් යා යුතුය. එද්දීත් හත අට වෙයි. එවිට කෙල්ලව බලා ගන්නේ කෙසේද... ඒ තරම් වේලාවක් කෙල්ලව තනි කර තබන්නටද මධුවන්තගේ හිතක් නැත.

"අම්මත් නැති කෙල්ල මංවත් එයා ළඟ ඉන්නෝන..."

ඔහු සිතුවේ එහෙමය. එහෙත් ජීවිතය මේ කරදර මැද්දේම පටන් ගත යුතුය.

"තව මාස කීයක් මෙහෙම ඉන්නද..."

තව ලොකු කාලයක් මේ ගෙදර ඉන්නට බැරි බව මධුවන්ත දනී.





කොහොමටත් හැකි ඉක්මනින් ඉන්නට තැනකුත් ජීවත් වන්නට මාර්ගයකුත් සොයා ගත යුතුය.

* * * * * * * * * * * *

හාමිණී උන්නේ ඇතුලාන්තෙන් පිච්චෙමිනි. ඇයට ඒ ගින්දර මෙතුවක් කල් දැනුණේ නැත. එහෙත් මධුවන්ත දුවවද රැගෙන සිංගප්පූරුවෙන් ගිය දා සිට ඇයට මොකක්දෝ බරක් දැනෙයි. කලින් සිනාගෙන උන්නේ ඔහු මේ ජීවිතයෙන් සදහටම වෙන්ව ගිය පසු කිරිල්ලියකගේ වැනි සැහැල්ලුවක් දැනේ යැයි කියාය. එහෙත් එවැනි අති සුන්දර සැහැල්ලුවක් නම් දැනුණේම නැත.

ඔහු සිංගප්පූරුවේ සිටිද්දී ජීවිතය වටා තිබූ යම් දෙයක් දැන් නැති බවක් හාමිණීට දැනෙයි. ඒ සමගම මහා පටක් කර ගත්තාක් වැනි කාලකන්නි දුකක් කළකිරීමක් ඇයට දැනෙයි.

සිංගප්පූරුවේ ගත කරන විසිතුරු මන්මත් ජීවිතයෙන් එක තත්පරයක් ඇයට ගැළවෙන්නට බැරි බව ඇත්තය. එහෙත් ඒ ජීවිතය අතර මැද දැනෙන සතුටක් නම් නැත.

ඔහු සිංගප්පූරුවේ ඉදිද්දී දැනුනේ නැති හැඟීමක් දැන් දැනෙන්නේ කොහොමදැයි හාමිණීටම තේරෙන්නේ නැත.

ඔහු එදා වෙන්ව යන දවසේ එයාර් පෝට් එකේ සිට කතා කළ අයුරු හාමිණීට සිහිවෙයි. ඒ මොහොතේ පවා ඔහු සිතුවේ සියල්ල අමතක කර දමා එකතු වන්නට විය යුතුය. එහෙත් ජීවිතය ඉල්ලා සිටියේ සදාකාලික නිදහසකි. දුවත් මධුවන්තත් පියාපත් වලට තබා බැන්ද ගල් ගෙඩි දෙකක් සේ එදා ඇයට දැනුණි.

නිවාඩුවක් ගෙන ලංකාවට ගොස් ඔහුවත් දුවවත් බලා එන්නට සිතෙනා තරමය. එහෙත් දැන් මධුවන්ත ඉන්නේ කේන්තියෙන් බව ඇය දනී.

ඔහු බාරගත් ජීවිතය ලේසි නැත. පහසු නැත. ඒ ජීවිතයේ බරම



Elegantalks.com

ඔනුව කේන්ති ගස්සවන්නට ඇත. එදා මධුවන්තට කතා කළ මොහොතේ කතා කළේ මුතු බව හාෂිණි දනී. ඇය අර තරම් කේන්තියෙන් තමාට කතා කළේ ඔවුන් සියල්ලන්ම ඔහුට ආදරය කරන නිසා විය යුතුය. "ඒකිගේ කට වැඩියි කොහොමත්..." හාෂිණි සිතුවාය.

හාෂිණි එදා රෑ එයාපෝට් එකෙන් පිටතට ආවේ රවීව සොයමිනි. හාෂිණි කළ රැකියාවේ හැටියට ඇයට නිතර නිතර ගුවන් තොටුපළට පැමිණෙන්නට සිදු විය. ඇගේ ජීවිතය මෙවන් කුණු වළක් වූයේද මේ රෑ ජීවිතය නිසාය.

දිගටම කරද්දී නරකම පුරුද්දක් වුව ජීවිතයට සාමාන්‍ය දෙයක් වේ. හාෂිණිට වූයේ එයය.

රවී උන්නේය. හාෂිණිව දැක රවී සිනාසී ළඟට ආවේය.

"අද ෆ්ලයිට් එක ඩිලේ හාෂි..."

"ඒක තමා... පැය දෙකක් වත් ඉන්න වෙයි ඔයාට..."

දෙදෙනාම එයාර් පෝට් එකේ ඇවිදිමින් කතා කළෝය.

"ම..ධූ කතා කළාද රවී..."

"ම්.. කතා කළා..."

"ෆෝන් එකක් අරගෙනද..."

"න..වම නෑ හාෂි..."

"ඇයි බොරු කියන්නේ..."

රවී සිනාසුණේ දුකෙනි.

"නම්බරයක් තියෙනවනම් දෙනවා හාෂි..."

"මට මධුවන්තට කතා කරන්නෝන..."

"වැඩක් නෑ නේද... ඌට හිත හදාගෙන ඉන්න දුන්න නම් ලොකු පිනක් නේද..."





හාෂිණි බිම බලාගත්තාය.

"කොල්ලා තනියම ප්‍රශ්න පත්තරේකටම උත්තර හොයන්නෝන... ඒක ලේසි නෑ හාෂි... ඇත්තටම ලේසි නෑ... ඌට වෙච්ච දේ හතුරෙකුටවත් වෙන්නෙපා කියලා මං හිතන්නේ..."

හාෂිණිට කතා කළ නොහැක.

"හාෂි..."

"ම්..."

"අ..ද රෑ තීරණයක් ගන්න... මං කොල්ලවයි දුවවයි හෙට හවස වෙද්දී මෙතන තියන්නම්..."

රවී කීවේය. හාෂිණි කතා කළේ නැත. ඇයට කතා කරන්නටද බැරි බව රවී දනී.

"තීරණ ගන්න බැරිනම් මිනිස්සුන්ගේ පපුව පාරන්නෙපා හාෂි... මං මේ ඔයාට බණිනවා නෙමේ... යාළුවගේ පැත්ත අරන් කතා කරනවත් නෙමේ... ඔය දෙන්නටම මං ආදරෙයි... ඒක වෙනම දෙයක්... ඒත් ඒ ජීවිතේ සෑහෙන්න තුවාල වෙලා... සෑහෙන්න... සීරියස්ලි ඩැමේජ්ඩ්..."

රවී කීවේ ඇත්තටම දුකෙනි.

"ඌට ගොඩ එන්න ලේසි නෑ... එක අතකට දරුවා අල්ලගෙන අනිත් අතින් මහගිරි දඹේ යන්න වෙලා තියෙන්නේ... ඌ යයි..."

"මධුවන්තට සිංගප්පූරුවෙම ඉන්න තිබ්බනේ..."

"තිබ්බා ඇස් නැත්නම්... කන් නැත්නම්... ඌ මෙච්චර කල් හරි හිටයෙ හාෂි ඌ අහිංසක පිරිමියෙක් නිසා... ඌට ඉන්නම බැරි තරම් දුක හිතුණා... දරුවවත් අරන් ඌ ගියා..."

හාෂිණි බිම බලාගෙන දිග සුසුමක් හෙළුවාය.



Elegantalks.com

"ඔයාට ජීවිතේ ලොකු වැරදීමක් උනා භාෂි... ලොකු වැරදීමක් උනා... පුළුවන් නම් ඒක හදාගන්න..."

භාෂි නෙත් එසෙව්වාය. රවී ඇය දෙසම බලා උන්නේය.

"ඔයා භාෂි ඊයේ දැක්කට වඩා අද ලස්සනයි..."

භාෂිණී සිනාසුණාය.

"ඒත් ඔයාගේ ජීවිතය ටික ටික කැත වේගෙන යනවා... ඔයාට ඒක දැනෙන්නෑ... මං තාමත් මේ ආදරෙන් කියන්නේ... සිහිය එන්නේ නැත්නම් ඔළුවට දහ පාරක් ගහගෙන හරි සිහිය ගන්න... එදාට ඔයාට තේරෙයි නැතිවුණේ මිනිහෙක් නෙමේ දෙවියෙක් කියලා... යන්නම් භාෂි..."

රවී ගියේ භාෂිගේ උරතලයටද තට්ටු කරය. භාෂිණී එහෙමම හිරිවැටී ගියාක් මෙන් එතනම හිටගෙන උන්නාය.

Elegantta





# 24

**මුතු** වාහනයට ගොඩ වූයේ ඇගේ මිතුරියකගේ නිවසට යන්නටය. කාලාන්තරයකට පසු ඇය නිල් පැහැගත් ජීන්ස් කලිසමට තද මෙරූන් පැහැ ගත් කමිසය ඇන්දාය... සුදු පැහැ ගත් කුඩා හෑන්ඩ් බෑගයද දමාගත් ඇය වාහනයට ගොඩ වූයේ මධුවන්ත ඉන්නා පැත්තද බලමිනි.

"හවස ඉඳලා පේන්න නෑ..."

මුතු සිතුවාය.

"කොහෙටද පොඩි බේබි..."

රියදුරු ප්‍රේමසිරි ඇසුවේය.

"මාලබේට ප්‍රේමසිරි..."

"අනුෂ්ක මිස්ලගේ ගෙදර නේද..."

"ඔ..ව්..."

යංතමට වැටෙමින් තිබූ පොදය මහ වැස්සක් වූයේ වාහනය ගේට්ටුවෙන් පිටතට ගනිද්දීමය.

"පුදුම වැස්සක්නේ එකපාර කඩා වැටුණේ..."

ඒත් ගමනක් යද්දී මෙහෙම වැසි වැටෙනවාට මුතු ආසය. ඒ වෙලාවට හිතට වෙනස්ම සතුටක් රසබර පාළුවක් දැනෙයි.

මල්වත්ත පාර අවසාන වන්නේ ප්‍රධාන පාරෙනි... ප්‍රේමසිරි මල්වත්ත පාර නිමවන තැන කුඩා හන්දියේ මොහොතක් වාහනය නතර කළේ ප්‍රධාන පාරෙන් වාහන එක දිගට එන නිසාය.

මහ වැස්සේම දුවාවද තුරුළටම කරගෙන කඩ අගුවේ උන් මධුවන්තව ඇය දැක්කේ එවිටය. ඔහු කොහේ හෝ යන්නට එන්නට ඇත. එහෙත් මහ වැස්ස නිසා කෙල්ලවද තුරුල් කරගෙන වැස්ස පායන තුරු ඉඳියි. ඒ දර්ශනය මුතුට බලා ඉන්නට බැරි තරම්ය.

ඔහු කෙල්ලව තුරුල් කරගෙන වැස්ස දෙස බලා උන්නේ කල්පනාබරවය. කෙල්ලද ඔහුව වැළඳගෙන වැස්ස දෙස බලා හිඳියි.

"ප්‍රේමසිරි..."

"පොඩි බේබි..."

"ඔහොම ටිකක් නවත්තන්න..."

ප්‍රේමසිරි වාහනය නතර කළේය. මුතු වාහනයේ වීදුරුව පහත් කළාය. භයියෙන් වැටෙන වැස්ස එහෙමම ඇතුළට කඩාගෙන එයි.

"වූ..ට් ද..."

මුතු කෑ ගැසුවාය. ඒ කටහඬට බැලුවේ මධුවන්තය. වාහනයේ හිඳ කතා කරන්නේ මුතු බව මධුවන්ත වැස්සේම දැක්කේය.





"ප්‍රේමසිරි..."

"පොඩි බේබි..."

"ආ මේ කුඩේ අරන් ගිහින් මධුවන්ත මහත්තයවයි බබාවයි වාහනේට එක්කං එන්න..."

ප්‍රේමසිරි කුඩය අරගෙන එද්දී මධුවන්ත දුක්බරව බැලුවේ මුතු දෙසය.

"යං මහත්තයා..."

"බේබි කොහේ යන ගමන්ද දන්නෑනේ ප්‍රේමසිරි..."

"යාළුවෙක්ගේ ගෙදර යනවා..."

මධුවන්ත කුඩ හෙවණ යටින් වාහනයට ආවේ කෙල්ලව පපුවේ ගහගෙන මෙනි. ඔහු තෙමී කෙල්ලව නොතෙමූ අයුරු පුදුමය. මධුවන්ත ඉදිරිපස අසුනට බරවී පිටුපස උන් මුතු දෙස බැලුවේ සුහද ලෙසිනි.

"දුවාගේ බඩු වගයක් ගන්න යන්න එළියට බැස්සේ නංගී... මේ ටික ඇවිදගෙන එද්දී එකපාරට වැස්සා..."

මුතුට ඒ ඇස් දෙස බැලිය නොහැක.

"ප්‍රේමසිරි මාව ෆ්‍රුඩ්සිටි එකක් ළඟ දාන්න..."

"හොඳයි මහත්තයා..."

ඔහු මේ වැස්සේ දුවවත් වඩාගෙන කොහොම බඩු රැගෙන එන්නද... මුතුට තේරෙන්නේ නැත. කෙල්ල සීට් එක උඩින් මුතු දෙස බැලුවේ සිනාසෙමිනි.

"එ..න්..න..."

මුතු දැනම දිගු කළාය. කෙල්ල ඇගේ ළඟට ආවේ උඩ දාගෙනය.

"කො..හෙද න..න්නේ... මි.. ජෝ වැස්සනේ... නන්න බෑ..."

මුතු කෙල්ලව තුරුල් කරගෙන කීවාය.

"බෑම් ගියා..."

"ඔව් පැටියෝ... බෑම් එකේ යං.. ම්..."

ඇයට දුව පුරුදු එක පුදුමය. පුදුම ලෙස පුරුදුය. කාමරයේ සිටිද්දී කෙල්ල උඩ පෙන්වමින් කියන්නේ ඇය ළඟට යන්නට ඕනා බවය.

"එයාට ඔයා වගේ හොඳ අම්මා කෙනෙක් ඉන්න තිබ්බා..." මධුවන්ත සිතුවේය. ඊටත් පසු ඔහු තමාට සිතෙන දේටම සිනාසුණේය.

ප්‍රේමසිරි නැවැත්තුවේ බත්තරමුල්ලේ සුපිරි වෙළඳ සැලක් අසළය.

"අ..පි බ..හි..න්..නම් නංගී..."

"දැ..ව මෙ..හෙම හිටපුදෙන්..."

ඇය නොකියා කීවේ තමා එනතුරු ඉන්නා බවය. මධුවන්තට පුදුමය. මධුවන්ත කුඩය රැගෙන බැස්සේය. මුතු යංතමට ඔහු දෙස බැලුවාය. "එයා ඔක්කොම තනියම කරගන්නෙපැයි..." මුතු සිතුවාය.

මධුවන්ත ඉක්මනින් බඩු ටික ගත්තේය. ඔක්කොම කෙල්ලට ඕන ඒවාය.

"ප්‍රේමසිරි..."

"පොඩි බේබි..."

"මහත්තයා ආවම කියන්න මාලඹේට ගිහිල්ලම ගෙදර යං කියලා... මං ඉක්මනට එනවා..."

"හොඳයි පොඩි බේබි..."

මධුවන්ත බඩු මලු දෙකක්ම ගෙන වාහනයට ගොඩ විය.

"මහත්තයා පොඩි බේබිගේ වැඩකට මාලඹේට යනවා... එහෙටත්





ගිහින්ම ගෙදර යං..."

"ක..ම..ක් නෑ නංගී..."

මුතු බිමට නෙත් බර කළාය. "මං ඔයා දිහා බලද්දී ඔයාට මොනවද වෙන්නේ කියලා හිතා ගන්න බෑ..." මධුවන්ත වැස්ස දෙස බලාගෙන සිතුවේය.

අවට මහ වැස්සය. මුතු කෙල්ලව සතීපයට පපුවට තුරුල් කරගෙන උන්නාය. කෙල්ලද හැල හොල්මනක් නැතුව ඇගේ උණුසුමට තුරුල් වීගෙන උන්නාය. ඇය ඉදිරිපස අසුනේ කල්පනාබරව යන මධුවන්ත දෙස බලාගෙනම උන්නාය.

මුතුගේ හොඳම මිතුරිය වූයේ අනුෂ්කාය. ඇය උන්නේ මාලඹේය. මේ ඇයව හමුවන්නට යන්නේ වැඩකටම නොවේ. නිකම් කෙල්ලව බලා එන්නටය.

ප්‍රේමසිරි අනුෂ්කාගේ නිවස ඉදිරිපිටම වාහනය නැවත්තුවේය. කෙල්ලව දමා යන්නට මුතුට ලෝබය. ඇය මධුවන්ත දෙස බැලුවාය.

"මං දැ..ව..වත් ටි..ක..ක් අරන් යන්නම්..."

"හොඳයි නංගී... අපි ඉන්නම්..."

මුතු බැස්සේ කෙල්ලවද පපුවට තබාගෙනය. ඇය කුඩය යටින් ගියේ අම්මා කෙනෙක් මෙන් ඇයව තුරුල් කරගෙනය. ඒ දෙස මධුවන්ත බලා උන්නේ ආශාවෙනි.

අනුෂ්කා පහළට දුවගෙන ආවේ කෙල්ල ආ බව දැනගෙනය. මුතු සුරතල් දුවෙක්ව තුරුල් කරගෙන ඉන්නවා දකිද්දී අනුෂ්කාට පුදුම සිතුණි. නිම්මි අක්කාට බබාලා නැති බව අනුෂ්කා දනී. එසේනම් මේ තරම් හුරතල් කෙල්ලෙක් මුතු අතට ආවේ කොහෙන්ද...

"කාහෙද කෙල්ලේ මේ බෝලේ..."

අනුස්කා ඇසුවේ දුවගේ මුහුණ අතගාය. දුවව දුටු හැටියේම ඇයටද ආසා සිතුණි.



Elegantart.com

"ම..ගේ..."

මුතු තොල් පට තද කරගෙන කීවාය.

"මේ මගේ දුව... ලස්සනයි නේද..."

"හොඳ කොල්ලෙක් හිටියනම් උඹ එහෙමත් හදයි තමා... කාගෙද කෙල්ලේ..."

"දුවගේ තාත්තා වාහනේ ඉන්නවා..."

"ම..ට තේරෙන්නෑ බං..."

"යං මං කියන්නම්..."

"හිටපං මං කෙල්ලට චොකලට් එකක් ඇති අරගෙන එන්නම්..."

අනුෂ්කා ඇද මතින් ඉඳගත්තේ කෙල්ලට පුංචි කිට් කැට් එකක් කඩා දෙමිනි. මුතු කෙල්ලව ඔඩොක්කුවේම තබාගෙන තුරුල් කරගෙන උන්නාය.

"අක්කා බැඳලා ඉන්න ප්‍රියමන්ත අයියව උඹ දන්නව නේද අනූ..."

"ම්..."

"එයාගේ මල්ලී... මධුවන්ත... මේ මධුවන්ත අයියගේ දුව..."

"ඇන් කපල් එකම ආවද..."

"න්..නෑ... ඒක දිග කතාවක් අනූ..."

මුතු අනුෂ්කාට කෙටියෙන් මධුවන්තගේ කතාව කීවාය.

"අ..නේ පව්... හිතන්නත් පුදුමයි එහෙම දෙයක් ගැන... කොල්ලෙක් දරුවෙකුත් අරගෙන ආවයි කිව්වාම..."

"එ..යා මේ කෙල්ලත් එක්ක නොවිදිනා දුක් විඳින්නේ අනූ... හිතපංකෝ තාත්තා කෙනෙක් මේ දුවෙක්ව කොහොමද තනියම





හදන්නේ කියලා..."

අනුෂ්කා හිස වැනුවාය.

"ඒ අයියට තියෙන්නේ උඹ වගේ දුවට ආදරේ කෙල්ලෙක්ව බඳින්න..."

මුතු දෙනෙත් එසෙව්වාය.

"එතකොට හරි..."

"ජීවිතේ හැම පාරම වරදින්නෑ මුතු..."

මුතු උන්නේ කෙල්ලගේ හිස සිඹගෙන නෙත් බර කරගෙනය.

"උඹට දුවයි තාත්තයි ගැන හරි දුකයි නේ..."

අනුෂ්කා මිතුරියගේ හදවත හොඳින් හඳුනයි. ඇයට බොරුවක් කරන්නට මුතුට නොහැක.

"මගේ ජීවිතේ පැටලිලා අනූ... ගොඩක් පැටලිලා..."

"උඹ ෆෝන් කරලා අරක කිව්වට පස්සේ මාත් හරියට හිතුවා..."

"උත්තරයක් නෑ නේද..."

"ම්.. සමහර විට උඹට කාංචනව බඳින්නම වෙයි..."

බලා ඉඳිද්දී මුතුගේ දෑස්වල කදුළු පිරුණි. කෙල්ල මේ කසාදයට මේ තරම්ම අකමැත්තෙන් උන්නේ නැත. ඒ ගැන මේ තරම් බියකින් ඇය කතා කළේද නැත. ඇය ඒ ගැන දෙවරක් සිතුවේ මේ මැතකදීය.

"මුතු..."

"ම්..."

"හිතේ තියෙනා දෙයක් තියෙනවා නම් මට කියපන් කෙල්ලේ..."

"වැ..ඩක් නෑ අනූ..."

"ඇයි මොනාද උඹ හිතන්නේ..."



Elegantalks.com

"හිතෙන්නේ මහ පුදුම දේවල් අනූ.. ම..ට කියන්න බෑ..."

මුතු ඇස් පිසදා ගනිමින් කීවාය.

"මෙහෙම අවුල් වෙලත් බැනේ කෙල්ලේ නේද..."

"ම.. මා..ත් හිතනවා අනූ... මොනා හරි වෙයි..."

"මං මොනාහරි බොන්න හදන්නම්... අද අම්මත් ගෙදර නෑ... කෝපි එකක් හදන්නද කෙල්ලේ..."

"ම.. අ..නූ.. මේ..."

"හරි... මං වාහනේට ගිහින් දෙන්නම්..."

අනුෂ්කා මුතු කියන්නටත් පෙර කීවාය.

"චොක්කා රහද... ම..."

"ර..සා..යි..."

"නැන්දිත් ගෙනත් දෙන්නම් හොඳද..."

"චො..ක්..කා බෝ..ලේ..."

"චොක්කා බෝලවලටද පැටියා ආස..."

මුතු ඇයව තදින් ළමැදට බර කර ගත්තාය. මේ කෙල්ලව ළඟ නියාගෙන සිටිද්දී හදවතට දැනෙන සැනසීම කුමක්දැයි තවමත් මුතුට සිහා ගන්නට නොහැක.

අනුෂ්කා කෝපි දෙකක් රැගෙන වාහනය ළඟට ගියාය. මධුවන්ත දන්නේ වාහනයෙන් බැස පෝට්කෝවෙන් එපිට වැටෙන වැස්ස දස බලාගෙනය.

"මධුවන්ත අයියා නේද... මුතු මට කිව්වා..."

අනුෂ්කා කියද්දී මධුවන්තට පුදුමය. "ඔයා මාත් එක්ක කතා යන්නෑ... ඒ වුණාට මං ගැන යාළුවන්ට කියනවා..." ඔහු සිතුවේය.





"කෝපි එකක් බොන්න අයියේ..."

"අ..නේ නංගී කරදර වෙලානේ..."

"ඔක මොකක්ද... දුවත් කිරි එකක් බොයි නේද අයියේ... දැන් නම් වොකලට් එකක් කනවා මුතුගේ ළඟට වෙලා..."

මධුවන්ත සිනාසුණේ හිතවත් කමිනි.

අනුෂ්කා කෝපි රැගෙන උඩට ආවේ ඉන් පසුය. "කෙල්ලගේ හිත හෙල්ලිලා තියෙන්නේ මොකද කියලා දැන් හිතාගන්න පුළුවන්..." අනුෂ්කා සිතුවේ උඩට එමිනි.

"දූට ඉන්නේ හරි ලස්සන තාත්තා කෙනෙක්නේ..."

අනුෂ්කා කීවේ ඇඳ මතින් ඉඳගන්නා ගමන්ය. මුතු සිනාසුණේ බිම බලාගෙන මෙනි. "එයා කොච්චර අහිංසකද කියලා උඹ දන්නෑ..." මුතු සිතින් කිවාය.

"පුදුමයි..."

"ඇයි අනූ..."

"ගෑණියෙක් මේ කොල්ලව අත්ඇරියා කිව්වම..."

"පුදුම නම් තමා... ඒ ගෑණි මහ වල් කරන්නයක්... හැම ගෑණියෙක්ටම හොඳ මිනිහෙක්ගේ වටිනාකම තේරෙන්නැනේ අනූ..."

අනුෂ්කා නෙත් ඔසවා මුතු දෙස බැලුවාය.

"තේරෙන අයත් ඇති ඉනින්... නේ..ද..."

මුතු සිනාසුණා මිසක කතා කළේ නැත.

"හැබැයි මේ දුවටයි අර නාත්නටයි පිහිට වෙන කෙල්ලට නම් ජීවිතේ දුකක් නම් විඳින්න වෙන්නෑ... ඒක ෂුවර්..."

අනුෂ්කා කීවේ අවංකවම ඇයට සිතුණ දේය.

"මං.. ඒ..ක ද..න්..නවා අනූ..."



Piggantta.com

මුතු අසරණකමින් කීවාය.

මුතු කෙල්ලව වඩා ගත්තේ පැයකට පමණ පසුය.

"මං ඒ පැත්තේ එන්නම් කෙල්ලේ... උඹට කතා කරන්නම මුතු..."

අනුෂ්කා මුතුගේ අත අල්ලාගෙන කීවාය.

"මං එන්නම් අනූ... මේ නැන්දිට උම්මා එකක් දෙන්න පැටියෝ... අපට වොක්කත් දුන්නනේ නැන්දි..."

කෙල්ල අනුෂ්කාගේ ගෙළ බදාගෙන උම්මා දෙද්දී මුතු ආශාවෙන් බලා උන්නාය. "ඔයා දැන් මගේම දුව වගේ..."

අනුෂ්කා මුතුත් සමඟම පහළට ආවාය.

"ය..න්..නම් නංගී..."

මධුවන්ත කීවේ අනුෂ්කාටය.

"හොඳයි අයියේ... මුතු එද්දී ආයෙත් දුවවත් එවන්න..."

මධුවන්ත හිස වැනුවේ මුතු දෙස බලාය. ඇය නෙත් බර කරගෙනම වාහනයට ගොඩ වූවාය. මුතු මධුවන්ත දෙස බැලුවේ වාහනය කඩුවෙල පාර දිගේ යද්දීය. "මේ තාත්තටයි දුවටයි පිහිට වෙන කෙල්ලට නම් ජීවිතේ දුකක් නම් විඳින්න වෙන්නෑ..." අනුෂ්කා කී කතාව යළි යළිත් මුතුට සිහි විය.

**හීන හතක් පළමු කොටස**
**මින් නිමාවේ.**

# හීන හතක් - 2

ඇන් පිටවී ඇත.




"ඔබට මිය යන්නට සිතෙනවාද...
දැවී අළුවී පිච්චී යන්නට සිතෙනවාද...
පැටුල් බූලියක් හිසට වක්කරගෙන
ගිනි තියාගෙන සියදිවි නසා ගන්නට තරම් දුකක්...
වේදනාවක් ආත්මානුකම්පාවක්...
කළකිරීමක් දැනෙනවාද...
හෙටින් පසු ඉර පායන දවසේ ඔබ ජීවත් විය යුතු නැතැයි ඔබට සිතෙනවාද...
ඒ තරම්ම ඔබේ ජීවිතය දුකක්ද...
මොහොතකට නවතින්න...
ඔබ දැවී අළුවී පිච්චී මිය යන්නට පෙර එක මොහොතකට
සුජීව ප්‍රසන්න ආරච්චිගේ නවකතාවකින් කියවන්න...
එපමණයි... ඔහුගේ අප්‍රමාණ වූ සිංහල වචන අතරින්
ඔබට කෙනෙක් කතා කරාවී... ජීවිතය කොතරම් සුන්දර
ආදරණීය දෙයක්දැයි ඔබට තේරේවී...
ඔබ එතැන් පටන් ජීවිතයට ආදරය කරාවී...
ඒ අමරණීය හෘද සංවේදී වචන වල
ඒ තරම්ම බලගතු බවක් ඇත...
ඒ බව ඔබම අත්විඳ බලන්න..."



# හීන හතක්

sujeewa prasannaarachchi

සුජීව ප්‍රසන්න ආරච්චි

Rs: 440/=

MADHARA BOOKS
loving presents..

Elegantlanka.com